## 2018.08.07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.30ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී** ☸

**(01)**

**01:01 018 – 07 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

**2018 – 07 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපතිඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

✠ **ඒ අනුව 2018- 07- 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** භාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන නැත

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03:01** “ අම්බලන්ගොඩ නගර සභාවේ සභා අවශ්‍යතාවයක් වන කොඩි කණු 100ක් සුදු කොඩි 100ක් පුටු 300ක් සහ සුභ සාධක කටයුතු සඳහා බුෆේ සෙට් එකක් මිල දී ගැනීමට අදාලව වැඩ පරිපාලක හිමාල් ගුණවර්න මහතා විසින් 2018.07.26 දිනැතිව ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගතකරන ලදී.

<u>තීරණය</u>

**සභා අවශ්‍යතාවයන් වන කොඩිකණු 100 ක් , සුදු කොඩි 100 ක්, ප්ලාස්ටික් ඇඳි රහිත පුටු 300 ක් සහ බුෆේ සෙට් එකක් ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීමට සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**3:2:1** “ **අම්බලන්ගොඩ නගර සභාවේ 2017.12.31 දිනට වරිපනම් බදු හිග ශේෂය රු: 12808367.55 වන අතර එය අයකර ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමා ලේකම්තුමිය ගරු නගර සභා මන්ත්‍රී කොඩිකාර මහතා සමග පැවැත්වූ සාකච්ජාවේදී එතුමා ප්‍රකාශ කලේ කළුවඩුමුල්ල කොට්ඨශයේපවත්වා ගෙන යන ගම්සිරි උදාන සමිතියෙන් යම් පුද්ගලයකු එම මුදල් එකතු කිරීමට ලබාදීමට හැකි බවත් එම එකතු කරන ආදායමෙන් 10% ක කොමිස් මුදලක් මහුට ලබා දීමටත් අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන ආදායම් ලිපිකරු දයාරංසි මහත්මිය විසින් සභාවේ අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.**

**3:2:2** **අම්බලන්ගොඩ බස් නැවතුම් පොල තුල ගාල් කරන සියළුම රථවාහන (පාපැදි ඇතුළුව) සහ ඉතිරි 50% එම නිලධාරියාටත් ලබාදීම සඳහා බදු එකතු කිරීමේ අයිතිය බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවීමට පුවත්පත් දැන්වීමක් පලකිරීමටත් අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන ආදායම් ලිපිකරු දයාරංසි මහත්මිය විසින් සභාවේ අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වෙනදා නම් මීට ප්‍රථම නගර සභාවේ ටැක්ස් එකතු කරන කෙනෙක් අපේ නිවසකට පැමිණියා අපේ බදු එකතු කර ගන්න. දැන් ඒ ක්‍රමය නෑ. ඒ නිසා මේ ක්‍රමය ඇති කරන්න කියන ක්‍රමය ඉදිරිපත් කරාම 10%කොමිස් මත අපේ ලීලාරත්න මහතා එකතු කරා. ඊට පසු උපාලි ඉන්ද්‍රරත්න මහතා එකතු කරා. පී. විජේසේන මාදුවගේ මහතා එකතු කරා. පසුව සිදුවූ යම් යම් අක්‍රමිකතා නිසා ඒ වැඩපිළිවෙල නවතා දැමුවා. ඒ නිසා ඒ වැඩපිළිවෙල නවතා දැම්මා. ඒ නිසා මෙය නැවත ඇති කරලා බදු එකතු කිරීම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාකතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ වැඩපිළිවෙල සඳහා ගම්සිරි උදාන පදනම පමණක් නෙවෙයි. ගමේ විස්තර දන්නෙ ගමේ ඇත්තො. ඒ නිසා කොට්ඨාශයකට එක් කෙනෙක් බැගින් නියෝජිතයෙක් පත් කරන්න සුදුසුයි කියලා අපි හිතනවා. ඔබතුමා ඒ ගැන හිතලා බලන්න. සභාවේඅවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සභාවේ එකගතාවය පරිදි අපි කටයුතු කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

නෑ ඒක ඇත්ත. ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කියන්න වගේ. අනික් තැන්වලිනුත් ඉල්ලීම් එනවා ඒ වගේ. කොහොම කලත් මන්ත්‍රීවරුනාට කරදරවෙයි.එනිසා ඔබතුමා බලලා කරන්න. නැත්නම් කලින් හිටපු දෙන්නත් ඇතුලත් කරන්න පුළුවන්නම් ඒ කොට්ටාශවලට ඒකත් හොදයි.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි ඉල්ලීම මත ඉදිරියේදීසිදු වූ අක්‍රමිකතා නිසාත් ඒ සම්බන්ධයෙන් ලේකම්තුමිය මේ පිළිබඳව දැඩිව සලකා බලලා එවැනි අක්‍රමිකතාවයක් සිදු නොවන ආකාරයට කටයුතු කරන්න. මට මතක් කරන්න ඕනකලින් සිටි ලීලාරත්න මහතාගේ ලක්ෂ දෙකක පමණ මුදලක් අරගෙන සභාවට බදින්නැතිව තිබුණා.අධිකරණය මගින් ඔහුට ඇප ලබා දීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරලා තිබුණා.අධිකරණයට ගියොත් වංචා කළ මුදල මෙන් 3 ගුණයක් බදින්න වෙනවා රජයට.එනිසා එදා අපි සානුකම්පිතව සලකලා එම මුදල විතරක් ලබා ගෙන, අධිකරණයට දැන්නුවා මෙම මුදල ඔහු විසින් කාර්යාලයට ගෙවා ඇති බව.මෙවැනි සිදු වීම් රසක් අපට අත්දැකීම් වශයෙන් තියෙනවා. එනිසා මේ අයුරින් කොට්ඨාශයට එක් අයකු බැගින් පත් කිරීම සඳහා සභාවේ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඉස්සරහට කටයුතු තරන්න ඉල්ලා සිටිනවා.

තීරණය

**අම්බලන්ගොඩ නගර සභාවේ වරිපනම් හිඟ ශේෂය අයකර ගැනීම වෙනුවෙන් කළුවඩුමුල්ල කොට්ඨාශයේ පවත්වාගෙන යන ගම්සිරි උදාන පදනමෙන් පුද්ගලයෙකු ලබා ගැනීමටත් සභාවට අයත් සියලු කොට්ඨාශ මට්ටමිනුත් පුද්ලයන් බඳවා ගෙන එකතු කරන ආදායමෙන් 10% ක කොමිස් මුදලක් ලබා දීමටත් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොතිබූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඒ වගේම දෙවෙනි කාරණය අම්බලන්ගොඩ බස් නැවතුම් පොල පමණක් නෙවෙයි නගරය තුළ පාර්ක් කරන සියලුම වාහනවලින් පාර්කින් පීස් අය කරන්න අම්බලන්ගොඩ වෙළඳ සංගමයට භාර දුන්නා. ඉන් 50% ක් නගර සභාවට බදින්නත් එකතු කරන අය වශයෙන් වෙළඳ සංගමයට 50% ක් ලබා දීමටත්. ඒ ලබා දීමෙන් පසුව වෙළඳ සංගමය විසින් නගර ආරක්ෂක බලකායක් ඇති කරාවි යන පදනම මත තමයි ඒ මුදල ඒ විදිහට ලබා දුන්නෙ. ඒ නිසා එවැනි ආකාරයෙනුත් බදු එකතු කිරීමේ අයිතිය ටෙන්ඩර් කිරීමේ පුවත්පත් දැන්වීමක් පල කිරීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතාකතා කරමින්

සභාපතිතුමනි,එම අයිතිය ලබා දීමට කලින් අපි රථවාහන පාර්ක් කිරීමේ තැන් හඳුනාගෙන තියෙනවා. මා දන්නා තරමින් අලුත් පාර දෙපස මොනම ආකාරයකින්වත් මොනම වාහනයක්වත් පාර්ක් කිරීම තහනම්. ඒකයි නීතිය. එක පැත්තකින් අපි නීතිය කඩනවා. අනික් පැත්තෙන් පොලීසිය ගිහිල්ලා වාහන නවත්වන්න එපා කියලා විනාඩි පහෙන් පහට යනවා. බරපතලම කාරණය අලුත් පාරේ වාහන නවත්වලා අපට පාර්කින් දුන්නා උනත් ගැටළුවක් තියෙනවා අලුත් පාරේ තියෙන තදබදයත් එක්ක අපි පාර්කින් ප්‍රදේශ හඳුන්වා දෙනවද කියන එක. මහවීදියේ තියෙන සෝචනීය තත්වය ඕන කෙනෙකුට ගියත් බලන්න පුළුවන්. මේ තියෙන තත්වය තවත් උග්‍ර වෙනවා. ඒ අය කියනවා අපි ටිකට් එකක් අරගෙන තියෙන්නෙ කියලා. වෙළෙඳුන්ට වෙළඳාමක්වත් කර ගන්න බැරි වෙනවා. මහපාරේ ලොරියක් ගිහිල්ලා උදේ පාන්දර ගැහුවොත් හවස් වරුවෙ ඒ කඩේ වැහුවා හා සමානයි. අපි බලපත්‍ර දීම තුළ ඒ අය කියනවා පාකින් පීස් අරගෙන තමයි පාර්ක් කරලා තියෙන්නෙ කියන එක. මේ කාරණා ප්‍රධාන පාරවල් දෙකේ තියෙන කොට අතුරු මාර්ගවල නම් ගැටළුවක් නෑ. ප්‍රධාන පාරවල් දෙකේ අය කරනවා නම් ටිකට් කඩන කෙනා කොහේ හරි නවත්වලා තියෙන වාහනයකින් ටිකට් එකක් අරගෙන එන්න කියන්න. ඒක නීත්‍යාණුකූල ආයතනයක් විදිහට අපි නගර සභාව කලයුතු නෑ. අපි නීත්‍යානුකූලව වැඩ කරලා ඕනෙ අනික් අයට නීත්‍යාණුකූලව වැඩ කරන්න ආදර්ශමත් වෙන්න. මං දන්න තරමින් අම්බලන්ගොඩ මේ මාර්ග දෙකේ නීත්‍යාණුකූලව වාහන නවතා තබා පාර්කින් පීස් අයකරන ක්‍රමවේදයක් තියෙනවද කියලා තවපාරක් කල්පනා කරලා බලන්න කියලා මම බොහොම උවමනාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතාකතා කරමින්

සභාපතිතුමනි,අපි සභාවෙ කතා කරාට ක්‍රියාත්මක උනේ නෑ. ඒක ඉක්මනට ක්‍රියාත්මක උනොත් හොඳයි කියලා හිතනවා. අම්බලන්ගොඩ නව නගර සැලැස්ම පිළිබඳව සංවර්ධන කමිටුවේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් ඇවිත් හිටිය නිලධාරියට අපි කිව්ව අදාල නගර සංවර්ධන සැළැස්ම ඉදිරිපත්

කරන්නයි කියලා. ඔය නව නගර සැළැස්ම තුල කර්තව්‍යන් කිහිපයකුත් ඔය භූමි භාගය තුල සිදු වෙන්න පුළුවන්. අපේ නිර්මාණ ශිල්පියට කියල මම ඉදිරිපත් කරා සංස්කෘතික මධ්‍යස්ථානයක්. ඒක අගමැතිතුමාට දුන්නා. අගමැතිතුමා ඒක නාගරික සංවර්ධන අධිකාරියට යවල තියෙනවා. මේකත් ඔය සැළැස්ම තුල ඇති. අපි කියමු ඒ අයට ඉදිරිපත් කරන්න කියල මේ ඉඩම් ටිකත් දුන්නහම මේ නගරයේ සංවර්ධන ව්‍යාපෘතිය මොකක්ද කෙරෙන්නෙ කියලා. එතකොට අපි දැනුවත් වෙනවනෙ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එක ප්‍රශ්නයයි තියෙන්නෙ. නගරයට එන වාහන සඳහා නැවතුම් ගාස්තුවක් අය කරනවද නැද්ද කියන එක. ඒ අය කිරීමේදී අය කරන අයට 50% ක කොමිස් එකක් දී ටෙන්ඩර් කිරීමට අවසරය ඉල්ලා සිටිනවා. මීට ප්‍රථම අපි කරලා තියෙනවා 50% කට මේක එකතු කරන්න අයිතිය අයිතිය ලබා දීලා තියෙනවා අම්බලන්ගොඩ වෙළඳ සංගමයට. ඒක හේතුවක් මත ලබා දුන්නෙ. ඒ කාලයේ අපේ කඩ සාප්පු නිරන්තරයෙන් හොරු කැඩුවා. ඒ 50% න් ඒගොල්ලන්ගෙන් ඉල්ලීමක් කරා නගර ආරක්ෂක බලකායක් පිහිටුවන්න කියලා. පොලීසිය ප්‍රමාණවත් නොවූ නිසා අපට ඒ කාලයේ ඇත්තට ආදායමක් ලැබුණා මේ සම්බන්ධයෙන්. ඒ ආදායමත් දැන් නෑ. වෙළඳ සංගමය එය නොකිරීම නිසා එය අතහැරලා තියෙනවා. ඒ නිසා අපට පුළුවන් ටෙන්ඩරයක් පුවත්පත් දැන්වීමක් දාලා ඉදිරිපත් වන අයෙක් සිටීනම්අපට 50%කුත් ඒ අයට 50%කුත් ලෙස ටෙන්ඩර් කරලා ඕනෑම කෙනෙකුට බදු දීමේ අයිතිය දෙන්න. මහවීදිය බස් නැවතුම් පොලේ සමහර අය රුහුණට වාහනය නවත්වලාහවසට සමුද්‍රය එනකම්ම තියෙනවා. පාර්කින් පීස් එකක් අය කරනවා නම් මේ ක්‍රමය අඩු වෙනවා. ඒ ගොල්ලො වෙනත් තැන්වල සල්ලි අයකරන නිසා වාහන දාලා යන එක සීමා වෙනවා. මේක නීත්‍යානුකූල වෙනවා වගේම වාහන නවතා තිබෙන කාලය අඩු කිරීමත් කරන්න පුළුවන්.ඒ නිසා තමයි මේ යෝජනාව ඉදිරිපත් කලේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මම අදහසක් දක්වනවා ඔය වාහන ඔබතුමා කිව්වා වගේ අනවශ්‍ය විදිහට ගාල් කරලා තියෙනවා. ඕන වෙලාවක ඇවිල්ලා වාහන අරගෙන යනවා. තදබදය වැඩි වෙනවා. නගර සභාවටත් ආදායමක් එන විදිහට ටෙන්ඩර් කිරීම සුදුසුයි කියලා හිතනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, කලිනුත් ඕක කරා. ආදායමකුත් ලැබුණා. වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය සමග සහයෝගයෙන් වැඩ කරා. ඒ ගොල්ලො ඉල්ලීමක් කරලා තියෙනවද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ.වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය කලේනගර ආරක්ෂක බලකායක් ඇති කලේ නෑ. ඒ ගොල්ලන්ගෙ වෙළෙන්දො අතර ණය දෙන සමිතියක් ඇති කලා. රු: 50000/- රු:25000/- ණය දීලා ඒකෙන් ආදායමක් ලබන තත්වයට ඇවිල්ලා. රුපියල් ලක්ෂ විස්ස, තිහ ඒ වගේ ආදායමක් ලබලා ඒ ගොල්ලන්ගෙ සුභ සාධනය සඳහා වැඩ කරා. මේකෙන් අපි බලාපොරොත්තු වුන ඉලක්කය ලැබුනෙ නෑ. මේක ලබා දෙන්න තීරණය කලේ සර්වේ එකක් කරලා. වෙළඳාමට ඇති බාධක, සොර සතුරු බිය කියන එකෙන් නගර 48කින් අපි හිටියෙ 42 ට. ඒ කාලය ඇතුලත කඩ සාප්පු බිඳින ආර්ථිකයට බලපාන පැමිණිලිවලින් නරක තත්වයක අපි හිටියා. මීට අවුරුදු 7කට 6 කට විතර කලින්.ඒ නිසා වෙළඳ සංගමයෙන් ඉල්ලීමක් කරා කාරණා දෙකක් ඉෂ්ට කරන්න කියලා. වෙළඳාම නීත්‍යානුකැල වගේම වාහන නවතා තබන කාලය අඩු කිරීම කරන්න. මැදිවෙලා හිටපු පුද්ගලික ආරක්ෂක සේවාවක් ඇති කරන්නඅපිත් උදවු කරන්න නිසා නගරයක පොලීසියට පැමිනෙලා තව පාර්කින් පීස්වලින් 50% ක් දෙන්නම් කියලා. තව දෙයක් තමයි මුළු නගරයම ආවරණය වන පරිදි කැමරා පද්ධතියක් සවි කරන්න කියලා. මම ඇල්පිටිය පොලිස් අධිකාරි තල්දූව මහතා සමග සාකච්ඡා කරා. ඒ වගේ දෙයක් කරනවා නම් අනිවාර්‍යයෙන්ම පොලීසියෙන් දෙන්නෙක් අම්බලන්ගොඩ බස් නැවතුම් පොල ඉදිරියේ නිරීක්ෂණ මට්ටමේ තියන්න පුළුවන් කියලා. නැවත වෙළඳ සංගමය සමග සාකච්ඡා කරලා අපිත් වැඩ කොටසක් හෝ මුදලක් දාලා නගරයේ නගර වැසියන්ගේ ආරක්ෂාව ඉටු කිරීමත් අපේ වගකීමත්. යම් වැඩ කොටසක් මේ මගින් කරන්න බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,අපිත් කියන්නෙ සමහර වෙලාවට වාහන ගහලා තියෙනවා. බඩු බාන ඒවා උදේ ඉඳන් හැන්දෑ වෙනකම් . ඒක පාලනය වෙනවා මේකෙන්. අපේ ව්‍යාපාරිකයන්ට ක්‍රමවේදයක් සකසලා සාධාරණයක් කරන එක හොදයි. අනෙක් නගරවලත් ක්‍රියාත්මක වෙනවා. හරියට කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාකතා කරමින්</u>**

සභාවෙන් අවසරයි. මට තියෙන ගැටළුව තමයි ඒකට අවශ්‍ය යටිතල පහසුකම් සකසලා දීලා ඉරි ගහලා ක්‍රමවේදයක් හදලා පටන් ගත්තා නම් හොදයි කියලා මම හිතනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මේ සම්බන්ධයෙන් නගර සභාව විසින් සකස් කල ප්‍රතිපත්ති රාමුව මොකක්ද කියලා සාකච්ඡා කරලා වෙනම කමිටුවක් මගින් තීන්දු කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතාකතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හොද යෝජනාවක්. හැබැයි ගැටළුවකට මුහුණ දෙන්න අම්බලන්ගොඩ වැඩියෙන්ම තියෙන තදබදය ත්‍රිවීල්. ඒකට විසදුමක් මේකෙන් එන්නෙ නෑ. අම්බලන්ගොඩ නගරයට එන වාහනවලට ස්ථානයක් දීලා පාර්කින් පීස් අය කරනවා නම් ගැටළුවක් නෑ. පාරවල හන්දිවල තියෙන්නෙ ත්‍රිවීල්. අපි ත්‍රිවීල් කමිටු දෙකක් පවත්වලා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපි දුන්නා ඒගොල්ලන්ට කාලයක් ඒ කාලය අනුව කටයුතු කරන්න කියලා. එහෙනම් සභාපතිතුමා ත්‍රිවීල් ගැටළුවට විසඳුමක් වෙනවද?පාර්කින් පීස් අය කරන්න ගන්න තීරණය ටෙන්ඩර් කරලා ඒ කෙන් විසදුමක් එනවද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට පුළුවන් මන්ත්‍රීවරුන්ට සාකච්ඡා කරලා. අපිබලපත්‍රයක් දෙන එකකට අපි දෙන්නෙ වාර්ෂිකව රු:1000/-කට රු:1200/- කට නම් හදිසියේ නවතන එකකට වැඩි ගානක් දෙනවා. එතකොට නැවතීමත් සීමා වෙනවා.ඒ විදිහෙ ක්‍රමවේද අපට අනුගමනය කරන්න වෙනවා. මන්තීතුමා අපි කෙළඹ නගරයට ගියත් වාහනය පාර අයිනෙ නැවැත්තුවත් අම්බලන්ගොඩ නගර සභාව කිච්චත් ටිකට් එකක් කඩනවා.

**<u>ගරු උප සභාපකි කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මාත් පිළිගන්නවා.අපි මේවාට දෙන ස්ථාන මොනවාද අපි හදුනාගත් ස්ථාන තියෙනවද?ගාලු පාරෙ ගැහුවොත් අපට තව ප්‍රශ්නයකට මුහුණ පාන්න වෙන්නෙ නැද්ද? ගන්නෙ නැති අයටත් ලොකු ගැටළුවකට මුහුණ දෙන්න වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාව තුළ මේකටස්ථිර තීරණයක් ගන්න ඕන වෙන්නෙ නෑ. අපි මන්ත්‍රී මණ්ඩලය වෙනම සාකච්ඡා කරලා කමිටුවක් පත් කරලා දියයුතු අන්දම මොකක්ද කියලාඑකගතාවයකට පත් වෙමු. විපක්ෂ නායකතුමා, රාහුලමන්ත්‍රීතුමා, ජනතා විමුක්ති පෙරමුණසරත් මන්ත්‍රීතුමා, උපසභාපතිතුමා, ලසන්ත මන්ත්‍රීතුමා, මාත් ඇතුළුව කමිටුවක් පත් කරලා තීන්දුව ලබන සභාවට ඉදිරිපත් කරන්නම්.

තීරණය

**අම්බලන්ගොඩ බස්නැවතුම්පළ තුළ ගාල්කරන සියලුම රථවාහන (පාපැදි ඇතුළුව) සම්බන්ධයෙන් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා , ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා,ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා ,ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා යන ගරු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සාකච්ඡා කොට තීන්දුවක් ගෙන ලබන සභාවට ඉදිරිපත් කරන ලෙසට සභාව විසින් තීරණය කරන ලදී.**

**3:3** **සෞඛ්‍ය අංශයට පහසුකම් සලසා ගැනීම''** මැයෙන් සෞඛ්‍ය පරිපාලක නිලධාරී හිරාන් මහතා විසින් ඉදිරිපත් කරන ලද 2018-07-30දිනැති ලිපිය සභාගතකරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු සේවක සේවිකාවන් පිරිසකගේ ඇඳුම් හා බඩු භාහිරාදිය,ආහාර ආරක්ෂිතව තබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් නොමැති බවත්,එබැවින් වානේ අල්මාරි කිහිපයක් හෝ යකඩ සේප්පු කිහිපයක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

**අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සේවයේ නියුතු සෙවක සේවිකාවන්ගේ භාණ්ඩ ආරක්ෂිතව තබා ගැනීම සඳහා වානේ අල්මාරි කිහිපයක් හෝ යකඩ සේප්පු කිහිපයක් ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අනුව එය ලබා දෙන ලෙස ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**03:04** **' කොඩි කණු 25ක් ලබා ගැනීම සඳහා'** මැයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක විසින් එවා තිබූ ලිපිය සභාගත සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ මූලස්ථාන පොලිසියේ පැවැත්වීමට නියමිත ඇල්පිටිය පොලිස් අධිකාරි තුමාගේ අර්ධ වාර්ෂික පරීක්ෂණය 2018.07.28 වන දිනට යෙදී ඇති බැවින් පොලිස් ස්ථානයේ ක්‍රීඩා පිටිය සැරසීම සඳහා කොඩි කණු 25ක් 2018.07.26 දිනට ලබා ගැනීම සඳහා මුදල් අයකිරීමකින් තොරව අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ඉල්ලා තිබුණි..

තීරණය

**අම්බලන්ගොඩ මූලස්ථාන පොලීසියේ පැවැත්වීමට නියමිත පොලිස් අධිකාරීතුමාගේ අර්ධ වාර්ෂික පරීක්ෂණය සඳහා පොලිස් ස්ථානයෙහි ක්‍රීඩාපිටිය සැරසිම සඳහා 2018.07.26 වන දින මුදල් අයකිරීමෙන් තොරව කොඩිකණු 25 ක් සභා අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:5** **' T.H.W. නිවාස සංකීර්ණයේ පිහිටි ප්‍රජා ශාලාව අම්බලන්ගොඩ නගර සභාවට පවරාදීම සඳහා '** මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රජා සේවා නිලධාරී වාසනා මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගතකරන ලදී.

උක්ත කරුණට අදාලවT.H.W. නිවාස සංකීර්ණයේ ප්‍රජා කමිටුව විසින් ගරු නගරාධිපතිතුමන් වෙත යොමු කරන ලද ලිපිය අනුව, එම ලිපිය මගින් රාජ්‍ය නොවන සංවිධාන ආධාර මත ඉදිකර නිවාස සංකීර්ණයෙන් පත් කරන ලද ප්‍රජා කමිටුවක් වෙත පවරා දෙන ලද ප්‍රජා ශාලාව එහි නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට නොහැකි බව දන්වමින් නගර සභාව වෙත පවරා ගන්නා ලෙස ඉල්ලීමක් කර ඇති බවත් (නිවාස වාසීන්ගේ අත්සන් සහිතව), ඒ අනුව ප්‍රජා ශාලාව නිරීක්ෂණය කිරීමේදී සිවිලිම, වොෂ් රූම්ස්,බාත් රූම්ස් සවිකර ඇති උපකරණ කැඩී බිඳී වැඩ කල නොහැකි තත්වයට පත්ව ඇති

අතර,ප්‍රජා ශාලාව අපිරිසිදු තත්වයේ පවතිනු දක්නට ලැබුණු බවත් එව ප්‍රජා ශාලාව නිවාස සංකීර්ණයේ ජනතාවගේ උත්සව පැවැත්වීමට , උත්සව සඳහා ආහාර පාන පිළියෙල කර ගැනීම , රැස්වීම් පැවැත්වීම ඇතුලු කටයුතු වෙනුවෙන් භාවිතයට ගෙන ඇති අතර,එවැනි උත්සවයකදී අය කරනු ලබන රු: 500/- මුදලින් විදුලි ගාස්තු ගෙවන ලද බවත්, ඔවුන්ගේ ඉල්ලීම පරිදි ප්‍රජා ශාලාව නගර සභාව වෙත පවරා ගන්නේ නම් අදාල ප්‍රතිසංස්කරණයන් සිදු කොට නගර සභාව මගින් අයදුම්පතක් සම්පූර්ණ කර ප්‍රජා ශාලාව වෙන් කර ගැනීවටත් ඒ ඒ උත්සවයේ ස්වභාවය අනුව මිල ගනන් තීරණය කර (ජල, විදුලි ගාස්තු සහිතව) මුදල් අයකර ගැනීමෙන් පසු ශාලා පහසුකම් ලබාදීම හෝ , නිවාස හිමියන් රැස් කරවා ඔවුන් දැනුවත් කර ඔවුන්ගේ ද දායකත්වය ඇතිව අදාල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර නව නිලධාරී මණ්ඩලයක් සහිප්‍රජාකමිටුවක් පත් කර නගර සභා අධීක්ෂණය යටතේ එහි කටයුතු පවත්වාගෙන යාම සුදුසු බව යෝජනා කර තිබුණි.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

අපි පවරා ගන්න දෙයක් නෑ. ඕක නගර සභාව දේපලක්. ඕක පරිහරණය කරන්නෙ ඒ මිනිස්සු නිසා ඒ කමිටුවකට භාර දීලා එහි නඩත්තු කටයුතු කර ගෙන යන්න සහ එම ධීවර ජනතාවට උත්සව කටයුතු කර ගෙන යාම සඳහා පහසුකම් සලසා ගන්න කියලා. දැන් ඒක ඉතාමත්ම අබලන් වෙලා තියෙන්නෙ ඒ අයට නැවත අලුත් වැඩියා කර ගත හැකි තත්වයක් නෑ. නගර සභාව මගින් අලුත් වැඩියා කරලා දෙන්න අපේ දෙපලක් වශයෙන් වගකීමක් වෙනවා. ඉක්මනින් නඩත්තු කටයුතු කරලා නැවත ඒ ජනතාවට දෙනවාට වඩා සභාව මගින් ධීවර සංකීර්ණය නඩත්තු කරනවා වගෙ සභාව මගින් කරනවානම් හොඳයි. සමහර පුද්ගලයන් එක එක දේවල් කරනවා. ඒ නිසා තමයි විනාශ වෙන්නෙ. ඒක නවත්වලා ධීවර ජනතාවගෙ පහසුකම් වෙනුවෙන් නැවත වරක් සමිතියක් හදලා භාර දෙනවාට වඩා සභාව මගින් පාලනය කරලා ඒ අයට ඉල්ලීමක් කරලා උත්සවවලට ලබා දෙනවා නම් හොදයි කියන යෝජනාව තමයි ගරු සභාපතිතුමනි මම කියන්නෙ.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මෙම T.H.W. නිවාස අම්බලන්ගොඩ නගර සභාවට සතු භූමියක තමයි හදලා තියෙන්නෙ. එවකට පින්ස් කියන රාජ්‍ය නොවන ආයතනය පෙර පාසලක් පවත්වා ගෙනයාම සඳහා අවසර ඉල්ලුවා. එම ඉල්ලීම මත එය විවෘත කර අපි දුන්නා එය නඩත්තු කරනවා කියන පදනම මත. නමුත් දැන් අද වනවිට එම වැසියන්ට බරක් වෙලා තියෙනවා. දැන් මුදල් ලබා දෙන්නෙ නෑ. ලයිට් ලබා දෙන්නෙ නෑ. දැන් ලයිට් කපලා තියෙන්න. එවැනි ප්‍රශ්න ඇති වෙලා. එය නඩත්තු කිරීම අප වගකීමක්. එහි නඩත්තු කටයුතු කරලා එම සුනාමි ජනතාවගෙ පහසුකම් සලසා දෙන්න සියලු දෙනාගෙ අවසරය ඉල්ලා සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මියකතා කරමින්__

මෙහි ඇතුලත් සකස් කරලා ඒක ආවරණය කරලා ගේට්ටුවක් දාලා සකස් කරලා ඉල්ලනවා.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

දැනට මෙතන කිසිම හොරකමක් වෙලා නෑ. භාවිතා කරනවිටදී කඩලා ගිහිල්ලා තියෙනවා. කිසිම හොරෙක් ඇවිල්ලා කැලි ගලවගෙන ගිහින් නෑ. සභාවට පවරගෙන නඩත්තු කටයුතු කරමු.

__තීරණය__

**T.H.W.නිවාස සංකීර්ණයෙහි පිහිටි ප්‍රජා ශාලාව අම්බලන්ගොඩ නගර සභාව වෙත පවරා ගන්නා ලෙසට කරන ලද යෝජනාව සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව මෙම දේපළ නගර සභාවේ දේපලක් බැවින් එය නඩත්තු කිරීම සභාවේ වගකීමක් වන බවත් මෙම දේපළ පවරා ගෙන නඩත්තු කටයුතු සිදු කරමින් නගර සභාවේ අනුග්‍රහයෙන් T.H.W නිවාස සංකීර්ණයෙහි ජනතාව වෙත සේවාවක් කිරීම වෙනුවෙන් සාධාරණ ගාස්තුවක් අයකර ලබාදීම සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් සභාවේ අනුමැතිය ඉල්ලා සිටි අතර ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03:06 ' 2018 සිසු නිපුණතා ත්‍යාග සඳහා අනුග්‍රයලබා ගැනීම'** අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රජා සේවා නිලධාරී වාසනා මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපියසභාගතකරන ලදී.

ශාසනාරක්ෂක බල මණ්ඩලයේලේඛකාධිකාරී අතිපූජනීය ශාස්ත්‍රවේදි නින්දානෙ චන්දික හිමිපානණ් විසින් ගරු නගරාධිපතිතුමන් වෙත යොමු කරන ලද ලිපිය අනුව, මීට පෙර වර්ෂවලදී සංවිධානය කරන ලද සිසු නිපුණතා ත්‍යාග ප්‍රධානෝත්සවයක් සඳහා නගර සභාව මගින් (සංවිධානය කරන ලද සෑම වසරකම පදක්කම්ද ඇතැම් වසරවලදී පදක්කම් හා ත්‍යාග සඳහාද ) අනුග්‍රහය දක්වන ලද අතර අයවැය ලේඛණයේ ව්‍යාපෘති අංක 02 පුස්තකාල සේවා යටතේ62459(4) දහම් පාසල් අතර තරගාවලි /ආගමික කටයුතු සඳහා වාර්ෂික මුදල් ප්‍රතිපාදනද වෙන් කරනු ලබන බවත් , 2018 අයවැය ලේඛණයෙන්වෙන් කර ඇති මුදල ලක්ෂයක් බවත්, වසර කිහිපයකට පසු සංවිධානය කරන්නට යෙදෙන මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා නගර සභාවේ අනුග්‍රහය ලබාදීම සුදුසු බවත් , ගරු සභාවේඅනුමැතිය සඳහාත් ඉදිරිපත් කර තිබුණි.

අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලෙයේලේඛකාධිකාරී අතිපූජනීය නින්දානෙ චන්දික හිමිපානණ් විසින් මෙම කරුණට අදාලව ඉදිරිපත් කර තිබූ ලිපිය අනුව, අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලය මගින් 2018.09.23 වන දින සිසු නිපුණතා තරග පැවැතවෙන බවත් එම සිසු නිපුණතා තරගවලින් ජයග්‍රහණ ලබන සිසුන් සඳහා ත්‍යාග පදානෝත්සවයක්නොවැම්බර් මාසයදී පමණ පැවැත්වීමට අදහස් කර ඇති බවත් ඒ සඳහා අවධානය යොමු කර නගර සභාවේ ප්‍රතිපාදන මත අනුගහයක් ලබා දෙන මෙන් ඉල්ලා ඇත. ඇත. රන්, රිදී, ලෝකඩ පදක්කම් සඳහා රු:24600.00 ක්ද, ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන ත්‍යාග සඳහා රු:61500.00 ක්ද වශයෙන් රු:86100.00 අදාල වන ඇස්තමේන්තුවද ඉදිරිපත් කර ඇත.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලෙයේත්‍යාග පදානෝත්සවයසඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමා, ශාසනාරක්ෂක බල මණ්ඩලෙයේ මෙම කටයුත්ත සඳහා තරුණ බෞද්ධ සංගමය සමග එකතු වෙලා පොසොන්පෝයටත් විවිධ වැඩසටහන් ඉදිරිපත් කරක්‍රියාත්මක කලා. නගර සභාව විදිහට අපට මුදල් තියෙනවා නම් හොඳයි. නමුත් අපේ විශාල අභියෝගයක් තියෙනවා ක්‍රීඩා පිටිය හදන්න. මම යෝජනා කරන්නෙ අනවශ්‍ය සියලු මුදල් ලක්ෂය ලක්ෂය එකතු කරලා නගරය වෙනුවෙන් නගර සභා ක්‍රීඩාංගනය හදන්න. මෙතනට රු:86000.00 වුනත් ඒක මුදලක්. මෙම තරුණ බෞද්ධ සංගමය විවිධ වැඩසටහන් මගින් සල්ලි එකතු කරනවා. ඒ සල්ලිවලට මොකද වෙන්නෙ? දහම් පාසල්වලට මෙහොද දෙයක් කරන්නෙ. නමුත් නගර සභාව විදිහට මුදල් වියදම් කරන්නෙ ඇයි මේකට. තරුණ බෞද්ධ සංගමයේ විවිධ වැඩසටහන් මගින් එකතු කරන සල්ලි නැද්ද මෙවැනි කටයුත්තක් සඳහා වියදම් කරන්න. ඒක පොඩ්ඩක් පරීක්ෂා කරලා මේ රු:86000.00 හරි ක්‍රීඩාපිටිය ඉදි කිරීම සඳහා එකතු කර ගන්න කියන එක තමයි මගේ ඉල්ලීම.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි තරුණ බෞද්ධ සංගමය හා ශාසනාරක්ෂක බල මණ්ඩලය සංවිධාන දෙකක්. ඒ නිසා විපක්ෂ නායකතුමාගේ අදහස සැලකිල්ලට ගත යුතුයි. අපි මේ සංවිධාන දෙක සමග කලයුතු වෙනවා. එහෙම උනොත් තමයි මූල්‍ය සම්පාදකත්වය අපට අනික් සංවිධානයට දිය හැකි වෙන්නෙ. මීට පෙර බොමහාම අලංකාර විදිහට ගරු ගාම්භීර විදිහට උත්සව සංවිධානය කරලා මේ සත්කාරය සුලසුවා. නමුත් දැන් ඊට වඩා අභියෝගයක් තියෙන නිසා මේ ගැන දෙපාර්ශවය සමග සාකච්ඡා කරලා එම මූල්‍යතත්වය හුවමාරු කිරීමට හැකි නම් වඩා හොදයි.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මන්ත්‍රීතුමා කිවූ පරිදිතරුණ බෞද්ධ සංගමයත්, ශාසනාරක්ෂක බල මණ්ඩලයත් ආයතන දෙකක්. මේ ආයතන දෙකේදි සැම ස්වාමීන් වහන්සේලා සියලු දෙනාම දහම් පාසලේ ත්‍යාග පදානෝත්සවය සඳහා මුළු ගමේම ගිහින් තෑගි එකතු කරනවා. නමුත් ශාසනාරක්ෂක බල මණ්ඩලය තුළ තියෙනවා දහම් පාසල් තරගාවලියක්. එහි තෑගි පදානෝත්සවය සඳහා තෑගි එකතු කරන්න ගියහම බරපතල ප්‍රශ්නයකට ස්වාමීන් වහන්සේලා පත් වෙනවා. මොකද ස්වාමීන් වහන්සේලා ගමේ තියෙන දහම් පාසලට තෑගි එකතු කරලා තියෙන්නෙ. මේකට කවුරුත් අත නොගහන තත්වයක් තිබුණා. නගර සභා ආඥා පනත අනුවත් මෙවැනි වැඩවලට මුදල් වැය කිරීමේ හැකියාව තියෙනවා. සභාවෙන් අනුමත වුනාට පසුව අපේ පළාත් පාලන ගරු ඇමතිතුමා වශයෙන් ප්‍රධාන ඇමතිතුමාගෙන්ද අවසරය ලබා ගෙන තමයි වියදම් කරන්නෙ. අපට තනියෙන් වියදම් කරන්න බලයක් නෑ. ඒ අනුව ඒ වැඩ කොටස් ටික සියලුම තෑගි ටික සියලුම දහම් පාසල් අතර පළවෙනියා, දෙවැනියා, තුන්වැනියා වෙන අයට තෑගි දීමක් තමයි කරන්නෙ. මේ උත්සවය ආගමික වැඩ කටයුතු කිරීම සඳහා නගර සභා ආඥා පනෙතේ අපට ලැබී ඇති බලතල ප්‍රකාරව ලබාදිය හැකි උපරිම දායකත්වය කියලා හිතලා කටයුතු කරමු. මීට වසර කට 15 කට කලින් මේ දායකත්වය හාමුදුරුවන්ට ලබාදීලා තියෙනවා. අපි කළුවඩුමුල්ල දහම් පාසලේ උත්සවයට ගියා. ඒ හාමුදුරුවෝ මුළු ගමේම ගිහිල්ලා තමයි ඔය තෑගි ටික එකතු කරලා තියෙන්නෙ. අපි ආගමික කටයුතු කිරීමේදී බෞද්ධ නගරයක් කියලා හිතලා අපට කරන්න පුළුවන් උපරිම දේ කිරීමට තමයි මේ වැඩ කොටස් තියෙන්නෙ. අපි ග්‍රවුන්ඩ් එක ගැන මතක් කල නිසා විතරක් මම කියන්නම්. මම පස්සේ ගරු ක්‍රීඩා හා පළාත් පාළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමා හමුවුනා. එතුමා ඒ වෙලේම නියෝග කලා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මේග්‍රවුන්ඩ් එකේ ඉතිරි වැඩ කොටස් ටික, තණ කොළ සිටුවීම, ටර්ෆ් 3 ක් සෑදීම, මැටන් එකක් සෑදීම, සයිඩ් ස්කීන් සෑදීම, ලකුණු පුවරුව සෑදීම සඳහා මුදල් ලබා දෙන්න කියලා ඔවුන් තීන්දු කරා. ඊට අමතරව පොඩි පොඩි මුදලක් නගර සභාවෙන් දරන්න වේවි. අපට තියෙනවා මේක ලෙවල් කරන්න. පස් සැපයීම කරන්න. වෝටරින් කිරීම සඳහා දළ වශෙයෙන් ඇස්තමේන්තු හදන්න තියෙනවා. අද ඉදිරිපත් කරනවා ඒක. රු:3,880,000/- ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. එය නගර සභාවෙන් දරන්න වෙනවා. අපි ලග සල්ලි තියෙනවා. ඒ නිසා මන්ත්‍රීතුමා අපි ඒ වැඩෙත් කරමු. නගරය එකම අන්‍යාගමිකයෙක්වත් නැති නගරය ලෙස සලකනවා නම් බෞද්ධ කටයුතු වෙනුවෙන් මෙම මුදල වැය කිරීමට සභාවේ සියලු දෙනාගේම අනුමැතිය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්

ගරු සභාපතිතුමනි, මම හිතන විදිහට ගරු මන්ත්‍රීතුමා අදහස් දැක්වූවා රුපියල් ලක්ෂයක් වැනි මුදලක් ක්‍රීඩාංගනය සඳහා යොදවනවා නම් හොදයි කියලා ප්‍රතිපාදන. අපි බෞද්ධයො වශයෙන් යුතුකම හා වගකීමත් තමයි අම්බලන්ගොඩ නගරයේ යම්කිසි බෞද්ධ කටයුත්තකට සහයෝගය දීමට හැකියාවක් තියෙයවා නම් උපරිම සහෙයෝගය දීම. පන්සල්, දහම් පාසල් වෙනුවෙන් ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලනවා.

ගරු උප සභාපතිකමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, දීර්ඝ කාලයක සිට පවත්වා ගෙන ආ කටයුත්තක් . 1997 අපි පත්වෙලා ඇවිල්ලා ඒ දවස්වල හිටියෙ චන්දිම හාමුදුරුවෝ. උන් වහන්සේ අපවත් වෙලා. උන් වහන්සේ තමයි අම්බලන්ගොඩ නගර සභාවට මේක ගෙනාවෙ. ඒ අනුව තමයි පවත්වා ගෙන ආවෙ. මං හිතන විදිහට තරුණ බෞද්ධ සමිතිය මේක ඉටු කරන්නෙ නෑ. අපේ යුතුකමක් තියෙනවා බෞද්ධ නගරයක් වශයෙන් තියෙන මෙම නගරය රැක ගැනීම. ඒ නිසා මේක හොද වැඩ සටහනක්. දහම් පාසලේ තෑගි බෙදා දීමට ළමයි දෙසැම්බර් මාසයේදී ගමේම ගිහිල්ලා කොටු ගහලා සල්ලි එකතු කරලා තමයි කරන්නෙ. ආසනේම තියෙන වැඩසටහනක් කරන්න පන්සලෙ හාමුදුරුවන්ට එච්චර හැකියාවක් නෑ. ඒ නිසා මේක පවත්වා ගෙන යන ආකාරයට අප නගර සභාවෙන් කර ගෙන යාම හොදයි කියලා හිතනවා. ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, ශාසනාරක්ෂක බල මණ්ඩලය තරුණ බෞද්ධ සමිතිය දෙකක් කියලා හිතාගෙන කථා කරා නෙවෙයි. මම කිව්වෙපොසොන් පෝයට එකතු වෙලා වැඩ කරා. පිට්ටනිය හදන්න සල්ලි තියෙනවා නම් අකමැත්තක්වත් විරෝධත්වයක්වත් නෑ. මම කියන්නෙ හැම රුපියලක්ම එකතු කරලා පිට්ටනිය හදන්න ඕන කියන එක. ඒක ප්‍රමුඛතාවය. නගර සභාවට සල්ලි තියෙනවා නම් ලක්ෂයක් නෙවෙයි ලක්ෂ පහක් දුන්නත් අපට ගැටළුවක් නෑ.

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්

ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමා ඉල්ලීමක් කලේ පිට්ටනිය අත්‍යාවශ්‍යකරුණක් නිසා තමයි. අම්බලන්ගොඩ බෞද්ධ පුරවරයක්. බෞද්ධාගමට මුල් තැන දෙන්න ඕන. විශේෂයන්ම දහම් පාසල් දරු දැරියන් අපේ දරුවන්ගේ ත්‍යාග ප්‍රධානෝත්සවයට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. විපක්ෂ නායකතුමා කිව්වෙ පිට්ටනිය තදබල අවශ්‍යතාවයක් වෙලා තියෙනවා. හැමෝම අහන්නෙ පිට්ටනිය හදලා ඉවර කරන්නෙ කවදද කියලා. අපට සල්ලි නැහැයි කියන අදහසින් තමයි කියන්න ඇත්තෙ. නගර සභාවට පිට්ටනිය කරන්න පුළුවන් නම් මේ උත්සවයත් අපි සාර්ථක අන්දමින් කරමු. අපි සියලු දෙනාගේම සහයෝගය කැමැත්ත ප්‍රකාශ කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාකතා කරමින්

සභාපතිතුමාගේ කැපවීම මත ඇමතිතුමා මුණ ගැහිලා කතා කල නිසා පිට්ටනිය විසඳුම ජේන තෙක් මානෙතියෙන නිසා මමත් ඒකට කැමැත්ත ප්‍රකාශ කරනවා. ශාසනාරක්ෂක බල මණ්ඩල ත්‍යාග ප්‍රධානෝත්සවයට සහයෝගය දෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්

සභාපතිතුමනි, විපක්ෂනායකතුමා පසුගිය කාලය තුළ දන්නෙ නැතිව ඇති නින්දානේ චන්දිම හාමුදුරුවො තමයි මුල් උනෙ. ඊට පස්සේ තමයි සුනන්ද හාමුදුරුවො මූලිකත්වය ගෙන කටයුතු කලේ. අපි අනුමැතිය දීලා අයවැයටත් ඇතුලත් කරලා ඒක කර ගෙන ගියා. අපේ දරු දැරියන්ට හොඳයි ඇගයීමක් කරලා ත්‍යාග ලබා දෙන එක ඔවුන්ගේ අනාගතයට හොඳයි. එතුමා වරදකට නෙවෙයි කිව්වෙ. අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය ගැන තමයි හැම තැනම කථා කරන්නෙ. මං හිතන්නෙ ලක්ෂ සීයක් ද කොහේ ස්ථිර තැන්පතු දාලා තියෙනවා නගර සභාව.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි ලග සල්ලි තියෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්

ඔව්ඒකනිසාමේකකරන්නපුළුවන්.කිසිගැටළුවක්නෑ. අපි සහයෝගය දෙනවා. ඔබතුමා ඒ ගැන සොයා බලා නීත්‍යානුකූල වන විදිහට කරන්න කියලා ඉල්ලා සිටිනවා.

තීරණය

**අම්බලන්ගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලය විසින් පවත්වනු ලබන 2018 සිසු නිපුණතා ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා අනුග්‍රහය ලබා ගැනීම වෙනුවෙන් කරන ලද යෝජනාව පිළිගැනීම සුදුසු බවත් ඇස්තමේන්තු මුදල වන රු. 86100.00 ක මුදල සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවත් ආගමික කටයුතු කිරිම සඳහා නගර සභා ආඥාපනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව ලබාදිය හැකි බැවින් මේ සඳහා උපරිම දායකත්වයක් ලබා දිය යුතු බවත් දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ද ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන ලෙසටත් සභාව විසින් දැනුම් දෙන ලදි.**

**03:07 පළාත් පාලනය පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාව සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් සහභාගී වන මන්ත්‍රීවරුන්/ මන්ත්‍රීවරියන්ගේ නාම ලේඛණය සභාගත කරන ලදි.**

'

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සඳහා එක් අයකුට රු:30000/- ක මුදලක් ගෙවන්න අවශ්‍ය වෙනවා පළාත් පාලනය පිළිබද ශ්‍රී ලංකා ආයතනයට. ඒ සඳහා ඒ හතර දෙනා වෙනුවෙන් එක් ලක්ෂ විසි දාහක් ගෙවන්න එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මුලදි මම තීරණය කරලා තිබුණා මෙම පාඨමාලාවට සහභාගි නොවෙන්න. නමුත් මම දැන් යෝජනා කලොත් මට දැන් සහභාගි වෙන්න පුළුවන්ද? මම කැමතියි සහභාගි වෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වෙනත් මන්ත්‍රීවරුන්ටත් සහභාගිවීමට අවශ්‍යතාවයක් තියෙනවද?එසේ නම් අපේ එස්.එම්. සරත් මන්ත්‍රීතුමා සහ අනික් මන්ත්‍රීවරුන් හතර දෙනා සඳහා රුපියල් එක් ලක්ෂ පනස් දාහක මුදලක් ගෙවන්නඅනුමතිය ඉල්ලා සිටිනවා. එය මේ මාසෙ 18 වෙනිදා ආරම්භ කරන බව දන්වලා තියෙනවා.

<u>තීරණය</u>

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වනු ලබන පළාත් පාලන ආයතනවල සභිකවරුන් සඳහා වූ මූලික සහතික පත්‍ර පාඨමාලාව - 2018 සඳහා ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රිනි ඉන්ද්‍රා අයිරාංගනී මිය , ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී. රුවනි පේෂලා මිය , ගරු නගර සභා මන්ත්‍රිනී හිනිදුමගේ ඉනෝකා ක්‍රිෂාන්ති මිය සහ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා යන මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා සහභාගි විම සඳහා එක් අයෙකු වෙනුවෙන් රු.30000.00 බැගින් රු.150000.00 ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොවූ බැවින් සභාව් ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**03:08** ‘තුඩුවමුල්ල පාර අලුත් වැඩියා කර ගැනීම ’ යනමැයෙන් එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායකප්‍රාදේශීය සංවර්ධන කමිටු සමසභාපති ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදි.

. 2018 වසර සඳහා ගරු මහාමාර්ග අමාත්‍ය කබීර් හෂීම් මැතිතුමාගෙන් මා වෙත කිලෝ මීටර් 20 ක් කාපට් ඇතිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, එම යෝජනා අතර මහ අම්බලන්ගොඩ සමුපකාර හන්දියේ සිට දෙල්දූව පාලම දක්වා කාපට් ඇතිරීමට යෝජනා කර ඇති බවත්, තුඩුවමුල්ල ලී මඩුව ආසන්නයේ සිට මාර්ගයේ වතුර බැසීමට නොහැකි අයුරින් සහ මාර්ගයෙන්ද කොටසක් අසු වන සේ තාප්ප බැද ඇති බවත්, මේ නිසා වතුර බැස යාමට නොහැකි වී ඇති බැවින් ජලය පිරීම නිසා මාර්ගය කඩිනමින් අබලක් වන බවත් , මේ තත්වය සලකා මාර්ගයේ ජලය බැස යාමට හැකිවන සේක්‍රමවේදයක් නිවෙස්හිමියන් හා සාකච්ඡා කර විසදීමට පියවර ගන්නා මෙන් ඉල්ලා තිබුණි. කාපට් ඇතිරීමට යෝජිත මාර්ග ලේඛණය ද ඉදිරිපත් කර ඇත.

| කාපට් ඇතිරීමට යෝජිත මාර්ගය | දුර |
|---|---|
| ගාලු පාරේ දොළොස්මහ ලග සිට මහා අම්බලන්ගොඩ පාර දූව බේකරිය අසල දක්වා | කි.මී. 1.5 |
| මහා අම්බලන්ගොඩ සමූපකාර හන්දියේ සිට දෙල්දූව පාලම දක්වා(දෙල්දූව ආරණ්‍යය සේනාසකයට යාමට ඇති අපහසුව නිසා) | මී.900 |
| ඉලුක්පිටිය මානම්ගොඩ මාර්ගය | කි.මී.4 |
| කැටන්තොට පන්සල අසල සිට පනියන්දූව මාර්ගය ප්‍රජාපතී විදයාලය අසල විලේගොඩ මාර්ගයට සම්බන්ධ කිරීම | මී.900 |
| තල්ගස්ගොඩ ඩිපෝ හන්දියේ සිට රවුම් පාර වෙද මහතාගේ නිවස අසල දක්වා | කි.මී.2 |
| කොබෙයිතුඩුවේ සිට බටදූව ගල්පොත්තාවෙල දක්වා මාර්ගය | කි.මී.2 |
| සංඝරාජ මාවත දුම්රිය හරස් පාර පසුකර පීරිස් වෙද මාවත පෝරඹ පුස්තකාලය අසලින් පොල්වත්ත මාර්ගයට සම්බන්ධ කිරීම | කි.මී.1 |
| ආර්.ඊ. ද සිල්වා මාවත | මී.800 |
| තිලකපුර මාර්ගය් දලුක්කන්ද පන්සල පාරේ අවසානය දක්වා | කි.මී.1 |
| කරුවලබැද්ද විහාරය ලගින් ආරම්භ වී අමරවංශ මාවත කිරිදිඇලට වැටෙන මාර්ගය | කි.මී.1 |
| කෝන්ගහගොඩ හරහා කලුවගහජනපද ආදාහනාගාර මාර්ගය - මාජුවාන මාර්ගයට සම්බන්ධ වීම සඳහා | කි.මී.1.8 |
| තිලකපුර ලිවිස්ටන්වත්ත මාර්ගය | කි.මී.1 |
| පනියන්දූව එඬේරමුල්ල මාර්ගය - මහා අම්බලන්ගොඩ මාර්ගයට සම්බන්ධ කිරීම | මී. 400 |
| ඔලබැද්ද පළමු හරස් මාර්ගය පැති කාණු දමා කාපට් ඇතිරීම | කි.මී.1 |
| තොරණගලවත්ත මාර්ගය | කි.මී.1 |
| ලක්සරු මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය | මී. 800 |

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එම පාරවල් ටික කාපට් කිරීමට එතුමා ඉල්ලා සිටිනවා. ඒ සඳහා සභාවෙ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම ඩෙනට් පන්යන්දූවගේ මැතිතුමාට මේ සම්බන්ධයෙන් මාගේ ස්තුතිය පල කරන්න ඕන. එහෙම දෙයක් කිරීමට මැදිහත්වීම පිළිබදව. මොකද තුඩුවමුල්ල දෙල්දූව දක්වා යන පාරේ මටත් ලිපියක් එවා තිබුණා ඔබතුමන්ලාටත් පිටපත් සහිතව. ඒ පාරේ යන්න බෑ. ෙෙත් මන්ත්‍රීවිතාන මහතාගේ අභාවය වෙලේ ඔබතුමාම ඇවිල්ලා ඇහුවා. අපි අර වැස්සෙ නිලානි මන්ත්‍රීතුමියත් ඇවිල්ලා ඔබතුමා එවපු ගල් දාලා තලලා ABC දාලා ඒ ටික කරා. පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඔය ලී මඩුවෙ තාප්පෙ බැදපු තැනින් වතුර බහින්නෙ නෑ. එදා වතුර බස්සන්න බැරි වුනා. මිනිස්සු ආරවුලට ආවහම මම පැත්තකට වෙනවා කිව්වා. නිලානි මන්ත්‍රීතුමිය මේකට මැදිහත් වෙන්න කියලා. මොකද ඒ කියන වචන අහන්න බැරි නිසා. ඒ පාර බැකෝ එකෙන් අයිනෙන් . මල ගෙදර තියෙන ගෙදරට ඉස්සරහ ගෙදරට ඉස්සරහ ගෙදර මනුස්සයා ඔක්කෝම වත්තෙ කුණු පිහදාලා දාලා තිබුණා. නිලානි මන්ත්‍රීතුමියත් මාත් වැස්සේම කල්පනා කරන කොට කිව්වා පෝර උර 2 ක් 3 ක් තියෙනවා අපට ඇදලා දාන්න. නිලානි මන්ත්‍රීතුමිය උර ගෙනාවා. මම කිව්වා මම කාගෙවත් කුණු අදින්න ලැස්ති නෑ කියලා. මම කලේ ඒ කුණු ටික බැකෝ එකෙන් උස්සලා ඒ වත්තටම දැම්මා.

වෙන කරන්න විකල්පයක් තිබුණෙ නෑ. මම නම කියන්න කැමති නෑ. එතනින් වතුර බස්සන්න බෑ. අයිනෙන් කපා ගෙන එනවිට කියනවා මෙ පර්චස් එක මගේ මෙතනින් බෑ කියලා. මම කිව්වා එහෙනම් වතුර ටික අපි දෙන්නා බොන්නද. එහෙනම් ඔයා නිසා දෙන්නම් කියලා යන්තම් කපලා වතුර දැම්මා. එතනින් එහාට ආපහු වතුර. බැකෝ එකෙන් සුද්ධ කරලා දැම්මෙගගේ තොටුපලට. ඩෙනට් පනියන්දුවගේ මන්ත්‍රීතුමා කියන ඔය තාප්පේ ලග. . නිලානි මන්ත්‍රීතුමියගේ ඇගටත් ආවා බොහොම සැරට වචන කියාගෙන. මම සාමකාමීව නිවලා කිව්වා මෙතන රංඩු වෙන්න නෙවෙයි ආවෙ. ඉඩෙමෙන් බස්සන්න දෙන්න කිව්වහම අපේ ඉඩම්වලින් උඹලට බස්සන්න දෙන්නෙකොහොමද. ඔය වගේලොකු දෝෂාරෝපණ ආවා. ඒ තාප්පෙට මොනවා හරි කරන්නෙ නැතිව කඩන්නෙ නැතිව ඔය පාර හදන්න බෑ. අනවසර ඔය තාප්ප තියාගෙන ඔය පාර හදලා වැඩක් නෑ මන්ත්‍රීතුමා කොච්චර ප්‍රතිපාදන ආවත්. එහෙම නැත්නම් හදන්නෙ නැතිව ඔහොම තියන්න. මිනිස්සු අපේ අම්මා මතක් කරලා බැන බැන ගියත් කරන්න දෙයක් නෑ. හදන්න නම් නගර සභාවෙන් ඔය කියන අනවසර තාප්ප ටික කඩන්න කියන්න. දැන් ඒ තාප්ප කඩන්න බෑ කියනවා නම් ඒ වතුර කොහේටද බස්සන්නෙ. එතනින් බස්සන්න හදන කොට කිව්වා ඒ මිනිස්සු ත්‍රී ජේස් කරන්ට් එක අරන් පොලව යටින් ප්ලේට් එකක් දාලා කරන්ට් එක එනවා කිව්වා. ඒ කියලා බැන බැන ඉන්දෙද්දි තමයි කාන්තාවොදෙන්නෙක් වෙලා අපි දෙන්නා ගිහින් යන්තම් වතුර බැස්සුවෙ. මම අත්දැකීමෙන්ම දැකලා තියෙනවා. ඒ ලීමඩුවෙ කට්ටියගෙ තාප්පෙ අනිවාර්යෙන්ම මොකක් හරි කරන්න ඕන. දිගටම තාප්ප අනවසර. වෙනදා වතුර ස්වභාවිකව ගලාගෙන ගියානෙ. එතකොට ඔය ප්‍රශ්න නෑ. එක්කො ලියුම් යවන්න ඕන පාර හදන විට ඔයගොල්ලන්ගෙ තාප්පෙ අයින්වලින් වතුර බස්සන්න කොනක් දෙන්න කියලා. තොටුපලේ නාන අයට ඇදුම් මාරු කර ගන්න ස්ථානයක් තිබුණා. ඒ ස්ථානයේ දැන් වැටක් ඉදි වෙලා. දැන් නාන තොටුපලක් නෑ. පොඩි කැල්ලක් තියෙන්නෙ. ඉස්සර නාන තොටුපල අපේ නගර සභාවෙගේට්ටුව ලග ඉදන් ගාලු පාර දක්වා වගේලොකු පරාසයක් තිබුනා. දැන් ඒක නැති වෙලා ගිහිල්ලා. ඒ නිසා සභාපතිතුමා මම ඉතා ඕනෑ කමින් කියනවා අනවසර තාප්ප ඉදිකල අයට මොකක් හරි පියවරක් අරන්, මෙතුමාගෙ ප්‍රතිපාදන අරන් හරියට කරන්න කියලා ඉල්ලා සිටිනවා. අනවසර තාප්ප කඩන්න බෑ කියලා හිටියොත් වතුර බස්සන්න විදිහක් නෑ. අපේ ගම හදන්න ගමේ ඉපදිච්චපුද්ගලයෙක් විදිහට ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා ගන්න වෙර වෑයම ගැන ස්තුතිය පල කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ජනතාවට මෙහෙ කිරීමේ අවංක අවශ්‍යතාවයක් ඇති අපේ පනියන්දුවගේ විපක්ෂ නායකතුමා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරයා හැටියට මම නියොජනය කරනු ලබන පක්ෂයේ ආසන සංවිධායකවරයා හැටියට ඉතාම නිවැරදි සංවර්ධන යොජනාවක් මල්පල ගත් මේ අවස්ථාවෙ අපේ සුපැතුම් මල්මිට එතුමාට පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. විපක්ෂ නායකතුමා සම්බන්ධීකරණ කමිටුව පවත්වන්නෙ ඉතාම සක්‍රීය සාධනීය ලක්ෂණ ඇතිව. සැබෑවටම උවමනාව තියෙනවා ජනතාවට සේවය කිරීමට. ඒ නාමාවලිය ඉදිරිපත් කල මාර්ග ලේඛණය අපි දකිනවා ඒ වගේම අපේ පළාත් නායකතුමාටත් මගහැරුනා පොල්වත්ත වතුගෙදර අධිවේගී පිවිසුමට පිවිසෙන මාර්ගය කාපට් ඇතිරීම. යෙදුවෙ අපේ ධනසේන මැතිතුමාගේ මායිමට විතරයි. පොල්වත්ත ග්‍රාමීය මාර්ගයට විතරයි ඔබතුමාට හැකියාවක් තියෙනවානම් සොයා බලන්න සියලුම දෙනා භාවිතා කරන මෙම මාර්ගයේ ඇයිද කියලා මෙම වෙනස්කම කලේ. මට ඒ කාලෙත් හිතාගන්න බැරි වුනා. ඔබතුමාට පුළුවන්නම් අන්න ඒ කොටහත් දාලා දෙන්න සංවර්ධන යෝජනාවක් විදිහට. ඒ පාරම්බෑමක් නෙවෙයි. මොකද මට තේරෙනවා මෙතුමාගේ අපේ අදහස් සමපාත වන බොහෝ අවස්ථා තියෙනවා. ඒ නිසයි කිව්වේ. පුරසාරමක් නෙවෙයි. එතුමාට තුතිමල් එක්කරමින් නවතිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා මේකෙ අඩි 10 ක් නැත්නම් කාපට් අතුරන්න බැරිවෙනවා. සමහර අය හිතයි පනියන්දුව වටේ දාලයි කියලා. මොකද කාපට් මැෂින් එනකොට පොඩි පොඩි කැලි ගහන්න බෑ. මං ඉපදුන ගම. නියෝජනය කරන ගම. මමදේශපාලනය කරන ගම. මම ඒ නිසා මහ අම්බලන්ගොඩ ඉදලා විලේගොඩට වෙනකම් සම්පූර්ණ කාපට් කරන්නත් , එතනින් දෙල්දූව ආරණ්‍ය පාරත්, එතනින් එඬෙරමුල්ල හරස් පාරත් කියන්නෙ මැෂින් එක එක රවුමෙ කැරකෙන්නෙ. අනික් ටික තල්ගස්ගොඩ ගොඩහේන ඔක්කෝම කිලෝ මීටර් 2ක් පමණ. හතරක් දැම්මෙ පන්සලෙට යන්න ප්‍රධාන පාර. ගොඩහේන ඉතාම අබලන් පාර කිලෝ මීටර් 2 යි. ඒ වගේ කි.මී. 20 අනික් පැත්තෙන් කි.මී. 4 ඒ වගේලොකු දුරවල් දැම්මෙ.මීටර් 600 මීටර් 700 කැලි දාන්න කොන්ත්‍රාත් කරන අයවත් ඒ මැෂින් දාන්න එහෙට මෙහෙට දාන්න ගන්නෙ නෑ. ඒ නිසා තමයි රවුම දැම්මෙ. ඔබතුමා කිව්ව විදිහට

හදන්න ඕන පාරක් පොල්වත්ත හන්දියේ සිට වතුගෙදර දක්වා. මට මේ පාර ගම්පෙරළිය යටතේ සල්ලි ඉතිරි වුනොත් අනිවාර්යෙන්ම කාපට් අතුරන්න දාන්නම් අඩි 10 ට. එකම දේ පහසුකම අවශ්‍යවෙනවා සභාපතිතුමා. අඩි 8 නම් ඒ කැල්ල වැටෙන්නෙ නෑ. අඩි 10 ක් අවශ්‍යයි කාපට් එක. මේක දෙන කොට එතුමා මට කිව්වා මේ ප්‍රමාණය නැත්නම් ඒ ගොල්ලො ඒක කරන්නෙ නෑ. මැෂින් පොඩි පොඩි කැලිවලට දාන්න එපා එකලග දා ගන්න. එතකොට ඉවර කරන්න ලේසියි කියලා. ඒ නිසා මේවෙලාවෙ කියන්න ඕන ගරු මහඇමතිතුමාටත් සංවර්ධන කමිටු සභාපතිවරු විදිහට මටත් මැතිවරණ කොට්ඨාශයේ දියුණුව වෙනුවෙන් කෝටි 25 ක විතර මුදල් වෙන් වෙලා තියෙනවා. මං මේ වනවිට කෝටි 40 ක විතර සංවර්ධන යෝජනාක්‍රම දීලා තියෙනවා. ඊට අමතරව තමයි මම කෝටි 20 ක් වෙන් කරන් තියෙන්නෙ කාපට් සදහා. ඊට අමතරව 25 ට අමතරව තව 20 ක් වෙන් කරලා තියෙනවා. සල්ලි ගොඩක් ලැබුණු වෙලාවෙප්‍රාදේශීය ලේකම්වරුන්ටත් කිව්වෙ නගර සභවෙ, ප්‍රාදේශිය සභා අපි හදන්න තියෙන විශේෂයෙන් පාරවල් මූලික දේවල් මේවෙලාවෙ හදා ගන්න. සභාවලට සල්ලි අපි හිතන තරම් නැති නිසා උපරිමය මැතිවරණ කොට්ඨාශයට ලැබෙන මුදල් ශත පහක්වත් ආපස්සට යවන්න බෑ. ඒ නිසා මගේ 25 ට 40 ක් දීලා තියෙනවා. මහ ඇමතිතුමා දීලා තියෙනවා. නිලානි මන්ත්‍රීතුමිය මමත් උත්සාහ කරනවා මානාන පිට්ටනිය ලක්ෂ 200 ක්වත් වෙන්කර ගෙන අපි අංග සම්පූර්ණ පැවිලියන් එකක් හදන්න. මෙම මුදල් ප්‍රතිපාදන තුළ අපට දීලා තියෙන චක්‍රලේඛයෙන් පිට යන්න බෑ. පාසල් සදහා වැසිකිලි, පොදු පහසුකම් , පාරවල්, සති පොලවල්, මම මාකට් එකට මුදල් ඉල්ලුවා සම්පූර්ණයෙන් හදන්න. ප්ලෑන් එකත් හදලා තියෙන්නෙ. මම සංවර්ධන කමිටුවේදි ඉල්ලුවා ප්ලෑන් එක. නාගරික සංවර්ධන අධිකාරියෙන් ආපු නිලධාරියෙක් හදලා තියෙන්නෙ. මටත් කොපියක් ලැබෙන්න සලස්වන්න කියලා කිව්වා. එහෙම උනොත් මෙම ප්‍රතිපාදන තුළ ඒක හදාගන්න පුළුවන් වෙනවා. මම ප්‍රාදේශීය ලේකම්වරුදෙන්නටම කිව්වෙත් මෙතන අපි දේශපාලනය ගැන නෙවෙයි කථා කරන්නෙ. සංවර්ධනයට ආපු මුදල් ශත 5 ක් අම්බලන්ගොඩ කොට්ඨාශයෙන් නැවත හරවා නොයන්න ඔබතුමන්ලා වැඩ කරන්න. ඒ සහයෝගය අපි අනිවාර්යෙන්ම දෙනවා. මම දිසාපතිතුමාට මේ පිළිබදව අම්බලන්ගොඩ ගෝනාපිනුවල සහ බද්දෙගම වෙනම ලිපිගොනු 3 ක්සංවර්ධන යෝජනාක්‍රම සමග ඇස්තමේන්තුත් හදලා භාර දීලා ඉවරයි. ඉදිරියේදී සාකච්ඡාවක් තියේවි. දැනට යෝජනා හදලා ඉවරයි. අපිට ප්‍රතිපාදන තිබුනොත් පොල්වත්ත හන්දියේ සිට වතුගෙදරට යන පාර දිසාපතිතුමාට වෙනම ඉල්ලන්නම්. එතුමා ඉතා පැහැදුනා මගේ ලිපිගොනු ගැන. ඒ නිසා මුදල් ඉතිරි උනොත් මේ මුදල් කවුරුත් යවන්න උත්සාහ කරන්නෙ නෑ

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ඇත්තටම ස්තූතිවන්ත වෙනවා.අපේ ගමත් කාපට් වෙනවා.කලින් පාලන කාලයට මාර්ගය කාපට් කර ගන්න බැරි වුනා. සංවිධායකතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. පුළුවන්නම් ඉල්ලීමක් කර පන්සල පිටුපස වතුරබට ලයින් එක දිරලා තියෙන්නෙ. අවුරුදු 25 කට 30 කට පෙර දාපු එකක් තියෙන්නෙ. මාස දෙක තුනකට සැරයක් කැඩෙනවා. ජල සම්පාදනයෙන් ඉල්ලීමක් කරලා බට ලයින් එක දාලම කාපට් කරන්න පුළුවන් නම් වඩා හොදයි. පනියන්දුව අපාය ලග සිට බෝක්කුව ලගට වෙනකම් ඉස්සරම දාපුබට ලයින් එකක් තියෙන්නෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

අපි ඉල්ලීමක් කරමු. ලේකම්තුමිය ඕක ඊලග සංවර්ධන කමිටුවට දාන්න. එතකොට ජාතික ජල සම්පාදන මණ්ඩලයට දෙන්නම් අලුත්වැඩියා කරන්න කියලා. පාරවල් හදන්න ගිහිල්ලා නැත්නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා. කාපට් එක දාලා කඩන්න උනොත් වැඩක් නෑ. නගර සභාවෙන් නඩත්තු කරන්න විශාල මුදලක් දරන්න වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, විපක්ෂනායකතුමනි, අපි ජලසම්පාදන මණ්ඩලයට අපි යවමු මෙන්න මේ පාරවල් කාපට් කරන්න යනවා මේවායේ තියෙන අබලන්වෙච්ච ජලනල රීප්ලේස් කරන්න කියලා. එතකොට ඒ ගොල්ලන්ට ඒක කරන්න පුළුවන්. එතකොට නගර සභාවට පොඩි ආදායමකුත් ලැබෙනවා. රෝඩ් ඩැමේජ් එකට සල්ලි අරගෙන. ඩැමේජ් එකටත් ඒ අය වෙනවා. කාපට් එකත් කර ගෙන නගර සභාවට ආදායමක් කර ගන්නත් පුළුවන් ඒක. විපක්ෂනායක තුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම

කළුවඩුමුල්ල ශ්‍රී විජයාරාම පන්සලට ලොකු බස් එනවා පන්සල බලන්න. පන්සලට එන පොඩි කැල්ලත් කාපට් කර ගන්න පුළුවන් නම් ලොකු වාසියක් වේවි අම්බලන්ගොඩට.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්**

කොඩිකාර මන්ත්‍රීතුමා ඒකත් දාලා තියෙන්නෙ ලැයිස්තුවට. අපේ කොට්ඨාශයට අපට වෙන් වෙච්ච මුදල්වලට ශ්‍රී විජයාරාමය, ධීරක්කන්ධ මාවත, කොඩිකාර පෙදෙස බාර දාලා තියෙන්නෙ. ගම්පෙරලිය යටතේකෝටි 25 ට දාලා තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

ගම්පෙරලිය එකට කෝටි 25 ට දාලා තියෙන්නෙ. මං ගාව දැන් නෑ. ඒකෙ පිටපතක් නගර සභාවට එවන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතාකතා කරමින්**

ගරු සභාපතිතුමනි, විපක්ෂනායකතුමාට මගේගෞරවපූර්ව ස්තූතිය පුද කරනවා. හෙප්පුමුල්ල ප්‍රදේශයේ ආර්.ඊ. ද සිල්වා මාවත කාපට් කරන්න ඉල්ලා තියෙනවා. ආර්. ඊ. ද සිල්වා මාවත හරහා බෝක්කු 4 ක් විතර තියෙනවා ඒවයේ තත්වය සොයා බලා අලුත්වැඩියා කරන්න තියෙනවානම් කරලා කාපට් කිරීම හොදයි. පන්සල පල්ලෙහා තියෙන බෝක්කුවෙන් අම්බලන්ගොඩ මේ ප්‍රදේශයේ සිට ගලා බසින ලොකු බටයක් තියෙනවා. බටේ හිරවෙලා තියෙන නිසා වතුර උතුරලා පාරට වතුර එනවා. ඒ බටේ ගලවලා වෙනත් විදිහකට ගහලා තමයි ඒ කටයුත්ත කරන්න වෙන්නෙ. ඒක ඔබතුමාගෙ අධීක්ෂණයට පත් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක තියෙන්නෙ නගර සභාව යටෙතෙද? PRD එකටද?

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

ඒක අපට ටිකක් බලන්න වෙනවා. PRD එකට නම් අපට ටිකක් කියලා කරන්න පුළුවන්. එතකොට අපට ටෙලිකොම් හා විදුලි රැහැන් එහාට මෙහාට කර ගන්න එක කර ගන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. මේවගේ ගැටළු අපි නිරාකරණය කරගත්තොත් හරියට කාපට් එක දැම්මොත් අපට ආයි අවුරුදු ගානකට ඒකට අත තියන්න ඕන නෑ. සභාපතිතුමා අපි ඒක බලලා කරගමු.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපේ විපක්ෂනායකතුමා ලබාදෙන ප්‍රතිපාදන වෙනුවෙන් සියලු දෙනා අදහස් දැක්වූවා. මේක්‍රියාදාමය යහපාලන රජය තුළින් ලැබුණු ප්‍රතිපාදන. ඒක පළමුවෙන්ම කියන්න ඕන. ප්‍රධාන අමාත්‍යතුමාගේ අම්බලන්ගොඩ ආසනයේ සංවිධායක වශයෙන් එතුමත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකතුමා වශයෙන් එතුමත් , එක්සත් ජාතික පක්ෂ සංවිධායක වශයෙන් කටයුතු කරන ඩෙනට් මහතාත් එක්ක එකතු වෙලා කථාබහ කරලා රජය මගින් ලැබුණු පතිපාදන තමයි ඔය වෙන් කරලා තියෙන්නෙ. අම්බලන්ගොඩ නගරයට ප්‍රමුඛස්ථානයක් දීලා කටයුතු කිරීම සම්බන්ධයෙන් අපි රජයට ස්තුති කරන්න ඕන. පසුගිය කාලෙනොකෙරුනු වැඩ දැන් කෙරෙන කොට අපට හරි සංතෝෂයි. දෙල්දූව පාර ගැන ලක්ෂ්මී මන්ත්‍රීතුමිය ප්‍රකාශ කරා . වැඩක් කරන කොට එන බාධක අපි ගනන් ගන්න ඕන නෑ. පැමිනෙන බාධක වෙස්වලා ගත් ආශිර්වාද කියලා ඒ දේ ඉෂ්ට කිරීම ෙෙ වගකීමක්. ඔබතුමා සහ අප මන්ත්‍රීවරු නිරීක්ෂණ චාරිකාවක යෙදෙනවා නම් අනවසර තාප්ප බලා ගන්න පුළුවන්. දෙල්දූව ආරණ්‍ය කඨින පිංකම පටන් ගන්නවා. ඊට ඉස්සෙල්ලා සේවයක් කල යුතුයි. පාරෙ තියෙන විදුලි කණු කාපට් කරන්න ඉසෙෙප්ලෙෙෙ ඉවත් කරලා ඒ කටයුත්ත ඉෂ්ට කරන්න ක්‍රියාත්මක වෙන්න කියලා ඉල්ලීම කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමා මහාඅම්බලන්ගොඩ පාර කාපට් කරන විට මගේගේ ඉස්සරහා තියෙන ප්‍රශ්නෙත් විසදලා කාපට් කරන්න. මගේ වත්තට තමයි අවුරුදු ගානක් තිස්සෙ මුලු මහ අම්බලන්ගොඩ තියෙන කුණු එන්නෙ. වහින කාලෙට එලියෙ අඩිය තියන්න බෑ. කාණු පද්ධතිය හදලා කාපට් කරන්නෙ නැත්නම් වැඩක් නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒකෙ ඇස්තමේන්තුවත් හදලා තියෙන්නෙ. සමිතියක් පත් කරලා එවන්න.

**ගරු සභාපති ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මගේ නම සම්බන්ධයෙන් ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කතා කල නිසා මට වචනයක් කියන්න වෙනවා. එදා අපේ හිටපු බැසිල් ඇමතිතුමා මෙහි පාරවල් කාපට් කිරීම සඳහා සම්පූර්ණයෙන්ම අම්බලන්ගොඩ ආසන්නයට කි.මී. 500 ක්. ඒ කි.මී. 500 න් තමයි තල්ගස්ගොඩ පාර කාපට් කරන්න යෝජනා කරලා මහ ඇමතිතුමා කරේ.. ඒ අවස්ථාවෙදි පොල්වත්ත රෝහල නිසා තමයි පින්නදූව හන්දියට කාපට් කලේ. වතුගෙදර පාර කාපට් කරන්න විදිහක් නෑ. කි.මී. 500 වෙන් කරලා තිබුනෙ. පින්නදූව හන්දියට වෙනකම් කලේ රජයේරෝහල තියෙන නිසා. නැතිව මගේගේ තියෙනවා කියලා නෙවෙයි. ශ්‍රේෂන් මන්ත්‍රීතුමා කිව්වෙ ඒකෙෙ වැරදි මතයක් ගෙනියන්න හදන්නෙ. අපි පක්ෂ දේශපාලනය කල නිසා තමයි කෙරුවත් කරන්නෙ. මන්ත්‍රීතුමා මේ වෙලාවෙ සභාවෙ නෑ. උත්තරේ හරියට දෙන්න. ඒක පැහැදිලිවම කියන්නෙ. අනික් එක කෝටි 25 ක් දෙන විට අපේ සංවිධායකතුමාටත්, මහ ඇමතිතුමාටත් ලැබෙනවා අම්බලන්ගොඩ නගරයේ තියෙන සියලුම ගම්වලට වැඩ කරන්න. එක්සත් ජාතික පක්ෂයේ ඉන්නෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්නෙත් රජය. අපට කරන්න පුළුවන් සියලු දේ අපි ගම් මට්ටමින් නගර සභාව වෙනුවෙන් මන්ත්‍රීවරු විදිහට සම්පූර්ණයෙන්ම කරන බව ප්‍රකාශ කරමින් නිහඩ වෙනවා.

**ගරු උප සභාපතිකමල් වැල්ලගේ මහතා කතා කරමින්**

විපක්ෂ මන්ත්‍රීතුමාට ස්තුති කරන්න කථා කලේ. තල්ගස්ගොඩ කි.මී.1 ක් හා ඊට අමතරවඅම්බලන්ගොඩ ගොඩහේනප්‍රදේශයට යන මාර්ගය ඉතා හොද යෝජනාවක් කි.මී. ක් කියන්නෙ. මේ අනුව කි.මී. 8.5 ක් ගොඩහේන මාර්ගයත් සමග අම්බලන්ගොඩ නගරයත් කාපට් වෙනවා. අම්බලන්ගොඩ නගර සීමාවෙ මාර්ග පද්දතියෙන් ¼ ක් පමණ කාපට් වෙනවා මේ අවස්ථාවේදී. ඇස්තමේන්තුවලට මං හිතන්නෙ ලක්ෂ 952 ක් පමණ යනවා. අඩි 10 ට කි.මී. 1 ක් කාපට් කලොත් ලක්ෂ 112 ක් පමණ යනවා. අපි විපක්ෂයෙ උනත් කුහක දේශපාලනය කථා කරන්නෙ නෑ. අපට එහෙම අවශ්‍යවෙන එකකුත් නෑ. අපි පත්වෙලා තියෙන්නෙ නගරය වෙනුවෙන් වැඩ කරන්න. නගරයේ මිනිස්සුන්ට හොද මාර්ග පද්දතියක් ලබා දෙන්නගත්ත මෙම යෝජනා ඉතාම හොද ඒවා. අපේගෞරවය හිමි වෙනවා. අපේ සහයෝගය හිමි වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, සියලු මන්ත්‍රීවරුනි, විපක්ෂ නායක එක්සත් ජාතික පක්ෂ සංවිධායක ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් රජයේප්‍රතිපාදන යටතේ අම්බලන්ගොඩ නගර සහා ප්‍රදේශය තුළ පාරවල් කාපට් කිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට දක්ෂ වෙලා තියෙනවා. ඒවා ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. අපට අදාල නෑ මොන දේශපාලනයද කියන එක. කුමන පාලනයක් යටතේ උවත් අම්බලන්ගොඩ ජනතාවට සේවාවක් වෙනවා නම් අපි එතන ඉන්නෙ. අපි මන්ත්‍රීවරුන් වශයෙන් දිවුරුම් දීලා තියෙන්නෙ ජනතා සේවයට. ඒ ගෞරවය හා ස්තුතිය ඩෙනට් පනියන්දූවගේ මහතාට පුද කරනවා. තුඩුවමුල්ල පාර ගැන කතා කරන විට මේ සියලුම අනවසර ඉදි කිරීම් ගග රක්ෂිතයේ තියෙන්නෙ. පළමුවෙන්ම කළ යුත්තේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවට දැන්වීම. ඊලගට අපි කාපට් නෙවෙයි රත්තරන් වලින් හැදුවත් මාස 3 ක් ඇතුලත නැවත ගැලෙවෙනවා. මොකද water level එකේමේ පාර තියෙන්නෙ. ගගයි පාරයි එක බිම. මේ පාර අයිති භූමිය ගග. සුළු වර්ෂාවකදි උනත් ගැලවිලා යනවා. මේවා සංවර්ධනය කරනවිට නිලධාරීන්ගෙ වැඩසටහන්වලින් මම ඉගෙන ගෙන තියෙන්නෙ ඉතාම සුළු පමාණයයි. හැබැයි නිලධාරීන් විදිහට නිරන්තරයෙන් උපදෙස් ලැබෙනවා . දෙයක් කරනවා නම් එය පවතින විදිහට කරන්න ඕන. ටෙලිකොම් එකේ කණුවලින් භාගෙට භාගයක්

තියෙන්නෙ අපේ කාණුවල. වෝටර් බෝඩ් එකෙන් කොච්චර පාර කාපට් කරලා තිබුනත් කවුරුහරි වතුර ඉල්ලපු වෙලාවට පාර කඩනවා. හරියට පපුවට පිහියෙන් අනිනවා වගේ. දැන් කාලය තියෙනවා කරුණාකරලා සභාපතිතුමා නගර සභාව විදිහට වගකිවයුතු රජයේ ආයතන දැනුවත් කරන්න. කාපට් කිරීමට නියමිත පාරවල්වල හරි ජල සම්බන්ධතා ඉල්ලලා තියෙනවා නම් අඩුම වශයෙන් දැන් ජලනල එලා ගන්න පාර කඩලා. යටින් යන බට දාලා තියෙන්නෙ. වෝටර් බෝඩ් එකෙන් කරන්නෙ නැත්නම් ඉල්ලුම් කල අයට මූලික කොටස ොෙස කර ගන්න කියන්න. දැඩි අපහසුතාවයක් තියෙන නෙනෙක් ඉන්නාවා නම් කියන්න පාර කඩනවට වඩා හොඳයි පුද්ගලිකව අපි දීලා හරි ඒක කරන එක. මම නම් ඉදිරිපත් වෙනවා ඒකට යන මුදලින් යම් ප්‍රමාණයක් දෙන්න. එතරම් කැක්කුමකින් කථා කරන්නෙ. කාපට් දාපු හැටියෙ කඩනවා පාර. ඒ නිසා මේවට අනුගත වෙන්න. ටෙලිකොම්, විදුලිබල මණ්ඩලය ස්ථානගත කරන්න නියමිත තැනින් කාපට් කිරීමට කලින්. අම්බලන්ගොඩ නගරයේ ඇවිදලා බලන්න ලයිට් කණු, ටෙලිකොම් කණු කීයක් පාරෙ කාණු මැද තියෙනවද කියලා. මේකද සංවර්ධනය? මේ රාජ්‍ය ආයතන හා අපේ පාරවල් කිසිම සම්බන්ධතාවයක් නෑ.ඉදිරියටත් මෙහෙම යනවා අපහසුතාවයට පත්වෙන්නෙ ජනතාව. ඒ නිසා අපි කරන දේ හරියට කල යුතුයි. විපක්ෂ නායකතුමනි, අවධානය යොමු කරන්න තුඩුවමුල්ල ගඟ ගැන සභාපතිතුමනි, ලක්ෂ්මි මන්ත්‍රීතුමිය කිව්වා වගේ කිසිම කෙනෙක් කැමති වෙන්නෙ නෑ තමන්ගෙ වත්ත උඩින් වතුර බස්සවන්න. මගේ යෝජනාව තමයි ගඟ රක්ෂිතයෙ තියෙන සෑම ගෙදරකින්ම කාණුවක් බැගින් ඉදි කරලා වතුර බස්සවන්න. අපේ ප්‍රධාන පාරේ ප්‍රධාන කාණුවේ වතුර ඒ සෑම ගෙදරක් ලඟින්ම ගඟට කාණුවක් සම්බන්ධ කරන්න සභාපතිතුමනි, ස්වභාවිකවම ගඟත් එක්ක සෑම ඉඩමක්ම සමාන්තරව තියෙන්නෙ. කෘතීමව ගොඩ කර ගෙන ඇති ට්‍රැක්ටර් 20 ක් 30 ක් දාගෙන . මොනවා කලත් වතුරෙන් යට වෙනවා මේ සියලු දෙනා ගෙන්නලා තේරුම් කරලාදීලා මේ ව්‍යාපෘතිය යටතේ ගඟට සිය කැමැත්තෙන් වතුර බසින විදිහට පිළිසකර කර දීලා දෙන්න. අඩුම තරමින් අඩියක්වත් උස්සලා කාපට් කරන්න. තාක්ෂණ සේවා නිලධාරීන්ගෙ උපදෙස් පරිදි. ඒ ගැන මට ඒ තරම් දැණුමක් නෑ. ඒ තත්වය යටතේ කටයුතු කරන්න කියන කාරුණික ඉල්ලීම මම කරනවා. ඒ වගේම ඩෙනට් පනියන්දූවගේ මන්ත්‍රීතුමා කථා කලේ පාරවල් සම්බන්ධව. නමුත් එකම කාණුවක් සම්බන්ධවත් ප්‍රතිපාදන වෙන්උනා කියලා කථා උනේ නෑ. මං මහ ඇමතිතුමා නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දෙපලගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා ප්‍රතිපාදන වෙන් කරන විට කාණු පද්ධතිය සඳහා වෙන් කරනවා නම් එය ජනතාව වෙත කරන විශාල සේවාවක් කියලා හිතනවා. දැනට වසරකට එක කාණුවක්වත් පිළිසකර කර ගැනීමෙ වත්කමක් නැති තත්වයක් තුළ. මෙම අත්‍යාවශ්‍ය කරුණු දෙක සඳහා මුදල් ලැබෙන අවස්ථාවලදී වෙන්කර ගැනීමට කාරුණික වන ලෙස ඉල්ලමින් නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, සරත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කලේ ඉතාමත්ම හොඳ කාලෝචිත කරුණු කිහිපයක්. මේ පිළිබඳව මම විදුලි බල මණ්ඩලයටත් ජල ප්‍රවාහන මණ්ඩලයටත් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයටත්, ඔබතුමාටත් අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිටත් පිටපත් සහිතව මේ පාරවල් ලේඛණයට ඇතුලත් කරලා යවන්නම්. ජල සම්පත දෙන්න තියෙන ඒවා තියෙනවා හන්දි. හන්දියෙන් එහා පැත්තට දැම්මොත් ජල සම්බන්ධතා දෙන්න ලේසියි. සභාපතිතුමත්, සරත් මන්ත්‍රීතුමත් ඉතාම කාලෝචිත යෝජනා ඉදිරිපත් කලේ. නැත්නම් අපි වියදම් කරන සල්ලි අපතේ යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, අපගේ ඉදිරියේදී ක්‍රියාත්මක වන යහපාලන රජයේ මුදල් ලැබිලා යම් වැඩ කොටස් ක්‍රියාත්මක කරන්න යන අවස්ථාවේ ඩෙනට් මන්ත්‍රීතුමා සැලසුමක් ඉදිරිපත් කලා නගරයේ අවශ්‍යතාවයන් තුළ මාර්ග ඉතා අබලන් වී තිබෙන මොහොතක මේක නවීකරණය කිරීමට ඉදිරිපත් කිරීම සම්බන්ධව. ඉදිරියේදී කරන්න යන වැඩ පිළිවෙලේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ලක්ෂ 200 ක් පමණ ලැබෙනවා. ඒ මුදල් මහජනතාවගේ අවශ්‍යතාවයන් මත අත්‍යාවශ්‍ය දේ සඳහා වියදම් කරන්න තමයි සැලසුම් සකස් කරන්න ඕනෙ. අපිත් කැදෙව්වා ප්‍රධාන ඇමතිතුමා . එතුමාගෙත් යම් සැලසුමක් තියෙනවා ඒ මුදල් අරගෙන පලාත් පාලන ආයතනත් සහයෝගය අරගෙන කටයුතු කරන්න. කාණු පද්දතිය ගැන සරත් මන්ත්‍රීතුමා කිව්වා. ඒ ගැන අවධානය යොමු කරන්නම්. නිසි ලෙස සකස් කරන්න කටයුතු කරන්න. මේ වැඩ කරගෙන යනවිට අඩුපාඩු බොහෝ තියෙනවා. පළාත් පාලන ආයතනයක් විදිහට අපෙත් වගකීමක් තියෙනවා අඩුපාඩු නිසිලෙස සකස් කරලා කාපට් කිරීම වැනි පාරවල් නවීකරණය කරන විට කටයුතු කරන්න. මම හිතන්නෙ ණය ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරනවා. ඒ මුදල්වලිනුත් ස්වයං රැකියා , මහාපරිමාණ මධ්‍යම පරිමාණ සුළුපරිමාණ

ව්‍යාපෘති ව්‍යාපාර සඳහාත් ණය දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න. නිවාස ණය විශාල වැඩ කොටසක්. නිර්ණායකයන් තියෙනවා ඒ තුළ තමයි කටයුතු කරන්න වෙන්නෙ. ධනසේන මන්ත්‍රීතුමාට ග්‍රේෂන් මන්ත්‍රීතුමා පොඩි කථාවක් කිව්වා එතුමාගේ ගේ ගාවට වෙනකම් කාපට් කලා කියලා. අපට දීපු ප්‍රමාණයෙන් පොඩි ඉතිරියක් තිබුණා. පොල්වත්ත රජයේ රෝහලට යන්න බෑ ඒ දවස්වල. ඒ නිසා තමයි කලේ. දැන් සුසාන භූමිය බලපිටිය කොටසින් විහාරගොඩ මාවත හන්දිය දක්වාත් කෙරමිණිය තුන්මං හන්දිය දක්වාත් හැදිලා තියෙනවා. අර ටිකේ යන්න බෑ මරණයක් ගෙනියන විට වතුරෙන් අයින් වෙලා යන්න තියෙන්නෙ. ඒකත් දාන්න තියෙන්නෙ. අපේ අයිරාංගනී මන්ත්‍රීතුමියත් ඉල්ලුම් කරලා තියෙනවා. මහජනතාව වෙනුවෙන් කරන මේ සියලු දේ වෙනුවෙන් සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා පාරවල්වල නවීකරණය කටයුතු කරනවිට ඔබතුමා ගිහිල්ලා සොයා බලන්න. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් ලක්ෂ 200 ක මුදලක් එනවා. ඒ කටයුතු කරනවිට සභාපතිතුමාට අපේ මන්ත්‍රීවරුත් සහයෝගය දීලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතාමහතා කතා කරමින්</u>**

මට අවස්ථාවක් ලැබුණෙ නෑ. මම උත්සහ කරා කථා කරන්න. මන්ත්‍රීවරු ඔක්කොම වගේ කථා කරා. ඒ නිසා මම මේ අවස්ථාව ලබා ගන්නවා. මම කැමති නෑ කාලේ නාස්ති කරන්න. අපේ ධම්මික මන්ත්‍රීතුමා ඉදිරිපත් කරා ධීරක්කත්ද මාවත කාපට් කරන්න. එතකොට එතනින් ඉස්සරහ තියෙන පෝරඹ හරස් පාර යන්න බැරිම තත්වයක් තමයි තියෙන්නෙ. අඩුගානෙ තාර ටිකක්හරි දාලා දේවි කියලා තමයි ඉල්ලන්නෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක අපි හදනවා. මේ ගැන මම මතක් කරන්න ඕන ඩෙනට් මන්ත්‍රීතුමාගේ මේ ලිපිය ආවට පස්සෙ මම කල්පනා කරා මේ ලිපිය ඕන නම් මට පැත්තකට දාලා තියන්න තිබුනා. සභාවට දාලා මන්ත්‍රීවරු දැනුවත් කරලා සියලු දෙනා දැනුවත් කරන එක මගේ යුතුකමක් කියලා. මම නගර සභාවට පත්වෙලා ආවෙ 1997 දි. වෙන නගර සභාවල ඇවිදින විට ඒවයේ පාරවල් කාපට් වෙලා තිබුනෙ. අපි කල්පනා කරා අපේ පාරවල් ටික ඇයි කාපට් කර ගන්න බැරි වුනේ කියලා. මේ ඉල්ලීම අපි අවුරුදු 20 ක් තිස්සෙම අපේ ඉහළ නායකත්වයෙන් ඒ දවස්වල ඉඳලම ඉල්ලා සිටියා. නමුත් අනික් පැත්ත තමයි බලාගෙන හිටියෙ. ඒ නිසා අනෙක් පැත්තෙ හරි ඩෙනට් මන්ත්‍රීතුමා මේක කරනවා නම් ඒක අපේ සතුටක්. ඒක අපි ජනතාව දැනුවත් කරලා අපේ සහයෝගය ලබාදීම අපේ යුතුකමක් ලෙස සලකනවා. අම්බලන්ගොඩ නගර සභාවෙන් පළාත් පාලන පාරක් කාපට් කරන්න කලින් අපි නගර සභා පාරක් කාපට් කරා. ඒ මුහුදු වෙරළ පාර. ඉෆාඩ් ආයතනයේ අනුග්‍රහයෙන් ලක්ෂ 100 ක් වියදම් කරලා තමයි අපි ඒක කලේ. ඒ වෙලාවෙ මම කිව්වා අපේ පාරක් ඕන නෑ පළාත් සභාවෙ තියෙන පාරක් හරි කාපට් කරන්න කියලා. ඊට පස්සෙ බැසිල් මහත්තයාගේ වැඩපිළිවෙල යටතේ ඒ කොටස් කරා. ධනසේන මහතාගේ ගේ ගාවට කාපට් කරා. ධනසේන මහතාට කොන්ක්‍රීට් දාලා දුන්නා ගෙට යන්න. ඒ විදිහට අපි හැමතැනම වැඩ කරා. බොහෝ දුරට ඒ දවස්වල අපේ මන්ත්‍රීවරු මාර්ග බලෙන් ගිහිල්ලා කරලා තියෙන්නෙ. දැන් හදන්න තියෙන්තන කාණු තමයි. කාණු ටික හැදීමේ වගකීමත් අපි භාර ගන්නවා ඔබතුමා ඉල්ලීමක් කරලා තිබුණා තුඩුවමුල්ල පාර. සරත් මන්ත්‍රීතුමා කිව්ව දේ ඇත්ත. එක ලෙවල් එකේ තියෙන්නෙ මේ ගගත් පාරත්. එනිසා යම් ප්‍රමාණයක් උස්සන්න ඕන. ඒ ඉස්සීමේ වගකීම සභාවෙන් ලක්ෂ 30 ක් 40 ක් වියදම් කරලා උනත් අපි ඒක ඉෂ්ට කරලා දෙන්නම්. මිනිස්සු වෙනුවෙන් ඔය දේ කරන්න. ඊට පස්සෙ අපි කාණු ටික දාලා හදා ගමු. අපි වැඩේ කරමු. මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. අනික් ඉතිරි වෙලා තියෙන සල්ලිත් අපේ ප්‍රදේශය තුළ ලබා ගැනීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු තිදෙනා උත්සාහ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මේ වගේ ප්‍රසංශා මුඛයෙන් ඔබතුමන්ලා ගැනත් කථා කරන්න අවස්ථාව හදා ගන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>තීරණය</u>

**සියලුම ටෙලිකොම් විදුලි කණු නියමිත තැන්වල ස්ථාපනය කොට , ජාතික ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කොට අම්බලන්ගොඩ නගරසභා බල ප්‍රදේශයේ කාපට් කිරීමට යෝජිත මාර්ගයන් සකස් කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුව මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිගත යුතු බවත් මෙය අම්බලන්ගොඩ ප්‍රාදේශිය සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ප්‍රකාශ කල අතර මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

3:9 **“ලේ දන්දීමේ පුන්‍ය කර්මය සම්බන්ධවයි“** මැයෙන් ගම්සිරි උදාන පදනම සභාපති ගරු නාගරික මන්ත්‍රීලලිත් ධම්මික කොඩිකාර මහතා 2018.07.12 දාතමින් එවන ලද ලිපිය සභාගත කරන ලදි.

2018.08.05 වන දින අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානයදී ගම්සිරි උදාන පදනම මගින් ලේ දන්දීමේ පුන්‍ය කර්මයක් බලපිටිය මූලික රෝහලේ වෛද්‍යවරුන් හා කාර්ය මණ්ඩලය මැදිහත්වීම යටතේසිදු කිරීමට නියමිත බැවින් නගර සභාවෙ කොඩි කණු 50ක්,කොඩි 50 ක්, රෙදි කූඩාරම් 04ක්, ප්ලාස්ටික් පුටු 50 ක් නොමිලේ ලබා දෙන ලෙසද විජයාරාම පාර පිරිසිදු කර දෙන ලෙසද ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**ගම්සිරිඋදාන පදනම විසින් පවත්වනු ලබන ලේ දන්දීමේ පුන්‍යකර්මය වෙනුවෙන් කොඩිකණු 50 ක්,කොඩි 50 ක් ,රෙදි කූඩාරම් (කැනපි) 04 ක් සහ ප්ලාස්ටික් පුටු 50 ක් මුදල් අයකිරීමෙන් තොරව ලබා දීම සහ ශ්‍රී විජයාරාම පාර පිරිසිදු කිරීමටත් පාරෙහි කඩතොළු පිළිසකර කිරීමටත් යන භාණ්ඩ හා සේවා සභා අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

3:10 **“නොමිලයේ බැනර් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ඉල්ලීම”**මැයෙන් ගම්සිරි උදාන පදනමනාගරික මන්ත්‍රීලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් 2018.07.07 දාතමින් එවන ලද ලිපිය සභාගත කරන ලදි.

අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල ශ්‍රී විජයාරාම විහාරස්ථානයදී ගම්සිරි උදාන පදනමලේ දන්දීමේ පුන්‍ය කර්මයේ බැනර් කලුවඩඩුමුල්ල හන්දිය, ගාලු කොළඹ ප්‍රධාන මාර්ගයේ සිට නගර සභාවට යන පාරේ ආරම්භයේ, රොසෙත් පුද්ගලික රෝහල ඉදිරිපිට , බස් නැවතුම්පල අසල, ඕකන්ද ගමේ නොමිලේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

**ගම්සිරිඋදාන පදනම විසින් පවත්වනු ලබන ලේ දන්දීමේ පුන්‍යකර්මය වෙනුවෙන් මුදල් අයකිරීමෙන් තොරව කළුවඩුමුල්ල හන්දිය , ගාළු ,කොළඹ ප්‍රධාන මාර්ගයේ සිට නගර සභාවට යන පාරේ ආරම්භයේ, රොසෙත් රොසෙත් රෝහල ඉදිරිපිට, බස් නැවතුම්පල අසල, ඕකන්ද ගමේබැනර් ප්‍රදර්ශනය කිරීම සඳහා සභා අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**(04)** ථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**05:01** **ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**
**(නිළධාරීන් විසින් සකස්කරන ලද පරිපාලන යෝජනා) :-**

**05.01.01 <u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු ලේකම් බී.ඒ.ධම්මිකා මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනාව.</u>**

**දකුණු පළාත් සභා පෙත්සම්කාරක සභාවේ 2018.03.12 යොමුව PE/07/03/17/336 දරණ තින්දුව ප්‍රකාරව රජයේ තක්සේරුව ගෙවා ඇති එම්.ඩබ්.චන්ද්‍රලතා මිය සහ එච්.ඒ.ජයලත් මහතාටඋපලේඛණයේ විස්තර කරන පහතින් දැක්වෙන දේපළ ( සභාවේ පොදු කටයුතු සදහා දී ඇති ඉඩමක් බැවින්) එකී පෙත්සම් කාරක සභාවේ තීන්දුව ප්‍රකාරව ඔප්පුවකින් භාර දිම සදහා සභා තීරණයක් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.**

**(අ) එම්.ඩබ්.චන්ද්‍රලතා මියගේ ඉඩම**

**ඉඩම -: දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ තල්ගස්ගොඩ අංක 86 D ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලය ලත් මානක පී.ඒ. රබින් චන්ද්‍රසිරි මහතාගේ 3711 දරණ පිඹුරු පත අනුව තැලිගලකන්ද Lot 02 නැමති ඉඩම නම් වූ**

**උතුරට සහ නැගෙනහිරට - එම ඉඩමේම Lot 01 ද**

**දකුණට - නගර සභා අඩි 15ක් පළල පාර ද**

**බස්නාහිරට - එම ඉඩමේම Lot 03 දරණ ඉඩමෙන්ම මායිම් වූ පර්චස් 06.0 ක වීශාල වූ ඉඩම සහ වරිපනම් අංක 63/8 C දරණ දේපල ද වේ**

**.**

**(ආ) එච්.ඒ.ජයලත් මහතාට ලබා දී ඇති ඉඩම,**

**ඉඩම-: -: දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ තල්ගස්ගොඩ අංක 86 D ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලය ලත් මානක පී.ඒ. රබින් චන්ද්‍රසිරි මහතාගේ 3711 දරණ පිඹුරු පත අනුව තැලිගලකන්ද Lot 01 නැමති ඉඩම නම් වූ,**

**උතුරට - පිඹුරු අංක 3707 හි Lot 01 නැමති ඉඩම නම් වූ,**

**නැගෙනහිරට - මෙම ඉඩමේම Lot 04 B4 ද,**

**දකුණට - මෙම ඉඩමේම Lot 02,Lot 03 සහ නගර සභා පාර ද ,**

**බස්නාහිරට - පිඹුරු අංක 3707 හි Lot 2801 මායිම් වූ පර්චස් 1305 ක විශාල ඉඩම සහ වරිපනම් අංක 63/8දරණ දේපල ද වේ.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවටගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියේ මහතා විසින් යෝජනාකළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියගේ විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඉහත නම් ඇති එම්. ඩබ්ලිව්. චන්ද්‍රලතා මහත්මියටත්, එච්. ඒ. ජයලත් මහතාටත් පවරා දිය යුතු යැයි යෝජනා කරනවා. මුදල් ලබා දී තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා, ඒකෙ දැන් කොටස් කාරයො 4 ක් ඉන්නවා. අපි තීන්දු කරා ඒක අවසාන සභාවේදී ඒ හතර දෙනාගෙ තිබෙන මුදලින් පොදු පහසුකම් සදහා අපි කොටසක් මිලදී ගනිමු කියලා. මම ගරු සභාපතිතුමාට කියනවා දෙන්නෙක්ට එකතු වෙලා තියෙනවා. සල්ලිත් බැදලා අනෙක් දෙන්නටත් ලිඛිතව යවලා යම් කාලයක් දීලා හතර දෙනාගෙන්ම මුදල් එකතු උනාම අපට පුළුවන් සාධාරණව බලලා කටයුතු කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා, දැනට මේ බදින ලද මුදල් වෙනම ස්ථිර තුන්පතුවක තුන්පත් කරලා තියෙනවා. අවශ්‍ය වූ විටෙක පාවිච්චි කරන්න. ඉතිරි දෙදෙනාටත් දැනුම් දීලා තියෙනවා මෙකයි කියලා. මේ තක්සේරුව වලංගු වෙන්නෙ දෙසැම්බර් 31 දිනය දක්වා පමණයි. ඊට පස්සෙ වෙනස් වෙන්න ඕන. එහෙම නැත්නම් බදු ක්‍රමය යටතේ ලබා දෙන්න ඕන. ඒක තමයි පෙත්සම්කාරක සභාවෙ තීන්දුව.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ වන විට තක්සේරු මුදල් බැද ඇති චන්ද්‍රලතා මහත්මිය හා ජයලත් මහත්මයා අපි දන්නවා ඉතාම වැර වැයමෙන් ලෝකෙට ණය වෙලයි මේ සල්ලි බැන්දෙ. මේ දෙන්නා වෙනුවෙන් අපි ඉල්ලනවා . සෙසු දෙදෙනාට මම හිතන්නෙ එතරම් උනන්දුවක් නැති ගානයි. සභාපතිතුමනි, මුදල් ගෙවූ අයට මේ අයිතිය දීමට හැකියාවක් තියෙනවාද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගෙව්ව අයට අයිතිය දෙන්න තමයි මේ යෝජනා කරලා තියෙන්නෙ.

*තීරණය*

**දකුණු පළාත් සභා පෙත්සම්කාරක සභාවේ 2018/03/12 යොමුව PE/07/03/17/336 දරණ තීන්දුව ප්‍රකාරව රජයේ තක්සේරුව ගෙවා ඇති එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය සහ එච්.ඒ.ජයලත් මහතාට උපලේඛණයේ විස්තර කරන පහතින් දැක්වෙන දේපළ (සභාවේ පොදු කටයුතු සඳහා ලබා දී ඇති ඉඩමක් බැවින්) එකී පෙත්සම්කාරක සභාවේ තීන්දුව ප්‍රකාරව ඔප්පුවකින් බාරදීම සඳහා සභා තීරණයක් ගැනීම සුදුසු බවට ලේකම් බී.ඒ.ධම්මිකා මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුව මෙය පූර්වාරදර්ශයක් නොවන සේ ඉඩම් කොටස් බැහැර කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියේ මහතා සහ ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.**

**එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය,**

**ඉඩම -: දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ තල්ගස්ගොඩ අංක 86 D ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලය ලත් මානක පී.ඒ. රබින් චන්ද්‍රසිරි මහතාගේ 3711 දරණ පිඹුරු පත අනුව තැලිගලකන්ද Lot 02 නැමති ඉඩම නම් වූ**
**උතුරට සහ නැගෙනහිරට - එම ඉඩමේම Lot 01 ද**
**දකුණට - නගර සභා අඩි 15ක් පළල පාර ද**
**බස්නාහිරට - එම ඉඩමේම Lot 03 දරණ ඉඩමෙන්ම මායිම් වූ පර්චස් 06.0 ක විශාල වූ ඉඩම සහ වරිපනම් අංක 63/8 C දරණ දේපල ද වේ**

**.**

**එච්.ඒ.ජයලත් මහතාට ලබා දී ඇති ඉඩම,**

**ඉඩම-: -: දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ තල්ගස්ගොඩ අංක 86 D ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලය ලත් මානක පී.ඒ. රබින් චන්ද්‍රසිරි මහතාගේ 3711 දරණ පිඹුරු පත අනුව තැලිගලකන්ද Lot 01 නැමති ඉඩම නම් වූ,**
**උතුරට - පිඹුරු අංක 3707 හි Lot 01 නැමති ඉඩම නම් වූ,**
**නැගෙනහිරට - මෙම ඉඩමේම Lot 04 B4 ද,**
**දකුණට - මෙම ඉඩමේම Lot 02,Lot 03 සහ නගර සභා පාර ද ,**
**බස්නාහිරට - පිඹුරු අංක 3707 හි Lot 2801 මායිම් වූ පර්චස් 1305 ක විශාල ඉඩම සහ වරිපනම් අංක 63/8දරණ දේපල ද වේ.**

**05.01.02 <u>අම්බලන්ගොඩ නගර සභාවේ සංවර්ධන සහකාර පී.එච්.එල්.සී.පුෂ්පරාණි මහත්මිය විසින් කරනු ලබන යෝජනාව.</u>**

ලිපි ද්‍රව්‍ය භාවිතය අවම කිරීම හා වැයවන පිරිවැය පාලනය කිරීම.
ඵලදායීතා සංකල්පය යටතේ එන හරිත ඵලදායීතාවය යනු නාස්තිය අවම කිරීමයි. ඒ අනුව කාර්යාලයේ නාස්තිය අවම කිරීම හා නිළධාරීන්ගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරමි.
නගර සභා මන්ත්‍රී මණ්ඩලය හා නිළධාරීන් වෙත ලබා දෙන සභා වාර්තා / කමිටු වාර්තා හා ලිපි වෙනුවට විද්‍යුත් තැපැල භාවිතයෙන් විද්‍යුත් ලිපිනයන් වෙත එම තොරතුරු ප්‍රේෂණය කිරීම.

මෙමගින් ලැබෙන වාසි.

1. කඩදාසි හා ඡායා පිටපත් කිරීම සඳහා වැයවන පිරිවැය අවම වීම.
2. කාර්ය මණ්ඩලයේ සේවාවන් පහසු වීම හා අඩු වීම. ( ඡායා පිටපත් කිරීම /බෙදා හැරීම)
3. වාහනයක ගමන් කරන අවස්ථාවකදී පවා තම දුරකථනය භාවිතයෙන් තොරතුරු දැන ගැනීමට හැකි වීම හා එමගින් තම කාලය ඉතිරි කර ගැනීමට හැකි වීම.
4. පැහැදිලි බව.
5. අදාළ අයට ලිපි ලේඛන යවා ඇති බවට තහවුරුවක් පැවතීම.

මෙය මා ලද පුහුණුවලදී ලත් දැනුම හා අත්දැකීම් පදනම් කරගෙන ඉදිරිපත් කරන ලද යෝජනාවකි. ඉහත කරුණු පිළිබඳව සලකා බලා එය ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතීද යන්න විමසා බැලීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට සංවර්ධන සහකාර පී.එච්.එල්.සී.පුෂ්පරාණි මහත්මිය විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

අපි මන්ත්‍රීවරු කිහිප දෙනෙක් බැලුවහම අපි රෑ 11.30 ට හරි බලනවා. මම නම් සාමාන්‍යයෙන් එකොළහට පස්සෙ තමයි බලන්නෙ. නමුත් මම හිතනවා බහුතරයක් අපේ මන්ත්‍රීවරුන්ට මේ පහසුකමුත් නෑ. කර ගන්න පුළුවන් කමකුත් නෑ. තව මේකට මුදලකුත් යයි. හැබැයි මීට වඩා මුදල් අපි නගර සභාවෙ වියදම් කරනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා සමස්ථයක් 75% ට වැඩි මන්ත්‍රීවරු අපි ධම්මික මන්ත්‍රීතුමා ඔබතුමා මන්ත්‍රීවරු ඉන්ටර් නෙට් එකට ගිහිල්ලා අපේ ඊ-මේල් එක බලලා ඒ දේවල් කරයි. අපට ප්‍රින්ට් එක ගන්නත් පහසුකම් තියෙනවා. නමුත් බහුතරයකට නෑ. ඒ නිසා මේ ලිපිලේඛණවලට යන මුදල පිළිබඳව සලකන්නෙ එපා. අපටත් පුළුවන් උපරිමයෙන්ම නගර සභා සීමාව තුළ සංවර්ධන කටයුතු සඳහා මුදල් යොදවනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීතුමා, මේ යෝජනාව ස්ථිර කලේ නැනෙ කවුරුත්. එහෙනම් ප්‍රතිෂේප කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

නෑ. නෑ. මම ඉන්නවා අත්‍යාවශ්‍යයි කියන කාරණාවෙ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ යෝජනාව සම්ඉන්ධයෙන් අවශ්‍ය නම් ඒ යෝජනාව ස්ථිර කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි, ඩෙනට් මන්ත්‍රීතුමා කියූ දේ සත්‍යයක්. එතනත් මම ඉන්නවා. හැබැයි මේ ලිඛිතව දෙන කඩදාසි ටික අපට අත්‍යාවශ්‍යයි. ඊට අමතරව ඉදිරියට තාක්ෂණයත් එක්ක යන්න මේ ඊ-මේල් මගින් ලබාදෙන සේවාව අරඹන්න. හැබැයි මේ දෙකම වෙන්න ඕන. ඒ නිසා මේ යෝජනාව පරිදි කටයුතු කිරීමට මම එකගයි. හැබැයි වෙනුවට නෙවෙයි මේ ලිඛිතව දෙන කඩදාසිත් සමග. මේක ඉතාම අපහසු දුෂ්කර කාර්යයක්. හැබැයි මේක ඉතාම හොඳින් කරලා තිබුණා. පසුගිය කාල වකවානු වල මේ වාර්ථාව හරියට දී ගන්න බැරි තත්වයක් තිබුණා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක මන්ත්‍රීවරුන්ට ලියුම් යැවීම පමණක් නෙවෙයි. නිලධාරීන්ටත් යවනවා. ඒ නිසා ඒ ක්‍රමය ඒ තුළ ඇති කිරීම අත්‍යාවශ්‍යයි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ඒ නිසා මමඉල්ලා සිටිනවා කරන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

හැබැයි මේ ලෙවල් එකේ ඉන්න බෑ. ඊලගට හරි මේක ටික ටික දියුණු වෙන්න ඕන. දැන් තියෙන නව තාක්ෂණය පාවිච්චි කරන්න ඕන.

<u>තීරණය</u>

**නගර සභා මන්ත්‍රී මණ්ඩලය හා නිළධාරීන් වෙත ලබා දෙන සභා වාර්තා , කමිටු වාර්තා හා ලිපි වෙනුවට විද්‍යුත් තැපැල භාවිතයෙන් විද්‍යුත් ලිපිනයන් වෙත එම තොරතුරු ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් සංවර්ධන සහකාර සහකාර විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව පෙර පරිදි මෙම වාර්තා ලිඛිතව ලබා දීමට අමතරව මෙම යෝජනාව ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.03 නගර සභාවේ කළමනාකරණ සහකාර එච්.එච්. රෝෂිණී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

2018.05.23 දින අම්බලන්ගොඩ නගර සභාව නමින් අම්බලන්ගොඩ මහජන බැංකුවෙ රුපියල් ලක්ෂ 100 ක (ලක්ෂ 10 බැගින් වූ තැන්පතු 10ක) ස්ථාවර තැන්පතු මුදලක් මාස 03කින් කල් පිරෙන සේ තැන්පත් කර ඇත. එය මුල් වරට 2018.08.23 දින කල් පිරෙන අතර, ඒ සඳහා වාර්ෂිකව 10.25% ක පොළී මුදලක් ලැබේ. ඒ අනුව මාසිකව රුපියල් ලක්ෂ 100 සඳහා රු: 85416.66 ක් බැගින් මාස 03 ක් සඳහා රු: 256250.00 ක මුදලක් පොළී ලෙස ලැබීමට නියමිතයි.

මේ වන විට කාර්යාලීය නිලධාරීන් හා සේවකයන් විසින් සේවක ණය වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම් ප්‍රමාණය අනුව ණය ගෙවීම සඳහා සේවක ණය ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොවන බැවින් මෙම ස්ථාවර තැන්පතු මගින් ත්‍රෛයිමාසිකව ලැබෙන පොළිය (රු:256250.00) සභා සේවක ණය ගිණුමට බැර කර සේවක ණය ගෙවීමට සුදුසු බව යෝජනා කරමි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් කියන්න ඕන අලුත් නීතිය අනුව කට්ටිය කථා කරන්න පුළුවන් ලක්ෂ 100 ක් තැන්පතු දාලා තියෙන්නේ මොකද කියලා. දැනට අපි බලයට පත්වෙලා මාස 4 ක් පමණ වෙනවා. තාම කරපු එකකටවත් ගෙවන්න පළාත් සභාවෙන් අනුමැතිය ලැබී නෑ. ඒ නිසා අනුමැතිය ලැබුනහම මේ සල්ලි ඉවර වේවි. අපි එතෙක් වැඩ කරගෙන යනවා. අනුමැතිය එනකම් මේ සල්ලි නිකම් ගිණුමෙ තියාගෙන ඉන්නවට වඩා ස්ථිර තැන්පතුවක දාලා යම් පොළියක් ලබාගෙන සේවකයින්ට හරි සහනයක් ලබා දෙනවා නම් ඒක තමයි අපි කරලා තියෙන්නෙ.

<u>තීරණය</u>

**2018.05.23 දින අම්බලන්ගොඩ නගර සභාව නමින් අම්බලන්ගොඩ මහජන බැංකුවේ රුපියල් ලක්ෂ 100 ක (ලක්ෂ 10 බැගින් වූ තැන්පත් 10 ක)ස්ථාවර තැන්පත් මුදලක් මාස 03 කින් කල් පිරෙන සේ තැන්පත් කර ඇත.එය මුල්වරට 2018.08.23 දින කල් පිරෙන අතර,ඒ සඳහා වාර්ෂිකව 10.25% ක මුදලක් පොළියක් ලැබේ.ඒ අනුව රුපියල් ලක්ෂ 100 සඳහා රු:256250.00ක් පොළී ලෙස ලැබීමට නියමිතයි.මේවන විට කාර්යාලීය නිලධාරීන් හා සේවකයන් විසින් සේවක ණය වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම් ප්‍රමාණය අනුව ණය ගෙවීම සඳහා සේවක ණය ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොමැති බැවින් මෙම ස්ථාවර තැන්පතු මගින් ත්‍රෛයිමාසිකව ලැබෙන පොළිය (රු.256250) සේවක ණය ගෙවීම සඳහා සහා සේවක ණය ගිණුමට බැර කිරීමට හැකිවන පරිදි ස්ථිර තුන්පතු අවලංගු කර නැවත ආයෝජනය කිරීම සුදුසු බවට ගිණුම් අංශ ප්‍රධානී විසින් කරන ලද යෝජනාව සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**05.01.04** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

නගර සභා පටබැඳිමුල්ල ආදාහනාගාරයේ ඇතුල්වන දොරටු ප්‍රදේශයේ තාර දැමීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**නගර සභා පටබැඳිමුල්ල ආදාහනාගාරයේ ඇතුල්වන දොරටු ප්‍රදේශයේ තාර දැමීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය**

**05.01.05**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

විලේගොඩ ගා/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය අසල කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීමසුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**විලේගොඩ ගා/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය අසල කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය**

**05.01.06** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

රණසූරිය පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**රණසූරිය පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.07** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

දෙල්දූව පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**දෙල්දූව පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.08** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

පටබැඳිමුල්ල ආදාහනාගාරයේ මායිම් තාප්පයේ තීන්ත ආලේප කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල ආදාහනාගාරයේ මායිම් තාප්පයේ තීන්ත ආලේප කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.09** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

පටබැඳිමුල්ල නගර සභා මාළු වෙළඳපළෙහි මාළු ලෑලි කඩා ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල නගර සභා මාළු වෙළඳපළෙහි මාළු ලෑලි කඩා ඉවත් කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.10** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

මානාන ක්‍රීඩාපිටියට ඇතුලු වන ස්ථානයේ ගේට්ටුව සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

**මානාන ක්‍රීඩාපිටියට ඇතුලු වන ස්ථානයේ ගේට්ටුව සැකසීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.11** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

පොල්වත්ත ක්‍රීඩාංගනයේ ආරක්ෂිත දැල සවි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

**පොල්වත්ත ක්‍රීඩාංගනයේ ආරක්ෂිත දැල සවි කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.12** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

පටබැඳිමුල්ල ආදාහනාගාරයේ දොර පියන සහ ජනේලය අලුතින් දැමීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල ආදාහනාගාරයේ දොර පියන සහ ජනේලය අලුතින් දැමීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.13** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

පටබැඳිමුල්ල ආදාහනාගාරයට පිවිසෙන ගේට්ටුව සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල ආදාහනාගාරයට පිවිසෙන ගේට්ටුව සැකසීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.14** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

හල්වතුර කසල රැස් කරන භූමියට පිවිසුම් ගේට්ටුව සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

**හල්වතුර කසල රැස් කරන භූමියට පිවිසුම් ගේට්ටුව සැකසීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.15** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

රේණුක මෝටර්ස් ආයතනය අසල පොදු ළිඳ අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**රේණුක මෝටර්ස් ආයතනය අසල පොදු ළිඳ අලුත්වැඩියා කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.16** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

පොල්වත්ත ක්‍රීඩාංගනයේ අත්පන්දු ක්‍රීඩා පිටිය සහ එම භූමියේ පැති බැම්ම සහ පස් ඇතිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**පොල්වත්ත ක්‍රීඩාංගනයේ අත්පන්දු ක්‍රීඩා පිටිය සහ එම භූමියේ පැති බැම්ම සහ පස් ඇතිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.17** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

නගර සභා ක්‍රීඩාපිටිය අසල ලොරි රථගාලට මායිම් වන ආරක්ෂිත බැම්ම ඉදිකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**නගර සභා ක්‍රීඩාපිටිය අසල ලොරි රථගාලට මායිම් වන ආරක්ෂිත බැම්ම ඉදිකිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.18** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

කායවර්ධන මධ්‍යස්ථානයේ පළමු මහල ඉදිකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**කායවර්ධන මධ්‍යස්ථානයේ පළමු මහල ඉදිකිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.19** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු වලට අදාළ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරිම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු වලට අදාල විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරිමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.20** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

රණසූරිය පාර පෙට්ටි බෝක්කුව අලුතින් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**රණසූරිය පාර පෙට්ටි බෝක්කුව අලුතින් ඉදිකිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.21** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීමසුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.22** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ක්‍රීඩාංගනයේ වැට අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ක්‍රීඩාංගනයේ වැට අලුත්වැඩියා කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.23** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩා මණ්ඩපයේ වහල අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩා මණ්ඩපයේ වහල අලුත්වැඩියා කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.24** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

හල්වතුර කුණු කසල බැහැරලන ස්ථානයට පස් දැමීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**හල්වතුර කුණු කසල බැහැරලන ස්ථානයට පස් දැමීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.1.25** <u>සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

පෝරඹ වලව්ව පාර ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**පෝරඹ වලව්ව පාර ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය**

**05.01.26** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

ඕකන්ද පොදු නාන ළිඳ ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

**ඕකන්ද පොදු නාන ළිඳ ඉදිකිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය**

**05.01.27** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

කෙරමිණිය පොකුණ පාර කාණුව කොටසක් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**කෙරමිණිය පොකුණ පාර කාණුව කොටසක් ඉදිකිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය**

**05.01.28** <u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා</u>

නගර සභා ක්‍රීඩාංගනයේ පැවිලියන් එකෙහි වහල සෑදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

<u>තීරණය</u>

**නගර සභා ක්‍රීඩාංගනයේ පැවිලියන් එකෙහි වහල සෑදීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය**

**5:2** ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා

**05.02.01** <u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

අම්බලන්ගොඩ කළුවඩුමුල්ලේ ගම්සිරි උද්‍යාන පදනම මගින් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා පීරිස් වෙද මාවතේ පොරොක් ඇළට යාබද නගර සභාව සතු කුඩා බිම් කොටස නිදහස් කර දෙන ලෙස යෝජනා කරමි

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාරමහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් තුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ කළුවඩුමුල්ලේ ගම්සිරි උද්‍යාන පදනම මගින් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා පීරිස් වෙද මාවතේ පොරොක් ඇළට යාබද නගර සභාව සතු කුඩා බිම් කොටස නිදහස් කර දෙන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් තුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**05.02.02** <u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

මානාන ක්‍රීඩා පිටියේ එළිමහන් රංග පීඨයක් හා ක්‍රීඩා මණ්ඩපයක් (ප්‍රේක්ෂකාගාරයක්) ඉදි කිරීමට යෝජනා කරමි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මම යෝජනාව ඉදිරිපත් කරන කොට බලාපොරොත්තු උනා මහා අම්බලන්ගොඩ ප්‍රදේශයේ මානාන පිට්ටනිය ක්‍රීඩකයකු වශයෙනුත් ක්‍රීඩකයන්ගේ ප්‍රශ්න වෙනුවෙනුත් යොමු කරන විට අපගේ ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරාවි කියලා. නමුත් ඇත්ත වශයෙන්ම ඔබතුමා මානාන ප්‍රදේශයේ යම් දෙයක් කරනවා නම් නිතරම කියනවා අපේ පෙර පාසල් උත්සවය. පෙර පාසල ආරම්භ කරන්න මුල්ගල තබන්න තාක්ෂණ සේවා නිලධාරී සිසිර මහත්තයා එක්කගෙන ගියා. ඒ අවස්ථාවේදීත් මන්ත්‍රීතුමාට තමයි සැලකිල්ල දැක්වූයේ. මේක ක්‍රීඩාපිටියට අත්‍යාවශ්‍ය දෙයක්. විපක්ෂ නායක ඩෙනට් මන්ත්‍රීතුමා මාත් එක්ක කථා කරලා කිව්වා නගර වැසියන් ආවහම ඉන්න තැනක් නෑ. අඩුපාඩු සම්බන්ධව කටයුතු කරලා යනවා. අවශ්‍ය දෙයක් මොන මන්ත්‍රීතුමන්ගෙන් හෝ වෙනවා නම් සතුටු වෙනවා. තරුණ දේවල් ගැන කථා කරන බොහෝ මන්ත්‍රීවරු සහයෝගය ලබා දේවි කියලාමගේ ලොකු විශ්වාසයක් තියෙනවා. අපේ විපක්ෂ නායකතුමාගේ ප්‍රදේශය ඉක්මනින්ම තාක්ෂණ සේවා නිලධාරි මගින් සභාපතිතුමා ඒවාට අවශ්‍ය සැලසුම් හදාවි කියලා. ඉදිරියේ දී ඒ සංවර්ධන කටයුත්ත කරන විට ගරු ප්‍රධාන අමාත්‍ය අම්බලන්ගොඩ නිදහස් පක්ෂ සංවිධායක ෂාන් විජයලාල් මැතිතුමාගේ සහයෝගයත් අර ගන්න. මානාන ක්‍රීඩාපිටියේ මරනාධාර සංගමයටත් ගොඩනැගිල්ලක් හදලා ප්‍රතිපාදන ලබා දුන්න ප්‍රධාන අමාත්‍යතුමා. එතන ග්‍රාම සංවර්ධන නිලධාරීතුමාට ද සියලුම රජයේ නිලධාරීන් ද කිසිම ප්‍රශ්නයක් නැතිව ඉන්නවා. පනියන්දුව කොට්ඨාශයේ සියලුම නිලධාරීන් එකම ස්ථානයක ජනතාවට හමුවෙන්න අවස්ථාව ලැබිලා තියෙනවා. මහා අම්බලන්ගොඩටත් ප්‍රජා ශාලාවක් ලබා දෙන්න විපක්ෂ නායකතුමා ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගෙන් සහයෝගය ලබාගෙන ඔබතුමා ඒ සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්ය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මෙතුමිය චෝදනාවක් කලා මම ස්ථිර කලේ කලේ නෑ කියලා. මෙතුමිය දන්නෙ නෑ සභාපතිතුමනි 2008 වර්ෂයේදීත් ඔතන ප්‍රජා ශාලාවක් සෑදීම සඳහා එවකට රාහුල මන්ත්‍රීතුමා උපසභාපතිතුමා. ප්‍රජා ශාලාවල් 2ක් හදන්න ප්‍රතිපාදන තියෙනවා කියලා තට්ටු දෙකේ බිල්ඩින් 2 ක් හදන්න ප්ලෑන් දෙකක් හදාගෙන ඇස්තමේන්තු අරගෙන ප්‍රධාන අමාත්‍යතුමාගේ අතටම ගිහිල්ලා දුන්නා. මාස දෙක තුනක් යනවිට එවකට හිටපු උප සභාපතිතුමාගේ එක විතරක් අනුමත උනා. පින්නදූව එක අනුමත උනේ නෑ. අපේ ගමේ අයත් දැන ගත්තා. මේකට මුල්ගල තියලා වැඩකරගෙන යනවිට පොඩ්ඩක් කලබල වුණාඅනුමත කර් නැත්තෙ කියලා. සභාපතිතුමත් හමු උණා. මම සභාපතිතුමත් එක්ක කථා කරලා ප්‍රජාදායකත්වයෙන් කරන්න කැමති උනා. සමිතිය කැමති චෙච්ද කියලා.මම කථා කරලා බලන්නම් මුණ ගස්සන්න කියලා. මම හිටියේ භාණ්ඩාගාරික වශයෙන්. නගර සභාවෙන් බඩු ලබා දෙන්නම්. ප්‍රජා දායකත්වය සමිතියෙන් දරන්න පුළුවන්ද කියලා කැමති උනා. මම බලාපොරොත්තු උනේ තට්ටු දෙකට. උඩ ප්‍රේක්ෂකාගාරයක්. යට ප්‍රජාශාලාවක් විදිහට ප්ලෑන් එක ඇඳලා තිබුණෙ. සභාපතිතුමා කිව්වා එච්චර දෙයකට යන්න අමාරුයි දැනට තියෙන අවශ්‍යතාවය ප්‍රජාශාලාවක් සඳහා වැඩ පටන් ගනිමු කියලා. සභාවෙන් බඩු අරන් දුන්නා. අත්තිවාරම දැම්මෙ ගමේ මිනිස්සු. එවකට උපසභාපතිතුමා 2008 විතර පටන් ගත්තෙ. අපි පටන් ගත්තෙ 2009 විතර. ශ්‍රම දායකත්වය ගමේ උදවියත් බඩු නගර සභාවෙන්ද ලබා දුන්නා. මාස 4ක් 5 ක් යනවිට ප්‍රධාන අමාත්‍යතුමා ප්ලෑන් එක අනුමත කරලා එව්වා. අත්තිවාරම

දැම්මෙ තනි තට්ටුවට. ඒ නිසා තමයි ප්‍රේක්ෂකාගාරයක් හදන්න බැරි වුනේ. කොහොම උනත් එතුමියගේ යෝජනාව හොදයි. එය හදන්න එතුමියට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. මගෙත් සහයෝගය දෙනවා. මම ස්ථිර නොකලෙ මං ඊට කලින් යෝජනාවක් කල නිසයි.

__ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ ශ්‍රේෂ්ට රංගදරයො, නාට්‍යධරයො බිහි උනා. අද අම්බලන්ගොඩ තිබ්බව රගහල වැහිලා අපි අපේ කාර්යාලය ලෙස භාවිතා කරනවා. මේ මොහොතේ නිලානි මන්ත්‍රීතුමියනි, දිස්ත්‍රික් සංවිධායකතුමිනි, අදහසක් දක්වනවා එලිමහන් රංගපීඨයකට වඩා අභ්‍යන්තර නාට්‍යක් රගදක්වන්න පුළුවන් අවස්ථාවක් නිර්මාණය කර දෙන්න පුළුවන් නම් මේ කලා පුරවරයට බොහෝ වැදගත් වේවි. ඒ සම්බන්ධයෙන් පළාත් නායකතුමාත් දැනුවත් කරලා . අපේ ධීවර සංකීර්ණය අහිමි උණා. විපක්ෂනායකතුමා පළමු දින හඩගෑවා මහ හඩින් ඒ සම්බන්ධව. එවැනි රගහලක අවශ්‍යතාවය දැඩිව පවතිනවා. ඒ නිසා රංගපීඨයක අවශ්‍යතාවය බොහොම වැදගත්. ඔබතුමියගේ අදහස් සපල වේවායි පතමින් නවතිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්__

ගරුසභාපතිතුමනි, නිලානි මන්ත්‍රීතුමිය ගෙන ආ යෝජනාව කාලෝචිත යෝජනාවක්. මේ ප්‍රදේශය අනුව අම්බලන්ගොඩ නගරයෙන් කි.මී. ¼ ක් කි.මී.1/2 ක් පමණ ආසන්න වපසරියක මේ පිට්ටනිය පිහිටා තිබෙන්නෙ. ඒ ගම් දෙක මහා අම්බලන්ගොඩ, පනියන්දූව ගම් දෙකේ දරු දැරියන්ගේ දක්ෂතා පුහුණු කිරීමට එළි දැක්වීම සදහා මේ රංගපීඨයක අවශ්‍යතාවය ඒ වගේම බරපතල විදිහට මානාන ක්‍රීඩාංගනයේ ක්‍රීඩා ප්‍රේක්ෂකාගාරයක අවශ්‍යතාවයකුත් තියෙනවා. මේ පිට්ටනිය වසා දමා තිබෙන නිසා. ඒ පිට්ටනිය පිළිසකර කර දුන්නත් ක්‍රීඩකයන්ගේ පාවිච්චිය සදහා දුන්නත් වැඩි ප්‍රවනතාවය ක්‍රිකට් ක්‍රීඩාව සදහා දෙන්න වෙන අවස්ථාවක මානාන ක්‍රීඩාංගනයේ අවශ්‍යතාවය අනෙක් ත්‍රීඩා කරන දරුවන්ට විශාල වශයෙන් දායක වෙන්න පුළුවන්. ඒ නිසා එහි ප්‍රේක්ෂකාගාරයක් ඉදි කිරීමේ යෝජනාව ඉතාව කාලෝචිත යෝජනාවක් ලෙස මා සලකනවා.

__ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්__

සභාපතිතුමනි, නිලාන් මන්ත්‍රීතුමිය ප්‍රදේශයට අත්‍යාවශ්‍ය කරුණක් වූ රංගපීඨයක් හා ක්‍රීඩා මණ්ඩපයක් ඉදි කිරීමට යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. එතුමියට අපි ස්තූතිවන්ත වෙනවා මං හිතන්නේ පනියන්දූව මහා අම්බලන්ගොඩ කොට්ඨාශ දෙකේ තරගයක් තියෙන්නෙ. සහයෝගයෙන් වැඩ කරන්න කියලා ඉල්ලා සිටිනවා. අපේ ජගත් මන්ත්‍රීතුමාටත්, නිලානි මන්ත්‍රීතුමියටත් එතුමා කිව්වා දීර්ඝ කථාවක්. පනියන්දූව මානාන ක්‍රීඩාංගනයේ ඉදිකල ප්‍රජාශාලාව සම්බන්ධව. ඔබතුමාගෙ ඒ දවස්වල වැඩසටහනක් තිබුණා ශ්‍රම දායකත්වය ලබා ගෙන යම් යම් ඉදි කිරීමේ කටයුතු කරන්න. ඒ අනුව තමයි ජගත් කුමාර මන්ත්‍රීතුමා මැදිහත් වෙලා කටයුතු කලේ. ප්‍රධාන අමාත්‍යතුමා ඉල්ලීමට පෙර තමයි අත්තිවාරම දැම්මේ. පසුව එය කරගැනීමට හැකියාවක් තිබුනෙ නෑ. මෙතුමාගෙත් උනන්දුව මදි උනා. ගිහිල්ලා භාර දුන්නත් මාස 2 කට 3 කට සැරයක්වත් ගිහිල්ලා කියන්න ඕන. කරදර කරන්න ඕන ගිහිල්ලා. ඒ තුළින් අපට ඒක ලැබුණා. මෙතුමට උනේ ඒක පහු උනා. මුදල් ලබා දුන්නා. කොහොම උනත් අපි ස්තූතිවන්ත වෙනවා නගරයට ඉදිවන දෙයක්. කොහේ කොට්ඨාශයකට උනත් කමක් නෑ. නිලානි මන්ත්‍රීතුමිය කල යෝජනාව ට සහයෝගය දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්__

මන්ත්‍රීවරු හැමෝම කථාකලාම කාන්තා මන්ත්‍රීවරියක් කල යෝජනාවට අපිත් අගය කරලා කථා කරන්න ඕන. කාන්තා මන්ත්‍රීවරියන් හැමවිටම ඉතා කාලෝචිත යෝජනා තමයි කරන්නෙ. ඒ ගොල්ලො තමයි මේකෙ අවශ්‍යතාවය දන්නෙ. එනිසා නිලානි මන්ත්‍රීතුමිය කල යෝජනාව කාන්තා මන්ත්‍රීවරියක් ලෙස ඉතාම ප්‍රසංශා කරනවා. ඔය කටයුත්ත කරන්න අපේ සමස්ථ සහයෝගය දෙනවා. ඔබතුමිය අපිත් එක්ක එකතු වෙලා ඔය වැඩය ලස්සනට කරලා අපි යහපාලන රජයේ විශිෂ්ඨත්වය මේ වේලාවෙ පෙන්නලා වැඩ කටයුතු කරමු කියලා මේ අවස්ථාවෙ ඉතාම සතුටින් කියනවා.

තීරණය

**මානාන ක්‍රීඩා පිටියේ එළිමහන් රංග පීඨයක් හා ක්‍රීඩා මණ්ඩපයක් (ප්‍රේක්ෂකාගාරයක්) ඉදි කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.02.03 ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.**

**අම්බලන්ගොඩ නගර සභාවට, සෞඛ්‍යය අංශය සඳහා දැනට නගරයේ බැහරලන කුණු හා කසල තුනී කිරීම සඳහා අවශ්‍ය D4Eයන්ත්‍රයක් ලබා දෙන ලෙස ගරු දකුණු පළාත් මහා අමාත්‍ය ෂාන් විජයලාල් මැතිතුමාගෙන් ඉල්ලා සිටීමට කරනු ලබන යෝජනාවයි**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව මං කරන්න යෙදුනෙ ඉතාමත් අපහසුතාවයක් නගර සභාවට තියෙනවා මේ කසල තුනී කරන්න යන වියදම් ප්‍රමාණය අනුව. එම මුදල් නවතා ගැනීමට හැකියාවක් තිබෙනවා නම් සංවර්ධන කටයුත්තකට යෙදවීමට හැකියි. අපේ වරිපනම් බදු ආදායම ගත්තත් එම වාර්ෂික ආදායමට වඩා කසල තුනී කිරීමට විතරක් මෙම යන්ත්‍රයට කුලී වශයෙන් දීමට සිදු වී තිබෙනවා. ඒ තත්වය මතයි මෙම යෝජනාව කරන්න හේතු උනේ. කසල බැහැර කරන ස්ථානයේත් බරපතල ප්‍රශ්නයක් නිර්මාණය වී තිබෙනවා. ඒ නිසා කසල තුනී කරන්නෙත් මාස දෙකකට, තුනකට හො හතරකට සැරයක්. ඒ ප්‍රදේශවල ජනතාව පීඩනයට පත් වෙනවා මාස 4 ක් තිස්සෙ. කුණු එක තැන පල් වෙන විට. ඒකට හේතුව අපටම කියලා යන්ත්‍රයක් නොමැතිකම. නගර සභාවට යන්ත්‍රයක් තිබෙනවා නම් කුණු ගෙන එන අවස්ථාවේදීම පස්දමා තුනී කරලා වසා දමලා මිනිස්සුන්ට මීට වඩා හොද ශරීර සෞඛ්‍ය පහසුකමක් සලසන්න පුළුවන්. ඒක හැම පැත්තෙන්ම නීත්‍යානුකූල වෙනවා. ඒ නිසා මා ඉල්ලා සිටිනවා ප්‍රධාන අමාත්‍යවරයා විදිහට විෂය භාර අමාත්‍යවරයා විදිහට අම්බලන්ගොඩ නගර සභාවෙ මූල්‍ය තත්වයත් එක්ක මෙවැනි යන්තයක් අලුතින් මිලදී ගන්න රුපියල් ලක්ෂ 40 ක 50 ක පිරිවැයක් යනවා. ඒ තරම් මූල්‍ය තත්වයක් නගර සභාවට මේ අවස්ථාවෙ නැති නිසා. ගරු මහ ඇමතිතුමාගෙප්‍රතිපාදන යටතෙ මේක ලබා දීමට කාරුණික ඉල්ලීමක් කරන ලෙස මෙම සභාවට මම යෝජනා කර සිටිනවා.

**ගරු උප සභාපතිකමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි, හොද යෝජනාවක් එතුමා ඉදිරිපත් කරේ. ගිය සභාවෙ 5:2:4 යටතේමේයෝජනාව කලා. මං දන්නෙ නෑ ඒක යැව්වද කියලා. කොහොම උනත් කවුරුයෝජනා කලත් ඒක හොදයි. ඒක ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කලොත් හොදයි. ගිය සභාවට ඉස්සෙල්ලා සභාවට අපි නැති කාලේ ලක්ෂ 19 ක් ගෙවන්න ඇවිල්ලා තිබුණා. තව මාස තුන හතරක් යනවිට තව ලක්ෂ 19 ක් ගෙවන්න ඕන. මේ කාර්තු දෙක ඇතුලත මේමැෂින් මිලදී ගත්තොත් මේක සම්පූර්ණ ඉතිරියක් වෙනවා. මිනිස්සුන්ගෙ සල්ලි යන්නෙ. මේ මැෂින් එකට අපි රුපියල් ලක්ෂ 100 ක් විතර වෙනවා අවුරුද්දකට. ගරුප්‍රධාන ඇමතිතුමා හරි කවුරු හරි දුරකතනයෙන් අහලා තිබුනා මැෂින් එකක් ගෙන්න මිල අහලා තිබුණා කියලා. සභාපතිතුමා ඒක ඇරියද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපෙන් අවශ්‍යතා මොනවද කියලා අහලා තිබුනා. අවශ්‍යතා දන්වලා යැව්වා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්**

අවශ්‍ය යන්ත්‍ර ටික දන්වලා යැව්වා. මං ඉල්ලා සිටිනවා ගරු රාහුල මන්ත්‍රීතුමා ඒක ක්‍රියාත්මක කරන්න. ඉල්ලීම ඉෂ්ට කරන්න මහ ඇමතිතුමාට විෂය භාර ඇමතිතුමා වශයෙන් සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සරත් මන්ත්‍රීතුමා කල යෝජනාව ඉතාම හොද යෝජනාවක්. මේකට කවුරුත් මන්ත්‍රීවරු විරුද්ධ වෙන්නෙ නෑ. මේක අපි ගරු මහ ඇමතිතුමාට ඉදිරිපත් කරමු. අපේ නගරයට දැනෙන ප්‍රශ්නයක් මේක. එතුමා දන්නවා මේ පිළිබදව. අපි හැකි ඉක්මනින් එතුමාගේප්‍රතිපාදනවලින් හෝ පළාත් පාලන ප්‍රතිපාදන යටතේ අපට ලබා දීමට කටයුතු කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ යන්ත්‍රය දැනට අලුතින් ගත්තොත් ලක්ෂ 100 කට ආසන්න වෙනවා. නමුත් මීට ඉස්සෙල්ලා කීප වරක්ම දකුණු පළාත් සභාවෙන් ඉල්ලුවා රීකන්ඩිෂන් යන්ත්‍රයක් ලබා දෙන්න කියලා. ඒක ලක්ෂ 30 කට වගේ ගන්න පුළුවන්. ලක්ෂ 30 ක් කියන්නෙ අපි දෙපාරකට ගෙවන බිල. අපි තුන් පාරක් පාවිච්චි කරලා ඇතුලට දැම්මත් පාඩු නෑ. නමුත් ඒ අවසරය අපට ලැබෙන්නෙ නෑ. ඒක කථා කරලා ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි, නගර සභා මන්ත්‍රී සරත් මන්ත්‍රීතුමා D4E යන්ත්‍රය මිලදී ගැනීම සදහා යෝජනාව ඉදිරිපත් කිරීම ඉතාම හොදයි. නගර සභාව කුණු තල්ලු කිරිම සදහා විශාල මුදලක් වැය කරනවා. අපේ මන්ත්‍රීවරු පත්වෙන්න ඉස්සෙල්ලත් ප්‍රධාන ඇමතිතුමා ලක්ෂ 20 ක් විතර වැය කරලා කුණු තේරීමේ මධ්‍යස්ථානයක් හදලා ට්‍රැක්ටර් දෙකකුත් පරිත්‍යාග කරලා තියෙනවා. මේවා කරන කොට අර යන්ත්‍රය ගන්නවා වගේම කුණු තේරිම වැදගත් වෙනවා. මහජනතාවත් දැනුවත් කරලා ඒක නීත්‍යාණුකූලවම කරන්න ඕන. නැත්තම් හැම තැනම කුණු. මට මතකයි ඒ දවස්වල බල්ලා මැරුනහම කාඩ්බෝඩ් පෙට්ටියක ගැට ගහලා කුණු ගොඩ උඩින් තියලා යනවා. මනුස්සයොනෙ කුණු අදින්නෙ. ඒ වගේ මිනිස්සුත් ඉන්නවා සමාජයේ. හැමදේම ඕන දේත් එපා දේත් දානවා . ඒකටත් මොකක් හරි ක්‍රමවේදයක් ඇති කරන්න ඕන. මේ කාරණාව සම්බන්ධයෙන් ප්‍රධාන ඇමතිතුමාත් අපෙන් මුදල කීයද කියලා ඇහුවා. මම කිව්වා ලක්ෂ 60 ක් විතර යාවි කියලා. රීකන්ඩිෂන් එකක් ගතහැකි නේද ඒකට අනුමැතිය දුන්නොත් හොදයි නේද කියලා. ඒ පාර කිව්වා ඔය පරණ කැලි ගෙනල්ලා හදන්න වේවි කියලා. ඒකටත් ගානක් යාවි කියලා. එතුමාගෙ අදහස උනේ අලුත්ම එකකට තමයි. මුළු පළාතටම දෙන්න ඕන නිසා අපි බැලුවා අවශ්‍යතාවය ඉටු කර ගන්න. මම හිතන්නෙමේක ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. ඒකටත් අපි සහයෝගය ප්‍රධාන ඇමතිතුමාගෙන් අරගෙන දෙන්නම්. මොකද මුදලුත් තියෙනවා නගර සභාවෙ අපේ සභාපතිතුමා ලග. ඕක හන්ගලා ස්ථිර තැන්පතු දාලා තියෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ වගේම අනුමැතියත් එවන්න කියන්න. කොන්ත්‍රාත්කාරයෝ බලාගෙන ඉන්නවා පොලු තියාගෙන.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ඔය අනුමැතිය නොලැබුනා කියන ටික දෙන්න. අපි ඒක කථා කරලා ඒකත් අරන් දෙන්නම්. අපි ඒක ඇහුවා එතෙකොට කිව්වා සියලු දෙනාට කියලා තියෙනවා කිව්වා පළාත් පාලන ආයතනවලට එවපු ගමන් අනුමැතිය ලබා දෙන්න කියලා. නොලැබී තියෙනවා නම් විස්තර ටික දෙන්න. අපි පෞද්ගලිකව ඒක කරලා දෙන්න. නගරයේ වැඩ සදහා තමයි අපි පත් කරලා තියෙන්නෙ. කුමන කටයුත්තකට උනත් අපේ පූර්ණ සහයෝගය එක්සත් ජාතික පක්ෂ සංවිධායකතුමන් සියලු මන්ත්‍රීවරුන් සහයෝගය දෙනවා. ට්‍රැක්ටර් ලබා දීලා තියෙනවා ගොඩනැගිල්ල ලබා දීලා තියෙනවා . ඒ නියමිත විදිහට ඒ කටයුතු ටිකත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

*<u>තීරණය</u>*

**අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍යය අංශය සඳහා දැනට නගරයේ බැහරලන කසල තුනී කිරීම සඳහා අවශ්‍ය D 4E යන්ත්‍රයක් ලබා දෙන ලෙස ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමාගෙන් ඉල්ලා සිටින ලෙසට ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා විසින් කරනු ලබන යෝජනාව සඳහා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

**05.02.04** **<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>**

**අම්බලන්ගොඩ පොල්වත්ත පොදු සුසාන භූමියේ පහළ ගරා වැටී ඇති ගොඩනැගිළි කොටස් ඉවත් කර එහි බිම ගල් අතුරා බැමි බැඳ වාහන නැවැත්වීම සඳහා සංවර්ධනය කළ යුතු යැයි ගරු සභාවට මම යෝජනා කරමි.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව 2018.05.01 රැස්වීමේදී වෙනත් කරුණු යටතේ අයිරාංගනී මන්ත්‍රීතුමිය යෝජනා කරලා පාර්ක් එක ඩිසයින් කරලා ඇස්තමේන්තුව දෙන්න කියලා දැනුම් දීලා තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්</u>**

අප්‍රේල් සභා වාර්තාවට මම යෝජනා කරා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

නවක මන්ත්‍රීවරු විදිහට යෝජනා කරනවා. ඒක ඇත්තටම හොඳයි. මේක කරන්න මුදල් ඕනනෙ. මුදල් ලැබීමේක්‍රමවේදයකුත් ඇති කර ගන්න ඕන. මුදල් ලැබුනද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හැබැයි මෙහෙම ප්‍රශ්නයකුත් ඇති කරා. එක වගේ යෝජනා ඉදිරිපත් කරන්න එපා මාස හයක් ඇතුලත. තේරුමක් නෑ. ඒ කියන්නෙ අපි කථා කල දෙයක්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මගේ යෝජනා ටික දිසාපතිතුමාට භාර දීලා ඉවරයි. ගරු මහ ඇමතිතුමාගෙයෝජනා ටික මේ වනවිට භාර දීලා නැත්නම් ඔය යෝජනාවට අපේ මුදල් ප්‍රතිපාදන තුළ ලක්ෂ 25 ක් 30 ක් උනත් ප්‍රතිපාදන ගන්න පුළුවන්. ගරු මහ ඇමතිතුමාගේ යෝජනා දිසාපත්තුමාට භාර දී නැත්නම් ඕකට ඇතුලත් කරන්න. අපට මේක ඒ හරහා කර ගන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

යෝජනාවක් වශයෙන් දාලා තිබුනෙ නැනෙ. නිකන් කථා කලා විතරයි වෙනත් කරුණු යටතේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මාදුවගේ මහතාගේ හාපුරා කියලා ඉදිරිපත් කල පළමු යෝජනාව ඒක ඉදිරිපත් කරන්න දෙන්න. ඒ යෝජනාවට මුදල් මහ ඇමතිතුමාගෙන් ලැබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

නවක මන්ත්‍රීවරු යෝජනා ඉදිරිපත් කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත් මේක කර ගන්නනෙ ඕන.මූලික වශයෙන් මේකෙ තියෙනවා ගොඩනැගිල්ලක්. කලින් තිබුණු ප්‍රජාශාලාව දැන් ගරා වැටිලා තියෙන්නෙ. ඒක නීත්‍යානුකූලව ඉවත්කිරීමේ කටයුත්ත කෙරෙන්න ඕන. මේකෙ මුදල් ගත්තට වැඩක් නෑ. නීත්‍යානුකූලව කටයුතු කලේ නැත්නම්. ඔබතුමා මැදිහත් වෙලා කරා නම් හොඳයි තාක්ෂණ සේවා නිලධාරී මහත්වරුන්ගෙ වාර්තා දාලා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාව විසින් අනුමත කරනවනෙ. ඒක කඩා ඉවත් කිරීම සියල්ලම. විරුද්ධ නැනෙ කවුරුත්. එහෙනම් ඒ සම්බන්ධව කටයුතු කරලා ඇස්තමේන්තුව ලබා දෙන්නම් ධනසේන මාදුවගේ මන්ත්‍රීතුමාට. එතුමා ඒක ඉදිරිපත් කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා ඕක අපි හදනවිට දැන් මේ සල්ලි ලැබිච්ච වෙලාවෙ මම ඔබතුමාට කියන්නෙ ඔතන පල්ලෙහා කොටසත් සම්පූර්ණයෙන් ගල් අල්ලලාහදලා දෙන්න. උඩ කොටස JCB එක දාලා කඩලා සම්පූර්ණයෙන් බිමට සමතලා කරලා ගල් අල්ලන්න මොනවා හරි මල් දාලා. ඒ ඇස්තමේන්තුව දුන්නහම ඒක මහඇමතිතුමාට දිසාපතිතුමාට දාන්න විතරයි. එතකොට අපට සල්ලි ටික ලැබෙනවා. අපට ඒක කර ගන්න පුළුවන් ලේසියෙන්ම.

**තීරණය**

**අම්බලන්ගොඩ පොල්වත්ත පොදු සුසාන භූමියේ පහළ ගරා වැටී ඇති ගොඩනැගිළි කොටස් ඉවත් කර එහි බිම ගල් අතුරා බැම් බැඳ වාහන නැවැත්වීම සඳහා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.02.05 ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව**

**අම්බලන්ගොඩ කළුවඩුමුල්ල නගර සභාවට සතු පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කළ යුතු යයි ගරු සභාවට මම යෝජනා කරමි.**

**අම්බලන්ගොඩ ඕකන්ද පැරණි නගර සභා නිවාස සංකීර්ණයේ ඇති පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කළ යුතු යයි ගරු සභාවට මම යෝජනා කරමි.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින්යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩබ්..එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කළුවඩුමුල්ලට අයිති ළිං කිහිපයක් තියෙනවා. මොන ළිදද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

වැඩිපුර පාවිච්චි කරන ළිදක්. පඤ්ඤාලෝක පාර අයිනෙ තියෙන ළිද. ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා දන්නෙ නෑ පාවිච්චි කරනවද කියලා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

තව එකක් තියෙනවා පිට්ටනිය ඉස්සරහ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

පාවිච්චි කලත් නොකලත් අපි දාලා තියෙන්නෙ. නගර සභාව සතු ළිං ආරක්ෂා කරන්න ඕන එකක්. අනිත් එක නැත්නම් ඔය ළිද වහලා තව මොකක් හරි එකක් කරනවා. ජල ප්‍රශ්නය උග්‍ර වෙනවා. ඒ නිසා නගර සභාව සතුව තියෙන ළිං අපේ කොට්ඨාශවල ආරක්ෂා කරන්න ඕන. තව එකක් තියෙනවා ඕකන්ද පහළ ළිද. තාක්ෂණ සේවා නිලධාරීන් පොළව ගැන අවබෝධයක් නැතිව මැෂින් දාලා කරන්න දුන්නා. ඒක කඩාගෙන ගිහින් තව පොඩ්ඩෙන් පාරත් යනවා. දැන් ඒක වහලා තියෙන්නෙ. මං හිතන්නෙ සිලින්ඩර් දාලා නැවත පුළුවන් යථා තත්වයට පත් කරන්න. ඒ ළිද කරන්න කියලා ඉල්ලනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශය නිසා ඒකට රු: 890,000/- ක ඇස්තමේන්තුවකුත් හැදුවා. මේ වන තෙක් මුතුත් වැඩක් වෙලා නෑ. අඩු ගානෙ බලන්නවත් ගිහිල්ලා නෑ. ගමේ අය අහනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඕක කලින් ඇස්තමේන්තුවක් කරලා . ඒ අනුව කරන කොට කණ්ඩි කඩන් වැටිලා පාර පවා කඩන් වැටෙන්න හදලා තියෙනවා. දැන් ළිද වහලා තියෙන්නෙ. අලුතින් දැන් හිතලා පාරත් බේර ගෙන අලුත් ඇස්තමේන්තුවක් කරමු.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්**</u>

නැහැනෙ සභාපතිතුමනි, අලුත් ඇස්තමේන්තුව තමයි රු: 890,000/- ක ඇස්තමේන්තුව. ඒ වෙලාවෙ සරත් මන්ත්‍රීතුමත් ඇහුවෙ ඕකන්දට රු:890,000/- ක ළිදක් හැර වෙනත් දේවල් නැද්ද කියලා. ජලය අත්‍යාවශ්‍යම දෙයක් වෙලා ඕකන්ද ප්‍රෙද්ශයට.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපි ඇස්තමේන්තුවක් අනුමත කිරීමයි, මුදල් වෙන් කිරීමයි කාරණා දෙකක්. ඒ නිසා ඒ වෙලාවට එන යෝජනාවල පයොරිටි හැටියට තමයි අපි කරන්නෙ. ඒ වෙලාවෙදි අපට ඉදිරිපත් වන යෝජනා අනුව කටයුතු කරනවා. කරන්නම ඕන නම් බලමු කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්**</u>

මේක අත්‍යාවශ්‍යයි. පාරවල් ටික අපි කොහොම හරි හදා ගන්නවනෙ. ඕකන්දට මේක අවශ්‍ය දෙයක්. මේක අනිවාර්යෙන්ම කරලා දෙන්න සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මගේ කොට්ඨාශය නිසා මම කියන්න ඕන. 2018 අප්‍රේල් රැස්වීමෙදිත් මේ විදිහටම කථා කරලා වැඩ අධිකාරීට තීරණ ලබා දීලා තියෙනවා ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්න කියලා. ඒ අනුව තමයි රු:890,000/- ඇස්තමේන්තු හැදුවෙ. මේ වගේ දේවල්වලදී අපරාදෙ කාලය.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සමිතියක් නම් කරලා එවන්න. මම මුදල් දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මේ යෝජනාව සම්බන්ධයෙන් රාහුල මන්ත්‍රීතුමන් අදහස් කරන්නෙ වෙන දෙයක්. ධනසේන මන්ත්‍රීතුමා කල යෝජනාවටත් මේ වගේ විරුද්ධතා ආවා. ඒක වැරදියි. එතුමා අදහස් කරන්නෙ මහ ඇමතිතුමාගේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක්. ඒකට තමයි මේ නීත්‍යාණුකූල විදිහට යෝජනාවක් විදිහට සභාවට ගේන්නෙ. ඒක අපි කලින් සාකච්ඡා කරලා තියෙනවා සභාවෙ. මමත් එකගයි. හැබැයි මෙතුමන්ලා යෝජනා ගේන්නෙ මහ ඇමතිතුමන්ගෙන් මුදල් ප්‍රතිපාදන ලබා ගන්න. ඒකට අවස්ථාව ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

මමත් යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. මේවා හැදෙන්නෙ නෑනෙ. අපි බලන්නෙ බොරුවට මිනිස්සුන්ගෙන් බොරුවට දෝෂාරෝපණ අහන්න බැහැනෙ. සභාපතිතුමාගෙ ඉදන් මන්ත්‍රීවරු ඔක්කොම බනිනවා. අවුරුදු ගානක් පහු වෙනවා. හැදෙන්නෙ නැති වුනාම අපි බලන්නෙ මුදලුත් අනුමත කර ගෙන වැඩේ කරන්න. ඔබතුමාට මුදලුත් තියෙනවා නම් සභාවට දාලා කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාට මුදල් ලබා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මේ පිළිබඳව දැනුවත්ව නෙවෙයි මම කථා කලේ. බොහොම ස්තුතියි. පුළුවන් නම් මම උගන්වන්න එනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කලින් වැඩ කල මන්ත්‍රීවරු දන්නවා . මෙච්චර යෝජනා ඉදිරිපත් කරන්න දෙන්නෙ නෑ. අයවැය සමග ඉදිරිපත් කරන්න කියලා . හැමදාම යෝජනා ටික දානවා. නමුත් මම කල්පනා කරා රාහුල මන්ත්‍රීතුමා, නිලානි මන්ත්‍රීතුමිය, ධනසේන මන්ත්‍රීතුමා, ඩෙනට් මන්ත්‍රීතුමා මේ සියල්ල සල්ලි සමග කල යෝජනා ඔබතුමන්ලා ධෛර්ය කිරීම සඳහා මේ යෝජනා ඉදිරිපත් කලා.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ කළුවඩුමුල්ල නගර සභාවට සතු පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සහ අම්බලන්ගොඩ ඕකන්ද පැරණි නගර සභා නිවාස සංකීර්ණයේ ඇති පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් කරන ලද යෝජනාව සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඩබ්..එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.02.06** <u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

**1.** **පසුගිය කාලය තුළ නගරයේ ඩෙංගු උවදුර ඉතාම දරුණු ලෙස පැතිරී ගිය බවත්, විශේෂයෙන් විලේගොඩ ප්‍රෙද්ශය අතිශයින්ම දරුණු වූ බවත් සියල්ල දන්නා කරුණකි.**

**2.** **මෙම වසංගතය තුරන් කිරීම සඳහා නිවාස වලින් ලැබුණු සහායට අමතර වශයෙන් නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සේවකයන්ද, පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ද ඉමහත් කැපවීමක් මෙම උවදුර දුරලීම සඳහා දායක විය.**

**3.** **සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් මෙම උවදුර මැඩලීම සඳහා කල කැප කිරීම අප අමතක නොකල යුතුය.**

**4.** **ඩෙංගු රෝගය වැළදීමෙන් රෝහල් ගතවී ප්‍රතිකාර ගත් සියළුම රෝගීන් වෙනුවෙන් බලපිටිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී මහතා ඇතුළු සියළුම වෛද්‍ය මහතුන්ගේ කැපවීමද මේ අවස්ථාවේදී අමතක නොකල යුතුය.**

**5.** **එමෙන්ම රෝහල් කාර්යය මණ්ඩලය කල කැප කිරීමද අමතක කල නොහැකිය. මෙම සියළුම අංශ වෙත ඩෙංගු රෝගය මැඩලීම සඳහා කල කැපකිරීමට කෘතගුණ සැලකීමක් වශයෙන් එම ආයතන වෙත නගරය වෙනුවෙන් ස්තුතිය පුද කර ලිපියක් යොමු කිරීමට මම යෝජනා කරමි.**

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදී.**

ගරු උපසභාපතිතුමාට සභාවෙ මුලසුන ගන්නා ලෙස දන්වමින්, පෙ.ව. 11.50 ට පමණ ගරු සභාපතිතුමා වානාඩි 5 කට සභාවෙන් පිටත්ව යන ලදි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා මම ඇත්තටම 2016 අවුරුද්දෙ ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය මට මතකයි ලේඛන ද ඉදිරිපත් කරමින් අම්බලන්ගොඩ නගර සීමාව තුළ 450 කට වැඩිය ඩෙංගු රෝගීන් වාර්තා වෙලා තිබුනා. මියගිය අය 12 කට වැඩියි. දකුණු පළාතේ වැඩිම ඩෙංගු රෝගීන් ගණනක් වාර්තා උනේ අම්බලන්ගොඩින්. ඇත්තටම මම මේ සඳහන් කල සියලු දෙනාගෙම කැපවීම, උනන්දුව, දක්වපු දායකත්වය නිසා තමයි අද සතුටින් කථා කරන්න පුළුවන්. එතුමිය පසුගිය සංවර්ධන කමිටුවට පෙර සංවර්ධන කමිටුවේදී දත්ත ගෙනවිත් පැවසුවා. දැන් සතුටුයි. මේ වනවිට ඩෙංගු රෝගීන් 50 කටත් අඩුවෙන් තමයි අම්බලන්ගොඩින් වාර්තා වෙලා තිබුනෙ. මේක නිකන් උනේ නෑ. සියලු දෙනාගේ කැපවීම තුලයි උනේ. ඒ නිසා අපි ස්තූති කරලා අදාල ආයතනවලට ලිපියක් යැවීමටත් ඒ තුළින් 2018 වර්ෂය ආපහු වහින්න ගනීවි. නැවත වරක් අම්බලන්ගොඩ ඩෙංගු උවදුරේ ප්‍රධාන නගරයක් නොවීමට වගබලා ගැනීමට තමයි මම මේ අවධානය යොමු කරන්නෙ. අහිංසක ජනතාව බේර ගන්න. එතකොට අපට ලැබෙන ප්‍රතිපාදන තුළ උපරිම කාණු පද්දති සාදා දීමට කටයුතු කරනවා. පසුගිය අවුරුදුවලින් ලැබුනු ප්‍රතිපාදන වලින් ඩෙංගු උවදුර වැඩිපුර තිබූ විලේගොඩ කාණු පද්දතියත් මගේ ප්‍රතිපාදන ලැබුනහම කාණුත් සමග පාරත් හැදුවා. අපි අවශ්‍ය තැනට ප්‍රතිකර්මය කල යුතුයි. ඒ නිසා අපි සියලු දෙනාටම ඉදිරියට එන වැසි කාලයත් වැඩි උනොත් ප්‍රශ්නයක් වෙනවා. අම්බලන්ගොඩ ව්‍යාපාරයක් කරන නෝනටත් මහත්තයටත් දෙන්නටම ඩෙංගු හැදුනා. නෝනා මැරුණා. මහත්තයා ඉස්පිරිතාලෙ. අන්තිම අමාරුයි. පසුගිය 2016, 2017 අවුරුදු වල මේ වගේ තත්වයක් තිබුනෙ. මේ පිළිබඳව අවධානය යොමු කරලා මේ අයට ස්තුතිය පුද කරලා ලිපි යැවීමටත් 2018 අවුරුද්ද අම්බලන්ගොඩ ඩෙංගු උවදුරෙන් අපේ අහිංසක දූ දරුවන් ආරක්ෂා කර ගන්නා අවුරුද්දක් බවට පත්කර ගන්න සියලු දෙනාගේ ශක්තිය, ධෛර්යය එකතු කරන්න කියමින් මම නිහඩ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්**

අපගේ විපක්ෂනායකතුමා විසින් කල යෝජනාව සාර්ථක යෝජනාවක්. අපි ස්තුතිය ප්‍රකාශ කරනවා. විශේෂයෙන් ඩෙංගු ගැන කථා කරන විට අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය සේවක මහතුන් සමග ඉතා සුහදව කලයුතු කාර්යයන් ඉතා සාර්ථක ලෙස කිරීම තුළ තමයි අම්බලන්ගොඩ නගරය ඩෙංගු උවදුරින් බේර ගන්න පුළුවන් උනේ. විශේෂයෙන් අපගේ සෞඛ්‍ය අංශයේ සේවක මණ්ඩලයත් කැපවීමෙන් වැඩ කරලා එතුමියට ලොකු ධෛර්යක් ලබා දුන්නා. විපක්ෂ නායකතුමා කිව්වා වගේ ඩෙංගු මර්ධනය සඳහා සහයෝගය ලබා දීමට කටයුතු කල අයට ස්තුති කරමින් ඒ අවශ්‍යතාවය එතුමා කියූ පරිදි කටයුතු කරන්න ඉල්ලනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියකතා කරමින්**

ගරු සභාපතිතුමනි, මමත් විපක්ෂ නායකතුමාට ස්තුතිය ප්‍රකාශ කරන්න කැමතියි. මොකද කාලෝචිත යෝජනාවක්. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඉතා දක්ෂ ලෙස ඉටු කල නිසා තමයි අම්බලන්ගොඩ නගරය ඩෙංගු වලින් බේර ගන්න පුළුවන් උනේ. කොළඹ නගරයේ ඩෙංගු වලින් ගොඩක් මිය යනවා. අම්බලන්ගොඩ නගරය ඒ අතින් වාසනාවන්තයි. කාර්ය මණ්ඩලයේ දක්ෂතාවය නිසා මාත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය ගන්නා ඇප කැපවීම මත විශේෂයෙන් සභාපතිතුමා කාලෝචිතව ගත් මෙම යෝජනාව සම්බන්ධයෙන් ස්තුතිය ප්‍රකාශ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඩෙනට් පනියන්දුව මන්ත්‍රීතුමා ඉදිරිපත් කල ස්තුතිය ප්‍රකාශ කිරීමට ගත් යෝජනාව ඉතා කාලෝචිතයි. මෙවැනි දේ නොකරන තාක් අපගේ නිලධාරීන් මහජනතාව වෙනුවෙන් උනන්දුව කැපවීම පිළිබඳ තක්සේරුවක් අපි විසින් දී නෑ. අපි සෞඛ්‍ය කමිටුවේදීත් ස්තුතිය ප්‍රකාශ කරා. ඊට එහා ගිය ස්තුතියක් මේ තුළ තියෙනවා. බලපිටිය රෝහලේ වෛද්‍ය කාර්ය මණ්ඩලයට ඔවුන් කල සේවය වෙනුවෙන් , අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය ඇතුලු සියලුම කාර්ය මණ්ඩලයටත්, අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ඇතුලු සියලුම සුල් සේවකයින්, නිලධාරි මණ්ඩලය ලේකම්තුමිය ඇතුලු කර්මාන්ත අංශයේ සියලු දෙනාටත් මෙම ස්තුතිය කෘතවේදිත්වය ප්‍රකාශ කරන්න කැමතියි. විශේෂයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ මෙම කාල වකවානුවේ මහජන සෞඛ්‍ය තුමන්ලා කටයුතු කල ආකාරය සංජීව මහත්තයා ස්ථාන මාරු වෙලා බලපිටිය ප්‍රදේශයට ගිහින් මම දැක්කා පාරේ බැහැගෙන වැඩ කරනවා. කලින් තිබු තත්ත්වය දිගටම කරගෙන යන තත්ත්වයක් දැන් පෙන්නේ නැහැ. ඒ නිසා මහජන පරීක්ෂක තුමාගෙන් ඉල්ලා සිටිනවා අම්බලන්ගොඩ නගරය ඩෙංගු උවදුර උස්සන්න කලින් නැවතත් තිබුන ආකාරයටම සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හා සේවකයින් සමඟ එකතු වී ඒ ක්‍රමවේදය ඉදිරියටම කරගෙන යන්න. කියලා . ඩෙංගු උවතුර මැඩලීම සඳහා අපගේ සුවිශේෂ දායකත්වය ලබාදී තියෙනවා. නගරයේ ජනතාව වෙනුවෙන්. දූමායනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ඩීසල් , අවශ්‍ය මිල මුදල්, සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය මුදල් අපේ මන්ත්‍රිවරුන්ගේ අනුමැතිය යටතේ ලබාදී තිබෙනවා. මේ සියළුදේ යටතේ නගරයේ ජනතාව සෞඛ්‍ය සම්පන්නව සිටිම සඳහා මේ යෝජනාවේ කියවෙන සියළුම නිලධාරීන්ට අපගේ නගර සභාවේ සුවිශේෂ ස්තුතිය හා කෘත වේදීත්වය පල කරමින් ඒ සඳහා ලිපි නිකුත් කරන ලෙස ඉලමින් මේ යෝජනාවට ස්තුතිවන්ත වෙමින් නිහඩ වෙනව.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ඩෙනට් මන්ත්‍රි තුමා ඩෙංගු උවදුර සම්බන්ධයෙන් කල යෝජනාව ගැන ස්තුති වන්ත වෙනවා. සරත් මන්ත්‍රිතුමා කීවවගේ මුලිකත්වය දැරුවා රාජ්‍ය ආයතන කිහිපයක්. නාවික හමුදාව, පොලිසිය, හමුදාව නගර සභාවේ සියළුම නිලධාරීන් එකතුවෙලා මුලිකත්වය දැරුවා. මහජන සෞඛ්‍ය නිලධාරි තුමිය ප්‍රමුඛ නගර සභාවේවැඩ කරන සියළුදෙනා මේ කල සේවය අගය කරන්න ඕන. පසුගිය දවස්වල රතු ලේබල් එක ලැබිලා තිබුනෙ. ඩෙංගු උවදුර සම්බන්ධව අම්බලන්ගොඩ නගරය තුළ . ඒක සම්පූර්ණයෙන් අවසන් කිරීම සඳහා කටයුතු කලේ මේ ආයතනවල නිලධාරීන්. ඒ සියලු දෙනාට ස්තුතිය පුද කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්**

ඇත්තටම විපක්ෂ නායකතුමා ගෙන ආ යෝජනාව හොඳ යෝජනාවක්. අපි කවුරුත් දන්නවා අම්බලන්ගොඩ නගරය පසුගිය වසරේ ඩෙංගු උවදුරෙන් ඉතාමත්ම කණගාටු තත්වයට පත්වෙලා තිබුනෙ. ලැයිස්තුවල වැඩිම ලෙස ඇතුලත් වෙලා තිබුනෙ අම්බලන්ගොඩ නගරය. අද මේ අවුරුද්ද වන විට මේ තත්වයට ඇති කරන්න හැකි වුනේ අප පාලනයට පත්වෙලා ආවාට පස්සෙ. කථා කරන්න ඕන අපේ සභාපතිතුමා ලොකු වෙහෙසක් ගත්තා. පසුගිය කාලේ අපට අදාල නැති කාණු පද්දතිවල පවා පිරිසිදු කරන්න අපි ක්‍රියාත්මක කලා. අදාල නැති කාණු පිරිසිදු කරන්න අවසරයක් නෑ. බලතලත් නෑ. නමුත් නගරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය බලලා අපට ඒක කරන්න සිද්ධ උනා. ඒ නිසා අපේ සියලු දෙනාට විශේෂයෙන් අපේ සෞඛ්‍ය අංශයේ සේවකයො දැඩි වෙහෙසක් ගත්තා කාණුවල බැහැගෙන. සහයෝගය දැක්වූ රාජ්‍ය අංශවල සියලු දෙනාට. ඒ එක්කම සෞඛ්‍ය අංශයේ සේවකයින්ට විශේෂ ස්තුතියත් පුද කරන්න ඕන. අපේ PHI මහත්තයාට , සෞඛ්‍ය අංශයේ ඉන්න සුපවයිසර් මහත්වරුන්ට. සමහර සුපවයිසර්ලා බැනුම් ඇහුවා මට මතකයි කඩහිමියන්ගෙන් කාණුවල ජලය බස්සවන්න ගියහම. දැඩි වෙහෙසක් අරගෙන ශුද්ධ කරේ. අද මේ තත්වයට පාලනය කරලා තියෙන්නෙ ඒ නිසා. එතුමා ගෙන ආ යෝජනාව හොඳයි. පෞද්ගලිකව ලිපි හදලා ස්තුති කරලා ඒ සියලු දෙනාට යවන්න සභාව තීරණය කලා.

<u>තීරණය</u>

**1. පසුගිය කාලය තුළ නගරයේ ඩෙංගු උවදුර ඉතාම දරුණු ලෙස පැතිරී ගිය බවත්, විශේෂයෙන් විලේගොඩ ප්‍රදේශය අතිශයින්ම දරුණු වූ බවත් සියල්ල දන්නා කරුණකි.**

**2. මෙම වසංගතය තුරන් කිරීම සඳහා නිවාස වලින් ලැබුණු සහායට අමතර වශයෙන් නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සේවකයන්ද, පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ද ඉමහත් කැපවීමක් මෙම උවදුර දුරලීම සඳහා දායක විය.**

**3. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් මෙම උවදුර මැඩලීම සඳහා කල කැප කිරීම අප අමතක නොකල යුතුය.**

**4. ඩෙංගු රෝගය වැළඳීමෙන් රෝහල් ගතවී ප්‍රතිකාර ගත් සියළුම රෝගීන් වෙනුවෙන් බලපිටිය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී මහතා ඇතුළු සියළුම වෛද්‍ය මහතුන්ගේ කැපවීමද මේ අවස්ථාවේදී අමතක නොකල යුතුය.**

**5. එමෙන්ම රෝහල් කාර්යය මණ්ඩලය කල කැප කිරීමද අමතක කල නොහැකිය.**

**මෙම සියළුම අංශ වෙත ඩෙංගු රෝගය මැඩලීම සඳහා කල කැපකිරීමට කෘතගුණ සැලකීමක් වශයෙන් එම ආයතන වෙත නගරය වෙනුවෙන් ස්තුතිය පුද කර ලිපියක් යොමු කිරීමට ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් කරන ලද යෝජනාව සඳහා ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**05.02.07** <u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

**ව්‍යාපෘතියේ නම : අම්බලන්ගොඩ නගර සභාව සඳහා දුරකථන ජාල පද්ධතියක් ස්ථාපනය කිරීම**

**ව්‍යාපෘතිය හැඳින්වීම**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුල වෙසෙන සමස්ථ ප්‍රජාව වෙත අවශ්‍ය පොදු පහසුකම් සපයා ඔවුන්ගේ ආර්ථිකල සාමාජික හා සංස්කෘතික සේවා ඉටු කොට ජීවන තත්වය නංවා සමාජ ප්‍රගතිය ඇති කිරීමේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම උදෙසා නගර සභා සියලුම අංශයන් ආවරණය වන පරිදි තොරතුරු හුවමාරුව පහසු කිරීමේ මාධ්‍යයක් ලෙස අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතියක් ස්ථාපිත කිරීම.

**අභිමතාර්ථ**

නගර සභාවෙන් සපයන සේවාවන් වඩා කාර්යක්ෂමතාවයකින් ඉටු කරවා ගැනීමට අදාල නිලධාරීමහත්ම/මහත්මීන් අප්‍රමාදව සම්බන්ද කරවා ගැනීම අරඹයා මෙම ව්‍යාපෘතිය යෝජනා කර ඇත.

**ප්‍රතිලාභීන්**

- නගර සභාවෙන් සේවාවන් ලබා ගන්නා මහජනතාව
- සභාපති,උප සභාපති ඇතුළු මහජන නියෝජිතයින්
- රාජ්‍ය සේවයේ නිලධාරී මහත්ම මහත්මීන්

**අභ්‍යන්තර දූරකථන සන්නිවේදන ජාලයක් ඇති කිරීම සඳහා යෝජනාවලිය**

අම්බලන්ගොඩ නගර සභාව සඳහා අඩුවක්ව පවතින අභ්‍යන්තර දූරකථන ජාල පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් 2018-06-28 දින පැවති මූල්‍ය කමිටුවේදී නාගරික මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් කරන ලද යෝජනාවක් අනුව මෙම අභ්‍යන්තර දූරකථන සන්නිවේදන ජාල පද්ධතිය ඇති කිරීම සඳහා ලංකා බෙල් ආයතනයෙන් ලබා ගෙන ඇති තොරතුරු (ඇමුණුම 01- මෙසේ ඉදිරිපත් කරමි.

**මෙම යෝජනාවලිය තුළින් පහත සඳහන් ප්‍රතිලාභ භුක්ති විඳීමට හැක.**

- සන්නිවේදන වියදම් අඩුකර ගත හැක.
- මූලික ගෙවීමක් නොමැත. සියලුම උපාංග ගාස්තු අය කිරීමකින් තොරව ස්ථාපනය කරනු ලැබේ.
- සම්බන්ධතා විස්සකින් (20) යුක්ත වේ.
- මාසිකව ගෙවිය යුතු ස්ථාවර ගාස්තුව රු.10,000.00ක් හා අවම ඇමතුම් ගාස්තුව සියලු සම්බන්ධතා සඳහා ස්ථාවර ගාස්තුවද ඇතුලත්ව රු.15,000.00ක අවමයකට යටත් වේ.
- පරිශ්‍රය සහ ශාඛා තුළ රැහැන් රහිත අභ්‍යන්තර සන්නිවේදන පහසුකම්
- ඇමතුම් අදාල පුද්ගලයාට යොමු කිරීම (Call forwarding),ඇමතුම් මාරු කිරීම (transferring),අනවශ්‍ය ඇමතුම් සීමා කිරීම(Restriction)හා ඇමතුම් නවතා තැබීම(Waiting)යන පහසුකම් නොමිලේ ලබා ගත හැක.
- ඉල්ලීම මත විශේෂ IDDගාස්තු හා ලැබෙන ඇමතුම් ගාස්තු නිදහස් වේ.
- දූරකථන ඇමතුම් සඳහා සීමාවන් පැනවීමේ හැකියාව.
- කෙටි මාර්ග කේතයන්(Short Cods)මඟින් ඇමතුම් ලබාගතහැකි වීම.
- සම්භන්ධතාවය සඳහා අවශ්‍ය උපාංග හැර සියලුම අලුත්වැඩියා ගාස්තු අය කිරීමක් නොමැත.

**දැනට පවතින සන්නිවේදන ක්‍රමයේ තොරතුරු**

- දැනට කාර්යාලය තුළ වෙන වෙනම භාවිතා වන ප්‍රධාන සම්භන්ධතා 07ක් පවතී.
- ඒ සඳහා ආසන්න වශයෙන් 2018 මැයි මාසයේ සියලුම සම්බන්දතාවයන් සඳහා රු.31.848.65ක ගාස්තුවක් ගෙවා ඇත.

**නව අභ්‍යන්තර සන්නිවේදනය ස්ථාපිත කිරීමෙන් කාර්යාලයට හා මහජනතාවට ලැබෙන වාසි**

- නගර සභාව තුළ මෙතෙක් පැවති සන්නිවේදන ක්‍රියාදාමය පුළුල් කර වැඩි පහසුකම් සහිත සන්නිවේදන ක්‍රියාදාමයකට අවතීර්ණ විය හැක.
- ඍජුවම කාර්යාලීය ප්‍රධාන අංශයන් සමඟ අපහසුතාවයකින් තොරව සම්භන්ධ විය හැක.

- පාලක පක්ෂයට අවශ්‍ය උපදෙස් ක්ෂණිකව අවශ්‍ය අංශයට ඉතා කෙටි කාලයකින් ලබා දිය හැකි වීම
- පරිපාලනය පහසුවීම
- මහජනතාවට නගර සභාව සමඟ පහසුවෙන් සන්නිවේදන කටයුතු සිදුකරගත හැකි වීම.
- නිලධාරීන්ට පැවති එක් සන්නිවේදන සම්බන්ධතාවයක් වෙනුවට අභ්‍යන්තර උප සම්බන්ධතාවයන් ගණනාවක් ලබා දීමෙන් කාර්යක්ෂම සේවාවක් මහජනතාවට ලබා දිමට පහසුවීම.

**සම්බන්ධතාවය ලබා දීමට යෝජිත ස්ථාන**

| | | | |
|---|---|---|---|
| 01. | සභාපති | 02. | උප සභාපති |
| 03. | ලේකම් | 04. | ගණකාධිකාරී |
| 05. | ප්‍රධාන කළමනාකරණ සහකාර | 06.ප්‍රධානආදායම්කළමනාකරණසහකාර | |
| 07. | ප්‍රජා සංවර්ධන නිලධාරී | 08 | ආරක්ෂක අංශය |
| 09. | සැපයුම් නිලධාරී - ගබඩා | 10. | කර්මාන්ත අධිකාරී (TO) |
| 11. | ආදායම් පරීක්ෂක (R.I) | 12. | පිළිගැනීමේ නිලධාරී |
| 13. | සෞඛ්‍ය අංශය (P.H.I) | 14. | වැඩ අංශය (Supervisor) |
| 15. | මහජන පුස්තකාලය | 16. | විද්‍යුත් පුස්තකාලය |
| 17. | බස්නැවතුම් පොළ | 18. | සුසාන භූමිය (පටබැඳිමුල්ල) |
| 19. | සුසාන භූමිය (පොල්වත්ත) | 20. | ජංගමසේවාසඳහාවාහනයතුල රැගෙනයනදුරකථනය |

ගරු සභාපතිතුමා 12.00 ට පමණ තැවත පැමිණ සභාවේ මුලසුන ගන්නා ලදි.

**ඉහත යෝජනාව පිළිගත යුතු බවට නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මම මේ යෝජනාව කරණු ලැබුවේ ගරු සභාපතිතුමනි, ඇත්තටම අපේ ආයතනයේ දුරකතන මාර්ග 7 ක් තිබුනත් මම මේ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි පොදු දුරකතන මාර්ගයට 58275 ට සම්බන්ධ වෙන්න කොච්චර වේලාවකින් පුළුවන්ද කියන එක. ඒක නිතරම රාජකාරී මට්ටමින් බිසී. මම සුළු උදාහරණයක් දුන්නෙ. අපේ ටෙලිකොම් බිල රු: 31,000/- ක් විතර. මේ මාසේ බිල රු: 44,898/- ක්. මේක අපි මොන තාලෙන් පාවිච්චි කලත් රු: 15,000/- මට්ටමේ ඉන්න පුළුවන් ගරු සභාපතිතුමකි වැඩිපුර පාවිච්චි කරන්නෙ නැත්නම්. මේ දුරකතන මාර්ග විස්සම එකකට එකක් සම්බන්ධ වෙනවා. ඉන්ටකොම් පද්ධතියක තියෙන්නෙ. දැන් මෙතනට උනත් දුරකතන 5 ක් උනත් ගන්න පුළුවන්. නැවත නියමිත ස්ථානයට නැවත ගෙනියන්න පුළුවන්. ඊලගට මේ සියලුම නිලධාරීන් කොළඹ ගියත් ගාලු ගියත් කොහේ ගියත් ඒ ස්ථානයට වාහනයකින් ඒක අරගෙන යන්න පුළුවන්. නැවත එනවිට කාර්යාලයට අරගෙන එන්න පුළුවන්. ඒ දුරකතන රැහැන් රහිත දුරකතන. මේක මුදල් අය කිරීමකින් තොරවයි සපයන්නෙ. ලංකා බෙල් ආයතනයෙන් පිට ඒවාට තමයි මුදල් අය කරන්නෙ. ඒ ගොල්ලො ඉල්ලන්නෙ මාසික ස්ථාවර බද්ද රු:500/- ක් එක සම්බන්ධතාවයකට. එතකොට විස්සට රු:10,000/-කුත් ඊට අමතරව රු:5000/- ක අවම බිලක්. ඒ රු:15,000/- විතරයි උපරිම. එතකොට තව කෙනෙකුට ප්‍රශ්නයක් වේවි මේ රු:35,000/- ටෙලිකොම් බිලයි මේකයි දෙකක් වෙනවා නේද කියලා. හැබැයි මේ විස්ස ඒම තුළ ටෙලිකොම් බිල රු: 3000/- කට රු:5000/- ක සීමාවකට අපට බස්සව ගන්න පුළුවන්. ඒක අත්‍යාවශ්‍ය උනොත් විතරයි අවුට් ගොයින් එක ගන්න ඕන වෙන්නෙ. මොකද ඉන් කමින් තියෙනවා. කොහොමත් නගර සභාවෙ පරණ දුරකතන නිසා එකේ ස්ථාවර දුරකතන ගාස්තු ගෙවන ගමන් අපට මේ දුරකතන වලට සම්බන්ධ වෙලා රු:5000/- ඇතුලෙ උනත්

ඊට එහාට සෑම නිලධාරියෙකුටම යම් සීමාවක් පනවන්න පුළුවන්. ලේකම්තුමියගෙ බිල රු:2000/- නම් අපට ඒ සීමාව ඒ ආයතනයට කිව්වහම ඊට එහා පාවිච්චි කරන්න බෑ. ජාත්‍යන්තර සම්බන්ධතාවය නෑ. ඒවා ඔක්කොම නවත්වන්න පුළුවන්.සභාවෙ අවශ්‍යතාවය මත ලේකම්තුමියගේ හෝ IT නිලධාරිනියගේ ඉන්ටර් නෙට් සම්බන්ධතාවය තියෙනවා නම් ලබා ගන්න පුළුවන්. මෙම සේවාව මම ලබන කෙනෙක්. මම මගේ ආයතනය සඳහාත් දුරකතන 15 ක සේවාවක් ලබා ගන්නවා. මේකෙන් විශාල සේවයක් ලැබෙනවා. නිලධාරීන්ට පහසුයි. සියලු මන්ත්‍රීවරුන්ට පහසුයි. උදාහරණයක් ලෙස ඉරිදට සෙනසුරාදට ආදාහනාගාරය බුක් කරන්නවිදිහක් නෑ. අනිවාර්යෙන්ම මෙතනට එන්න ඕන. අපි දුරබැහැරව හිටියත් ගමේ මරණයක් උනොත් ඒ මනුස්සයා ආදාහනාගාරය බුක් කර ගන්න කෙලින්ම කතා කරන්නෙ මන්ත්‍රීවරයාට. ඒක සම්බන්ධ කර ගන්න විදිහක් නෑ. සිකුරිටි කෙනෙකුට දන්වන්න විදිහක් නෑ. ඒ අනුව බැලුවහම මෙවැනි සේවාවක් තිබීම නගර සභාවක් විදිහට අත්‍යාවශ්‍යයි කියන මතයෙ මම ඉන්නවා. ගරු මන්ත්‍රීවරුන්ගෙ අදහස් ඉදිරිපත් කරලා මේක සම්බන්ධ කර ගැනීම හෝ ප්‍රතික්ෂේප කරන ලෙස මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා කල යෝජනාව ඉතා සාර්ථක යෝජනාවක්. ගැටළුවක් තියෙන්නෙ රු:31,000/- ක බිල ගෙවනවා. දැන් මෙතන එනවා සම්බන්ධතා විස්සක්. එතකොට අපි සිංහල ජාතියනෙ. මේක තියාගෙන තව 20 ක් එකතු කරලා අපට නගර සභාවට තව අමතර රු:20,000/- ක බිලක් එකතු වේද? එහෙම නැතිනම් අපේ ගරු නගරාධිපතිතුමාගෙ එකත් ලේකම්තුමියගේ දුරකතනයත් තියෙද්දි අනෙක් 20 ට ගිහිල්ලා මහජනතාව වෙනුවෙන් මේ දේ කරන එක හොඳයි. මොකද අලුත් තාක්ෂණය දියුණු වෙන සමාජය අපි යල්පැන ගිය දේවල්වලින් ඔබ්බට ගිහිල්ලා බුද්ධිමතුන් බිහිකල නගරයක් විදිහට අපි අද සමාජයට උචිත ක්‍රමවේදය හඳුන්වා දෙන්න ඕන ජනතාවට.අනෙක් පැත්තෙන් මූල්‍යමය ගැටළු නිසා තමයි මම අර විදිහට කිව්වෙ. අපි නගරාධිපතිතුමාගෙ එකත් ලේකම්තුමියගෙ එකත් තියලා ඒවායෙන් දුරකතන අඩු කරලා අපි බලමු. නැත්නම් ඒ දුරකතන 7 තියාගෙන අපි පාලනයක් ඒ දුරකතන 7 ට දාලා මේ 20 ත් අරගෙන බලමු . සීමාව මීට රු: 5000/- ට ඉක්මවා ගියාට කමක් නෑ. රු:35,000/-, රු:40,000/- ගියාට කමක් නෑ. මහජනතාවට මේකෙන් ලොකු සේවයක් වන නිසා. ඊට පස්සෙ අපි බලමු මේක අපට දරා ගන්න බැරි විදිහට රු:60,000/-, රු:70,000/- යනවා නම් මේක ගැටළුවක් වෙනවා. එහෙම නම් ඔබතුමාගෙත් ලේකම්තුමියගේත් දුරකතන දෙක තියෙද්දි ඉතිරි දුරකතන ටෙලිකොම් එකේ දුරකතන ඉවත් කරලා මෙම අලුත් තාක්ෂණයත් එක්ක ඉදිරියට ගියාට කමක් නෑ. අපි මහජනතාවට සේවය කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, තමන්ගෙ ආයතන සමූහය තුළ ක්‍රියාත්මක කරලයි අපේ සරත් මැතිදුන් මේ යෝජනාව කරන්නෙ. ඒ වගේම අපේ නගර සභාවට අනුබද්ධිත තව පුද්ගලයො 20 දෙනෙක් එකතු කර ගැනීමේ පහසුකම තියෙනවා. ඒ වගේමයි වඩා වටිනාම සම්පත මූලධනයයි. මූලධනය අඩු කර ගැනීමේ හැකියාව තිබෙන බවයි ප්‍රකාශ වෙන්නෙ. ඒ නිසා මේ වැඩ පිළිවෙල ඉවත නොලා අපේ නගර සභාවට ආදේශ කරලා බලමු කියලා අපේ ඩෙනට් මන්ත්‍රීතුමාගේ අදහසත් වටිනවා. මොකද අමතර මුදලක් අපි වැය කර නොගෙන යම් ප්‍රමාණයක් අඩු කර ගැනීමට හැකි නම් හොදයි. ඒ නිසා මේ යෝජනාව සඳහා ප්‍රශංසාව පුද කරමින් මෙය ආදේශ කර ගමු යැයි ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගංගේ සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමාගේ යෝජනාව මම ඉතා අගය කොට සලකනවා. හොඳ යෝජනාවක්. අපේ විපක්ෂ නායකතුමා කිව්ව ආකාරයට සභාපතිතුමාගේත්, ලේකම්තුමියගේ දුරකතන පමණක් තියෙද්දි අනෙක් ඒවා ඉවත් කරලා මේ කටයුත්ත ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි. මේ යෝජනාවේ වැදගත්කම තමයි සෞඛ්‍ය අංශයට, PHI මහත්තයට කථා කරන්න වෙන අවස්ථා වෙනවා. ගම් පළාත්වල වෙන දේවල් අනුව ඒ වගේ අවස්ථාවක අපට නගර සභාවට ඇවිල්ලා කෙලින්ම හම්බ වෙනවට වැඩිය , ඒ වගේම නිවාඩු දවසකදී ඒ වගේ ප්‍රශ්නයක් උනොත් කෙලින්ම සෞඛ්‍ය අංශයට කතා කරලා ක්ෂණිකව කාරණය ඉෂ්ට සිද්ධ කර ගැනීමට හැකියාව ලැබෙනවා මේ ක්‍රියාවලිය තුළ. අන්න ඒක නිසා මා හිතනවා මේ යෝජනාව ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා අත්දැකීම් ලබලා

තියෙන නිසා දන්නවා මෙහි ඇති වන ප්‍රතිඵලය. ඒ වගේම අපට ලාභයක් ඇති වෙනවා කියන අදහසක් අපට හැගෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉතා හොද යෝජනාවක් කියලා හිතනවා.

__ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්__

සභාපතිතුමනි, සරත් මන්ත්‍රීතුමා ගෙන එන ලද මෙම නව දුරකතන පැකේජය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාවට මම ස්තූතිවන්ත වෙනවා. නමුත් ටෙලිකොම් එකෙත් තියෙනවා මේ ක්‍රමයම. නමුත් මම සමූපකාරයේ සිටියදී ලංකා බෙල් එක ක්‍රියාත්මක කරා. අසාර්ථකයි. අසාර්ථක උනේ සමහර විට ෆෝන්වල ඇහෙන්නෙ නෑ. දාන්නෙ බාල ෆෝන්. ඉතිං ඔය වගේ ගැටළු ගොඩක් ආවා. බැටරි බහිනවා. පිටට ගන්න විට වෙනම අය කිරීමක් එනවා. පස්සෙ බැලුවා මේක හරි යන්නෙ නෑ. ටෙලිකොම් එකේ එක ගත්තා. මම හිතන්නෙ ඒක තමයි දැනුත් තියෙන්නෙ. ඔබතුමාට සොයලා බලන්න පුළුවන්. ආයතන වලින් බලලා තමයි ඔය සම්බන්ධයෙන් දැනුම තියෙන තාක්ෂණය පිළිබදවත් පොඩ්ඩක් සොයලා බලලා ක්‍රියාත්මක කරා නම් හොදයි. ටෙලිකොම් එකේ ලෑන්ඩ් ෆෝන් එකේ තියෙන වටිනාකම තරම් මොකක්වත් නෑ. මුදල ගෙවනවා වගේම සේවයත් වෙනවා. ඇතුලත කෙරෙන කාර්ය භාරයන් තුල අපේ ලේකම්තුමිය වගේ නිලධාරීන් ඒක කරන්න ඕන. මේක හොදයි ටෙලිකොම් එකෙනුත් විස්තර අහලා හොද එක ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

මත දෙකක් ඇවිල්ලා තියෙනවා. මොකක්ද ක්‍රියාත්මක කරන්නෙ?

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි , මෙතුමා කිව්වා වගේ ටෙලිකොම් එක රාජ්‍ය ආයතකයක්නෙ. ටෙලිකොම් එකෙනුත් මේ පිළිබදව විමසලා . මොකද අලුතෙන් ලයින් ගන්න ඕන නෑ. ටෙලිකොම් ලයින් 7 ක් තියෙන නිසා. ටෙලි කොම් එකේ මේ ක්‍රමයම තියෙනවා නම් ඒ පහසුකම් ටික අපට සපයනවා නම් අපි ටෙලිකොම් එකෙන් ගමු. අපි අමතර මුදලත් දරන්න උවමනා නැනෙ.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

ලේකම් මිස් මෙහෙමයි. මේ ආයතන දෙකෙන්ම වෙනසත් එක්ක වාර්ථාවක් ලබන සභාවට ඉදිරිපත් කරන්න ඊට පසුව අපි තීන්දුවක් ගමු.

*__තීරණය__*

**අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රෙද්ශය තුල වෙසෙන සමස්ථ ප්‍රජාව වෙත අවශ්‍ය පොදු පහසුකම් සපයා ඔවුන්ගේ ආර්ථික , සමාජීය හා සංස්කෘතික සේවා ඉටුකොට ජීවන තත්ත්වය නංවා සමාජ ප්‍රගතිය ඇති කිරීමේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම උදෙසා නගර සභා සියලුම අංශයන් ආවරණය වන පරිදි තොරතුරු හුවමාරුව පහසු කිරීමේ මාධ්‍යයක් ලෙස අභ්‍යන්තර දුරකථන ජාල පද්දතියක් ස්ථාපිත කිරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව ඉදිරිපත් කරන ලද ලංකා බෙල් ආයතනයේ පවතින එම පහසුකම් පිළිබඳ තොරතුරු ටෙලිකොම් ආයතනයෙන්ද ලබා ගෙන එහි වාර්තාවක් ලබන සභාවට යොමු කරන ලෙසට ගරු සභාව විසින් දැනුම් දෙන ලදි.**

**(06)** රක සභාවාර්තාසලකාබැලීම

**6: 1 2018-07-20 දිනඅම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව**

**2018 ජූලි මස 20 වන දින පුස්තකාල කමිටු වාර්තාව**

| | |
|---|---|
| ගරු සභාපති | ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා |
| ගරු නගර සභා මන්ත්‍රී | ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා |
| ගරු නගර සභා මන්ත්‍රී | ධනසේන මාදුවගේ මහතා |
| කමිටු සාමාජික | හර්බට් වීරක්කොඩි මහතා |
| කමිටු සාමාජික | එන්.එච්.ඩන්කන් ද සිල්වා මහතා |
| කමිටු සාමාජික | සුගත් හෙට්ටිආරච්චි මහතා |
| කමිටු සාමාජික | එම්.ඒ.ජයවීර මහතා |
| කමිටු සාමාජික | සිරිපාල මාදුවගේ මහතා |
| කමිටු සාමාජික | ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතා |
| ප්‍රධාන කළමණාකරණ සහකාර | එච්.පී.මිහිරි ද සිල්වා මිය |
| පුස්තකාලයාධිපති | කේ.ඩබ්ලිව්.රංජනී මානෙල් මෙනවිය |
| පුස්තකාලයාධිපති | ඩී.මහේෂා තාබ්‍රේව් මෙනවිය |
| පුස්තකාල සහායිකා | ඒ.ජී.ලක්ෂ්මී පෙරේරා මෙනවිය |
| පුස්තකාල සහායිකා | ජී.එච්.එල්.පියන්ති මෙනවිය |
| පුස්තකාල සහායිකා | බී.එච්.දයාලතා මිය |
| පුස්තකාල සහායිකා | එම්.ඩබ්ලිව්.ජිනේකා සුමංගලී මිය |
| පුස්තකාල සහායිකා | එස්.එම්.මනෝරි චන්ද්‍රවංශ මිය |
| පුස්තකාල සහායිකා | මාලති සමන්තා ආරියසිංහ මිය |
| පුස්තකාල සහායිකා | එස්.සුසිලා දීපානි මිය |
| පුස්තකාල සහායිකා | කේ.ඒ.විසුද්ධි රේණුකා මිය |

**අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මූලාසනය දැරූ 2018/07/20 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව**

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණීමෙන් පසුව ප.ව. 2.30 ට පුස්තකාල කමිටුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

එතුමා විසින් කමිටුවට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරු කමිටු සාමාජික මහතුන් සහ ප්‍රධානකළමණාකරණ සහකාරතුමිය සහ පුස්තකාලයාධිපතිවරියන් ඇතුළු සියලුම මහත්ම මහත්මීන් පිළිගන්නා ලදී.

ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා සහ ටී.ඩබ්ලිව්.හරිස්චන්ද්‍ර මහතා පුස්තකාල කමිටුවට සහභාගී වීමට නොහැකි බව දන්වා එවා තිබූ ලිපි ගරු සභාපතිතුමා විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදු කරන ලදී.

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින්ද ශාඛා පුස්තකාල වල ප්‍රගතිය ඒඒ ශාඛා භාර පුස්තකාල සහායිකාවන් විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදී. විද්‍යුත් පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ජී.එච්. එල් .පියන්ති මෙනවිය විසින් ඉදිරිපත් කරන ලදී.

ජාතික කියැවීම් මාසය පිළිබඳ සාකච්ඡා කිරීම.

ජාතික කියැවීම් මාසය අරමුණු කර ගනිමින් පවත්වනු ලබන විශේෂ වැඩ සටහනේ ප්‍රධාන ආරාධිත දේශනයට මහාචාර්ය ජේ.බී.දිසානායක මහතාගේපැමිණීම ඔක්තෝම්බර් මස19 වන දින යොදා ගත්

බව ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා පුස්තකාලයාධිපති ට දැණුම් දුන් බව එතුමිය විසින් කමිටුවට දන්වන ලදී.

ඉදිරියේදී පවත්වන 6,7,8 ශ්‍රේණි සඳහා අත් අකුරු තරගය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීම සුදුසු බව එම්.ඒ.ජයවීර මහතා කමිටුවට යෝජනා කරන ලදී. එම තරගය සඳහා වැයවන ඇස්තමේන්තු මුදල අනුමත වී ඇති බැවින් ඒ පිළිබද ප්‍රශ්ණයක් මතු වන නිසා එය ලබන වසරේදී පැවැත්වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදී.

ජාතික කියැවීම් මාසයේ උත්සවයට මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියගෙන් කරුණු විමසන ලදී.

දැනට සියලුම ආයතන වෙත ලිපි මඟින් දැනුවත් කර ඇති බවත් එම ලිපි ප්‍රධාන කාර්යාල වෙත යවා අනුමැතිය ලබා දුන් පසු මුදල් වෙන් කරන බව දන්වන ලදී.

පොත් ප්‍රකාශකයන්ගෙන් කියැවීම් මාසයේ උත්සවයට මුදල් ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කළේය.

ප්‍රධාන හා ශාඛා පුස්තකාල සඳහා පොත් රාක්ක සෑදීමට අවශ්‍ය දැව ලබා දුන් බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදී.

ප්‍රධාන පුස්තකාලයේ පාඨක පිරිස 7500 ට වඩා වැඩි බැවින්ඉඩ කඩ පිළිබඳප්‍රශ්ණයක් මතු වෙන බව සිරිපාල මාදුවගේ මහතා කමිටුවට දන්වන ලදී. එහිදී ගරු සභාපතිතුමා දන්වා සිටියේ කියැවීම් ශාලා ඉදිකිරීමට බලාපොරොත්තු වන බවය.

පෝරඹ පුස්තකාලයඉදිරිපිට ඇති මුරකුටිය සම්බන්ධයෙන් ජී.ඩබ්ලිව්.ගුණසිරි මහතාගේ යෝජනාව වුයේ එම කුටිය පරණ පත්තර තැබීමට යොදා ගැනීම සුදුසු බවය. ඉදිරියේදී පත්තර වෙන්දේසිය පැවැත්වෙන බැවින් ඉතා ඉක්මනින් එම ප්‍රශ්ණයට විසඳුමක් ලැබෙන බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදී.

ප්‍රධාන පුස්තකාලයට Sunday Times පුවත්පත ගැනීම සුදුසු බව පාඨක අදහස් පොතේ පාඨකයකු ඉල්ලා ඇති බැවින් එය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා පුස්තකාලාධිපතිනියට දැනුම් දෙන ලදී.

ප්‍රධාන හා ශාඛා පුස්තකාලවල පාඨක අදහස් පොත පුස්තකාල කමිටුවට පැමිණෙන විට රැගෙන ඒමට කටයුතු කරන ලෙස සභාපතිතුමා පුස්තකාල කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදී.

එහිදී පාඨක අදහස් පොත අනුවප්‍රධාන හා ශාඛා පුස්තකාලයකටම අවශ්‍ය වී ඇත්තේ අලුත් නව කතා පොත් ලබා ගැනීම බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදී. එහිදී තීරණය වූයේ ප්‍රධාන හා ශාඛා පුස්තකාල සඳහා රුපියල් ලක්ෂ දෙකකමුදලක් වැයකර අලුත් නවකතා පොත් මිළදී ගැනීම සුදුසු බවයි. එම පොත් මිළදී ගැනීම සඳහා ඉදිරි කටයුතු කිරීමට පුස්තකාලයාධිපතිනිය දැනුවත් කරන ලදී.

මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ වහල කැඩී ඇති බැවින් කාර්මික නිලධාරී මහතෙකු යොදවා මේ පිළිබද පරික්ෂා කර බලා ප්‍රධාන කළමණාකරන සහකාරතුමියට ඉදිරි අවශ්‍ය කටයුතු සිදුකිරීමට උපදෙස් ලබා දෙන ලදී.

ඕකන්ද ශාඛා පුස්තකාලයට ළමා පුටු හතරක් සහ ළමා මේසයක් අවශ්‍ය බව එම ශාඛා පුස්තකාලය භාරපුස්තකාල සහායිකාව විසින් කමිටුවට දන්වන ලද අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට ප්‍රධාන

කළමණාකරණ සහකාරතුමියට දන්වන ලදී. ඕකන්ද ශාඛා පුස්තකාලයේ විදුලි බල්බ පිළිසකර කිරීම ප්‍රමාද බව එම සහයිකාව කමිටුවට දන්වන ලදී. ඒ සඳහා අවශ්‍ය වයර් නොමැති බව එය ලබා ගැනීමට අනුමැතියට යවා ඇති බව ප්‍රධාන කළමණාකරණ සහකාරතුමිය කමිටුවට දන්වන ලදී.

පෝරඹ ශාඛා පුස්තකාලයේ පුටුවල කුෂන් කැඩී ඇති බැවින් ඒ සඳහා වැල් පුටු ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන කළමණාකරණ සහකාරතුමියට දන්වන ලදී.

හිරේවත්ත ශාඛා පුස්තකාලයේ වතුර ටැංකිය තබා ඇති කණු දිරාපත් වී ඇති බැවින් එය පුස්තකාල ගොඩනැගිල්ලට හානිවිය හැකි බව එම සහායිකාව පෙන්වා දෙන ලදී. එයට අවශ්‍ය කටයුතු කිරීමට කාර්මික නිලධාරීන් දැනුවත් කර ඉදිරි කටයුතු කිරීමට දන්වන ලදී.

අලුතින් සාදා ඇති වැසිකිලි පද්ධතිය කාර්ය මණ්ඩලයේ භාවිතයට ගැනීමට සුදුසු ලෙස සකස් කර දෙන බව ගරු සභාපතිතුමා කමිටුවට දන්වන ලදී.

වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් ස්වෙච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ කටයුතු අවසක් කරන ලදී.

......................................
කමිටු ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ

.......................................
ලේකම්
නගර සභාව අම්බලන්ගොඩ

..................................
අත්සන් කළේ සභාපති
නගර සභාව අම්බලන්ගොඩ

**2018-07-20 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රීජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඕකන්ද ශාඛා පුස්තකාලයට ළමා පුටු හතරක් සහ ළමා මේසයක් අවශ්‍ය බව දන්වන තියෙනවා. කරන්ට් එක දීලා නෑ වයර් නොමැති නිසා. ඒ ටික කරලා දෙන්න පුළුවන්නෙ සභාපතිතුමා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

TOමහත්තයා ලබන සුමානෙ වනවිට ඒ වැඩය ඉෂ්ට කරලා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ වහල ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා මාස තුනක් තිස්සෙ කියනවා. තාම නෑ ඒක කරලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

TOමහත්තයාමහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ වහලත් ප්‍රතිසංස්කරණය කරලා දෙන්න.

**2018-07-20** දින ප.ව 2.30ට පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**6: 2 2018-07-17** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව

පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව

**2018.07.17 ප.ව.2.30**

සහභාගීත්වය

1. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප්. ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.
2. ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
3. ඒ.ඩබ් ජගත් කුමාර. ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. ග්‍රේෂන් කෙරමිණියගේ ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
5. ජී.ජී රුවිනි පේෂලා ගරු නගර සභා මන්ත්‍රීනි, අම්බලන්ගොඩ නගර සභාව.
6. බී.ඒ ධම්මිකා. ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.
7. වෛද්‍ය එල්.එච්.ඒ එස්. කුමාර. අතිරේකසෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ.
8. වෛද්‍ය වී.ජී.සී ජීවනී. පශු වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ.
9. බී.එම්.යු.කේ ප්‍රනාන්දු (මහේෂ්) මහජන සෞඛ්‍ය පරීක්ෂක ,අම්බලන්ගොඩ උතුර.
10. ඩී.එස්.ඊ ගමගේ. පවුල් සෞඛ්‍ය සේවිකා, සෞ.වෛ.නි කාර්යාලය.
11. පී.එච් අමිත් ක්‍රශාන්ත පර්යන්ත පරිපාලක ධීවර වරාය, අම්බලන්ගොඩ.
12. ජී.ජී රන්දික මධුෂාන් ග්‍රාම නිලධාරී, 85 පටබැඳිමුල්ල
13. ටී.ඒ.සී.එන් කුමාරි ග්‍රාම නිලධාරී, 83ඒ, හෙප්පුමුල්ල.
14. පී.එම් විජේසිංහ තාක්ෂණ සේවා නිලධාරී.අම්බලන්ගොඩ නගර සභාව
15. පී.එච්.එල්.සී පුෂ්පරාණි සංවර්ධන සහකාර.අම්බලන්ගොඩ නගර සභාව
16. ඒ.අයි සාරංග සෞඛ්‍ය පරිපාලක.අම්බලන්ගොඩ නගර සභාව

**පිළිගැනීම**

ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා.පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, ඇතුළු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා නගර සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනුලබන බව පවසන ලදි.

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග. | සාකච්ඡා වූ කරුණු. | තීරණය. |
|---|---|---|---|
| **2018**.06.19 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය. | | | |
| මාළු අපද්‍රව්‍ය කු.ප.නි.ස සනත් මහතාගේ තිලකපුර පිහිටි ගොවිපලට භාර දීම | | මාළු අපද්‍රව්‍ය භාර ගැනීම සඳහා මුදල් අය කළ යුතු බව | |

| | | | |
|---|---|---|---|
| අත් කරත්ත 5ක් මිල දී ගැනීම. | පුෂ්පරාණි මිය | වත්තෙගම නගර සභාවෙන් අත් කරත්ත සඳහා මිල ගණන් කැඳවා ඇති බව. | කොළඹ නගර සභාවෙන් හා තවත් ආයතනයකින් මිළ ගණන් කැඳවිය යුතු බව. |
| ධර්මාශෝක විද්‍යාලය ඉදිරිපිට පාළුවට ගිය ඉඩමේ ඇති කසල ගොඩ වරින් වර ගිනි ගන්නා බැවින් එය ඉවත් කිරීමට පියවර ගැනීම. | | | එම කසල ගොඩ ඉවත් කරන ලෙස සෞඛ්‍ය පරිපාලක සාරංග මහතාට උපදෙස් ලබා දෙන ලදි. |
| සභාව සතු වාහන හා සේවකයන් යොදාගෙන කාණු පවිත්‍ර කිරිම. | ගරු නගර සභා මන්ත්‍රී, ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා | එය ඉටුවන බව | |
| මහ වීදිය රාජපක්ෂ ස්ටෝර්ස් අසල කාණුව ඌරු මීයන් හාරා ඇති බැවින් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගෙන එම ස්ථාන ශුද්ධ කර වසා දැමීම | තාක්ෂණ සේවා නිලධාරී.පී.එම් විජේසිංහ | කාණුවේ වතුර හා පස් පිරී තිබීම නිසා ඌරු මීයන් හාරන ලද ස්ථාන සොයා ගත නොහැකි වූ බව. | |
| | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | අවමංගල්‍ය අවස්ථාවන් සඳහා පාරට වැලි දැමීම සිදු කරන අතර එම වැලි සේදී කාණුවලට එකතුවන බව. මෙය අම්බලන්ගොඩ ප්‍රදේශයේ පමණක් දක්නට ලැබෙන චාරිත්‍රයක් බව. | අවමංගල අවස්ථාවන් සඳහා බලපත්‍ර ලබා ගැනීමේදී පාරට වැලි දැමීම සිදු නොකරන ලෙස එම පුද්ගලයන් දැනුවත් කිරීම. |
| දිස්නි පාර, කරිත්තකන්ද කුලරත්න හරස් පාරට හැරෙන ස්ථානය යන තන්හි ඇති බෝක්කු පිළිසකර කිරීම. | තාක්ෂණ සේවා නිලධාරී.පී.එම් විජේසිංහ | දිස්නි පාරට හැරෙන ස්ථානයේ කාණුවක් නොමැති අතර පළාත් මා.ස.අධිකාරිය මගින් කාණුව සකස් කළ යුතු බව.කරිත්තකන්ද කුලරත්න හරස් පාරට හැරෙන ස්ථානයේ අවශ්‍ය මිනුම් ලබා ගත් බව | |
| පටබැඳිමුල්ල රේණුක මෝටර්ස් අසල නිවාස 10ට අයත් පොදු නාන ළිඳ පිරිසිදු කිරීම හා මායිම් නිරවුල් කිරීම | තාක්ෂණ සේවා නිලධාරී.පී.එම් විජේසිංහ | ලබා දී තිබූ පිඹුරු සැලැස්ම ළිඳ පිහිටි ඉඩමේ පිඹුරු සැලැස්ම නොවූ හෙයින් මායිම් නිරවුල් කිරීම සිදු කළ නොහැකි බවත්, අලුත්වැඩියා කළ යුතු ස්ථාන සටහන් කර ගත් බව. | |
| වරාය භූමිය තුළ ෆයිබර් කැබලි විශාල වශයෙන් ගොඩගැසී ඇති බව | | හල්වතුර භූමියේ වල දැමීමට වලවල් හැරීමේදී වතුර එන නිසා එය කළ නොහැකි බව. | |

| | | | |
|---|---|---|---|
| | පර්යන්ත පරිපාලක පී.එච් අමිත් ක්‍රශාන්ත | පිලිස්සීමේ පිටවන දුම විෂ සහිත බවත්,මේ තත්ත්වය විශාල ගැටළුවක් බවත්, මෙමගින් ඩෙංගු අවධානමක් ඇති විය හැකි බව. | |
| | ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් ජගත් කුමාර | අධික උෂ්ණත්වයේ පුලුස්සන බැවින් සිමෙන්ති නිශ්පාදනය කරන හොල්සිම් ආයතනයට ලබා දිය හැකිද යන්න සොයා බැලීම සුදුසු බව | |
| | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | හොල්සිම් ආයතනයට ලබා දිය හැකිද යන්න සොයා බලන ලෙසත් එම ආයතනය ලබා ගන්නේ නම් කුඩා කැබලිවලට කඩා ඩ්‍රම් ට්‍රක් රථයෙන් ප්‍රවාහනය කළ හැකි බව, | තෙල් සපයා ගැනීමේ පදනම මත ෆයිබර් කැබලි ප්‍රවාහනය කිරීම සඳහා ඩ්‍රම් ට්‍රක් රථය ලබා දිය හැකි බව. |
| මාළු ලැලි ඉවත් කිරීම | නගර සභා ලේකම්, බී.ඒ ධම්මිකා. මිය | හෙට දිනයේ එම කාර්යය ඉටු කිරීමට නියමිත බව | |
| | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | සභාවේ බැකෝ යන්ත්‍රය හා සේවකයන් යොදවා එම කාර්යය ඉටු කිරීම අපහසු බව. | මාළු ලැලි කඩා ඉවත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම |
| **ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම** | | | |
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳ පළාත් පාලන ආයතන වෙත සුදුසු ඉඩම් ලබා ගැනීම. මැයෙන් 2018.06.25 දින පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමු කරන ලද ලිපිය. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | නගර සභාවට කසල දැමීම සඳහා තිබූ දළුක්කන්ද ඉඩම සුනාමි නිවාස ඉදිකිරීම සඳහා අකමැත්තෙන් වුව ද ඒ මොහොතේ ලබා දීමට සිදු වුණා. මෙම ලිපියට අනුව අක්කර 5ක පමණ විශාල ඉඩමක් අප සොයා ගත යුතුව තිබෙනවා. එය කඳු ප්‍රදේශයක් වේ නම් වඩා සුදුසුයි. ඊට හේතුව කසල වලින් බේරීයන අප ජලය පහලට ගලා එන විට පෙරී පිරිසිදු වන නිසා. | |
| | ගරු නගර සභා මන්ත්‍රී, ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා | එවැනි ඉඩමක් නගර සභා සීමාවේ හෝ අවට සභාවලවත් නොමැති බව. | |
| | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | හල්වතුර ඉඩමේ නියමිත ප්‍රමිතින්ට අනුකූලව කටයුතු කර පරිසර නිර්දේශය ලබා ගැනීම. | කසල කළමනාකරණයට සුදුසු අක්කර 5ක පමණ ඉඩමක් තිබේද යන්න සොයා බවන ලෙස කමිටු සාමාජිකයන් වෙත දැනුම් දීම. |

| අදහස් හා යෝජනා | | . | . |
|---|---|---|---|
| වැසි ජලය බැස යාම සම්බන්ධ ගැටළුව. | ගරු නගර සභා මන්ත්‍රී, ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගොවිජන සේවා කාර්යාලයේ සේවය කර විශාමික ශාන්ති මියගේ ඉඩමට වැසි ජලය ගලා ඒම වලක්වා ගැනීමට අදාළ පැමිණිල්ල සම්බන්ධව වර්තමාන තත්ත්වය කුමක්ද යන වග. | වැසිජලය බැසයාම සඳහා දමා ඇති බව ඉවත් කරන්න සාමාන්‍ය ක්‍රමයට ජලය බැස යාමට සැලැස්වීම සුදුසු බව. |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත පැවරීම. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | මා වෙත පැවරී ඇති සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධ බලතල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත පවරන ලිපිය කඩිනමින් යවන්න | |
| කාණුවලින් ගොඩ දමන පස් ඉතා කඩිනමින් ඉවත් කළ යුතු බව. | ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | කාණුවලින් ගොඩ දමන පස් එසේ තිබුණහොත් නැවත කාණුවලට එකතු වීම. | |
| | සෞඛ්‍ය පරිපාලක ඒ අයි සාරංග මහතා. | පස්වල තෙත ගතිය ඉවත් වන තුරු පැටවීමට අපහසු නිසා එසේ සිදු වන බව. | කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බව. |
| | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | කුඩා කසල ප්‍රමාණයක් පාරවල්වල තිබුණහොත් ටැක්ටරයට දමා ගන්නා ලෙස දන්වන්න. | පාරවල්වල තිබෙන කුඩා කසල ප්‍රමාණයන් ඇදීම සඳහා එම අවස්ථාවේම සුදුසු මුදලක් අය කර එය ඉවත් කරන්න. |
| | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | රාත්‍රී වැඩ මුරය ප.ව 6.00ට අරම්භ කිරීම නුසුදුසු බව. වෙළඳ සැල් වසනු ලබන්නේ ප.ව 6.30ට පමණ බැවින් රාත්‍රී වැඩ මුරය සවස 6.30ට ආරම්භ කිරීම සුදුසුය. | රාත්‍රී හෝ පාන්දර 3.00ට පමණ බස් නැවතුම්පල පිරිසිදු කිරීමට සේවකයකු යොදවිය යුතු බව |
| සුනඛ වන්ද්‍යාකරණය | ගරු නගර සභා මන්ත්‍රී, ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා | සුනඛ වන්ද්‍යාකරණ කටයුතු සිදු වන්නේද යන වග | |
| | පශු වෛද්‍ය නිලධාරී වෛද්‍ය වී.ජී.සී ජීවනී. | දැනට කාර්යාලයට රැගෙන එන සුනඛයින් නොමිලේ වන්නත් කරනු ලබයි. එන්නත් කරන පුද්ගලයන් පුහුණු කිරීම තවම සිදු කර නොමැති අතර ඉදිරියේදී දකුණු පළාත් සභාව එන්නත් කරන පුද්ගලයන් බඳවාගෙන පුහුණු කිරීමට නියමිත බව. | |

| | | | |
|---|---|---|---|
| දළුක්කන්ද ඉඩම සුනඛයන් සඳහා වෙන් කළ හැකි බව. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | අයාලේ යන සුනඛයින් නිසා මිනිසුන්ට මාර්ගවල ගමන් කිරීම පවා අපහසු වී තිබුණත් ඔවුන් මැරීම සිදු කළ නොහැකි නිසා එක් ස්ථානයකට අල්ලා ගෙන ගොස් දමා මැරෙන තෙක් ජීවත් වීමට ඉඩ සැලැස්වීම සුදුසු බව. ඒ සඳහා අවශ්‍ය ආහාර පාන ආදිය අමාත්‍යාංශය මගින් ලබා දී පාලනය කළ හැකි නම් ඒ සඳහා දළුක්කන්ද ඉඩම ලබා දිය හැකි බව. | |
| | පශු වෛද්‍ය නිලධාරී වෛද්‍ය වී.ජී.සී ජීවනී | එය හොඳ අදහසක් බවත් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබා දිය හැකි බව. | |
| කසල බැහැර කරන ඉඩමේ ගේට්ටුව කැඩී ඇති බව. | සෞඛ්‍ය පරිපාලක ඒ අයි සාරංග මහතා | කසල බැහැර කරන ඉඩමේ ගේට්ටුව කැඩී ඇති නිසා භාහිර පුද්ගලයන් කසල බැහැර කිරීම සිදු කරන බව. | ගේට්ටුව සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව අගෝස්තු සභාවට ඉදිරිපත් කිරීම. |
| පටබැඳිමුල්ල ආදාහනාගාරය ගේට්ටුව කැඩී ඇති බව | ගරු නගර සභා මන්ත්‍රිනී ජී.ජී රුවිනි පේෂලා මිය. | පටබැඳිමුල්ල ආදාහනාගාරය ක්‍රියාත්මක වීමේදී පිටවන දුම දැඩි දුර්ගන්ධයන් හමන බව හා ගේට්ටුව කැඩී ඇති බව | ගේට්ටුව සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව සකස් කිරීම. |
| එකවර ගවයන් දෙදෙනෙක් මිය ගිය බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | ඊයේ බෞද්ධ මධ්‍යස්ථානය අසල හා හෙප්පුමුල්ල ප්‍රදේශයේ එකවර ගවයන් දෙදෙනෙක් මිය ගියා. දෙවන සතා කපා බලන ලෙස අප පශු වෛද්‍යවරයා දැනුම් දුන්නා. | |
| | පශු වෛද්‍ය නිලධාරී වෛද්‍ය වී.ජී.සී ජීවනී | ලන්ච් ශීට් ආහාරයට ගැනීමෙන් ඒවා සිරවීම නිසා හුස්ම ගැනීමට නොහැකි වීම හේතුවෙන් ගවයන් මිය ගොස් තිබූ බව. | |
| ඇල මාර්ග පවිත්‍ර කිරීම. | ගරු නගර සභා මන්ත්‍රී, ජී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | පෝරොක් ඇල,ඕකඩ ඇල,හා මානාන ඇල යන ඇල මාර්ග පවිත්‍ර කළ යුතු බව. | ඇල මාර්ග පවිත්‍ර කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම. |
| ස්තුති කතාව | ගරු නගර සභා මන්ත්‍රී, ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | අද දින කමිටුවට සහභාගී වූ මන්ත්‍රී තුන්පලටත්, අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ පශු වෛද්‍ය නිලධාරිනිය ඇතුළු සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන බව. | |
| නිමාව | | ප.ව 4.30 | |

සකස් කළේ,
සංවර්ධන සහකාර(පරිසර)

නිර්දේශ කරමි, අනුමත කරමි.

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2018-07-17 දින පවත්වන ලද පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රීජී.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඕකඩ ඇල, පෝරොක් ඇල වතුර බහින්නෙ නෑ. කුණු රොඩු ටික අයින් කරලා දෙන්න පුළුවන් නම් හොඳයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ දෙකේම වාරිමාර්ග එකෙන් ඇස්තමේන්තු කර ගෙන ගිහිල්ලා තියෙනවා. ඉදිරියේදී වැඩ ආරම්භ කරාවි නේද කොඩිකාර මන්ත්‍රීතුමා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

මේක ගම්පෙරලිය යටතේ විශාල මුදලක් වෙන් කරලා තියෙනවා. එක ඇලකට ලක්ෂ 35 ක්. ඒක අපට ගත හැකියි. ඔබතුමා මේ ටික එකතු කරලා සංවර්ධන කමිටුවට දාන්න. සංවර්ධන කමිටුවෙදී අපි කියන්නම් ඒ ගොල්ලන්ගෙ ප්‍රතිපාදන වලට දාන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

කරිත්ත කන්දෙන් පෝරොක් ඇල සම්බන්ධ වන පන්සල ලගට යන ඇල මාර්ගය. මේක ගේබ්‍රියන් අල්ලපු නිසා මිනිස් ශ්‍රමයෙන් පමණයි ශුද්ධ කරන්න පුළුවන්. JCBවලින් බෑ. මොකද කම්බි ගැලවිලා එනවා JCB දැම්මොත්. මැද පස් පිරිච්ච නිසා නිවැසියන් අමාරුවෙ වැටෙනවා. වහින වෙලාවට ගිහින් බලන්න. විශාල වතුර ප්‍රමාණයක් කාණුවට එනවා. එතන බ්ලොක් වන නිසා ඒක නිරන්තරයෙන් ශුද්ධ කරන්න වෙනවා. බෙහෙත් දාන්න බෑ මාළු මැරෙන නිසා. මිනිස් ශ්‍රමයෙන්ම ශුද්ධ කරන්න වෙනවා කවුරු හරි දම්මලා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

පොඩි ඉල්ලීමක් කරනවා. අපේ අම්බලන්ගොඩ නගරයත් එක්ක තිබෙන හැමදේම තමයි නගරාධිපතිතුමා දූව අම්බලන්ගොඩ හරහා එන ගඟ අඩි 7 ක් 8 ක් පිරිලා තියෙන්නෙ. මේ ඇලවල්වල තියෙන වතුර බහින්නෙ නෑ. මේකට පුද්ගලික ඉල්ලීමක් මම අතිගරු ජනාධිපතිතුමාගෙනුත්, ගරු අගමැතිතුමාගෙනුත් කරලා තියෙනවා. මේක ශුද්ධ කරලා ඒ ක්‍රමවේදය පාලනය කරන්න. මේක ගංවතුර පාලනයට මූලික දෙයක් කියලා අපි නගර සභාව විදිහට යෝජනාවක් විදිහට සංවර්ධන කමිටුවට දාමු. ඒක තවත් ශක්තියක් මේ ගඟ ශුද්ධ කරල දෙන්න. ඩෙංගු උවදුර වැඩිවෙන්නෙත් මේ නිසා. නොයෙක් බෝ වෙන රෝග ඇති වෙන්න පුළුවන්. ශුද්ධ කරලා දෙන්න කියලා මුදල් ප්‍රතිපාදන ආපු නිසා සභාපතිතුමාට කියලා පුද්ගලිකවම මේකට මුදල් ප්‍රතිපාදන වෙන් කර ගන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනාව අපේ සංවර්ධන කමිටු රැස්වීමට ඉදිරිපත් කරන්න.

**2018- 07- 17 දින ප.ව 2.30 ට පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3 2018- 07- 23 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව**

**<u>ක්‍රීඩා කමිටු වාර්තාව</u>**
**<u>2018.07.23</u>**

**සහභාගිත්වය-**

| | | |
|---|---|---|
| ජී.සරත් ශ්‍රී ලාල් මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව |
| ධම්මික කොඩිකාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි,අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.ජී.ආර්.පී.කේ.ද සිල්වා මිය | - | ගරු නගර සභා මන්ත්‍රිනි,අම්බලන්ගොඩ නගර සභාව. |
| එම්.ඩබ්ලිව්.තරිඳු ප්‍රභාත් මහතා | - | ආචාර්ය.ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලය. |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික පෝරඹඅම්බලන්ගොඩ. |
| ටී.සරත් ශාන්ත මහතා | - | සිංහ ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ. |
| ජේ.ඩබ්ලිව්.ආනන්ද සිල්වා මහතා | - | ඇවිදින්නන්ගේ සංගමය . අම්බලන්ගොඩ. |
| එච්.එල්.ද සිල්වා නිලමුණි මහතා | - | තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා | - | දකුණු පළාත් පා පන්දු පුහුණුකරු |
| බී.ඒ.ධම්මිකා මිය | - | ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.අශෝක කුමාර මහතා | - | ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.වි.තරංගි මිය | - | ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනීම.-ඊ.ඇම්.ඉන්ද්‍රා අයිරාංගනි මිය,ගරු නගර සභා මන්ත්‍රිනි,අම්බලන්ගොඩ නගර සභාව.**

අද දින ගරු සභාපතිතුමා අත්‍යාවශ්‍ය කටයුත්තක් සඳහා බැහැර ගොස් සිටි බැවින් ගරු නගර සභා මන්ත්‍රිනි, ඊ.එම්.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මියගේ ප්‍රධානත්වයෙන් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි.

එතුමිය විසින් අද දින ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි සියළු දෙනා පිළිගන්නා ලදි.

**<u>ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම.</u>**

01. අම්බලන්ගොඩ,පෝරඹ.තොටුපොලපාර,සුගතබිම්බාරාමමාවතේඅංක35හි පදිංචිආර්.ජී.නිමල්චන්ද්‍රසිරිමහතාවිසින්කොලඹ 07,රීඩ්මාවත,ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත, අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන් වෙත පිටපත් සහිතව යොමු කරන ලද“අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණය සහ ක්‍රීඩාගාරය ප්‍රතිසංස්කරණය”කිරීමට අදාළ ලිපිය ක්‍රීඩා කමිටුවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

02. අම්බලන්ගොඩ නගර සභාවේ කාය වර්ධන මධ්‍යස්ථානයේ සේවය කරනු ලබන බී.එච්.මහේෂ් කුමාර මහතා විසින්, තාක්ෂණ සේවා නිලධාරිතුමාගේ වාර්තාවක් සහිතව ශරිර සුවතා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම මැයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය ක්‍රීඩා කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, එම ලිපියෙන් ඉල්ලීම කර ඇති පරිදි තාක්ෂණ සේවා නිලධාරිතුමා විසින් පහත උපකරණ මිල ගණන් කැඳවා මිලදී ගැනිම සුදුසු බව දන්වා ඇත.

| | | | |
|---|---|---|---|
| 01 | ට්‍රෙඩ් මිල් උපකරණ | 01 | |
| 02 | කිලෝ 15.0 පඩි | 02 | මුළු බර කිලෝ 80.0 |
| 03 | කිලෝ 10.0 පඩි | 02 | |
| 04 | කිලෝ 5.0 පඩි | 02 | |
| 05 | කිලෝ 4.0 පඩි | 02 | |
| 06 | කිලෝ 2.5 පඩි | 04 | |
| 07 | කිලෝ 1.0 පඩි | 02 | |
| 08 | අඩි 6 අහල් 6 ප්‍රමාණයේ බාර් | 01 | |
| 09 | අඩි 6 ප්‍රමාණයේ බාර් | 01 | |
| 10 | අඩි 5 ප්‍රමාණයේ බාර් | 01 | |
| 11 | අඩි 3 ප්‍රමාණයේ බාර් | 01 | |
| 12 | Dump Bellබාර් | 01 | |

**ධම්මික කොඩිකාර මහතා -ගරු නගර සභා මන්ත්‍රී ,අම්බලන්ගොඩ නගර සභාව.**

ශරිර සුවතා මධ්‍යස්ථානයේ කටයුතු මනාව පවත්වා ගෙන යාමට ඉහත උපකරණ අත්‍යාවශ්‍ය බැවින් එම උපකරණ මිලදී ගෙන ලබා දීම සුදුසු බව යෝජනා කරන ලද අතර
ක්‍රීඩා කමිටුව විසින් එය නිර්දේශ කරන ලදි.

**පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය**

❖ පොල්වත්ත ක්‍රීඩාංගණයේ වොලිබෝල් පිටිය සහ මීටර් 100 ධාවන පථය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තු සකස් කිරීම.
එච්.එල්.ද සිල්වා නිලමුණි මයා-තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.
ක්‍රීඩා නිලධාරිතුමා සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ නිසා අදාළ ඇස්තමේන්තුව සකස් කර ගැනීමට නොහැකි වූ බවත් ඉදිරි සභාවකට ඉදිරිපත් කරන බව දන්වන ලදි.

❖ පොල්වත්තක්‍රීඩා පිටියමැදින්යනකාණුවේනිරාවරණයවීඇතිකොටසසකස්කිරීම.
එච්.එල්.දසිල්වානිලමුණිමයා-තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.
ඊට අදාල ඇස්තමේන්තුව පසුගිය මාසික සභාවට ඉදිරිපත් කරන ලද බව.

❖ පොල්වත්තක්‍රීඩාංගණයෙන්පන්සලටපන්දුයැමවළක්වාගැනීමටදැල් එලිමට අදාළ ඇස්තමේන්තුව සකස් කිරීම.
ඊට අදාල ඇස්තමේන්තුව පසුගිය මාසික සභාවට ඉදිරිපත් කරන ලද බව.

❖ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට සෑදීමට අවශ්‍ය බඩු ඇණවුම් කර දීම.
එච්.එල්.දසිල්වානිලමුණිමයා-තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව.
අදාළ බඩු ඇණවුම් කිරීමට සැපයුම් නිලධාරිට ලබා දී ඇතිබව.

❖ එළිමහන් ව්‍යායාම උපකරණ සවිකරන ලද ව්‍යායාම මධ්‍යස්ථානයක් සෑදිමට අදාළ ඇස්තමේන්තුව සකස් කිරීම.
එච්.එල්.දසිල්වානිලමුණිමයා-තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව
ඉදිරි සභාවකට ඉදිරපත් කරන බව.

❖ **මහජන ක්‍රීඩාංගණයේ වතුර රැදෙන එක නැවැත්වීමට හා ගාලු පාර අයින දිගේ ගල් බැම්මට උඩින් යකඩ වැටක් සෑදීමට ඇස්තමේන්තු සකස් කිරීම.**
එල්.දසිල්වානිලමුණිමයා-තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව
අදාළ මැනුම් ලබාගෙන ඇති අතර ඇස්තමේන්තුව අගෝස්තු මස සභාවට ඉදිරිපත් කරන බව.

- **ප්‍රජාපතිය පිට්ටනිය ඉදිරිපිට කොන්ක්‍රීට් කැඩි වතුර රැදෙන එක වැලැක්වීමට අදාළ ඇස්තමේන්තුව සකස් කිරීම.**

  එල්.දසිල්වානිලමුණිමයා-තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව
  අදාළ මැනුම් ලබාගෙන ඇති අතර ඇස්තමේන්තුව අගෝස්තු මස සභාවට ඉදිරිපත් කරන බව.

- **මානාන ක්‍රීඩාංගණය වල්බිහිවී ඇති තැන් ශුද්ධ කිරීම.**

  **ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**
  JCBඑකත් යොදා ගෙන ඒ වැඩේ කරගෙන යනවා.

**ධම්මික කොඩිකාර මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**

මන්ත්‍රීතුමියක් කථා කරල මට කිව්වා ඔබතුමාලා පිට්ටනිය මැදින් පාරක් හදල දීල කියලා,

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**

ඒක බොරුවක් අපේ වාහන දාන්න තමයි ඇළ අයින ශුද්ධ කරල ගත්තේ,එතැන ගේට්ටුවක් දාල ලොග් කරල යතුර නගර සභාවේ තබා ගත යුතුයි.පිට්ටනිය මැදින් අපි කාටවත් පාරවල් දෙන්නේ නැහැ. ජගත් මන්ත්‍රීතුමත් කිව්වා මීට පස්සේ එතුමාගේ වාහනත් පිට්ටනියට දාන්නෙ නැහැ කියල, පිට්ටනිය මැදින් තමයි දැනට ගේට්ටුව තියල තියෙන්නෙ එතැන කැරකෙන ගේට්ටුවක් දැම්මාම හරි.

**අදහස් හා යෝජනා**

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**

ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලට මොකද වෙන්නේ? අවුරුදු 03ක් තිස්සේ අපි බලාගෙන ඉන්නවා.

**ධම්මික කොඩිකාර මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**

මමයි සභාපතිතුමයි ඊයේ ගියා ධර්මපාල විද්‍යාලයේ ක්‍රීඩාංගණය බලන්න. ඒක හදපු කෙනාට තමයි අපේ ක්‍රීඩාංගණය හදන්න දීල තියෙන්නේ. ඒක නම් හොඳටම කරල තියෙනවා.Turfවිකට් 8ක් විතර තියෙනවා. ජිනසේන එකෙන් තමයිSprinkler System (තණ කොළ සඳහා වතුර ඉසීමෙ කියාවලිය) එක කරන්නේ නඩත්තුත් කරනවා. ඊට කලින් අපි තව හලන ලද පස් දාල පිට්ටනිය හදන්න ඕනේ ඒකට තව ලක්ෂ 80ක් විතර යනවා.වැඩේ බාල විදියට කරන්න අපේ කිසිම අදහසක් නැහැ. සභා අරමුදල් යොදවල හරි වැඩේ කරනවා.මම හිතන්නේ නැහැ කවුරුවත් මන්ත්‍රීවරු මේකට විරුද්ධ වෙයි කියල.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා -ක්‍රීඩා කමිටු සාමාජික**

Cricket Board එකෙන් වැඩේ කරන්නෙ නැද්ද?

**ජී.අශෝක කුමාර මහතා- ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව.**

කරනවා,නව ක්‍රීඩා අමාත්‍යවරාගෙනුත් අනුමැතිය අවශ්‍ය වෙලා තියෙනවා.තණ කොළවැවිම.Turfවිකට් 03 ,මැටින් විකට් 01, දර්ශන පථය ,ලකුණු පුවරුව හදල දෙන්නව කියල තියෙනවා.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා/ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා**

පා පන්දු සංගමය හරහා අපි ෆුට් බෝල් වලට ගෝල් පෝස්ට් 02 හදා ගන්නම්.

**මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා**

ක්‍රීඩා මණ්ඩපයේ කාමර වලට ලයිට් නැහැ, පිට්ටනිය වටේ තියෙන කණුවලටත් බල්බ් ටිකක් දාල දෙන්න, තව කරගහන බාර් 02 ගිය වසරේ සුළං ඇතිවුන අවස්ථාවේ ගස් වැටිල කැඩුණා ඒකත් හදල දෙන්න.

**ටී.සරත් ශාන්ත මයා,සිංහ ක්‍රීඩා සමාජය, අම්බලන්ගොඩ.**

අපේSideවිකට් එක ළඟ තියෙන නගර සභාවේ කළු ගල් ටික එතනින් අයින් කරල දෙන්න.

**ස්තූති කථාව-ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා**

ප්‍රදේශයේ දරුවන්ගේ ක්‍රීඩා කටයුතු නංවාලීමේ අරමුණින් තමන්ගේ වටිනා කාලය කැප කරමින් අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි සියළු දෙනාට ස්තූතිය පුදකරමින් ක්‍රීඩාකමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ,

.........................................

ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ......................................... | ......................................... |
| ලේකම්, | සභාපති, |
| නගර සභාව- අම්බලන්ගොඩ. | නගර සභාව-අම්බලන්ගොඩ. |

**2018- 07- 23 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

සභාපතිතුමා පුළුවන් නම් මානාන පිට්ටනියට පස් 5 ක් ලබා දෙන්න. වලවල් තියෙනවා හදාගන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පිට්ටනියේ අලුත් වැඩියා සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න. අවශ්‍ය දේ ඉල්ලන්න.

මම ක්‍රීඩා වාර්තාව නිසා ඉදිරිපත් කරන්නෙ. පසුගිය දවස්වල මම පුද්ගලිකවම ගරු ක්‍රීඩා ඇමතිතුමා හමුවුනා අපේ පිට්ටනිය සම්බන්ධයෙන් ඒක ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට භාර දීම කරනු ලැබුවා වැඩ කොටස් කරන්න. ඒ සම්බන්ධයෙන් වැඩ කෙරීගෙන යනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

සිංහ සමාජයේ ටී. සරත් ශාන්ත මහතා ඉල්ලීමක් කරනවා සයිඩ් විකට් එක ලග තියෙන කළුගල් ටික ඉවත් කර දෙන්න කියලා. මම පරිපාලකතුමාගෙන් ඉල්ලීමක් කලා කළුගල් නගර සභාවෙ තියාගන්න ස්ථානයක් නොමැති නිසා කන්ද මාවත ලිද ලග තැන්පත් කරන්න කියලා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එතන කළුගල් තියෙන්නෙ ඇයි? සයිඩ් විකට් එක ලග තියෙන කළුගල් ඉවත් කරන්න.

**2018- 07-23 දින ප.ව 2.30ට පැවති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4 2018- 07– 24 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව**

**ටෙන්ඩර් කමිටුව**
**2018/07/24 දින ප.ව 2.30**

**සහභාගීත්වය**

1. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ධම්මිකකොඩිකාරමහතා — ගරු නගර මන්ත්‍රී.,අම්බලන්ගොඩ නගර සභාව
3. නන්දන රාජපක්ෂ මහතා — ගරු නගර මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව
4. එච්.පී. මිහිරිදසිල්වාමියප්‍රධානකළමණාකරනසහකාර. අම්බලන්ගොඩ නගර
5. ඩබ්.පී. සිල්වා මිය — අභ්‍යන්තර විගණන නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව

6.පී.එම්විජේසිංහ මිය — තාක්ෂණ නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව

6. එච්. එල්. ද සිල්වා නිලමුණි මහතා — තාක්ෂණ නිලධාරීල අම්බලන්ගොඩ නගර සභාව
7. ලක්මාලි රුවනි — සංවර්ධන නිලධාරී. අම්බලන්ගොඩ නගර සභාව

**2018- 07- 24 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රමමහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මෙහි පොඩි පොඩි අඩු පාඩු තියෙනවා. මෙහෙම උනාම හැල්ලුවට පත් වෙනවා. දිනය නෑ. කොහේද කියන එක නෑ. පිටු අංක කර නෑ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ටෙන්ඩර් කමිටුව කරන නිලධාරියා ඉන්නවාද ? මුලින්ම ටෙන්ඩර් කමිටුව කොලවල අංක කරන්න. මේ කරන වරදවල් නිවැරදි කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ටෙන්ඩර් කමිටුවේදී මමත් ධම්මික මන්ත්‍රීතුමත් නිලධාරීන්ට කිව්වා මේ ටෙන්ඩර් කැඳවන භාණ්ඩවල වර්ගය ඉදිරිපත් කරන්න කියලා. උදාහරණයක් වශයෙන් ¾GI බට, 2 GI බට අපි දන්න විදිහට දැනට ලංකාවෙ පකිස්ථාන්, සංස්ථා එක ගනන්. මෙතනින් ලොකු මුදල පාස් කරනවා.ඊට පස්සෙ ගේනවා ගේජ් එක අඩු ඉන්දියන් බටයක්. මීට පස්සෙ මේ වගේ දේවල් ඉදිරිපත් කරන්න එපා කියන්න මන්ත්‍රීතුමා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලලිත් මන්ත්‍රීතුමා සභාවට පැහැදිලි කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා, කළුවඩුමුල්ල ක්‍රීඩාංගනයේ තාප්පය හා වැට සකස් කිරීමට. අපි තීරණය කරා සභාපතිතුමනි තාප්පය නැතිව දැල් වැට පමණක් ප්‍රතිසංස්කරණය කරන්න. ඒ නිසා බ්ලොක් ගල් හා ෂටරින් ලෑලි අවශ්‍ය නෑ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේ නම් එය ඉවත් කරනවා. අංක 3 පිළිගැනීමෙන් වලකිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ඔබතුමාත් ඉන්දෙද්දි කොඩිකාර මන්ත්‍රීතුමත් මාත් නිලධාරීන් ඉන්න තැන පැහැදිලිව සරල සිංහල භාෂාවෙන් කිව්වා කරුණාකරලා ටෙන්ඩර් මිලදී ගැනීම්වලදී පිරිවිත හරියට ඒ වර්ගවල නම, ප්‍රමාණ නිවැරදිව ඉදිරිපත් කරන්න කියලා. ආයි දවසක නම් සභාපතිතුමා මේ විදිහට ඉදිරිපත් කරන්න මේ සභාවෙ නිලධාරීන් නම් අවශ්‍ය වෙන්නෙ නෑ. බොහොම පැහැදිලිව මේ කියන්නෙ. අපරාදේ කාලේ. විනාඩි 5 න් ඉවර කරන්න පුළුවන් වැඩක්. අපි මහජනතාවගෙ මුදල් සමග සෙල්ලම් කරන්නෙ. බොහොම පැහැදිලිව මේ කියන්නෙ. රාජකාරි හරියට කරන්න. ආයි පාරක් කියන්න තියන්න එපා අපට. හැල්ලුවට පත් කරන්න එපා සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරු. නගරයේ මිනිස්සුන්ගෙ සල්ලි. ඔයිට කලිනුත් කිව්වා මේවා ඉදිරිපත් කරන විට ප්‍රමාණය, වර්ගය, මොනවද ජාතිය, ගේජ් එක. බබාලා වෙන්න එපා ඔබතුමන්ලා. අපේ කාලේ කන්න එපා බොරුවට මෙතන. කොලේ වහලා ගහලා අපට අනුමැතිය දෙන්න බෑ. සභාපතිතුමාට මේක හොඳ නෑ. සියලු මන්ත්‍රීවරුට හොඳ නෑ. කරුණාකරලා මින් ඉදිරියට මේ වගේ මිල ගනන් කැඳවන විට බට නම් මොකද්ද වර්ගය, ගේජ් එක ඔක්කොම අවශ්‍යයි. එහෙම නැතිව මෙහෙම දාන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්**

මට සුළු අවබෝධයක් තියෙන නිසා තාක්ෂණ සේවා මහතුන්ට කියන්නෙ. GI බට කිව්වහම ජපානයෙත් හදනවා තුනී බට. පකිස්ථාන් කිව්වහම හොඳයි වගේ. නමුත් පකිස්ථානයෙත් හදනවා තුණී බට. එහෙත් මෙතන නිර්වචනය වෙන්න ඕන පයිපයේ ගේජ් එක. ඩයර් මීටර් එක. තහඩුවේ තික්නස් එක. ඇණයක් ගත්තොත් හය පට්ටම් ඇණයක්ද, කම්බි ඇණයක්ද, පිත්තල ඇණයක්ද යන්න හරියට කියළනා නම් මේ ප්‍රශ්නෙ ඇති වන්නෙ නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කොඩිකාර මන්ත්‍රීතුමා ඔබතුමාගෙ වැඩේ පොඩ්ඩක් මාසයකට කල් දානවා. අංක 7 ඉවත් කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේ කාර්මික නිලධාරීන්ට පළාත් සභාවෙන් හෝ පළාත් පාන ආයතනයෙන් එවලා මිල දර්ශකයක්. ඒගොල්ලන්ට නම් කියලා ඉල්ලන්න බෑ. ශාස්තුව අනුව ඉල්ලන්න ඕන. කාර්මික නිලධාරීන් දුන්නා නම් සැපයුම් නිලධාරී අහන්න ඕන මොකක්ද බටය කියලා. ඒකේ විස්තර ලියලා තියෙනවද කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රමමහතා කතා කරමින්**

ෂබ්ජෙට් එකේ නිලධාරියා දන්නෙ නෑ ඕක. ඇයි ලියලා දෙනකොට ලියලා දෙන්න බැරි . කර්මාන්තයක් ගිහිල්ලා බලන කොට ඩිසයින් කරන කොට මේකෙන් තමයි මේක කරන්න ඕන කියන එක.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අංක 7 ඉවත් කරනවා. පිළිගැනීමෙන් වලකිනවා. නිලධාරීන්ගෙන් ඉල්ලනවා මේ කියන දේ නිවැරදිව කරන්න කියල.

**2018-07-24 දින ප.ව 2.30 ට පැවති ටෙන්ඩර් කමිටු වාර්තාවෙහි පිටු අංක කිරීම , ආයතනයේ නම සඳහන් කිරිම හා භාණ්ඩවල වර්ගය ආදිය සඳහන් කරමින් නිවැරදිව ඉදිරිපත් කරන ලෙසටත් සඳහන් කළ අතර මෙහි අංක 03 හි සඳහන් කාරණය අවශ්‍ය නොවන බැවින් ඉවත් කිරීමටත් , අංක 07 හි සඳහන් කාරණය පිළිගැනීමෙන් වැලකී සිටි අතර වාර්තාවට අදාළ අනෙකුත් සියලු කරුණු පිළිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5 2018- 07- 25 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව**

මූල්‍යකමිටුව
**2018-0 7-25 දින ප.ව.2.30**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1.ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 2.ධම්මික කොඩිකාර මහතා | ගරු නගර මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව |
| 3.ඇම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව |
| 4.බී.ඒ.ධම්මිකා මිය | ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව |

**පිළිගැනීම**

ගරු සභාපතිඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මූල්‍ය කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් , නගර සභා ලේකම්, ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා ලදී.

අනතුරුව එදිනට කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සඳහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදී

| **ගෙවීම් ලබන්නාගේ නම** | **මිලදීගෙන ඇති භාණ්ඩ පිලිබඳ විස්තර** | **මුදල රු.** |
|---|---|---|
| 01එම්.එස්.වීරසිංහ | නගර සභා පුස්තකාල සඳහා ජුනි මස ලබා ගත් පුවත්පත් සඳහා | 44,935.00 |
| 02.කළමණාකරු , මහජන බැංකුව , අම්බලන්ගොඩ | රු.ලක්ෂ3 ක මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම(ගි.අ/035100126295234 ) (තැලිගල ඉඩම් කට්ටි වෙනුවෙන් එම්.ඩබ්.චන්ද්‍රලතා මිය විසින් තබන ලද මුදල ) | 300,000.00 |
| 03.ආර්.චන්ද්‍රසිරි | නගර සභාවට අදාල කර්මාන්තවලට තාර දැමීම(දිස්ත්‍රික් මිල ගණන් අනුව)රු.2000*දින41/2 | 11000.00 |
| 04.ශ්‍යාමලී වේවැල්වල | 2018 වසරට අදාල වෙළඳ බලපත්‍ර හා වෙළඳ බදු අවසන් නිවේදන යැවීමට අවශ්‍ය මුද්දර ගැනීම | 11200.00 |
| 05. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | කාර්යාලයේ ස්ථාපිත දුරකථනයන්හි 2018 මැයි දුරකථන බිල් | 30,525.32 |
| 06.සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය | සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන් ජුනි 01-14 දක්වා ඉන්ධන බිල | 130375.00 |
| 07.පී.එච්.සී.සී. ද සිල්වා | ඇ.අංක 1852 යටතේ1ක් රු.6500/-බැගින් ගල් කියුබ් 06 | 39000.00 |
| 08.ටියුලිප් කම්පියුටර්ස් | UCCF/9 දරණ පරිගණකය සඳහා Mother boad 01 ක් හා නව Hard disk 01 ක් සවි කිරීම | 16300.00 |
| 09.සාමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ගලි බවුසර් ලෝඩ් 25 ක් සඳහා අදාල ගාස්තු | 25,875.00 |
| 10.මිළිඳු එන්ට්‍රප්‍රයිසස් (ඇනවුම-1870) | ආදාහනාගාර සඳහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.5445 බැගින් 08 ක් ) | 43,560.00 |
| 11. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2018 ජුනි මස දෙවන කාර්තුවට අදාල Vat ගෙවීම | 16,000.00 |
| 12.ලක්ෂාන් එන්ටර්ටේන්මන්ට් | ලෝක ළමා දිනය වෙනුවෙන් අනුග්‍රාහක හවතුන්--ගෙන් ලද මුදලින් අත්තිකාරමක් ගෙවීම | 100000.00 |
| 13. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | | |

| | | |
|---|---|---|
| | 2018 දෙවන කාර්තුවට අදාල මුද්දර බදු ගෙවීම | 24547.56 |
| 14.පී.ජී.මාර්ටින් වොන්ඩර්වර්ල්ඩ් | ලෝක ළමා දිනය වෙනුවෙන් අනුග්‍රාහක හවතුන්- -ගෙන් ලද මුදලින් අත්තිකාරමක් ගෙවීම | 75500.00 |
| 15.මධුමි විජේසිංහ | සභාව සතු ට-5185 දරණ බැකෝ යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා අත්තිකාරමක් ලබා දීම | 10000.00 |
| 16. රජිතා දිල්රුක්ෂි | සභාව සතු වාහන හා යන්ත්‍ර අලුත්වැඩියා,සභා ගරාජයතුල සිදු කිරීමට අත්තිකාරමක් ලබා දීම | 25000.00 |
| 17.මිළිදු එන්ට්‍රප්‍රයිසස් | ආදාහනාගාර සඳහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.5445 බැගින් 08 ක් ) | 43,560.00 |

(ඇනවුම-1886)

පැමිණි සැමට ස්තුති කරමින් ප.ව.3.15 ට පමණ කමිටුවේ කටයුතු නිම කරන ලදී.

| ...................................... | ............................................. | ............................................. |
|---|---|---|
| සකස් කලේ | ලේකම්, | ගරු සභාපති, |
| එම්.එච්. රෝෂිණී | බී.ඒ. ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් |
| කළමණාකරණ සහකාර | නගර සභාව , අම්බලන්ගොඩ | නගර සභාව , අම්බලන්ගොඩ |

**2018- 07- 25 දින ප.ව 2.30ට අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රීකේ. ශ්‍රේෂන් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**2018- 07- 25 දින ප.ව 2.30ට අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මූල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රී කේ. ශ්‍රේෂන් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 6 2018- 07- 12 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු වාර්තාව**

<u>අම්බලන්ගොඩ නගර සභාව</u>
<u>විගණන කළමනාකරණ කමිටු රැස්වීම</u>

දිනය - 2018.07.12

ස්ථානය- නගර සභා රැස්වීම් ශාලාව වේලාව - ප.ව.2.30

**පැමිණීම**

1. බී.ඒ.ධම්මිකා මිය - ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ
2. එච්.ඒ.එම්.පී.සමන්ත මයා - විමර්ශන නිලධාරී , ප.පා.ස.කොමසාරිස් කාර්යාලය
3. එච්.පී.මිහිරි ද සිල්වා මිය - ප්‍රධාන කළමනාකරණ සහකාර
4. ඩබ්ලිව්.පී.සිල්වා මිය - අභ්‍යන්තර විගණන නිලධාරී
5. ඩී.වී..තරංගි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
6. ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මයා - සභාපති , නගර සභාව, අම්බලන්ගොඩ

7. එම්.එච්.රෝෂිණී මිය - අංශ ප්‍රධානී (ගිණුම් අංශය)
8. එස්.සී.දයාරංසි මිය - අංශ ප්‍රධානී (ආදායම් අංශය)
9. කේ.පියරත්න මයා - ආදායම් පරීක්ෂක
10. අචිරා රංජනී මිය - කළමනාකරණ සහකාර
11. නිශාමලී වේවැල්ලව මිය - කළමනාකරණ සහකාර
12. ඩී.රජිතා ක්‍රිශාන්ති මෙන්ඩිස් මිය - කළමනාකරණ සහකාර
13. එච්.කේ.ප්‍රියන්ති සුජීවි මිය - කළමනාකරණ සහකාර
14. කේ.කේ.සුගන්ධිකා මිය - කළමනාකරණ සහකාර
15. එම්.ඩබ්.ආර්.දිල්රුක්ෂි මිය - සංවර්ධන නිලධාරී
16. ආර්.ඩබ්.ඩී. මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරී
17. බී.එම්.යූ.කේ.ප්‍රනාන්දු මයා - මහජන සෞඛ්‍ය පරීක්ෂක
18. එච්.ජී.දිලිනි චතුරිකි - කළමනාකරණ සහකාර
19. පී.එච්.එල්.සී පුෂ්පරාණි මිය - සංවර්ධනප සහකාර

නගර සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරී විසින් එදින විගණන කළමනාකරන කමිටුව සඳහා පැමිණ සිටි සියළුම දෙනා පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

මෙහිදී ප්‍රධාන වශයෙන්ම සාකච්ඡාවට භාජනය කරන ලද්දේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ විගණකාධිපති වාර්තාව (කෙටුම්පත ) සඳහා පිළිතුරු යැවීම සම්බන්ධවයි.

ඒ අනුව මෙම කෙටුම්පත් වාර්තාවේ අඩංගු පිළිතුරු සැපයිය යුතු සියළුම කරුණු එකින් එකසාකච්ඡා කරන ලදි. එක්එක් විෂයට අදාළව ඒ ඒ විෂයන් භාර නිලධාරීන් ගෙන් කරුණු විමසූ අතර මේ සඳහා පිළිතුරු සැපයිය යුතු ආකාරය පිළිබඳව විමර්ශන නිලධාරී විසින් කරුණු පැහැදිලි කරන ලදි.

එමෙන්ම එම විෂය කරුණු සම්බන්ධව ගරු සභාපති තුමා විසින් කරුණු පැහැදිලි කිරීමක් සිදු කරන ලදි. විගණනයට ලක් වී ඇති කරුණු සම්බන්ධව දැඩි අවධානයක් යොමු කර ගැටළු නිවැරදි කර ගන්නා ලෙසටත් සියළුම නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි.

පැමිණ සිටි සැමට ස්තුති කරමින් ප.ව. 4.15 ට පමණ කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ - ඩබ්ලිව්.පී.සිල්වා ( අ.වි.නි.)

ලේකම්,

නගර සභාව, අම්බලන්ගොඩ

ගරු සභාපති

නගර සභාව, අම්බලන්ගොඩ

.

**2018-07-12 දින ප.ව 2.30 ට පැවති විගණන කළමනාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 7 2018- 07- 20 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ත්‍රීවිල් රැස්වීම් වාර්තාව**

<u>රථවාහන හා ත්‍රිරෝද රථ රැස්වීම</u>

**<u>2018.07.20 දින ප.ව. 2.30</u>**

<u>සහභාගීත්වය</u>

1. කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ඩබ්.ඒ. සෝභිත රංජිත් ම - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
3. නන්දන රාජපක්ෂ මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. දිනයාදුර ධර්මදාස මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
5. ඩබ්.එම්. නිලානි මෙනවිය - ගරු නගර සභා මන්ත්‍රීනි, අම්බලන්ගොඩ නගර සභාව
6. කේ. ශ්‍රේෂන් මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
7. එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
8. එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
9. එච්.මහින්දසේන මහතා - කමිටු සාමාජික
10. එම්. ශිවාන් සාරත විමලතුංග මහතා - කමිටු සාමාජික
11. බි.ඒ. ධම්මිකා මිය - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
12. දුමින්ද කන්නන්ගර මහතා - උප පොලිස් පරීක්ෂක
13. කේ.පියරත්න මයා - ආදායම් පරීක්ෂක
14. ටි. චන්න මයා - ආදායම් පරීක්ෂක
15. අචිරා රංජනි ලොකුගේ මිය - කළමනාකරණ සහකාර
16. ත්‍රිවීල් හිමිකරුවන් 106

<u>කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති</u>

ත්‍රිරෝද රථ හා වාහන රැස්වීම සඳහා සහභාගි වීමට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන්ලාත්, නගර සභාවේ ලේකම් තුමිය, කමිටු සාමාජිකයින් පොලිස් නිලධාරිතුමන් ඇතුළු කාර්ය මණ්ඩලයත් ත්‍රිරෝද රථ හිමිකරුවනුත් ඉතාමත් ගෞරවයෙන් පිළි ගනිමින් රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදී.

<u>කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති</u>

විශාල අර්බුදයක්ව ඇති ත්‍රිරෝද රථ සම්බන්ධයෙන් පොලිසියට පමණක් තනිවම ක්‍රියා කිරීමට නොහැකි බවත් ත්‍රිරෝද රථ හිමියන්ගේද සහයෝගය ඊට අවශ්‍ය බවත් ඒ සඳහා විසඳුමක් ගැනීම මෙහි අරමුණ බවත් පෙන්වා දෙන ලදී. තවද මෙය ක්‍රියත්මක කරන්නේ කෙසේද යන්නත් බදු ගෙවන ජනතාව අප මේ තනතුරට පත් කර ඇති බැවින් ඔවුන්ට සහන සැලසිය යුතු බවත් සඳහන් කරන ලදී. වෙළඳ සංගම් වලින් පෙන්වා දී ඇති පරිදි බඩු රැගෙන යාමට එන ජනතාවගෙන් 40% පමණ මේ හේතුවෙන් අඩුවී ඇති බවත් එම නිසා මේ සඳහා සියළු දෙනාගේම සහයෝගය ඉල්ලා සිටින බවත් පවසන ලදී.

**යෝජනා හා ගැටළු**

- වෙනත්රැකියාවලයෙදෙන්නන්ප.ව. 4.30 පසුව ත්‍රිරෝද රථ රැකියාවේ යෙදීම නිසා ත්‍රිරෝද රථ රැකියාවේ පමණක් යෙදෙන්නන් හට ඉන් ගැටළු ඇති වීම.
- පාසල් වලට ළමුන් රැගෙන විත් ත්‍රීවීල් රැකියාවේ යෙදෙන අය සිටින බවත්,(ධර්මාශෝක විද්‍යාලය ලඟ) සවස් කාලයේ රැකියාවෙන් පසු ත්‍රීවීල් රැකියාවේ යෙදෙන අය සහ රාත්‍රි කාලයේ ත්‍රීවීල් රැකියාවේ යෙදෙන අය නිසා ගැටළු මතු වන බව පෙන්වා දීම.
- නගරසභාවමඟින්ස්ටිකර්එකක්ගහලාමාසිකව එම මුදල අය කිරීමට කටයුතු කරන්න

**කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති**

අනුමත ත්‍රිවිල් නැවතුම්පොළවල් හැර අනිකුත් සියල්ල ඉවත් කල යුතු බව පෙන්වා දීම.

**යෝජනා හා ගැටළු**

- අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ සිටින අයට ප්‍රධාන තැනක් දෙන්න.
- 2016 වර්ෂයේ ස්ටිකර් එක ගන්න ආවත් එය නිකුත් නොකල බැවින් අදාල ගෙවීම් සිදු නොකල බව

**කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති**

2015, 2014 වර්ෂවල අපි හිටියා. මේ කාලයේ ගෙවීම් කරන්න සහ ස්ටිකර් දුන්නේ නැහැ කියන්න එපා.

**යෝජනා හා ගැටළු**

- ස්ටිකර් නිකුත් කිරීම කල පසු ස්ටිකර් නොගන්නා අය නවත්වනවාද යන්න.
- ත්‍රිවිල් නැවතුම් පොළවල්වලට අදාල ප්‍රමාණය ඉක්මවා ත්‍රිවිල් ලියාපදිංචි නොකළ යුතුයි.

**කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති**

මෙය ක්‍රියාත්මක කරන්න ත්‍රීවීල් රථ හිමිකරුවන්ගේ සහයෝගය අවශ්‍ය බව ප්‍රකාශ කිරීම**.**

**එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මයා - ගරු නගර සභා මන්ත්‍රී,**

අප සමඟ කවදත් සහයෝගයෙන් වැඩ කරන සභාපති තුමන් ඇතුළු කණ්ඩායම සැලසුම් සකස් කළත් මෙය විධිමත් කරන්න හැදුවත් යම් යම් කාරණා හේතුකොටගෙන මෙය ක්‍රියාත්මක කරන්න නොහැකි වුනා. මෙය ඔය ගොල්ලන්ගේ පහසුව තකා සිදු කරන්නක්. ත්‍රිවිල් 05 ක් නැවැත්විය හැකි ස්ථානයක ත්‍රිරෝද රථ 10 ක් නතර කිරීමට ක්‍රියා කරන්න එපා. ඒක ඔය ගොල්ලන්ගේ වගකීම වෙන්න ඕන. අම්බලන්ගොඩ කියනනේ ස්වභාවිකව වෙළඳ මධ්‍යසන්ථානයක්. එහිදී කාගෙත් ගරුත්වය ආරක්ෂා වන පරිදීත් නගර සභාවටත් ආදායමක් එන විධියට මෙය ක්‍රියාත්මක කල යුතුයි. මෙම කටයුත්ත විධිමත් කරන්න නාගරික මන්ත්‍රිතුමන්ලාටත් නිලධාරින්ට හා පොලිසියට විතරක් බෑ. මේ සඳහා ඔයගොල්ලන්ගේ සහයෝගය අවශ්‍ය වෙනවා. ඒ සම්බන්ධව සාකච්ජා කර ගැනීම සඳහා පැමිණීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. මේකට ක්‍රමවේදයක් ඇති කරන්න ඕන. පොරොත්තු ලේඛනයක් සකස් කර ගන්න. මේ සඳහා ක්‍රමවේදයක් නොතිබුනොත් ඔය ගොල්ලන්ට කුලී ගාස්තු (හයර්) එන්නේ නැහැ. ඔයගොල්ලන්ට වැඩක් නැහැ. උප සභාපතිතුමාගේ මුලිකත්වයෙනුයි මෙය ක්‍රියාත්මක කරන්නේ. මේ සඳහා ඔයගොල්ලන් හරියාකාර විධියට ක්‍රමවේදයක් ඇති කර ගන්න. සියළු දෙනාගේම සහයෝගය දක්වන්න. ඒක තමයි ඔයගොල්ලන්ට කරන මගේ ඉල්ලීම.

**<u>දිනයාදූර ධර්මදාස මහතා -ගරු නගර සභා මන්ත්‍රී,</u>**

සාකච්ඡා කල යුතු බලපත්‍ර ලාභීන් 200 පමණ සිටියත් අද දින කැදවා ඇත්තේ 120 පමණක් බව පෙන්වා දෙන ලදී. රථකියාවල නිරත වන්නන් රථකියාවෙන් පසු ත්‍රිවීල් රථකියාවේ යෙදීම ත්‍රිරෝද රථකියාවේ පමණක් යෙදෙන්නන් හට අසාධාරණයක් බව පෙන්වා දෙමින්. තව දුරටත් ඔහු කියා සිටියේ පාතාලයේ අය විසින් කරන බලපෑම් හමුවේ ත්‍රිවිල් රථ ගාල් වල සිටින සැම එකතු වී ඔවුන් මෙල්ල කල යුතු බවත් එවැනි අවස්ථාවල නගර සභාවේ නිලධාරීන්ගේ සහ පොලීසියේද සහාය ඊට ලබා ගන්නා ලෙසත්ය. තවද මහා වීදියේ ත්‍රිරෝද රථ වලින් ජනතාවට අවහිරතා සිදුවන බැවින් එම නිසා මේ සඳහා නීති පද්ධතියක් ක්‍රියාත්මක කල යුතු බවත්ය. තවද බලපත්‍ර ලබා දීමේදී අම්බලන්ගොඩ නගර සීමාවේ පදිංචි අයට ප්‍රමුඛතාවය දිම කළ යුතු යන්නත් මේ පිළිබඳ සහයෝගය ලබාදීම සම්බන්ධව ස්තුතිය ප්‍රකාශ කරන ලදී.

**<u>එච්.මහින්දසේන මහතා - කමිටු සාමාජික</u>**

අපි ලියාපදිංචි අයගෙන් 120 ක් හදුනාගෙන ඒ අයට මුලිකත්වය දීලා කැඳවීම් කල බවත් පසුව අම්බලන්ගොඩ බල ප්‍රදේශයේ අයට බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බවත්.

**<u>කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති</u>**

අම්බලන්ගොඩ නගරයේ ත්‍රිරොද රථ සම්බන්ධව ගැටළු විසදන්න ටික කාලයක් ගත වන බවත් අම්බලන්ගොඩ නගරයට සේවය කල අයට අවස්ථාව ලබාදී ඉතිරි අය සඳහා පොරොත්තු ලේඛනය සකස් කරන බවත් 2013 වර්ෂය සම්බන්ධව යම් යම් ප්‍රකාශ කල ද දැන් එම කරුණු පිළිගත නොහැකි බවත් 2014 ස්ටිකර් අරගෙන තිබේද යන්න විමසීම් කරන ලදී.

**<u>ත්‍රිවිල් රථ හිමිකරුවන්</u>**

ස්ටිකර් ගැනීම සඳහා ඉදිරිපත් වුවද 2014 ස්ටිකර් ලබා නොදුන් බවත් , ස්ටිකර් නිකුත් නොකරන බව නිලධාරින් ප්‍රකාශ කල බවත්ය සඳහන් කිරිම.

**<u>එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මයා - ගරු නගර සභා මන්ත්‍රී,</u>**
ඉහත කරුණ සම්බන්ධව අවධානය යොමු කල යුතු බව ප්‍රකාශ කරන ලදී.

**<u>කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති</u>**

ස්ටිකර් ලොකු ගණනක් මුද්‍රණය කරන විට එය නගර සභාවට ලොකු පාඩුවක් . සභාවට ලොකු පාඩුවක් නම් රජයට වගකිව යුතු වෙනවා. අපට පසුගිය මුදල් කපා හරින්න බැහැ. ගැටළුවලට පත් වෙනවා. රජයට වගකියන්න වෙනවා. එසේම ත්‍රිවීල් හිමිකරුවන්ගෙන් නගර සභාව යැපෙන්නේ නැති බවත්. ටිකට් එකක් මගින් ගාස්තු අය කිරීම වෙළඳ සංගමය මගින් කරන ලද්දක් බවත් පෙන්වා දෙන ලදී. හැටන් නැෂනල්එක ලඟ දැනට සිටින සංඛ්‍යාව30 ක් බවත් ඉන් බලපත්‍ර ලබා ගෙන ඇත්තේ 27 ක් පමණක් බවත් බලපත්‍ර ලබා ගත් අයගෙන් දැනට සිටින සංඛ්‍යාව 18 ක් බවත් පෙන්වා දෙන ලදී.

**<u>ත්‍රිවිල් හිමිකරුවන්</u>**

සමහරුන්ට ලිපි ලැබි නැති බව ප්‍රකාශ කරන ලදි.

**<u>කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති</u>**

අපේ නිලධාරීන් දවස් 03 ක් ගිහින් සොයා බලා තිබෙනවා දවස් තුනෙන් එක දවසක් හරි ඉන්න ඕන. ඔය ගොල්ලන්ගේ කමිටුවලින් නිර්දේශ කරන විට නගරයේ අයට ප්‍රමුඛතාවය දිය යුතුයි යන්න පෙන්වා දෙන ලදී.

ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා - ගරු නගර සභා මන්ත්‍රී,

මේ ගොල්ලන් කියන්නේ හැටන් නැෂනල්එක ලඟ 38 ක් කියලා.

, කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති

සමහර අය හිතන් ඉන්නවා මේක දේපලක් බුදලයක් කියලා. මේක නගරයේ ඇති දේපලක් . ඔයගොල්ලන්ගේ සහයෝගය දෙන්න. අපි අනිත් හරිය බලාගන්නම්. මේ නගර සභා ස්ටිකර් එක ගන්න කැමති ද කියලා කියන්න.

ත්‍රිවිල් හිමිකරුවන්

අනවසර කට්ටිය ඉවත් කලොත් අපි අනිවාර්යෙන්ම ස්ටිකර් එක ගන්නම්. ඕකන්ද, පොල්වත්ත කියලා වර්ගි කරණය කරන්න එපා.

, කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති

මීට අමතරව අපි දෙන්නේ නැහැ. ඔයගොල්ලන් කැමතිනම් ස්ටිකර් එක ගන්න. ස්ටිකර් එක දීලා අපි පොලිසියේ පැමිණිල්ලක් දානවා අනවසර ත්‍රිවිල් හිමියන් අයින් කරන්න කියාලා. පොලිසියේ කලින් හිටි නිලධාරින් ද මෙය ක්‍රියාත්මක නොවීම ගැන වගකිව යුතුයි,

ත්‍රිවීල් හිමිකරුවන්

ස්ටිකර් නැති අයට අනිවාර්යෙන්ම ත්‍රිවීල් පාක් කරන්න දෙන්න එපා.
ලබන මාසේ පලමු වන දින වන විට ස්ටිකර් එක දෙන්න පුළුවන්ද?

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

ලබන මාසේ 15 වන විට ස්ටිකර් එක දෙන්න පුළුවන්.

ත්‍රිවිල් හිමිකරුවන්

ස්ටිකර් එක මිලදී ගන්න කවුරුත් කැමති බවත් රොසෙත් එකේ පුද්ගලික ඉඩමේ ත්‍රිරෝද රථ නවතාගෙන ත්‍රිරෝද රැකියාවේ යෙදී සිටින බවත් එවැනි ත්‍රිරෝද රථ හිමියන් ඉවත් කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

, කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති
අපි ඇත්තටම එය පිළිගන්නවා.

ත්‍රිවිල් හිමිකරුවන්

ධර්මාශෝක විද්‍යාලයේ පොඩි ඉසකෝලේ ලඟත් ත්‍රිවිල් නතර කර ඇති බව පෙන්වා දෙන ලදී.;

, කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති

මට මාදම්පේ, වතුගෙදර, රන්දොඹේ කියලා නෑ. ලබන මස 15 සිට මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කල යුතුයි. තවද හිඟ මුදල් කපා හැරීම සම්බන්ධව උපරිම සහයෝගය දෙන බවත් ඒ සම්බන්ධව ගැටළුව සභාවේදී කතා කල යුතු බවත් පෙන්වා දෙන ලදී. අපි පොලිසියට කියනවා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. ලියාපදිංචි නැති අයට නැවතුම් ස්ථාන (පාකින්) නැහැ. තවද කුඩු ව්‍යාපාරය ඉතාමත් සීඝ්‍රයෙන් ඉහල ගොස් ඇති බව පෙන්වා දෙමින් කියා සිටියේ අම්බලන්ගොඩ පොලිසියේ සිට විශ්‍රාම ලබා ඇති ගුණසේකර මහතා අම්බලන්ගොඩ බල ප්‍රදේශයට හා විශේෂයෙන්ම පාසල් දරුවන් වෙනුවෙන් කරන ලද සේවය ඇඟයීමට පත් කළ යුතු බවයි. ඒ වෙනුවෙන් කමිටුවේ ගෞරවය පුද කරන බව ද ප්‍රකාශ කරන ලදී.

**<u>එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී,</u>**

ඔය ගොල්ලන් හැමෝම දුවන්නේ දිවා කාලයේ බවත් රාත්‍රී කාලයේ දුවනවා නම් ඒවාට ද ලයිසන් දිය හැකි බවත් පාතාලයේ අය සිටිනවා නම් ඒ සඳහා පොලිසියේ සහයෝගය ලබා ගන්න ලෙසත් , පහසුවෙන් බලපත්‍රලාභීන් හදුනා ගැනීම සඳහා ඇඳුමක් සකස් කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

**<u>දුමින්ද කන්නන්ගර මහතා - උප පොලිස් පරීක්ෂක</u>**

මෙහි මූලික ප්‍රශ්නය වෙලා තියෙන්නේ සාමාජිකත්ව ප්‍රශ්නයක්. ආයතනයට මුදල් ගෙවා සාමාජික නොවීමයි. පසුගිය මුදල් කපා හැරීම සම්බන්ධව සාකච්ජා කරණ බව ප්‍රකාශ කළවිට ඔයගොල්ලන් හැසිරෙන වෙනසෙන්ම එය පෙනෙනවා. ඒ සම්බන්ධව මෙතුමාට තනි තීරණයක් දෙන්න බැහැ. නමුත් අවශ්‍යතාවය ඔය ගොල්ලන්ගේ, රැකියාව ආරක්ෂා කර ගැනීම. ඔයගොල්ලනගේ සහාය නැතිව මෙය ක්‍රියාත්මක කරන්න බැහැ. මෙය පොලිසියටවත් නගර සභාවටවත් ඔයගොල්ලන්ගේ සහාය නැතිව ක්‍රියාත්මක කරන්න බැහැ. කොහොම හරි හොඳතිරණයකට එන්න. පාතාලය සම්බන්ධයෙන් කිසිම කෙනෙක් මෙතෙක් පැමිණිලි කර නැහැ. නීතිය ක්‍රියාත්මක කරන්න නම් අපි ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙන්න ඕන. දන්නේ නැතිව ක්‍රියාත්මක වෙන්න බැහැනේ. සමගියක් නොමැතිකම මෙයට හේතු වෙනවා. ත්‍රිවිල් දුවන්න පොරකන්නේ නැතිව වෙනත් රැකියාවලට යොමු වන්න. ඔයගොල්ලන්ට හැකියාව තියෙනවා වෙනත් රැකියාවන් කරන්න. මේ තත්ත්වයට නැවත පත් වෙන්න එපා. නගරයේ රථ වාහන තදබදයක් ඇති වී තිබෙනවා කියලා පිටින් ආපු කෙනෙක් කියලා අපට ආපසු යවන්න බැහැ. රථවාහන පාලනය කිරීමට ඔයගොල්ලන්ගේ සහාය ලබා දෙන මෙන් ඉල්ලා සිටින අතර ඒ සඳහා උපරිම සහාය ලබා දෙන බවත් ප්‍රකාශ කරනවා. මම මේ අවස්ථාවේ යොජනාවක් හැටියට කරනවා පුළුවන්නම් අවුරුදු 35ට වැඩි අයට බලපත්‍ර ලබා දීමට කටයුතු කරන්න කියලා.

**<u>, කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති</u>**

ලබන මස 15 වන විට ඔයගොල්ලන් ස්ටිකර් එක ගන්නවනම්, අපි ත්‍රිවිල් නැවත්විය යුතු ස්ථාන ලකුණු කරනවා. ඊට අමතරව ලිපි ඉදිරිපත් කර ඇති කොටස තෝරා ගැනීමෙන් පසු බලපත්‍ර ලබා දීමට කටයුතු කරනුයේ නගර වැසියන්ට පමණයි.

**<u>කේ. ශ්‍රේෂන් මයා - ගරු නගර සභා මන්ත්‍රී,</u>**

ගරු උප සභාපති තුමන් ඇතුළු නාගරික මන්ත්‍රී තුමන්ලාටත් කමිටු සාමාජිකයන් හා කාර්ය මණ්ඩලයටද පොලිස් නිලධාරි තුමන්ටත් ත්‍රිරෝද රථ හිමියන්ටත් මේ අවස්ථාවට සහභාගි වීම පිළිබඳව ස්තුතිය පුද කල අතර නගරයේ ඇති ගැටළු ප්‍රශ්න පිළිබඳ සාකච්ජා කර විසඳා ගැනීම සඳහා සහාය ලබා දෙන මෙන්ද ප්‍රකාශ කරන ලදී. තවද ඔබතුමන්ලාගේ වටිනා කාලය මේ සඳහා කැප කිරිම වෙනුවෙන්ද ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදී.

සකස් කලේ

| | | |
|---|---|---|
| ...................................... | ...................................... | ...................................... |
| අචිරා රංජනී ලොකුගේ | ලේකම් | උප සභාපති |
| කළමනාකරණ සහකාර | බී.ඒ. ධම්මිකා | කමල් වැල්ලගේ |
| | අම්බලන්ගොඩ නගර සභාව | අම්බලන්ගොඩ නගර සභාව |

**2018- 07- 20 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද රථවාහන හා ත්‍රිරෝද රථ රැස්වීමපිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර නගරසභා මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**2018.07.20 දින ප.ව.2.30 ට පැවති රථවාහන හා ත්‍රිරෝද රථ රැස්වීම වාර්තාව පිළිගතයුතු බවට යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අදාල ත්‍රීරෝද රථ කමිටු සාමාජිකයින් ගෙන්වලා සාකච්ඡාවක් තිබුනා සභාපතිතුමනි, RI මහත්තයා අපට දුන් ලැයිස්තුව අනුව 120 ක සාමාජිකයින් සංඛ්‍යාවක් ගෙන්වූවා. රාහුල මන්ත්‍රීතුමා, සෝභිත මන්ත්‍රීතුමා ධර්මදාස මන්ත්‍රීතුමා, නන්දන මන්ත්‍රීතුමාත් සහභාගී උනා. මෙතනදි ඒගොල්ලො කිව්වෙ 2012 න් පස්සෙ ස්ටිකර් මුද්‍රණය කරලා දුන්නෙ නෑ කියලා කියන කාරණය ගෙනාවා. කාර්යාලයෙන් සොයා බැලුවහම 2013 වර්ෂයට මුද්‍රණය කලේ නැත්තෙ ටික දෙනෙක් ගන්න හිටිය නිසා. මුද්‍රණය කලේ නෑ පාඩු වෙන නිසා. ඒ අනුව එකගයි. කෝටේෂන් කැඳවන්න කිව්වා නිලධාරීන්ට. ඒ ගොල්ලො කියන්නෙ නැවත වරක් අලුතින්ම පිහිටවමු කියලා. මේක කරන්න අමාරු වේවි කලක් සිටිය අයත් එක්ක ගත්තහම. මේක නැවත අලුතින් පිහිටුවන්න යෝජනාව ගරු සභාවෙන් අනුමැතිය ඉල්ලා සිටිනවා. 2007, 2008 වර්ෂවල ඉඳන් සමහර අය ඉන්නවා. දඩ මුදල් අයකර ගෙන කරන්න ගියොත් මේක අමාරු වෙනවා. මේක ක්‍රියාත්මක නොවන දෙයක්. නැවත ක්‍රියාත්මක කරන්න ගරු සභාපතිතුමනි, අලුත් යෝජනාවක් විදිහට පිහිටුවලා කරන්න සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

කීප දෙනෙක් කථා කරාම කිව්වා. නගර සභා සීමාව තුළ පදිංචි පුද්ගලයන්. 2012 න් පස්සෙ ස්ටිකර් නැහැනෙ. සමහර අයට කමිටුවට කැඳවලා. සමහර අයට නෑ කියලා. එතන පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා අපි මෙතුමා කිව්වා වගේ කිසිම දඩ මුදලක් මුකුත් නැතිව අලුතින්ම මේ අවුරුද්දෙ ඉඳලා සාධාරණ මුදලකට ස්ටිකර් දීලා, ස්ටිකර් නැත්නම් දෙන්නෙ නෑ, නියමිත ස්ථානවලට අපි නම් කරලා , වෙන අයට අවසරක් නැතිව ඇතුල්වෙන්න නොදී එහෙම කරමු. අම්බලන්ගොඩ සීමාව තුළ සිටින අයටත් ලියුම් යැව්වෙ නෑ කියන අයටත් ප්‍රමුකත්වය දීලා මේක ක්‍රියාත්මක කරමු. කාලයක් තිස්සෙ නොකල දෙයක්. මේක ඉක්මනට ක්‍රියාත්මක කරමු කියලා ඉල්ලනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාව එකගද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

එකගයි. අම්බලන්ගොඩ නගර සීමාව තුළ කියලා එක එක අය ඉල්ලනවලු. එහෙම අයට කියන්න ග්‍රාම සේවා සහතිකයක් සමග ඉදිරිපත් කරන්න කියලා. ඊට පස්සෙ ස්ටිකර් එක දෙන්න . බදු ගෙවන අයට තමයි මූලිකත්වය දිය යුත්තෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කලින් ලබාදීමේදී උපසභාපතිතුමා, රාහුල මන්ත්‍රීතුමා එහෙම සිටියා. අවුරුදු 03 ක ඡන්දයත් බලලා තමයි දුන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රමමහතා කතා කරමින්**

කලින් අය කරානෙ. ඒ මුදලේ ආදායමක් ලෙස ලැබීමේදී නීත්‍යානුකූල කරන්න පුළුවන්ද? සභාපතිතුමනි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නිත්‍යානුකූල ලෙස කරන්න පුළුවන්. බයිලෝ එකක් පනවලනෙ තියෙන්නෙ. ගැටළුවක් නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගැටළුවක් නැහැනෙ. එහෙනම් ඒ විදිහට කරන්න. හැබැයි සියලු දෙනා ගන්න විට ප්‍රශ්න ගැටළු ඇති නොවන විදිහට සභාපතිතුමා කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි කමිටුවෙ තීරණය කරා. සභාපතිතුමා උපදෙස් දුන් පරිදි අවුරුද්දකට රු:1200/- ගානෙ. අවුරුද්දටම එකවර ගන්නවා නම් රු: 1000/-කට ඒ ලයිෂන් එක ලබා දෙන්න. ඒකටත් අපි මන්ත්‍රීවරුන්ගෙ අවසරය ගන්න ඕන කමිටුවේ තීරණය ගන්න. .

. **ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මම ලේකම්තුමියගෙන් අහන්න කැමතියි. මේකේ නීතිමය ප්‍රතිපාදන පොඩ්ඩක් සොයලා බලන්න. මොකද අපි කලින් අයකරලා හිග අය වෙන්න තියෙන විදිහටනෙ සභාවෙ තියෙන්නෙ. ඒකෙ අවසරය ලබා ගන්න. නීත්‍යානුකූලව විමර්ශන නිලධාරීන්ගෙන් අහලා අවශ්‍ය අවසරය ලබා ගන්න. මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා ගරු සභාපතිතුමනි, අපි බලපත්‍ර දුන්නට පාකින් ගැසට් කරලා නැනෙ. ඉතාම ස්වල්පයයිනෙ තියෙන්නෙ. එතකොට මේකෙ නීතිය හරස් වීමක් තියෙනවා. අපි බලපත්‍රය දුන්නොත් අහවල් තැන පාර්කින් සදහා ගාස්තුවක් කියලා ඒක නීත්‍යානුකූල නෑ. උදාහරණයක් ලෙස ලංකා බැංකුව ලග ත්‍රීවීල් 5 කට අවසරය ලබා දෙනවා. ස්ටිකරයේ ගැහුවොත් ලංකා බැංකුව අසල ත්‍රීවීල් පාක් එක කියලා අපි නීති විරෝධි දෙයක් කරන්නෙ. මේ බලපත්‍රය දෙන්න අහවල් ස්ථානය කියලා බලපත්‍රයේ සදහන් කරන්න එපා. ඒක අපේ ලැයිස්තුවල තියා ගන්න. ත්‍රීවීල් පාර්ක් වලට කියන්න ඕන ඒ අය බෙදා ගන්න කියලා ක්‍රමවේදය. නැත්නම් ඒක විශාල ප්‍රශ්නයක් වෙනවා . කලිනුත් ඕක ප්‍රශ්නයක් වෙලා නීතිමය උපදෙස් මත රිවස් උනේ. මොකද නීතියට ගියහම අපට බලයක් නෑ පාර්කින් නොකරන එකකට දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාම කිසිම අධිකරණයකින් අපට මේ පිළිබදව චැලෙන්ජ් කිරීමක් නෑ. චැලෙන්ජ් කලොත් අපට බලන්න වෙනවා මේක. දැනට අපි බයිලො එකක් පනවලා ඒකේ දඩ පනවන හැටි, බලපත්‍රයක් දෙන හැටි ඒවා කියලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එදා ත්‍රීවීල් කමිටු රැස්වීමේදී ත්‍රීවීල් රියදුරන්ගෙ ගැටළුව උනේ ඒගොල්ලන්ට බලපෑම් තියෙනවලු. අපි යෝජනාව ගෙනාවනෙනගරයේ අයට පමණක් මූලිකත්වය දෙන්න. ඒක හරි ඒ කටයුතු කරන්න ඕන. හැටන් නැෂනල් එක ලග ත්‍රීවීල් 38 ක් ද කොහේ තියෙනවා කියලා ඒගොල්ලෝ කියනව කියනවා. එයින් 18 ක් ද කොහේ බලපත්‍ර අරන් තියෙන්නෙ. බලපත්‍ර අරන් තියෙනවා 27 ක් .

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය සියල්ල කමිටුවෙදි සාකච්ජා නරන්න. එයගොල්ලා කැමති තීන්දුව ගන්න. අරගෙන මෙහාට එවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා  මහතා කතා කරමින්**

මෙහෙම තීරණයක්  ආවා එතනදී.  රියදුරන් කියනවා පිටින් ගෙනත් දානවා පාතාලෙ අය.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ සියල්ලම දන්නවා ඔය හැටන් නැෂනල් බැංකුව ලග ත්‍රී විල් එකක් දාන්න එතන ඉන්න ත්‍රීවීල් සංගමයට රු: 25,000.00 ක් ගෙවන්න ඕන.  ඒක තමයි ඇත්ත කථාව.  අපට රු: 1000.00 ක් ගෙවන්න බෑ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

කමිටුවෙදි මම කිව්වා.  මම බැන්නා.  එක පුද්ගලයෙක් ඉන්නවා අම්බලන්ගොඩත් නෙවෙයි.  ඔබතුමා දැක්කනෙ අපෙන් අවසරයක් නැතිව හැටන් නැෂනල් බැංකුව ලග පාර්ක් එකට කවුරුවත් එවන්න එපා.  මම කිව්වා සෝභිත මන්ත්‍රීතුමා දැනගන්නවා තමුසෙගෙ බූදලයක් නෙවෙයි මේක කියලා.  නගර සභාවෙ කියලා. ඒපාර මිනිහා නිශ්ශබ්ද උනා.  එහෙම තත්වයක් තියෙන්නෙ සභාපතිතුමා. එනිසා මේක ක්‍රියාත්මක කරන්න අවසර දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම  උනත් ඔය කමිටුවට ගියේ නැත්තෙ ස්වාධිනව හිතලා බලලා අවශ්‍ය තීන්දුව ගනියි කියන පරමාර්ථය ඇතිව.  මට දෙපැත්තක් බැලන්ස් කරන්න වෙනවා සමහරවිට.  තීන්දු ගන්න ඔයගොල්ලො.  කිසිම ප්‍රශ්නයක් නෑ.  මෙතනදි කතා කරන්න ඕින නෑ ඕක.

**6:8 2018- 07- 05 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ත්‍රීවිල් කමිටු  වාර්තාව**

<u>රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුව</u>

**<u>2018.07.05 දින ප.ව. 2.30</u>**

**<u>සහභාගීත්වය</u>**

1. කමල් වැල්ලගේ මයා - ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
3. නන්දන රාජපක්ෂ මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
4. දිනයාදූර ධර්මදාස මහතා - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව
5. එච්.මහින්දසේන මහතා - කමිටු සාමාජික
6. එම්. ගිවාන් සාරත විමලතුංග මහතා - කමිටු සාමාජික
7. පි.එම්. විජේසිංහ මෙ.වි. - තාක්ෂණ සේවා නිලධාරී
8. කේ.පියරත්න මයා - ආදායම් පරීක්ෂක
9. ටි. චන්න මයා - ආදායම් පරීක්ෂක
10. අචිරා රංජනි ලොකුගේ මිය - කළමනාකරණ සහකාර

**පිළිගැනීම - කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති**

ත්‍රිරෝද රථ හා වාහන කමිටුව සඳහා සහභාගි වීමට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන්, කමිටු සාමාජිකයින් ඇතුළු කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරයෙන් පිළි ගනිමින් රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදී..

| මාතෘකාව | ප්‍රකාශය කවුරුන් විසින් ද යන වග | සාකච්ජා වූ කරුණු | තීරණ |
|---|---|---|---|
| | | | |
| පසුගිය කමිටුවේදී සාකච්ජා කරන ලද කරුණු සමාලෝචනය | ගරු උපසභාපති තුමා කමල් වැල්ලගේ මයා | පුංචි පොලට යන පාරේ වැට ඉවත් කර ඇති ද යන්න ත් RTSකඩයඉදිරිපිටඇතිතෙල්බැරල්ඉවත්කිරීමපිළිබ දවිමසීම. | |
| | කේ. පියරත්න මයා | එම කටයුතු සිදු කර ඇති බව දැන්වීම. | |
| | ගරු උපසභාපති තුමා කමල් වැල්ලගේ මයා | අනවසර ලොතරැයි කුඩු හා අසනවසර වෙළඳ කුටි ඉවත් කිරීමත් පදික වේදිකාවේ වෙළඳාම් කරන පුංචි පොලට යන පාර දෙපස හා ඔරලෝස් කණුව අසල වෙළදුන් ඉවත් කිරීම සම්බන්ධව | |
| | කේ. පියරත්න මයා | එම කටයුතු සිදු කර ඇති බව දැන්වීම. සතියේ දින වල 4.30 පසුව හා සෙනසුරාදා ඉරිදා දින වල මෙම වෙළදුන් වෙළඳාමේ යෙදෙන බව දැන්විම. | |
| | ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ. සෝහිත රංජිත් මයා | බස් නැවතුම්පොළෙහි ඇති වැසිකිලිය නිසි ලෙස නඩත්තු නොවන බව පැවසිම. | |
| | ගරු උපසභාපති තුමා කමල් වැල්ලගේ මයා | ලොතරැයි කුටි සඳහා දිනකට රු. 100 ක මුදලක් හෝ මාසිකව රු.3000/- මුදලක් අය කිරීමට යෝජනා කිරීම. | |
| | ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ. සෝහිත රංජිත් මයා | පුඩ් සිටිවල මාළු විකිණිය හැකි ද යන්න විමසන ලදී. | |
| | ගරු නාගරික මන්ත්‍රි<br>දිනයාදුර ධර්මදාස මයා | | |
| | ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ. සෝහිත රංජිත් මයා | පුංචිපොළ මාර්කට් එකට ගෙන යාම ගැන අදහස් විමසන ලදී. | |

| | | | |
|---|---|---|---|
| | ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා | පලතුරු වෙළඳපළක් සැකසීමට තිබුණ තැන දැනට ත්‍රිරෝද රථ නැවතුම් පලක් ලෙස යොදා ගැනීම පිළිබඳ අකමැති බව ප්‍රකාශ කරන ලදී. තවද පුංචි පොලට යන මාර්ගය වන්වේ කිරීම අවශ්‍ය නොවන බවත් අවශ්‍ය නම් උදෑසන 6.30-7.30 අතරත් සවස 1.30-2.00 අතර වන්වේ කිරීම පමණක් ප්‍රමාණවත් බව පවසන ලදී. | |
| | ගරු නාගරික මන්ත්‍රී<br>දිනයාදුර ධර්මදාස මයා | ඉහත කරුණ ක්‍රියාත්මක කල යුතු බව පෙන්වා දීම. | |
| | ගරු උපසභාපති තුමා කමල් වැල්ලගේ මයා | ලංකා බැංකුව ලඟ ත්‍රීවීල් පාක් කිරීමට ඉඩ නොදෙන ලෙසත් ත්‍රිරෝද රථ ලියා පදිංචිය කිරීම සඳහා ත්‍රිරෝද රථ මුලින් ලියාපදිංචි වී ඇති අය පමණක් කැඳවන ලෙසත්, ත්‍රිවීල් අයිතිකරුවන්ගේ අදහස් විමසා ඒ අයට බලපත්‍ර ලබා දීමට කටයුතු කරන ලෙසත් කරුණු දැක්වීම. මුලින් ලියාපදිංචි වී ඇති අය 120 ක් පමණ සිටින බවත් එම ඊට අදාල හිඟ මුදල් දඩ මුදල් නොමැතිව අය කිරීමටත් . මේ 120 ට අමතරව අනිත් අයට බලපත්‍ර නිකුත් කරනුයේ කෙසේ ද යන්න පිළිබඳවත් විමසීම. | |
| | ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා | ත්‍රිවිල් බලපත්‍ර ගාස්තුව වැඩි කල යුතුයි. | |
| | ගරු නාගරික මන්ත්‍රී<br>නන්දන රාජපක්ෂ මහතා<br>- | අම්බලන්ගොඩ බල ප්‍රදේශයෙන් පිට අය වැඩි වශයෙන් ත්‍රිවිල් පාක් කර ඇති බව පෙන්වා දීම. | |
| | | | |
| | ගරු උපසභාපති තුමා කමල් වැල්ලගේ මයා | අළුතින් ත්‍රිවිල් 130 කට පමණ නවතා තැබීමට අවසර ලබා දිය හැකි බව පෙන්වා දෙමින් ත්‍රිවිල් ලියා පදිංචි කිරීමෙන් පසු අවසර පත්‍ර ලබා නොගන්නා ත්‍රිවිල් සම්බන්ධයෙන් ආර්.අයි. මහතා විසින් නීතිමය පියවර ගතයුතු බව පෙන්වා දෙන ලදී. 2018.07.20 දින ප.ව.2.30 ට ත්‍රිවිල් හිමිකරුවන් දැනුවත් කිරීමේ රැස්වීමක් කැඳවන ලෙස ද ප්‍රකාශ කරන ලදී. තවද ලිපි ඉදිරිපත් කර ඇති සියළුම දෙනාට නිත්‍යානුකූලව ඉල්ලීම් කිරීමට දැනුම් දෙන ලදී. | |

| | | | |
|---|---|---|---|
| | ගරු නාගරික මන්ත්‍රී<br><br>නන්දන රාජපක්ෂ මහතා<br>- | චාමර බුක් ෂොප් එක ළඟ වාහන ඇතුලට දැමීම සම්බන්ධව පෙන්වා දීම | |
| | ගරු උපසභාපති තුමා කමල් වැල්ලගේ මයා | ආර්.අයි. මහතාට ඒ සම්බන්ධව සොයා බලා ක්‍රියා කරන ලෙස දැන්වීම | |
| | ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා | මාළු ලෑලි ඉවත් කිරීම සම්බන්ධව ප්‍රකාශ කිරීම | |
| | ගරු නාගරික මන්ත්‍රී<br><br>නන්දන රාජපක්ෂ මහතා<br>- | පොල්වත්ත හන්දියේ ත්‍රිරෝද රථ 30 කට පමණ බලපත්‍ර ලබා ගත යුතු බව පෙන්වා දීම. | |
| | ගරු උපසභාපති තුමා කමල් වැල්ලගේ මයා | මුල් වටය කැඳවූ පසු දෙවනුව අනිකුත් අය දැනුවත් කිරීම කළ යුතු බව පෙන්වා දීම. | |
| | ගරු නාගරික මන්ත්‍රී<br><br>දිනයාදුර ධර්මදාස මයා | ගරු උප සභාපති තුමන් ඇතුළු නාගරික මන්ත්‍රී තුමන්ලාගෙන් ද කමිටු සාමාජිකයන්ගේ හා කාර්ය මණ්ඩලයටද මේ අවස්ථාවට සහභාගි වීම පිළිබ ස්තුතිය පුද කල අතර නගරයේ ඇති ගැටළු ප්‍රශ්න පිළිබද සාකච්ජා කර විසදා ගැනීම සදහා සහාය වීම පිළිබද ස්තුතිය පුද කරන ලදී. | |

සකස් කලේ

| | | |
|---|---|---|
| අචිරා රංජනී ලොකුගේ | ලේකම් | උප සභාපති |
| කළමනාකරණ සහකාර | බී.ඒ. ධම්මිකා | කමල් වැල්ලගේ |
| | අම්බලන්ගොඩ නගර සභාව | අම්බලන්ගොඩ නගර සභාව |

**2018- 07- 05 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද රථවාහන හා ත්‍රිරෝද රථ කමිටුවපිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**2018-7-05 දින ප.ව 2.30 ට පැවති ත්‍රීවිල් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත වූ අතර මෙහිදී අම්බලන්ගොඩ නගරසභා බල ප්‍රෙද්ශයෙහි පදිංචි පුද්ගලයන්ගේ ත්‍රීරෝද රථ සඳහා ස්ටිකරයක් ලබාදීමේ කාර්යය සඳහා දඩමුදල් අයකරගෙන කිරීම අපහසු බැවින් නැවත වරක් අලුතින්ම පිහිටුවීම සඳහා උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහාත් කමිටු වාර්තාවි සඳහන් ගාස්තුව අයකිරීම සඳහාත් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි**

**6:9 2018- 07- 09 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කර්මාන්ත කමිටු වාර්තාව**

<u>අම්බලන්ගොඩ නගර සභා කර්මාන්ත කමිටු වාර්තාව-**2018.07.09**</u>

**පැමිණීම**

1. එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති
2. කමල් වැල්ලගේ මහතා - ගරු උපසභාපති
3. ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී
4. බී.ඒ.ධම්මිකා මිය - ලේකම්,නගර සභාව,අම්බලන්ගොඩ
5. එච්.එල්.ද සිල්වා නිලමුනි මහතා - තාක්ෂණ සේවා නිලධාරී,නගර සභාව,අම්බලන්ගොඩ
6. පී.එම්.විජේසිංහ මෙය - තාක්ෂණ සේවා නිලධාරී,නගර සභාව,අම්බලන්ගොඩ
7. ආර්.ඩබ්.ඩී.මල්කාන්ති මිය -සංවර්ධන නිලධාරී, නගර සභාව,අම්බලන්ගොඩ

**පිළිගැනීම - ආර්.ඩබ්.ඩී.මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරී**

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු නාභා සිටුවීම උදෙසා අවශ්‍ය සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡා කර, එම කටයුතු වඩාත් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම මෙම කමිටුවෙහි අරමුණ බව ප්‍රකාශ කරන ලදී.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති**

මෙම කමිටුවෙහි ප්‍රධාන අරමුණක් තමයි පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 3/1/1/50 අංක සහිත 2018.04.19 දිනැති ලිපිය.මෙම ලිපිය මගින් පළාත් පාලන ආයතන මගින් සභා ප්‍රතිපාදන යොදාගෙන කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදි ප්‍රථමයෙන් මාසික සභාවට එම යෝජනා ඉදිරිපත් කර සභා සම්මත කර ගැනීමෙන් පසු සභා තීරණය ඇතුලත් වාර්තාව සමග පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය සමගින් අනුමැතිය සඳහා පලාත් පාලන කොමසාරිස් වෙත යොමු කළ යුතු බව එම ලිපියෙහි සඳහන් කර ඇත.මේක නීති විරෝධී ක්‍රියාවක් ලෙසයි මම හිතන්නේ.මේ ආකාරයෙන් ක්‍රියා කිරීමේදි මහජනතාව වෙනුවෙන් අවශ්‍ය කටයුතු කිරීම ප්‍රමාද වීම පමණයි මේකෙන් සිදුවන්නෙ..මේ ආකාරයට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම නිලධාරින්ගේ වගකීමක්.නගර සභා අඥාපනත පාර්ලිමේන්තුවෙන් පනවලා තියෙන්නේ.එම පනත මගින් අපට ලබා දිලා තියෙන බලතල වෙනස් කිරීමක් මේ කරලා තියෙන්නෙ.මේ ලිපිය නීත්‍යාණුකූලව බලාත්මක ලිපියක් නෙවෙයි.

**ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී**

මේ තාක්ෂණ සේවා නිලධාරී මහත්ම, මහත්මීන් මේ දේවල් ගැන දන්නවා අඩුයි.නවක නිලධාරීන් නිසා.මේ පිළිබඳව දන්න නිලධාරීනුත් කියන්නැ මේවා.ටොයිලට් එකේ ප්‍රශ්නේ බැලුවත්, වැඩිපුර ගෙවලා තියෙනවා, බීම් වලට ,PVC බට වලට.

**එච්.එල්.ද සිල්වා නිලමුනි මහතා - තාක්ෂණ සේවා නිලධාරී**

අපි එහෙම කරන්නැ.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති**

බස් නැවතුම්පොල වහල ඔයාලත් කීවා නිවැරදි කියලා.මේවයේ වගකිය යුතු සියලුම දෙනා මේවා නිවැරදී කියලා අත්සන් කරලා තියෙනවා.අපි කියන්නේ වැඩක් කරන කොට නිවැරදිව හරියට කරන්න කියලා.

**ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී**

අනෙක් අය බේරන්න ගියොත් වැරදිකාරයෝ වෙන්නේ ඔයාලා.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති**

ඔයාලා වැඩ කරලා මෙතනට ඇවිත් තියෙන්නේ.ඔයාලා වැඩ කරන්න දන්නවා.

**ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී**

ඔයාලා මිල ගණන් ගන්නේ RATE BOOK එකෙන්ද?

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති**

අපි ඉන්නේ මිනිස්සුන්ට සේවය කරන්න.එනිසා අපි කරන දේ නිවැරදිව කරන්න ඕන.මේ ගෙවීම් කරන්න තියෙන සියලූම දේවල් නිවැරදිව හොයලා බලන්න ඕන.පසු ගිය මාසික සභාවේදී තීරණය කළ පරිදි ,යෝජනා කළ කමිටුව පත්කරලා ඒ පරීක්ෂණය පවත්වලා වාර්තාව මීලඟ මාසික සභාවට ඉදිරිපත් කරන්න.හල්වතර කසල වෙන් කිරීම සඳහා හදපු ගොඩනැගිල්ල, මහජන පුස්තකාලයේ වැසිකිළිය සහ පින්නදූව පාර කාණුව පිළිබඳව පරීක්ෂා කරලා මේ කමිටුවෙන් වාර්තාවක් ගන්න.මේකට ලේකම්,තාක්ෂණ සේවා නිලධාරීන් හා විෂය නිලධාරීන් සම්බන්ධ වෙන්න.

**ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී**

අපි නිරන්තරයෙන් නිලධාරීන් සමඟ ඉන්නවා.එනිසා ඔයාලා බය නැතිව නිවැරදිව වැඩ කරන්න.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති**

ක්‍රිකට් බෝඩ් එකෙන් ආවා ක්‍රීඩාංගනය බලන්න.කොපමණ මුදලක් වැය වෙනවද මේ සඳහා?

**පී.එම්.විජේසිංහ මෙය - තාක්ෂණ සේවා නිලධාරී**

පස් හා වැලි සඳහා ලක්ෂ 20 ක් පමණ වැය වනවා.කොහු බත් වල මිල ගණන් දන්නෑ.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති**

තණ තිල්ල අපිට ක්‍රිකට් බෝඩ් එකෙන් හදලා දෙනවා කීවා .අපි පිට්ටනිය තලලා දෙන්න ඕන.මේ සඳහා පස් කියුබ් 500 ක් පමණ ඕන.පස් හලලා, ඒක වැලි හා කොහු බත් සමඟ කවලම් කරලා ගන්න ඕන.මෙහිදී 30% පමණ අපතේ යනවා. මේක තමයි TOP SOIL එක.අපි මේක කරලා නොදුන්නොත් , ක්‍රිකට් බෝඩ් එකෙන් මේක අතහරිනවා. බොරළු අඩු පස් ගන්න බලන්න.

**ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී**

අපි මේක කරමු සභාපතිතුමා.මම කොහු බත් ගන්න තැනක් බලන්නම්.බොරළු අඩු පස් තියෙනවා.රු.5000.00 ක් විතර වෙනවා කියුබ් එකක්.අපි මේ ක්‍රීඩාංගනයේ කාර්යය හොයලා බලලා කරමු.

**එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා - ගරු සභාපති**

ඔව් මේක අත්‍යාවශ්‍ය දෙයක් නිසා අපි මූලික අවධානයක් දීලා කටයුතු කරමු.

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් පැමිණි සියලූම දෙනාට ස්තුති කිරීමෙන් අනතුරුව ප.ව.3.40 ට පමණ කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

| | | |
|---|---|---|
| සකස් කළේ - | බී.ඒ.ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප්, |
| ආර්.ඩබ්.ඩී.මල්කාන්ති, | ලේකම්, | සභාපති, |
| සංවර්ධන නිලධාරී, | නගර සභාව - අම්බලන්ගොඩ | නගර සභාව - අම්බලන්ගොඩ |
| නගර සභාව - අම්බලන්ගොඩ | | |

**2018- 07- 09 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කර්මාන්ත කමිටු වාර්තාවපිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**2018- 07- 09 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කර්මාන්ත කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:10 2018- 07- 26 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කර්මාන්ත පරීක්ෂන කමිටු වාර්තාව**

<u>අම්බලන්ගොඩ නගර සභා කර්මාන්ත පරීක්ෂණ කමිටු වාර්තාව-**2018.07.26**</u>

**පැමිණීම**

8. කමල් වැල්ලගේ මහතා - ගරු උප සභාපති
9. මගගේ අතුල ප්‍රියන්ත මහතා - ගරු නගර සභා මන්ත්‍රී
10. ධම්මික කොඩිකාර මහතා - ගරු නගර සභා මන්ත්‍රී
11. එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා - ගරු නගර සභා මන්ත්‍රී
12. ඩී.එච්.එස්.ඩී.ගුණවර්ධන මහතා - තාක්ෂණ සේවා නිලධාරී,නගර සභාව,අම්බලන්ගොඩ
13. එච්.එල්.ද සිල්වා නිලමුනි මහතා - තාක්ෂණ සේවා නිලධාරී,නගර සභාව,අම්බලන්ගොඩ
14. ආර්.ඩබ්.ඩී.මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරී, නගර සභාව,අම්බලන්ගොඩ

**පිළිගැනීම - කමල් වැල්ලගේ මහතා - ගරු උප සභාපති**

2017 වර්ෂයේදී ඉටු කරන ලද කර්මාන්ත පිළිබඳ පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා පැමිණි සිටි ගරු නගර සභා මන්ත්‍රීවරුන් හා නිලධාරීන් කර්මාන්ත පරීක්ෂණ කමිටුව වෙනුවෙන් පිළිගන්නා ලදී.

- කර්මාන්ත පරීක්ෂණ කමිටුව සඳහා සහභාගී වූ ගරු නගර සභා මන්ත්‍රීවරුන් කර්මාන්ත පරීක්ෂණයට අදාල පහත සඳහන් කර්මාන්ත ලිපි ගොනු පරීක්ෂා කරන ලදී.

ද්වීතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම - 2017
කසල වෙන් කිරීම සඳහා ගබඩා පහසුකම් ලබාදීම.

Iiපළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2017

මහජන පුස්තකාලයේ සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය ඉදිකිරීම.

Iii විශේෂ ව්‍යාපෘති - 2017

පින්නදූව පාර පැති කාණුව ඉදිකිරීම.

මීට ඉහතදී කර්මාන්ත විෂය කටයුතු සිදු කළ නිලධාරීනිය විසින් බිල්පත් අනුමැතිය සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කිරීමේදී මිණුම් පත්‍ර වල කාර්යාලීය පිටපතක් තබා නොගැනීම නිසාවෙන් කර්මාන්ත වල ඉදිකිරීම් වලට අදාල මිණුම් පරීක්ෂා කිරිමට නොහැකි බැවින් අදාළ ආයතන වලින් මෙම ලිපි ලේඛණ ලබා ගැනීමෙන් පසු නැවත 2018.08.13 වන දින පෙ.ව.9.30 ට කමිටුව රැස් වී අදාල පරීක්ෂණ කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් පැමිණි සියලුම දෙනාට ස්තුති කිරීමෙන් අනතුරුව පෙ.ව.11.15 ට පමණ කමිටුවේ කටයුතු අවසන් කරන ලදී.

| | | |
|---|---|---|
| සකස් කළේ - | බී.ඒ.ධම්මිකා , | ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප්, |
| ආර්.ඩබ්.ඩී.මල්කාන්ති,<br>සංවර්ධන නිලධාරී,<br>නගර සභාව - අම්බලන්ගොඩ | ලේකම්,<br>නගර සභාව - අම්බලන්ගොඩ | සභාපති,<br>නගර සභාව - අම්බලන්ගොඩ |

**2018- 07- 26 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කර්මාන්ත පරීක්ෂණ කමිටු වාර්තාව-පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**2018- 07- 26 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කර්මාන්ත පරීක්ෂණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පරීක්ෂණ සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගෙ ඉල්ලීම පරිදි, ද්විතීක සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම කසල වෙන් කිරීම් හා ගබඩා පහසුකම් ලබා දීම, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2017 මහජන පුස්තකාලය ආශ්‍රිත සනීපාරක්ෂක වැසිකිළි පද්දතිය ඉදිකිරීම, විශේෂ ව්‍යාපෘති පින්නදූව පාර පැති කානු ඉදි කිරීම යන කාරණා ගැන කමල් වැල්ලගේ මහතා, මගගේ අතුල ප්‍රියන්ත මහතා, ධම්මික කොඩිකාර මහතා, රාහුල ලලිතවික්‍රම මහතා කියන මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවකින් ගෙවීම පිළිබඳ සනාථ කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දෙන්න කිව්වා. නිර්දේශ ලබා දීමට අවශ්‍ය මිනුම් කටයුතු තියෙන ලිපි ලේඛණ නැතැයි වාර්තා කරලා තියෙනවා. ඒක තමයි ඇත්ත තත්වය දැනට තියෙන.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එකක විතරයි මිනුම් කටයුතු තිබුනෙ. අනෙක් මිනුම් කටයුතු ගාල්ලට ඇරලා ආපහු එවලා නැතැයි කියලා.TO මහත්තයා ඒක ගෙනාවද දන්නෑ. ගෙනැල්ලා භාර දුන්නා නම් ආපහු 13 දාගෙන තියෙනවා. එදාට පරීක්ෂා කරනවා නම්.

## (07) ටෙන්ඩර්භාමිළගණන්

**7:1** ටෙන්ඩර්:- නැත

**7:2** මිළගණන්:- නැත

**(08)** **වීම**

**08.01** නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා **2018** ජුනි මාසය සඳහා සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු **.43935.00** ක මුදලක් එම්.එස්.වීරසිංහ මහතා වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08.02** මිය ගිය මල්ලියාවඩු ප්‍රේමණී මහත්මිය සමෘද්ධිලාභියෙකු වන බැවින් ආදාහනාගාරය වෙන් ලබාදෙන රු.**2000.00** ක සහන මුදල ඥාතියෙකු වන නො.**18/12**, නගර සභා නිවාස, ධම්මකුසල මාවත, අම්බලන්ගොඩ ලිපිනයෙහි පදිංචි බඩබ්.පී.උපුල් සනාජී මහතා වෙත ආපසු ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08.03** මිය ගිය කොඩිකාර යසවතී මහත්මිය සමෘද්ධිලාභියෙකු වන බැවින් ආදාහනාගාරය වෙන් ලබාදෙන රු.**2000.00** ක සහන මුදල පවුලේ සාමාජිකයෙකු වන නො.**03**,කන්ද මාවත, පටබැඳිමුල්ල,අම්බලන්ගොඩ ලිපිනයෙහි පදිංචි ජී.එල් .චාන්දනී මහත්මිය වෙත ආපසු ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08:04**අම්බලන්ගොඩ නගර සභාව සතු සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා **2018** ජුනි මාසය වෙනුවෙන් ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු.**279667.00** ක මුදලක් අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය වෙත ගෙවීමට ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම් නිර්දේශය මත එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

| අනු අංකය | වාහනයේ අංකය | 2018.06.01 දින සිට 2018.06.14 වන දින දක්වා මුදල | 2018.06.17 දින සිට 2018.06.29 වන දින දක්වා මුදල | 2018 ජුනි මස සඳහා මුළු මුදල |
|---|---|---|---|---|
| 01 | 252 – 0730කැබ් රථය | රු: 3674.00. | රු: 5700.00. | රු:19374.00. |
| 02 | PF – 7424කැබ් රථය | රු: 12360.00 | රු: 23976.00 | රු:36336.00 |
| 03 | QL – 6618ත්‍රිරෝද රථය | රු. 2055.00 | රු. 1960.00 | රු. 4015.00 |
| 04 | RA –3709ට්‍රැක්ටර් රථය | රු. 8682.00 | රු.9213.00 | රු. 17895.00 |
| 05 | RA –8796ට්‍රැක්ටර් රථය | රු. 9456.00 | රු12765.00 | රු.22221.00 |
| 06 | SL –3731අත්ට්‍රැක්ටරය | ------ | රු:555.00 | රු:555.00 |
| 07 | SL -3942 අත්ට්‍රැක්ටරය | රු:1026.00 | රු666.00 | රු:1692.00 |
| 08 | SL– 5694 අත්ට්‍රැක්ටරය | රු1461.00 | රු. 777.00 | රු2238.00 |
| 09 | GL – 9369 ගලි රථය | රු. 16650.00 | ------- | රු. 16650.00 |
| 10 | RF–0022ට්‍රැක්ටර් රථය | ------ | ------ | ------ |
| 11 | RF – 0031 ට්‍රැක්ටර් රථය | රු. 6042.00 | රු. 10101.00 | රු. 16143.00 |
| 12 | RF – 0970 ට්‍රැක්ටර් රථය | රු.7 212.00 | රු.9879.00 | රු. 17091.00 |
| 13 | RF – 0986 ට්‍රැක්ටර් රථය | රු. 8997.00 | රු. 13209.00 | රු. 22206.00 |
| 14 | 49 – 9436 ට්‍රැක්ටර් රථය | රු. 3420.00 | රු. 11877.00 | රු. 15297.00 |
| 15 | මාර්ග තලනය | රු4440.00 | ------ | රු4440.00 |
| 16 | LL–7642කෘ කැබ් රථය | -------- | රු. 5661.00 | රු. 5661.00 |

| | | | | |
|---|---|---|---|---|
| 17 | LL – 6406 ඩම්ට්‍රක් රථය | ------- | ------- | ------- |
| 18 | RA –2509 ට්‍රැක්ටර් රථය | රු. 5700.00 | රු. 5439.00 | රු.11139.00 |
| 19 | ගස් කපන යන්ත්‍රය | රු. 685.00 | රු. 1370.00 | රු.2055.00 |
| 20 | ZA–5185බැකෝලෝඩරය | රු. 20202.00 | රු. 28638.00 | රු. 48840.00 |
| 21 | තණ කොල කපන යන්ත්‍රය | රු:3835.00 | රු:1370.00 | රු:5205.00 |
| 22 | පොල්වත්ත ආදාහනාගාරය (තණකොළ කැපීමට) | රු:685.00 | ------- | රු:685.00 |
| 23 | පටබැඳිමුල්ල ආදාහනාගාරය (තණකොළ කැපීමට) | රු. 685.00 | රු. 685.00 | රු1370.00 |
| 24 | සභා ගරාජය තුළ සිදු කරන අලුත් වැඩියා සඳහා | -------- | -------- | -------- |
| 25 | SA – 2806හාඩ්මෙක් රථය | රු. 888.00 | රු. 888.00 | රු. 1776.00 |
| 26 | ධූමායන කටයුතු සඳහා | ------ | රු. 4563.00 | රු. 4563.00 |
| 27 | තණ කොල කපන යන්ත්‍රය ( අත්ට්‍රැක්ටරය) | රු2220.00 | -------- | රු2220.00 |
| | මුළු එකතුව | **රු.130375.00** | **රු. 149292.00** | **රු. 279667.00** |

**08:05 UCCC – 1 දරණ පරිගණකය සඳහා H41 –M/B එකක් සහ Toshiba TB HDD යන උපාංගයන් සවිකර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගාස්තුව වන රු.11600.00 ක මුදලක් ටියුලිප් කම්පියුටර්ස් වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**08:06 2018 අප්‍රේල් මස ජල සැපයුම ලබා ගැනීම වෙනුවෙන් රු.26260.37 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත සභා අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**08:07 2018 මාර්තු මස ජල සැපයුම ලබා ගැනීම වෙනුවෙන් රු.26990.30 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**08:08 2018 ජූලි මස 01-15 දක්වා වැට් මුදල වන රු.116813.23 ක මුදල දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමා ලේකම් නිර්දේශය ලෙස ලියවෙන්න ඕන. ඒක ලියවිලා නෑ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

න්‍යාය පත්‍රය හදන විට නිර්දේශය කල තැනැත්තාගේ නම ගහන්න.

**08:09 බස් නැවතුම්පල අංක 27 දරණ කඩ කාමරයේ වහලයේ ඉවත් කරන ලද තහඩු ෂීට්නවය අතරින් තහඩු ෂීට් හතක් ගබඩාවට බාර දී ඇති බැවින් එම තහඩු ෂීට් හත සඳහා පමණක් ගෙවීම් කිරීමටගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**08:10 අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ප්‍රතිපාදන ග්‍රාමීය යටිතල පහසුකම් නගා සිටුවීමේ වැඩසටහන , හිරේවත්ත විජේ මහතාගේ නිවස අසල කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම කර්මාන්තයේ අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා ඇති ඇස්තමේන්තු වටිනාකම වන රු.30,000.00 ක මුදල සභා අරමුදලින් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සෝභිත මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කොට්ඨාශයේ හිරේවත්ත විජේ මහතාගේ නිවස අසලින් ඇති පාර කියලා. රු:120,000.00 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනුමත වෙලා තියෙනවා. නමුත් මේ කාරණය සඳහා රු:150,000.00 ක් යනවා. ඒ රු:30,000.00 අපේ අරමුදලෙන් වැය කරන්න තීන්දු කරලා තියෙනවා. නමුත් එක් කොන්ත්‍රාත්කාරයෙක්වත් ඉදිරිපත් වෙන්නෙ නෑ. හේතුව හොයලා බැලුවා. මේ කාණු හැම එකටම ටොයිලට් වලෙන් එන ඒවා යොමු කරලා තියෙනවා. ඉතිං සර්, කොහොමද අහනවා මේකෙ වැඩ කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා, එක් කෙනෙක් ඉදිරිපත් වෙලා තියෙනවා. භාර ගත්තා එයා වැඩ කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙනම් එයා එවන්න.PHI මහත්ත.යා මේ කියන හිරේවත්ත , විජේ මහතාගේ නිවස අසලින් යන කාණුව. මේ කාණුවට බට දාලා තියෙනවලු ටොයිලට් වලෙන්ම. මම දන්නෙ නෑ මිනිස්සු කියන්නෙ. පොඩ්ඩක් ගිහින් බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

27 වන කඩ කාමරය කඩකාමරය වහල නවීකරණය කියලා තියෙන්නෙ. මට මතකයි කලිනුත් තිබුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කලින් තිබූ එකේ වාර්තාව. පී.වී.ඩී. තිලකරත්න. මේක සිද්ධ වෙලා තියෙන්නෙ අප්‍රේල් 25. ගොඩක් කලින් එයා ලියුමක් දීලා තියෙනවා. පළමු බිල්පතෙන් රු: 12900/- දෙවැනි බිල් පතෙන් රු:5000/-, රු:17490/- ක් ගිහිල්ලා තියෙනවා. චාමර බුක් ෂොප් රු:5040/- යි. මේ සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවලා ගිය සැරේ 2018.06.05 පැවති සභාවෙ 8:4 අංකය ඉදිරිපත් වෙලා . ඒකෙදි අපි තීන්දු කරලා තියෙනවා බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ අ'ක 27 කඩ කාමරයේ වහලයේ තහඩු සවි කිරීමේදී කැඩී බිඳී ගිය ෂීට් 9 ගබඩාවට භාර දීමට සිදු කොට එහි වාර්තාවක් ද සමග මීලග සභාවට ඉදිරිපත් කරන ලෙස වාර්තා කරන්න කියලා. පරණ යකඩ තහඩු ගබඩාවට භාර දී ඇති බව වාර්තා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

TO මහත්තයාගෙන් අහන්නෙ. බස් ස්ටෑන්ඩ් එකෙන් ඇවිල්ලා තරප්පුවෙන් නැගලා උඩ දෙවැනි එකද? චාමර එකට අල්ලපු එකද? මම කොණ්ඩෙ කපන්න ගිය වෙලේ එක මුදලාලි කෙනෙක් මාව එක්ක ගිහිල්ලා පෙන්නුවා තහඩුව නැවිලා. හුළගට නැව්ච්ච තහඩුව කෙලින් කරලා හදලා තියෙනවා. නැව්ච්ච තැනින් ඉරක් ගිහිල්ලා හිලක් පේන්න තියෙනවා. එක තහඩුවක් පෙන්නුවා. මම ඒකයි ඇහුවෙ තහඩු 9 ම ගෙනාවද කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගෙනැත් තියෙන්නෙ. අඩි 12 ක් දිග තහඩු 07 ක් ගෙනැවිත් ගබඩාවට භාර දී ඇත.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ඒ කියන්නෙ 2 ක් වහලෙ තියෙනවා නේද? 7 යි ගෙනැත් තියෙන්නෙ. අද TO මහත්තයාට ගියොත් බලන්න පුළුවන් නැමිච්ච තහඩුව කෙලින් කරලා ගහලා තියෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්

කැඩිච්ච තහඩු 9 ම ගෙනැත් දුන්නද?

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

7 යි ගෙනැත් දීලා තියෙන්නෙ. වැඩිය කථා කරන්න දෙයක් නෑ. ඒගොල්ලන්ගෙ බිලේම තියෙනවාතහඩු 9 ක් කියලා. 7 යිනෙ භාර දීලා තියෙන්නෙ. 2 ක් අඩු කරලා ඉතිරි මුදල ගෙවන්න.

ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්

8:6, 8:7 ජල බිල්පත්වල කොහේද ස්ථාන කියලා දාලා නෑ. ඒකත් දාන්න කියන්න.

**08:11** **ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් ලබා ගෙනඇති ණය මුදල් 2008 II, III ,IV කාර්තු සඳහා වාරික සහ පොළී මුදල වන රු.248625.00 ක මුදල දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**08:12** **අම්බලන්ගොඩ පටබැඳිමුල්ල ආදාහනාගාරයේ චිමිනිය සුදු යකඩින් සෑදීමට අදාල ඇස්තමේන්තු ගත මුදලින් 50% කමුදලක් "නර්ඩ්" ආයතනයට ගෙවීමේදී රදවාගනු ලබූ 10%ක රැදවුම් මුදල වන රු. 103,030.61ක රැදවුම් මුදල නැවත එම ආයතනයට ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නර්ඩ් ආයතනය සමග වැඩ කරන විට 50% ක් මුලින් ගෙවන්න කියනවා. ගෙවීම් පතයේදී මේ ගොල්ලො කරන්නෙ 10% ක් රදවා ගෙන . ඒ ගොල්ලො කියනවා අපට 50% ක්ම ගෙවන්න. මූලික බිලෙන් අඩු කරලා පස්සෙ වැඩ කර ගන්න කියලා. රාජ්‍ය ආයතනයක් නිසා 50% ම ගෙවලා කටයුතු කරනවා.

**08:13** **A4 පැකට් 50ක් ලබා ගැනීම වෙනුවෙන් රු.30,000.00ක මුදලක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවවෙතගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**8:14** **ඇණවුම් අංක 1839 යටතේ ලබාගත් හියුම් පයිප්ප සඳහා රු.17,000.00 ක මුදලක් අම්පේගම කොන්ක්‍රීට් වර්ක්ස් ඇන්ඩ් කන්ට්‍රක්ෂන්ස් වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ලේකම්ගෙ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**08:15** **අම්බලන්ගොඩ නගර සභාවට ලබා ගත් ඡායා පිටපත් යන්ත්‍රය සඳහා රු.97750.00 ක මුදලක් ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**08:16**

අම්බලන්ගොඩ නගර සභාවට ලබාගත් ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් රු.**12,800.00** ක මුදලක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**.08.17**

බිටුලින්ක් ඉමල්ෂන් පුද්ගලික සමාගම වෙත රු.**610,000.00** ක මුදල ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08:18** අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයට ලබාගත් ලිපිද්‍රව්‍ය වෙනුවෙන් **12,302.00** ක මුදලක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

-

**08:19** ඇ. අංක **1841** යටතේ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනයට ලබාගත් පස් වෙනුවෙන් **P.H.C.** ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ වෙත රු.**16,200.00**ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**. 08:20** ජාතිකජාතික ගොඩනැගිලි ගොඩනැගිපර්යේෂණ සංවිධානයේඅධ්‍යක්ෂ ව්‍යාපෘති කළමනාකරණ අංශය ඉංජිනේරු **J.K.** ජයවර්ධන මහතා විසින් එවන ලද අම්බලන්ගොඩ නගර සභා කාර්යාල ගොඩනැගිල්ල අබලන්වීම සම්බන්ධයෙන් තත්ත්ව පරීක්ෂණ වාර්තාව සඳහා රු.**41,465.55**ක මුදලක් ගෙවීම සඳහාගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගෙව්වට පස්සෙ තමයි වාර්ථාව එන්නෙ අපට. ඒ ගෙවපු එකට අමතරව තමයි මේ බිල එවලා තියෙන්නෙ.

**08:21** **2017** මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ධම්මානන්ද මාවත සපත්තු කාණුව ඉදි කිරීමේකර්මාන්තයට අදාළ කොන්ත්‍රාත්තුවට අදාළ රු.**13,307.51**ක රැඳවුම් මුදල අම්බලන්ගොඩ , කරිත්තකන්ද අංක **83** ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජා මණ්ඩලයේ සභාපති වෙත නිදහස් කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගෙු නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08:22** අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් ගෙවීම සඳහා රු. **57,000.00**ක මුදල ගෙවීම සඳහාගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08.23** අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයට ලබාගත් විදුලි උපාංග වෙනුවෙන් චානක එන්ටර් ප්‍රයිසස් වෙත රු.**64,265.00** ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08.24** නගර සභාව සඳහා ටෝනර්යක් ලබා ගැනීම වෙනුවෙන් ලංකා ටෙක්නොලොජි ඇප්ලිකන්ස් පුද්ගලික සමාගමට රු.**10925.00**ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

.

**08.25** නගර සභාව සඳහා ටෝනර්යක් ලබා ගැනීම වෙනුවෙන් ලංකා ටෙක්නොලොජී ඇප්ලිකන්ස් පුද්ගලික සමාගමට රු.**10925.00**ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

## (09) ගිණුම්

**09.1** **2018 ජුනි මාසයට අදාල පොදු ගිණුම- වියදම් වැය විශ්ලේෂණය හා 2018 ජුනි මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## (10) ඇස්තමේන්තු

**10:1)** නගර සභා පටබැඳිමුල්ල ආදාහනාගාරයේ ඇතුල්වන දොරටු ප්‍රදේශයේ තාර දැමීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.280,000.00 ඇස්තමේන්තුව සභාගත කරන ලදි.

__තීරණය__

**නගර සභා පටබැඳිමුල්ල ආදාහනාගාරයේ ඇතුල්වන දොරටු ප්‍රදේශයේ තාර දැමීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 280000.00ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:2)** විලේගොඩ ගා/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය අසල කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.90,000.00 ක් ඇස්තමේන්තුව සභාගත කරන ලදි.

__තීරණය__

**විලේගොඩ ගා/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය අසල කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 90000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා වසින් සථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි**

**10:3)** රණසූරිය පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.20,000.00 ක් ඇස්තමේන්තුව සභාගත කරන ලදි..

__තීරණය__

**රණසූරිය පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.20,000.00 ක් ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:4)** දෙල්දූව පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරනය කිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.140,000.00 ක් ඇස්තමේන්තුව සභාගත කරන ලදි.

<u>තීරණය</u>

**දෙල්දූව පාර අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.140,000.00 ක් ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:5)** පටබැඳිමුල්ල ආදාහනාගාරයේ මායිම් තාප්පයේ තීන්ත ආලේප කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.160,000.00 ක් ඇස්තමේන්තුව සභාගත කරන ලදි.

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල ආදාහනාගාරයේ මායිම් තාප්පයේ තීන්ත ආලේප කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.160,000.00 ක් ඇස්තමේන්තුව පිළිගතයුතු බවත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:6)** පටබැඳිමුල්ල නගර සභා මාළු වෙළඳපළෙහි මාළු ලැලි කඩා ඉවත් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.13,000.00 ක් ඇස්තමේන්තුව සභාගත කරන ලදි.

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල නගර සභා මාළු වෙළඳපළෙහි මාළු ලැලි කඩා ඉවත් කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.13,000.00 ක් ඇස්තමේන්තුව පිළිගතයුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා වසින් සථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:7)** මානාන ක්‍රීඩා පිටියට ඇතුලු වන ස්ථානයේ ගේට්ටුව සැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු: 70000.00ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

**මානාන ක්‍රීඩා පිටියට ඇතුලු වන ස්ථානයේ ගේට්ටුව සැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 70000.00ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:8)** පොල්වත්ත ක්‍රීඩාංගනයේ ආරක්ෂිත දැල සවිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු: 500000.00 ක් වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**පොල්වත්ත ක්‍රීඩාංගනයේ ආරක්ෂිත දැල සවිකිරීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 500000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:9)** පටබැඳිමුල්ල ආදාහනාගාරයේ දොර පියන සහ ජනේලය අලුතින් දැමීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු: 95000.00 ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල ආදාහනාගාරයේ දොර පියන සහ ජනේලය අලුතින් දැමීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 95000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:10)** පටබැඳිමුල්ල ආදාහනාගාරයට පිවිසෙන ගේට්ටුව සැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු: 51000.00 ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**පටබැඳිමුල්ල ආදාහනාගාරයට පිවිසෙන ගේට්ටුව සැකසීමේ කර්මාන්තය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 51000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:11)** හල්වතුර කසල රැස් කරන භූමියට පිවිසුම් ගේට්ටුව සැකසීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු :70000.00 ක්වූඇස්තමේන්තුවසභාගත කරන ලදී.

<u>තීරණය</u>

**හල්වතුර කසල රැස් කරන භූමියට පිවිසුම් ගේට්ටුව සැකසීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු 70000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සභා අරමුදලින්**

**ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:12)**රේණුක මෝටර්ස් ආයතනය අසල පොදු ළිඳ අලුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු: 40000.00 ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

__තීරණය__

**රේණුක මෝටර්ස් ආයතනය අසල පොදු ළිඳ අලුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 40000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:13)**පොල්වත්ත ක්‍රීඩාංගනයේ අත්පන්දු ක්‍රීඩා පිටිය සහ එම භූමියේ පැති බැම්ම සහ පස් ඇතිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු:1,000,000.00 ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

__තීරණය__

**පොල්වත්ත ක්‍රීඩාංගනයේ අත්පන්දු ක්‍රීඩා පිටිය සහ එම භූමියේ පැති බැම්ම සහ පස් ඇතිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු1000000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවත් එම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ලේකම්ගේ නිර්දේශය මත සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි**

**10:14**නගර සභා ක්‍රීඩාපිටිය අසල ලොරි රථගාලට මායිම් වන ආරක්ෂිත බැම්ම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු:300,000.00 ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

__තීරණය__

**නගර සභා ක්‍රීඩාපිටිය අසල ලොරි රථගාලට මායිම් වන ආරක්ෂිත බැම්ම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු 300000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:15)**කායවර්ධන මධ්‍යස්ථානයේ පළමු මහල ඉදිකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු: 3,300,000.00 ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

__තීරණය__

**කායවර්ධන මධ්‍යස්ථානයේ පළමු මහල ඉදිකිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු. 3300000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**10:16)** අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතුවලට අදාළ විසිරි ජල සැපයුම් පද්දතිය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.3,880,000.00 ක්වූඇස්තමේන්තුවසභාගතකරනලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

මෙතන පොඩි ගැටළුවක් තියෙනවා සභාපතිතුමා. හදපු පිට්ටනිය නේද? මේක අලුතින් බට දාලා හැදුවනෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තණකොළ වැවීමෙන් පස්සෙ වතුර මල් සවි කරනවා. ලංකාවෙ දැනට කරන්නෙ ජිනසේන මෝර්ටස් විතරයි. ඒ ගොල්ලො ඇවිල්ලා පරීක්ෂණයක් කරලා බලලා ඇස්තමේන්තුවක් දීලා තියෙන්නෙ. නමුත් ටෙන්ඩර් කරන්න ඉස්සෙල්ලා ඇස්තමේන්තු සභාවෙන් අනුමත කරන්න ඕන. මට මතක විදිහට ලක්ෂ 35 ක් විතර යනවා. මේ ලක්ෂ 35 වැය කරන්නෙ නැතිව අපට මේ ග්‍රවුන්ඩ් එක හදලා වැඩක් නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

සභාපතිතුමා ජිනසේන වගේ ආයතනයක් කරනවා නම් කිසිම ගැටළුවක් නෑ. පලපුරුදු ආයතනයක්. මට මුදල පිළිබඳවයි ගැටළුවක් තිබුනෙ. අපි ඒක සම්පූර්ණයෙන්ම කරමු.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ වැඩේ අපි බෝඩ් එක ලව්වා කරනවා නම් මේ කාර්යත් අපි ලක්ෂ 35 ත් වියදම් උනත් අපි මේක කරන්න ඕන. සභාවෙන් අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතුවලට අදාළ විසිරි ජල සැපයුම් පද්දතිය සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද රු.3880000.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යොජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි**

**11)** වෙනත් කරුණු

11:1 **අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 අප්‍රේල් මස වාර්තාවසභාගත කරන ලදි.**

ආයතනයේ සායන තිබූ දින ගණන 16 ½, පැමිණි රෝගීන් සංඛ්‍යාව 96, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 6, මාසය සඳහා වැය වූ ඖෂධවල මුළු වටිනාකම රු: 12.293.83, එක් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු: 128.06 ක් බවත් වාර්තා කර තිබුණි.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 අප්‍රේල් මස වාර්තාව සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර පසුගිය වර්ෂයකදී ලබා ගන්නා ලද විනකටු පිළිබඳ වාර්තාවක් ඉදිරියේදි ලබාදෙන ලෙස සභාව විසින් දැනුම් දෙන ලදි.**

**11:02 අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 මැයි මස වාර්තාව සභාගත කරන ලදි.**

ආයතනයේ සායන තිබූ දින ගණන 21½, පැමිණි රෝගීන් සංඛ්‍යාව 132, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය ගණන 6, මාසය සඳහා වැය වූ ඖෂධවල මුළු වටිනාකම රු: 18076.40, එක් රෝගියෙක් සඳහා වැය වූ මුදල රු: 136.94 ක් බවත් වාර්තා කර තිබුණි.

ආයුර්වේද වෛද්‍ය නිලධාරිනිය සමග සාකච්ඡා කර, වෛද්‍ය නිලධාරිනියගෙන් වාර්තාවක් ලබා ගෙන සභා අරමුදලෙන් ආයුර්වේද බෙහෙත් අවශ්‍ය පරිදි යම් ප්‍රමාණයක් (රු: 50,000.00 ක පමණ) ලබදීම ලේකම්තුමිය විසින් නිර්දේශ කර තිබුණි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ කියන්නෙ දැනට ලබා දෙන බෙහෙත් යම් අඩුවක් තියෙනවා කියලා නගර සභා අරමුදලෙන් ලබදීමට සභාවෙ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

අපි පසුගිය වාරේ මේ සභායට ඉන්න කොට ඔය වීන කටුද මොන කටුද කියලා ලොකු වියදමක් දරලා ඇත්තටම මම ඒ අවස්ථාවේදීත් විරුද්ධ වුණා. ඒ කටුවලට මොකද වෙලා තියෙන්නෙ කියලා පරීක්ෂණයක් පවත්වන්න. ඔය කට්ටක් ගේන්න එපා කියලා කිව්වා. ඔය එක කට්ටක් රුපියල් ලක්ෂයක්ද දෙකක්ද මං දන්නෙ නෑ. ඒ වෙලේ හිටපු වෛද්‍යවරිය ඇවිල්ලා මේක පතුරුවලා ඕන කිව්වා. අන්තිමේදි ගහපු කට්ටකුත් නෑ. සල්ලිත් ඉවරයි. දැන් ඔය කටු තියෙනවද මලකඩ කාලද දන්නෙ නෑ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි ඔය කටු සභාවෙන් අරන් දුන්නද? මට මතක නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

ඔව්. ඔව්. අපේ ජගත් කුමාර මන්ත්‍රීතුමාලා සාක්ෂි දරනවා පෙට්ටිවල දාලා ෆොටෝ දාලා නගර සභාවෙ. ඒ වෛද්‍යවරිය සභාවට ඇවිල්ලා තමයි ෆේස් බුක් වලත් දාලා තිබුණා. ඒ කටුවලට වෙච්ච දේ වහාම සොයන්න. කරුණාකරලා සොයලා වාර්තාවක් දෙන්න ලේකම්තුමිය අපට ඒ කටු තියෙනවද නැද්ද කියලා.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 මැයි මස වාර්තාව සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර ආයුර්වේද බෙහෙත් අවශ්‍ය යම් ප්‍රමාණයක් ලබාගැනිම**

**වෙනුවෙන් රු.50000.0 ක මුදලක් සහා අරමුදලින් ලබා දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:3** **පරිසර බලපත්‍ර ලබා ගෙන කර්මාන්ත නාම ලේඛනය සභාගත** කරන ලදී.

2018.07.03 දින පැවති මාසික සභාවේදී පරිසර බලපත්‍ර ලබා ගෙන ඇති කර්මාන්ත පිළිබඳ විස්තර ලබා දෙන ලෙස දන්වා තිබුණි.

<u>*තීරණය*</u>

**පරිසර බලපත්‍ර ලබාගෙන ඇති කර්මාන්ත නාම ලේඛණය සහ 2018 බලපත්‍ර සහිත නාම ලේඛණය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි**

**11:4** **දකුණු පළාත් ඩෙංගු මර්ධන සතිය 2018.07.31 දින සිට 2018.08.04 දක්වා යෙදී ඇති අතර එම සතිය තුළ පවත්වන වැඩසටහන් පළාත් පාලන ආයතනවල සම්බන්ධීකරණය යටතේ සිදු කරන ලෙස ප්‍රධාන අමාත්‍යාංශ සහකාර ලේකම්ගේ 2018.07.26 දිනැති ලිපිය මගින් දන්වා ඇති බැවින් ,** ඒ අනුව සංවර්ධන සහකාර (පරිසර) නිලධාරිනියවිසින් ඉදිරිපත් කර තිබූවාර්තාව සභාගත කරන ලදී.

ඒ අනුව, ප්‍රචාරක කටයුතු සිදු කිරීම, වැඩසටහන්වලට සහභාගිවන්නන් සඳහා උදෑසන හා දහවල් සංග්‍රහ කටයුතු සිදු කිරීම, වාහන පහසුකම් සැපයීම, අවශ්‍ය මානව සම්පත් සැලසීම ඒ අතර වන බවත්, හා ඉහත වැඩසටහන සඳහා සහභාගි වන අයට සංග්‍රහ කටයුතු සිදු කිරීමට අවශ්‍ය වියදම් ඇස්තමේන්තුව රු:26,125.00 ක් බවත් සඳහන් කර අනුමැතිය සඳහා ඉරිරිපත් කර තිබුණි.

<u>*තීරණය*</u>

**දකුණු පළාත් ඩෙංගු මර්ධන සතිය 2018.07.31 දින සිට 2018.08.04 දක්වා යෙදි තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද රු.26125 .00 ක අත්තිකාරම් මුදල ලබා දීම සඳහා ගරු මන්ත්‍රීවරුනගේ විරෝධතාවයක් නොතිබූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** **අම්බලන්ගොඩ නගර සභා පොවෙළඳ පොළ සංකීර්ණය කඩ කාමර අංක 6 බදු දීම සඳහා වූ** ප්‍රසම්පාදන දැන්වීම අනුමැතිය සඳහා සභාවට ඉදිරිපත් කර තිබුණි.

<u>*තීරණය*</u>

**පොදු වෙළඳපොළ අංක 06 කඩ කාමරය බදුදීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම සඳහා සකස් කරන ලද ක්‍රම සම්පාදන දැන්වීම සහ ඊට අදාළ කොන්දේසි සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12.1** **' නව පරිගණකයක් ලබා ගැනීම සඳහා** කළමනාකරණ සහකාර ඩී.ආර්.කේ. මෙන්ඩිස් මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කාර්යාලයේ පරිගණක නිතර තිතර අක්‍රිය වන බව නිලධාරීන්ගේ වාර්තා කරන බැවින් අලුත් පරිගණක එකක් හෝ දෙකක් මිලදී ගැනීමත් උප සභාපතිතුමාගේ කාමරයට ආසන්න කාමරය වායු සමනය කර එම ස්ථානයේ ස්ථාන ගත කිරීමත් සුදුසු බව නිර්දේශ කර තිබුණි.

<u>*තීරණය*</u>

**කාර්යාලයෙහි පරිගණක නිරන්තරයෙන්ම අක්‍රිය වන බැවින් අලුතින් පරිගණක දෙකක් මිලදී ගෙන උප සභාපතිතුමාගේ කාමරයට ආසන්න කාමරය වායු සමීකරණය කොට එම ස්ථානයේ අදාළ**

**පරිගණක ස්ථානගත කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12.2 ' පවත්නා මාර්ගයකට තවත් මාර්ගයක් සම්බන්ධ කිරීම මැයෙන් තාක්ෂණ සේවා නිලධාරී ඩී.එම්.එස්.ඩී. ගුණවර්ධන** ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2018.03.29 දිනැති ලිපිය 2018.04.05 දින මාසික සභාවෙ 12:10 යටතේ සභා ගත කර ඇත. අදාල ස්ථානය ගරු නාගරික මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සමග පරීක්ෂා කරන ලද බවත්, අදාල ස්ථානයේ පදිංචිකරුවෙකු මාර්ගය දිගු කිරීමට දැඩි ලෙස විරෝධය පල කරන ලද බවත්, ඒ අනුව එය කිරීම නොහැකි කාර්යක් බවත් දන්වා තිබුණි.

<u>*තීරණය*</u>

**පීරිස් වෙද මාවත ,ඇටලස් හන්දිය අසලින් බෝගහවත්ත ,කන්දෙගොඩ දෙසට දිවෙන මාර්ගය දිගු කිරීම සම්බන්ධයෙන් අදාළ ස්ථානයේ පදිංචිකරුවෙකු විරෝධතාවය පළ කර ඇති බැවින් මෙය සිදු කිරීම කළ නොහැකි කාර්යයක් බව නිරීක්ෂණය වී ඇති බවත් මේ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කළ නොහැකි බවට සභාව දැනුවත් කිරීම සඳහා මෙය ඉදිරිපත් කරන ලදී.**

**12.3 ' පාර ලබා ගැනීම ,** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

ඉහත කරුණ සම්බන්ධයෙන් එවන ලද අංක 125/1, පටබැදිමුල්ල, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ආර්.එම්. හේමසිරි මහතාගේ 2018.07.03 ලිපිය අනුව, ඉහත ලිපිනයේ පදිංචි අයගේ ඉඩමෙන් අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය පුළුල් කිරීම සඳහා ඉඩමෙන් කොටසක් ලබා දී ඇති බවත් , එය ලබා දෙන විට ඒ මහතාගේ නිවසට ප්‍රවේශවීම සඳහා මාර්ගයක් ලබා දෙන බව නගර සභාව විසින් එකගත්වය පල කර ඇති බවත් දන්වා තිබූ බවත්, එම ගැටළුව සම්බන්ධයෙන් විසඳුමක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>*තීරණය*</u>

**පටබැදිමුල්ල , අම්බලන්ගොඩ පදිංචි ආර්.එම්.හේමසිරි මහතා විසින් අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනය පුළුල් කිරීම සඳහා තමාගේ ඉඩමෙන් කොටසක් ලබා දී ඇති බැවින් තම නිවසට ප්‍රවේශ වන මාර්ගයක් ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව පාවිච්චි කරන ලද ආකාරයටම පාවිච්චි කිරීමට කටයුතු කරන ලෙසට සභාව විසින් දැනුම් දෙන ලදි.**

**12.4 'Future Minds 2018 – National Higher Educational and Career Exhibition Request for Hoarding Location**' මැයෙන් සභාපති විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

'Future Minds කියලා ප්‍රදර්ශනයක් තියෙනවා. ගාල්ලයි, නුවරයි, කොළඹයි. මෙය කරන්නෙ කොළඹ නාලන්ද විදුහලෙන්. විශ්ව විද්‍යාලයට ඉස්සරහට යන ළමයින්ට පිටරට විශ්ව විද්‍යාලවල යොදා ගැනීම කොහොමද කියන එක තමයි පෙන්වන්නෙ. ඒ ගොල්ලන්ගෙ ඇඩ්වටිස්මන්ට් බෝඩ් එකක් සවි කරන්න මීට ඉස්සර ඉදන්ම අපි අවසර දීලා තියෙනවා. එය නොමිලේ සවි කරන්න අවසර දෙන්න කියලා ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>*තීරණය*</u>

**අධ්‍යාපන කටයුත්තක් බැවින්** 'Future Minds**ආයතනය විසින් 2018 අගෝස්තු 01 සිට 2018 සැප්තැම්බර් 9** වන දින **දක්වා බස්නැවතුම්පල ඉදිරිපිට මුදල් අයකිරීමකින් තොරව දැන්වීම්**

**ප්‍රදර්ශනය කිරීමට කරන ලද ඉල්ලීම සහා අනුමැතියට යටත්ව ලබාදීම වෙනුවෙන් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**12.5** **' අම්බලන්ගොඩ තානයම් භූමිය බදුදීම'** මැයෙන් අධ්‍යක්ෂ- එම්.එච්. ජමල්ඩීන් මහතා, ASCOT AMBALANGODA (PVT) LTD කොළඹ විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත විෂය සම්බන්ධයෙන් අංක අම්/නස/2/6 හා 2018.07.19 දිනැති ලිපිය සම්බන්ධව අප විසින් ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් යෝජනාවලට පිළිතුරු පහත පරිදි දක්වා එවා ඇත.

<u>යෝජනා අංක</u>

1. ඔබ දන්නා පරිදි තානායම් භූමිය ඉදිකිරීම් කටයුතු වලට අනුමැතිය ලබා ගැනීමට අදාල කටයුතු සිදු වෙමින් පවතින අතර අනුමැතිය ලබා ගැනීමට සාමාන්‍ය වශයෙන් වසරක පමණ කාලයක් ගතවනු ඇත. මීට ඉහතදී මෙවැනි කටයුත්තක් සඳහා අප හට අනුමැතිය ලබා ගැනීමට වසර එකහමාරක් පමණ ගත වූ බැවින් ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සැලසුම් සහ අනුමැතියට අදාල වැඩ කටයුතු අවසන් කර ගැනීමට වසරක කාලයක් ලබා දෙන මෙන් ඉල්ලමු.

2. අප අරමුණ වන්නේ තත්වයෙන් උසස් ගුණාත්මක භාවයෙන් ඉහල සංචාරක හෝටල් ව්‍යාපාරයක් පොදු මහජනතාවට ලබා දීමයි. මෙහි ඉදි කිරීම් කටයුතු සැලසුම් කරන පරිදි නිසි ආකාරව නිම කරවා ගැනීමට අඩුම වශයෙන් වසර තුනක කාලයක් ගතවන බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.

තවද තානායම් භූමිය ඇති පරිශ්‍රය තාප්පයකින් ආවරණය කිරීමට අවශ්‍ය කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කරන බව ද දන්වා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , තානායම කියන්නෙ අම්බලන්ගොඩට කිවයුතු නෑ. කාලෙ කන්න ඕන නෑ. ඒ නිසා ඔය සිංහල භාෂාවෙන්ම එවපු ඔය සමාගමට ඉතාම හොඳ දකුණේ සිංහල භාෂාවෙන්ම පිළිතුරු යවන්න. අපි ඔබතුමා සමග කකුල් දෙකෙන් නෙවෙයි අත් දෙකෙනුත් ඉන්නවා. හතරෙන්ම ඉන්නවා. බය වෙන්න එපා. ඒ නිසා සමාගමේ ඉන්න අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නෙ මොක්කුද කියලා මම දන්නෙ නෑ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා ඕකට පිළිතුරු යවන්න. අපි ගරු උප සභාපත්තුමාත් මමත් යෝජනාව ගේනවා. මෙතුමාත් කොන්ත්‍රාත් කරන ඉදි කිරීම් ක්ෂේත්‍ර යේ පලපුරුදු තියෙන කෙනෙක්. මම මගේ හෝටල් ව්‍යාපෘතිය තනියෙන් කරන පුද්ගලයෙක්. මේ දකුණෙ ඉපදිච්ච අපි හොඳට දන්නවා මගේ හෝටල් ව්‍යාපෘතිය කාමර 102 ක්. මම මගේ දේශපාලනය කරන අස්සෙ කාල කළමනාකරනය කොහොම හරි කරගෙන ඉන්නවා. මං මේ වන විට මිලියන 100 කට වැඩිය ආයෝජනය කල පුද්ගලයෙක්. ඔය ව්‍යාපෘතියට අවසර ගන්න මගේ ව්‍යාපෘතියත් IEE කියන ව්‍යාපෘතියක්. ඔය සියලුම ආයතන 40 ක් පමණ බදුල්ල හෝටලයකට ගෙන්නලා සියලු විශ්ව විද්‍යාලවල දේශකයො ඇවිල්ලා කියන්න ඕන රිපෝට් එක ගන්න අම්බලන්ගොඩ ඉගෙන ගත්තු මිනිස්සු ඉන්න තැනක්. කරුණාකරලා ඔබතුමාට බැරි නම් මම ලියන්නම් හොඳ සිංහල භාෂාවෙන් අදාල කම්පැණියට. ඔය සැලසුම් අඳින්න අපේ මොහාන්ට දුන්නා නම් සතියෙන් ඇඳලා දෙයි කාමර 500 ක්ම. ඕන තරම් ආකිටෙක්ලා ඉන්නවා ලංකාවෙ හොඳ බුද්ධිමත්. ඕන තරම් සැලසුම් කරන්න පුළුවන්. සතියයි දෙකයි. අපේ ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා ඉංජිනේරුවෙක්. ඕකට සැලසුම් හදන්න යන්නෙ සතියයි. මම තනියෙන් දුන්නා මහජන බැංකුවටමගේ ඇස්තමේන්තුව. මිලියන හත්සිය ගානක්. ඕවා එච්චර දේවල් නෙවෙයි. පැහැදිලිව දෙන්න සභාපතිතුමා මමත් උප නගරාධිපතිතුමත් අපි තීන්දුවක් ගත්තා. අපි ඒ තීන්දුවෙ තමයි ඉන්නෙ. ඔබතුමාම පිළිතුර අරගෙන සංවර්ධන කමිටුවට දාන්න. ඔය කාල සීමාවට අදාල කරන්නෙ නැත්නම් මම ඔබතුමාට කියන්නෙ මගෙන් ඇහුවා අගමැතිතුමාගෙ කාර්යාලයෙන් . අම්බලන්ගොඩ ප්‍රමුඛත්වය දියයුත්තෙ කුමකටද? මගේ පළවෙනි උත්තරය අම්බලන්ගොඩ ප්‍රමුඛතාවය 1. අම්බලන්ගොඩ මාකට් ගොඩනැගිල්ල ඉදි කිරීම. 2. අම්බලන්ගොඩ තානායම ඉදිකිරීම. 3. අම්බලන්ගොඩ මාර්ග තදබදය අවම කිරීම සඳහා බයි පාස් එක සෑදීම. අපට ඕන නගරයට වැඩක්

කරන්න. ඒ නිසා ඔය යක්කුන්ට ඕවා දීලා කියන්නෙ. කිවයුතු තැනට කියනවා සභාපතිතුමා. ජනාධිපතිතුමාට උනත් කියනවා කියන්න ඕන උනොත් පක්ෂ නායක අගමැතිතුමාට උනත් කියනවා. ඒක තමයි හැටි. මැරුනත් අපට හෙන ගහනවා. මැරුනත් අපට ගල් ගහනවා. ඔය තානායම් භූමියේ ඔය අය කරන මේ සියල්ලම ඉදිරියට කරන්න දුන්නොත්. අපි ඔබතුමා සමග ඉන්නවා. ගේන්න පුළුවන් උපරිම සල්ලි ටික ගේනවා. ඒ සහයෝගය අපි දෙනවා. කිසි පක්ෂ දේශපාලනයක් නෑ. අපට ඕන අම්බලන්ගොඩ නගරය දියුණු කරන්න. ඔය කියන කාල සීමාවට කරන්න බැරි නම් මෝඩයෝ කරන්න එපා. සෙල්ලම් කරන්න එපා. කරුණාකරලා ඔය කියන වකවානුවට කරන්න බැරි නම් අපට පවරන්න. අපි එකතු වෙලා මේ වැඩය කරමු සභාපතිතුමා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමා, ඊට තවත් ටිකක් එකතු කරන්න ඕන. දැන් ඇස්කොට් කිව්වහම අපිත් අප්සෙට් වෙනවා. පසුගිය කාලෙ අපිත් ඇස්කොට් එකේ තමයි හිටියෙ. මොකද අද හදයි හෙට හදයි කියලා බලන් ඉන්නවා මේක. නිකන් හරියට බොද වූ සිහිනයක් වගේ තමයි . අපි හැමදාම මේ සිහිනය දැක දැක ඉන්නවා. දැන් එදා කිව්වහම ඔය යෝජනාව ගෙනාවාම ඩෙනට් මන්ත්‍රීතුමා එහෙත් ආවා කවුද මං දන්නෙ නෑ ටයි එකක් දාපු මනුස්සයෙක්. කවුද දන්නෑ. අරකට අවුරුද්දක් යනවා. මේකට අවුරුද්දක් යනවා කියනවා. මට නම් කොන්ත්‍රාත් ගැන පලපුරුද්දක් නෑ. නමුත් මගේ පියා හොද පිළිගත් කොන්ත්‍රාත්කරුවෙක් සහෝදරයො කරනවා. ඩෙනට් මන්ත්‍රීතුමා , උප සභාපතිතුමා වගේ අය දැන් දන්නවා මේ කරන්නෙ බොරුවක් කියලා. මෙතන පොරොන්දු උනා අවුරුද්දක් දෙන්න කල්. තාප්පේ බදින්න කියලා ඒකටත් කාලයක් ඉල්ලනවා. සාමාන්‍ය මිනිස්සුත් තාප්ප බදිනවා අනවසරයෙන් හරි. ඇස්කොට් නම් හිගන කොට් එකක්. ගේට්ටුවක් දාලා ඒ වපසරිය ආරක්ෂා කර ගන්න බැරි ඔය හිගන කොට් එකෙන්. වහාම ඕක ඉවත් කර ගන්න සභාපතිතුමා මේ ගිවිසුම බේරුම්කරුවෙකු ලවා හෝ අවලංගු කර ඩෙනට් මන්ත්‍රීතුමා , උප සභාපතිතුමා වැනි අය සමග එකතු වෙලා මේකට මොකක්හරි කරන්න. මේක තමයි අම්බලන්ගොඩ නගරයේ හදවත. මේක ආරක්ෂා කරන්න කියලා නැවත වරක් ඉල්ලා සිටිනවා. ඔබතුමා නීතිඥයෙක්. ඔබතුමාට මේ සම්බන්ධව හොද දැනුමක් තියෙනවා අවුරුදු 25 ක පමණ පලපුරුද්දක් එක්ක. ඔබතුමා මේ සම්බන්ධයෙන් දැඩිව ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලමින් අපි ඔබතුමා සමග ඉන්නවා කියමින් නවතිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් පාලකයෙක් වශයෙන් මට තියෙන ගැටළුවක් කියන්න ඕන. මේ ගොල්ලො අවුරුදු හයක් අපට බදු ගෙවලා තියෙනවා. අවුරුද්දකට නගර සභාව ලක්ෂ 25 ක ආදායමක් ලබනවා කොහොමද කියලා හිතන්න වෙනවා. දැන් මේ පාරත් ඔඩිට් ක්වරි එකක් තියෙනවා. ඒකෙ තියෙන්නෙ 2002 සිට 2006 වෙනකම් තිබුණා. 2007 සීල් කරලා. 2007 දි පළාත් සභාවට අරගෙන කැඩුවා. ඒ කාලය තුළ ඒ මුදල්අයකර නොගැනීමට හේතු දක්වන්න කියලා. මේ ගොල්ලො දැනට දෙලක්ෂ ගානක් බදු ගෙවනවා. මේ මුදල අහිමි වෙනවා අපි කරන වැඩවලින්. ඒ මුදල අහිමි කර ගන්නවා පිළිතුරක් වශයෙන් මේක භාර දෙන්න කෙනෙක් ඉන්නවද? ආයතනයක් තියෙනවද? ප්‍රශ්නයට පිළිතුරක් නැතිව මේක එක පාරට අවලංගු කිරීම ගැන හිතන්න එපා. මේ දේ අපට කරන්න පුළුවන් වන්නෙ කොයි විදිහටද? අහිමි වන ආදායමට අපි මොකද කරන්නෙ. අපිට සල්ලි තියෙනවද මේක හදන්න. ග්‍රවුන්ඩ් එක හදා ගන්න බැරිව ඉන්නවා අපි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමා ඔබතුමා කියනවනෙ දෙලක්ෂෙ ගන්න. සමූපකාරයේ එහා පැත්ත පොඩි කෑල්ල බදුදීලා වාහන ගහන්න රුපියල් එක් ලක්ෂ ගානක් ආදායමක් ගන්නවා. මොකද අද වෙළද වටිනාකම වැඩියි. මොකක්හරි එහෙම දෙයක් හරි කරන්න. මොකද අවුරුදු හයක් තිස්සෙ අපට බදු ගෙවන ඒගොල්ලො අපේ බලාපොරොත්තු නගරයේ ජනතාවගෙ බලාපොරොත්තු ඉටු උනේ නැනෙ. වෙනත් ක්‍රමයක් හරි අනුගමනය කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔබතුමත් සමග එකගයි. එකග වුනාට මේ එකගතාවයෙන් ඉවත් වෙන්න ඕන මේ අහිමි වන ආදායම උපයාගන්න ක්‍රමවේදයක් සලසගෙන මිසක් නිකන් ඉවත් වෙන්න එපා.

__ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ඔය විගණන විමසුම ආවෙ කලින් තිබුණු බදු මුදල නොගෙවීම සම්බන්ධවනෙ. ඒකට නීත්‍යාණුකූලව කටයුතු කරන්න ඕන කොහොම කලත් බදු අයකර ගැනීමට.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්__

ගරු මහ ඇමතිතුමත් , ඔබත්, මමත්, අපි නම් කරගත් මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත් එකතු වෙලා මේකට සාකච්ඡාවක් කරමු. මේ තියෙන්නෙ නැවත පිහිටුවන්න වැඩසටහන.මේ යටතේ විවිධ පොලී යටතේ මුදල් වෙන් කරලා තියෙනවා මිලියන 750 ක් වන තෙක්. අඩු පොලී 6.65%. එතකොට මහ ඇමතිතුමත්, ඔබත්, මමත්, තව කිහිප දෙනෙක් එක්ක මේක සාකච්ඡා කරමු. මොකද මේකෙ කිසිම දේශපාලනයක් නෑ. මේක පොදු ප්‍රශ්නයක් අම්බලන්ගොඩ දේශපාලනය කරන සියලු දෙනාට. අප මැරුනත් අපහාස විදිනවා මේ කාලය තුලදිවත් මේකට නිසි ක්‍රියාමාර්ගයක් නොගත්තොත්. ඔබතුමාටවත්, මටවත් මේ අන්ඩර් හැන්ඩ් කවුරුවත් නෑ. මං ඒක හොදටම දන්නවා. අපට දෙන්න පුද්ගලයොත් නෑ. අපේ එකම පරමාර්ථය මේ 21 දෙනා එක්ක අත්වැල් අල්ලාගෙන කටයුතු කරන එක. අපට යම් දවසක් තියෙනවා මේකෙ මුල්ගල තියලා අපි 21 දෙනා එක්ක මේක විවෘත කරන දවස ඒක තමයි මම හිතනවා මම දේශපාලනය කරන පුද්ගලයෙක් හැටියට ජීවිතයට ලබන්න පුළුවන් උපරිම සතුට අම්බලන්ගොඩ මිනිස්සු වෙනුවෙන්. ඒ නිසා අපි මේක ඔබතුමා කියන ඔය රු:225,000/- ක මුදල පැත්තකට කරලා, ආදායම අහිමි වන එක නෙවෙයි මං කියන්නෙ අවුරුදු ගානක් අපට තිබ්බ්ච උරුමය නැති කරලා දැන්වත් අඩු ගානෙ අපි මේකට ක්‍රමයක් සොයමු. ප්‍රතිපාදන වෙන් වෙලා තියෙනවා ඕන තරම්. ණය මුදල් තියෙනවා. ඔබතුමා කිව්වා අපට නගර සභාවට ණය මුදලක් ගන්න බෑ කියලා. එතකොට අපට පිළියමක් ගන්න වෙනවා. මේක සාකච්ඡා කරලා මේකෙ තියෙනවා ලක්ෂ 76 ක් වියදම් කරලා හදපු සැලැස්ම. ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා හිටිය කාලෙ නාගරික සංවර්ධන අධිකාරියේ. අපට සැලැස්ම ඉල්ල ගන්න බැරි වෙන එකක් නෑ. මොකද මේකට සම්බන්ධ උනා මොහාන් පී ද සිල්වා මහතා . අපට ඒක ඉල්ල ගන්න පුළුවන්. මමත් එන්නම්. අපි යමු නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා හමු වෙන්න. ඕන නම් ඇමතිතුමත් හමු වෙමු. කිසි ගැටළුවක් නෑ. අපි ඒ සැලසුම් ඉල්ලලා බලමු මේක කරන්න. කාමර 50 මෙතුමා ගහයි මාස හයෙන්. මම දන්නවා මගේ හැකියාව කොච්චරද කියලා. ඉක්විප්මන්ට් තියෙනවා නම් කාමර 50 ක් ගහන එක මාස හය හතක වැඩක්. ඒක නිසා අපි මේකට මැදිහත් වෙමු. සභාපතිතුමා මැදිහත් වෙලා සාකච්ඡා කරලා සැලසුම තියෙනවා නම් ඒක අරගෙන කුමන හෝ ක්‍රමවේදයක් හදලා අපි මේක පුළුවන් නම් අපේ නගර සභාව හරහාම ඉදිකරන්න උත්සාහ කරමු. පවතින හොද මිලකට දෙන්න. ඔබතුමත්, මමත් අපි පොඩි කාලෙ අවුරුදු හත අට කාලෙ ඔතනින් නාන්න යනකොට ඔතන ප්‍රධාන ගේට්ටුවෙන් යන්න දුන්නෙ නෑ. ඒ කාලෙ කලේ ජෝන් කීල්ස්ලා. අපි පස්සෙ රිංගලා එන්නෙ. හොද පාලනයක් තිබුණා. ඒ නිසා මම කියන්නෙ නැවත වතාවක් අඩු ගානෙ මේ නගරෙ ජීවත් වන පොඩි එවුන්ටවත් ඒ අවස්ථාව අරන් දෙන්න. බැහැයි කියලා දෙයක් නෑ. අපි මේකට මහන්සි වෙමු. ඔන්න ඔය කියන ගිවිසුම් ටික අවලංගු කරලා අපි එකතු වෙලා අදාල බලධාරීන්. ඇමතිවරු එක්ක සාකච්ඡා කරලා ඉදි කරන්න කටයුතු කරමු. මම ඔබතුමන් එක්ක දෙපයින්ම ඉන්නවා කිසිදේකට බය වෙන්න එපා. මේ කටයුත්ත කරමු කියලා යෝජනා කරමු.

__ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

අනික් එක සභාපතිතුමා කාමර 501 ක් ගැහුවෙ අවුරුදු දෙකක් ගියෙත් නෑ. ඌරවත්ත ශ්‍රීබ්‍රීස් එක පටන් ගත්තෙ කොහොමද පොඩි තත්වයෙන්. දැන් කොහොමද? ඒක නිසා මොකක් හරි සැලසුමකට කරලා මේක ඉක්මන් කරන්න කියලා අපිත් ඉල්ලා සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්__

මේ ගැන කථා වෙන කොට පසුගිය වකවානු තුළ ඔබතුමා තමයි විවේචනයට ලක් උනේ. අතීතයේ මොන හේතුවක් නිසා ආපස්සට ගියත් ඒවා ඇන හිටියත් නරක නාමය දැනට ලැබී තිබෙන්නෙ ඔබතුමාට. නගරාධිපතිතුමා මේක කරන්නෙ නෑ කියලා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නමුත් ඔය කිසිම ක්‍රියාවකට මා සම්බන්ධ නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

ඒක තමයි සභාපතිතුමනි , මේ කටයුත්ත අපට කනින් කොනින් ඇහෙන වචනවලින් මේ කියන්නෙ . මේ කතන්දරය මෙහෙම ගායොත් තවදුරටත් අපවාද තමයි අහන්න වෙන්නෙ. ඒ නිසා ඔබතුමාගේ දේශපාලන ජීවිතයටත් ඒක බලපාන නිසා මේ කටයුත්ත මේ සභාව තුලදී කුමක් හෝ ආකාරයකින් කලයුතු යැයි මා යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමා ඒකටත් පොඩි උත්තරයක් දෙන්න ඕන. ඔබතුමාට නම් කිසිකෙනෙක් දෝෂාරෝපන කරන්නෙ නෑ. අපි සභාවක් විදිහට අපි මන්ත්‍රීවරුත් ඉදලා තමයි ඔය ගිවිසුමට එකග වෙලා ගිවිසුම් ගත උනේ. අපි සියලු දෙනාම ඒ සම්බන්ධයෙන් වග කියන්න ඕන. එහෙනම් අපටත් ඒ අවලාද එන්න ඕන. නමුත් සභාපතිතුමා දැන් ඔය දෙලක්ෂ ගාන අපට ඔය එන්නෙ අවුරුදු 6 ක් තිස්සෙ ඉදලනෙ. ඊට කලින් ඔය තානායම කඩලා කොච්චර කල් වෙනවද?

.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

2002 සිට 2009 දක්වා සතයක්වත් නෑ.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ඒක නිසා ඔය දෙලක්ෂ ගාන අමතක කරමු සභාපතිතුමා. මේ අවුරුදු 6 ක ඉදන්නෙ ඔය දෙලක්ෂ ගාන එන්නෙ. ඔය අහිමි වෙලා තිබුණු කාලෙත් අපි මේ නගර සභාව පවත්වාගෙන ගියා. ඒ ආදායම නැතිව මේ නගර සභාව කොහොම හරි පාලනය කරානෙ. ඒ නිසා මම කියන්නෙ ඩෙනට් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි ගිහිල්ලා අපි මනුස්සයො අපට ඇමති කෙනෙක් හමු වෙන්න යන්න යන්න බැරි කමක් නෑ. ගරු ජනාධිපතිතුමා හමුවෙන්න යන්න බැරි කමක් නෑ. අගමැතිතුමා හමුවෙන්න යන්න බැරි කමක් නෑ. අපි යන්නෙ පොදු දෙයක් කරන්න. අපේ ගමේ දෙයක් කරන්න. අපට පක්ෂයක් පාටක් ඕන නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි දීලා තියෙන්නෙ මාස 8 යිනෙ. මේ ගොල්ලො පළවෙනි එක ඉල්ලන්නෙ අවුරුද්දයි. තව අපි කියනවට වැඩිය මාස 04යි. අපි මේක දීලා ඊට පස්සෙ තීරණයක් ගනිමු. අපිත් සාධාරණ වෙමු. ඒගොල්ලන්ගෙ වැඩ පටන් අරන් ආරම්භ කරන්න ඕන කොහොම ගියත්. අපි දුන්නෙ මාර්තු 31. බලමු මේ ගොල්ලො ඉල්ලන්නෙ තව මාස 4ක්. අපි 8 ක් දීලා තියෙනවා. ඒගොල්ලො අවුරුද්දක් ඉල්ලන්නෙ. ඊට පස්සෙ අවලංගු කරන්න තීරණයක් ගනිමු.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඕක එවලා තියෙන්නෙ වගකිවයුතු නිලධාරියෙක් ද සභාපතිතමා.?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එච්.එම්. ජමල්ඩීන්. ජමල්ඩීන් කියන්නෙ හිටපු මුසාමිල්ගෙ පුතා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ඒක අපට වැදගත් නෑ. ඒ ද බී ද සී ද අපට වැඩක් නෑ. ජනාධිපතිතුමාගෙ පුතා උනත් අපට වැඩක් නෑ. අපි ඔබතුමා කියනවා වගේ මෙහෙම කරමු. එහෙමනම් සභාවෙ මන්ත්‍රීවරුන්ගෙ එකගතාවය මත . අපි දුන්නෙ 2019 මාර්තු මාසය වන විට ඉදිකිරීම් ආරම්භ කරන්න. තව මාස 4 ක් දෙනවා ලිඛිතවම. ඔබතුමත් ගැලවෙන්න මන්ත්‍රීවරුන්ටත් ලියුමෙ පිටපතක් සමග දාන්න. එතකොට සියලු මන්ත්‍රීවරු එකගයි. 2019 ජූලි 30 ට පෙර අනිවාර්යෙන්ම මේ පලවෙනි අදියරේ වැඩ පටන් ගන්න ඕන. එසේ නොකරන්නේ නම් අපි අනිවාර්යෙන්ම අගෝස්තු මාසයේ සිට මේක අත්පත් කර ගන්න කටයුතු කරන්න ඕන.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මම කතා නොකරම හිටියෙ ඕක සම්බන්ධව. කතා කරලා තියෙන්නෙ සැහෙන්න නේද සභාපතිතුමා. කණ්ඩායම් රැස්වීමෙදි මායි සභාපතිතුමයි ඇත්තට ඒ තත්වයට ආවා ඊයේ. මම කිව්වෙත් ඔය මාස 4 දෙමු. මාස 4 දුන්නට පස්සෙ අපට පුළුවන් ලිඛිතව අරන් ඊට පස්සෙ ලක්ෂ 2 1/2 ට නෙවෙයි ලක්ෂ 5 ක් දුන්නත් ඕක අවලංගු කරන්න ඕනමයි. අපට අම්බලන්ගොඩ මිනිස්සුනට මුහුණ දෙන්න ඕන. ඒ නිසා මාස 4 ක් දීලා වැඩේ අවසන් කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තාප්පෙ බදින්න කාලයක් ඉල්ලලා නෑ. තාප්පය බැද ආවරණය කිරීමේ කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කරන බව දන්වනවා. තව මාස 4 ක් දීලා ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් දන්වන්න.

<u>තීරණය</u>

**තානායම සභාවේ මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත ලබා දී ඇති කාලයට අමතරව තව දුරටත් මාස 04 ක කාලයක් ලබා දිමට එකඟ වූ අතර 2019 ජූලි මස 31 දිනට ප්‍රථම ව පළමු අදියරේ ඉදිකිරීම් ආරම්භ කිරීම සිදු කළ යුතු බවත් එසේ නොකරන්නේ නම් මෙම ගිවිසුම අහෝසි කිරීමට පියවර ගැනීම සුදුසු බවට ලිඛිතව දන්වා යැවීමටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**12.6 ' සුනාමියෙන් අවතැන් වූ අයට ඔප්පු ලබා දීම-අම්බලන්ගොඩ THWනිවාසසංකීර්ණය'**මැයෙන් ගාල්ල මිනින්දෝරු අධිකාරි විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ අනුව මේකෙන් සිදු වන්නෙ THWනිවාස ව්‍යාපෘතියේ කැබලි 84 ක් ලබා දීලා තියෙනවා නගර සභාවෙන්. නගර සභාවට අපි ඔප්පුවක් ලිවීමේදී ඔප්පු දෙකකින් අරන් තියෙන්නෙ. ඒ ඔප්පු දෙකට අදාල නම නැත්නම් අලුත් පිටුවක තමයි මේක ලියා පදිංචි වෙන්නෙ. මේ කියන විදිහට ගියොත් එහෙම අපි දෙන ඔප්පුවේ වටිනාකමක් නැති වෙනවා. ඒ නිසා මේක හදනවා නම් කරන්න වෙන්නෙ පෞද්ගලික මිනුම්දෝරුවෙක් ලව්වා මැනුම් කරලා අපි කියන නම සඳහන් කරලා ඔප්පුව ලබා දීම. එහෙම නැත්නම් අපි අර ක්‍රමයට යන්න වෙනවා. රජයේ මිනින්දෝරු අධිකාරියේ ක්‍රමයට. ඒ නිසා සභාවෙන් අවසරය ඉල්ලා සිටිනවා පෞද්ගලික මිනුම්දෝරුවෙක් ලව්වා මැනලා මෙය ලබා දෙන්න. මුදල් යනවා. නමුත් අපි කරන දේ වටිනාකමක් නැත්නම් වැඩක් නෑ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා මැනලා අපට එවලා තියෙනවා වාර්තාව. ඒකෙ කියලා තියෙන්නෙ තල්ගස්ගොඩ කන්ද කියන එක. අපි ප්‍රාදේශිය ලේකම් එක හරහාම යැව්වා ඔප්පු දෙකක් තිබෙනවා නම් සඳහන් කරලා එවන්න . එතකොට කියනවා මේක පදනම් කර ගෙන තියෙන්නෙ අංක 44457 කියන පිඹුරෙන්. ඒ පිඹුරෙ තියෙන්නෙ නම් 3 යි. තල්ගලෙ කන්ද, තල්ගස්ගොඩ කන්ද, ඉදිකැටිය කැලේ කන්ද යන 3 විතරයි. ඒ නම් තුනෙන් එහාට ඒ ගොල්ලන්ට නමක් දාන්න බැහැ කියලා. එතකොට මේ නමින් අරගෙන මිනිස්සුන්ට ඔප්පුවක් දුන්නොත් ඒකෙ වටිනාකම බිංදුවයි. ඒක කියා මේක වාද කරනවාට හොඳයි පෞද්ගලින මිනින්දෝරුවෙක් ලව්වා කරන එක.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඔච් සභාපතිතුමා පොල්වත්තපුරට වෙලා තියෙන්නෙත් ඕක. දිගින් දිගටම මිනිස්සු බලාපොරොත්තු වෙනවා . අනික් හැමෝටම ඔප්පු ලබා දීලා තියෙන්නෙ. ඒ මිනිස්සුන්ට විතරක් ඔප්පු නැතිව ඉන්නෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සභාවෙ අනුමැතිය දෙන්න . ඊට පස්සෙ අපි ඔප්පු දෙන්නම්.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ THWනිවාස සංකීර්ණයෙහි ඔප්පු ලබා දීමසම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව පෞද්ගලික මිනින්දෝරුවකු ලවා ඉඩමේ මැනුම් කටයතු සිදු කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කර ඔප්පු ලබා දීමේ කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි .**

**12.7** ' **අංක 07 කඩකාමරය සුළු සංශෝධනයක් සඳහා අවසර ලබා ගැනීම** යන මැයෙන්එච්. එස්. ප්‍රනාන්දු ඇන්ඩ් සන්ස් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අපගේ එළවළු තොග සහ සිල්ලර ව්‍යාපාරය පවත්වාගෙන යන අංක: 07 කඩ කාමරයේ කෙලෙවර බිත්තියට සම්බන්ධ කර අඩි 10x04x 1 ½ ප්‍රමාණයේ වේදිකාවක් වැනි කොටසක් බ්ලොක් ගලෙන් සාදා සකස් කර ගැනීමට අවශ්‍යාව ඇත.
එම පොළව මට්ටමට වඩා කඩ කාමරයේ පොළව මට්ටම පහතින් පිහිටීම නිසා විශේෂයෙන් මෙම අවස්ථාව පැන නැගී ඇත. එබැවින් මෙය පරීක්ෂාව සඳහා අදාල නිලධාරී මහතුන් යොමු කරන කියල ඉල්ලීමක් කරනවා. ඒ අනුව ඒක සවිකරනවනම් අපේ කඩල දාන කොටසට අලාභය වශයෙන් රු.9474.84ක් මුදලක් සහ වැට් සහ NBT එකතු වෙලා මේක කිරීම සඳහා එකඟතාවයක් ලබා දීම සුදුසුයි කියල තාක්ෂන සේවා නිලධාරි වාර්තා කරල තියෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එහෙනම් අපි ඒ මුදල අය කරල ලබා දෙමු.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභා පොදු වෙළඳ පොලෙහි අංක 07 කඩ කාමරය අවශ්‍ය අවස්ථාවක කඩා ඉවත් කිරීමේ කොන්දේසියට යටත්ව වේදිකා කොටසක් ඉදිකිරිමට සහ අංක 8,9 කඩකාමර හරහා පිවිසීමට හැකිවන පරිදි 1.8 * 0.9 mප්‍රමාණයක වර්ගඵලයෙන් යුතු කොටසක් ඉවත් කර උළුවස්සක් යෙදීමට අනුමැතිය ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවත් ඒ සඳහා ගොඩනැගිල්ලට වන හානිය සඳහා VAT + NBTඇතුළුව රු.11,085.56 ක මුදලක් කඩ හිමිකරුගෙන් අයකර ගැනීමටත් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

.

**12.8** ' **පොල්වත්ත අවමංගල්‍යාධාර සහ සුභ සාධක සංගමයේ ගොඩනැලිල්ලක් ඉදි කිරීමට නගර සභාව සතු ඉඩම් කැබැල්ල ලබා ගැනීම** ' සම්බන්ධයෙන් පොල්වත්ත අවමංගල්‍යාධාර සහ සුභ සාධක සංගමයේසභාපති හා ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පොල්වත්ත ගම්වාසීන් 425 කගේ සාමාජිකත්වයෙන් යුතුව පවත්වාගෙන යනු ලබන පොල්වත්ත අවමංගල්‍යාධාර සහ සුභ සාධක සමිතිය වසර 27 ක් තිස්සේ සාමාජිකයින්ගේ නිවෙස්වල අවමංගල්‍ය අවස්ථාවලදී ඔවුන්ට ශක්තියක් වශයෙන් ක්‍රියා කරන සංවිධානයක් බවත් පොල්වත්ත ගමේ සහ අම්බලන්ගොඩ නගර වාසීන්ගේ සමාජ සුභසාධන කටයුතුවලදී හැකි සෑම අයුරකින්ම තම දායකත්වය ලබා දී ඇති බවත් , මේ වන විට සමිතිය සතු භාණ්ඩ සහ උපකරණ නිසි පරිදි ආරක්ෂා කිරීම සඳහා අම්බලන්ගොඩ නගර සභාව සතු පොල්වත්ත පියසේන ක්‍රීඩාපිටියේ ක්‍රීඩා මණ්ඩපයේ ඇති කුඩා කාමරයක ගබඩා කර ඇති බවත් , එහි ඉඩ ප්‍රමාණවත් නොවීම නිසා සමිති නිලධාරීන්ගේ නිවෙස්වලද භාණ්ඩ තබාගෙන ඇති බවත්, 2018.07.15 දින පැවති 27 වෙනි මහා සභා රැස්වීමේදී පොල්වත්ත පියසේන ක්‍රීඩාපිටිය ඉදිරිපිට ප්‍රසිද්ධ නාන ළිඳ අසල වසන්ත මහතාගේ ත්‍රීවීල ගරාජයට යාබදව ඇති ඉඩම් කොටස සමිතියේ ගොඩනැගිල්ලක් සෑදීමට සුදුසු ස්ථානයක් බව සභාව ඒකමතිකව තීරණය කරන ලද බවත්, එබැවින් මෙම ඉඩම් කොටස සමිතියට ලබා දීමට කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි , අපි තමයි ඒ ලිපිය දැම්මෙ. සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා අපේ මරණාධාර සංගමයට ඒ ඉඩම් කෑල්ල දෙන්න කියලා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මන්ත්‍රීවරුන්ට කියන්න ඕන . මේ ස්ථානය ත්‍රීවීල් හදන යාබද ස්ථානය . මේ මනුස්සයා මේක අල්ලගෙන අල්ලගෙන ගිහිල්ලා නගර සභාවට කොහෙත්ම නැති වෙනවා. ඒ නිසා මම හිතනවා පොල්වත්ත අවමංගල්‍ය හා සුභ සාධක සංගමයට ලබා දීමෙන් අඩු ගානෙ ඉඩම හරි ආරක්ෂා කර ගන්න පුළුවන් වේවි කියල හිතනවා. කඩකාමර ගහන්න ඉඩක් නැහැ පේන්නෙ නැත්ද එතැන තියෙන හැටි

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

අපේ අයිතිය එතන පර්චස් කීයක් තියෙනවද? අපට කාමර කීපයක් එක්ක ගහන්න පුළුවන් නම් ඒකෙන්ම කෑල්ලක් දෙන්න පුළුවන්නෙ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ළිඳත් එක්ක තියෙන හරියෙ නම් පුළුවන්. අපි මේකෙ ඩිසයින් කරමු කඩ කාමර 3ක්. කඩකාමර 3 ක් සඳහා ටෙන්ඩරුත් කරා. ටෙන්ඩර් කරලා ඒ සඳහා අවශ්‍ය කට්ටිය ටෙන්ඩර් ඉදිරිපත් කරන්න ගියහම උනේ වෙනින් දෙයක්. ඒ නිසා ඒක අතහැර දැම්මා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>

අපි ඒක බලලා කරමු. නැත්නම් ඔය විදිහට අපේ ඉඩම් අපරාදෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

එහෙම කඩ කාමර 3 ක් හදනවා නම් අපට පහතින් තමයි උවමනා වෙන්නෙ. මොකද අපේ බඩු තියා ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍රමහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මම ගොඩක් සතුටු වෙනවා අපේ ගමේ මේ වගේ යෝජනාවක් ඉදිරිපත් වෙලා තියෙනවා. මම කලින් කීප වතාවත්ම කතා කරා ඔබතුමා එක්කත්. මෙතන පර්චස් හය හතක් විතර තියෙනවා. ලක්ෂ 100 ක් විතර වටිනවා මෙතන. මේ භූමි ප්‍රමාණය ලක්ෂ 100 කට වඩා වටිනවා. ලේසි භූමි භාගයක් නෙවෙයි. මං කලින් කථා කරා හුගවතාවක්. මේ ගැන බොහොම අඩු අවධානයක් තමයි යොමු උනේ සභාවෙන්. මේ යෝජනාව මම ඉතාම අගය කොට සලකනවා.

මාසික සභා රැස්වීම ප.ව. 1.30 ට පමණ කාරක සභා වක් බවට පත් කරන ලදි.
ප.ව.1.40 ට පමණ කාරක සභා අවස්ථාව අවසන් කරන ලදි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පොල්වත්ත අවමංගල්‍යාධාර සහ සුභ සාධක සමිතියට ගොඩනැගිල්ල ඉදි කිරීමට ලබා දීමට යෝජනා කරනවා.

<u>තීරණය</u>

**පොල්වත්ත අවමංගල්‍යාධාර සහ සුභ සාධක සමිතියේ ගොඩනැගිල්ලක් ඉදිකිරිමට නගර සභාව සතු ඉඩම් කැබැල්ලක් (පොල්වත්ත ක්‍රීඩා පිටිය ඉදිරිපිට ප්‍රසිද්ධ නාන ළිද අසල වසන්ත මයාගේ ත්‍රීවිලර ගරාජයට යාබදව ඇති ඉඩම් කොටස) ලබා දෙන ලෙසට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ස්ථීර කරන ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12.9 'පෙර පාසැල් ළමුන්ගේ විනෝද චාරිකාව සඳහා බස් රථ 05ක් ලබා ගැනීම'**මැයෙන් පෙරපාසැල් ගුරුතුමියන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පෙර පාසැල් ළමුන්ගේ විනෝද චාරිකාව සම්බන්ධයෙන් බස් තුනක් ලබා දීමට ස්තූතිය පුද කරන අතර දුවා දරුවන්ට ලබා දෙන වරප්‍රසාද පිළිබඳව සියලුම දෙමාපියන් දැනුවත් වූ අතර දෙමාපියන් ඇඩි සතුටට පත් වූ අතර ළමුන් 125 වැනි පිරිසක් සහභාගී වීමේදී මව සහ පියා ද අවස්ථාවට සහභාගී වීමට අපේක්ෂාවෙන් සිටින නිසා බස් රථවලට අදාලව ගැටළුවක් ඇති වී ඇති බවත් ඒ නිසා අප ඉල්ලා සිටින්නේ අවම වශයෙන් බස් රථ 05ක් ලබා දෙන්න කියල ඉල්ලීමක් කරතිබුණි.

<u>තීරණය</u>

**අම්බලන්ගොඩනගරසභාවටඅයත්පෙරපාසල්දරුදැරියන්ගේවාර්ෂිකඅධ්‍යාපනචාරිකාවයාමටප්‍රවාහනප හසුකම්ලබාගැනිමසඳහාසභාඅරමුදලින්බස්රථ 05 ක්ලබාදීමටසහර්ටඅදාළරු.100000.00 කඇස්තමේන්තුවසඳහාගරුමන්ත්‍රීවරුන්ගේවිරෝධතාවයක්නොමැතිවූබැවින්ඒකමතිකවසභාවේඅනුමැ තියලබාදෙනලදි.**

**12.10 'අම්බලන්ගෙඩ , වට රවුම් පාර, තුඩුවමුල්ල , 25/11, දරණ ස්ථානයේ පදිංචි යූ. ජී. තරංගනී මහත්මිය** විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

යූ. ජී. තරංගනී මිය 99.04.22 දින අම්බලන්ගොඩ නගර සාභාවේ සරප් සහායක ලෙසද 2000.10.01 කොන්ත්‍රාත් පදනම මත අන්තර්ජාල ක්‍රියාකරු ලෙස ද සේවය කළ බවත් 2002 වසරේ සේවය නතර කළ බවත් එය නැවත 2002-12-02 සිට සේවයේ පිහිටුවූ බවත් එසේ සේවය කළ මාස ගණනක් වැටුප් ගෙවීම සිදු නෙකළ බවත් පසුව වැටුප් ලැබුණු බවත් සඳහන් කරමින් ලිපියක් ඉදිරිපත් කර ඇත. එසේම තරංගනී මියට සිදුවූ අසාධාරණය පිළිබඳව සානුකම්පිතව සලකා බලා සාධාරණයක් ඉටු කරන මෙන් ඉල්ලීමක් කර ඇත.

එමෙන්ම දපස/පපකො/2018-1 චක්‍රලේඛනය අනුව තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත හෝ වෙනත් කිසිදු පදනමක් මත සේවකයින් බඳවා ගැනීම සීමා කර ඇති අතර, සේවා අවස්ථාවන් මත එවැනි පත්වීමක් ලබා දීම සඳහා අත්‍යාවශ්‍ය ඊට අදාල සාධාරණීකරණ වාර්තාවක් සමඟ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

එමෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2012/03 අනුව සභාවේ යතුරු ලියන පරිගණක මුද්‍රණ කටයුතු සඳහා කැලි පදනම මත ගෙවීම් කිරීමට හැකියාව ඇත. එබැවින් තරංගනී මහත්මියගේ ඉල්ලීම සලකා බැලීමට සහා තීරණයක් ලබාගෙන පළාත් පාලන කොමසාරිස්තුමා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමට ලේකම් විසින් නිර්දේශ කර ඇත..

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේකට ඉදිරිපත් කරන්න හේතු වුනේ අපේ සභා කටයුතු වෙනුවෙන් හිටපු ඊෂා ක්‍රිෂාන්ති මහත්මිය පත්වීමක් හම්බ වෙලා බලපිටිය ප්‍රාදේශීය සභාවට ගියා. දැනට ඒ කටයුතු වෙනුවෙන් නිලධාරීන් යොදවලා තියෙනවා. නමුත් කලින් සභාවල කලේ තරංගනී තමයි. තරංගනී යම් යම් හේතු නිසා එයාගෙ වරද මත නොවෙයි දේශපාලන හේතු මත නවත්වලා දැම්මා. ඒ ළමයා නැවත අරගෙන සභාවෙ කටයුතු කිරීමට සභාවෙ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඒක දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී වඩුමේස්ත්‍රි නිලානි මෙනවිය කතා කරමින්</u>

සභාපතිතුමනි මම හිතන විදිහට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න ඕන මොකද යම් කිසි අසාධාරණයක් ඒ කාලය තුළ සිදු වුනා. ඒ කාලයේ මමත් හිටියා. මම හිතන විදිහට අපේ විපක්ෂ නායක තුමා ගොඩක් ප්‍රශ්නවලදි සාධාරණ විදිහට කටයුතු කරන හින්දා මං හිතනවා යහ පාලන රජයක් තුළ ඒ වැරැද්ද නිවැරදි කරලා කටයුතු කරයි කියලා. ඒ නිසා මං හිතන විදිහට ඒ වෙච්ච අසාධාරණයට සාධාරණයක් ඉෂ්ඨ කරන්න සභාපතිතුමාට සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දීලාඑතුමියට රැකියාවට සාධාරණයක් ඉෂ්ඨ කරන්න කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඒක දෙන්න සභාපතිතුමා

<u>තීරණය</u>

**අම්බලන්ගොඩ නගර සභාවේ සභා කටයුතු සහ මාසික වාර්තා නිසිපරිදි කරගෙන යාමේ අවශ්‍යතාවය මත සේවකයකු ආදේශක / තාවතාලික /කොන්ත්‍රාත් පදනම / කැලි ක්‍රමය මත බඳවා ගැනීම වෙනුවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරි කටයුතු කිරීමට සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**12.11** **'හල්වතුර ව්‍යාපෘතිය යටතේඉඩම් අත්පත් කර ගැනීම** අඩු ආදායමලැහි නිවාස ව්‍යාපෘතිය යටතේ 2007 අත්පත් කර ගනු ලැබූ හල්වතුර ඉඩම් කොටස් සඳහා වන්දි ගෙවා අවසන් කර නොමැති බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම හල්වතුර ලිපියේ පිටපතක් හල්වතුර ව්‍යාපෘති අත්පත්කර ගත් ඉඩම් වල අදාළ මූලික පිඹුරු පිටපත් මේ සමඟ යොමු කරන අතර 2018.08.04 මාසික සභාවේ දී මෙම ගැටළුව සම්බන්ධව සාකච්ඡා කෙරුණු කටයුතු යොදාගෙනකාරුණික අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කර තිබුනි..

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක අපි මේ විධියට සාක්ච්ඡා කරනවද නැත්නම් වෙනම කමිටුවක් මඟින්සාක්ච්ඡා කරනවද?
මේ තීන්දුවයි ගන්න ඕන මන්ත්‍රීවරුන්ට, මේ මුදල ගෙවපු කොටස් තියෙනවා, රජයේ කොටස් තියෙනවා. අපට ගෙවන්න වෙන කොටස් තියෙනව. මේකෙන් අපට අවශ්‍ය මොනවද අනවශ්‍ය මොනවද අපට අනවශ්‍ය නම් ප්‍රතික්ෂේප කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා මම දකින දේ තමයි, මම හිතන්නෙ අපේ මන්ත්‍රීවරුත් එකඟ වෙයි. දැන් මුදල් ප්‍රමාණයක් ගෙවල තියෙනව අයිතිකාරයො නැති කොටසක් තියෙනවා. ඒ අයට අපි ගෙවන්න ඕනෙ නැහැ. තව තියෙන්නෙ අපට ගෙවන්න තව පොඩි සාමාන්‍ය මුදලක්. මම යෝජනානරනවා ගෙවන්න ඕන මුදල ගෙවල මේ භූමි ටික නගර සභාව සතුකර ගමු. මොකද අම්බලන්ගොඩ හදවත වගේ අපට තියෙන ඉඩම් ටික. මේක අවුරුදු ගානක් යනකම් නගර සභාවේ නගර සංවර්ධන කටයුතු ඕන දෙයක් සඳහා භාවිතා කරන්න පුළුවන්. කවුරු හරි අපෙන් ඇවිත් ඉල්ලුවත් අපිට කියන්න පුලුවන් අපට තියෙන්නෙ මෙච්චරයි. නගර සභාව සතුයි. අපිට මෙච්චර සල්ලි දෙන්න මෙන්න මේක කරන්න අපේ යටතේ. නමුත් මම කියන්නෙ මේක පිටනොදී මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යාංශයටවත් නොදී අපි මේක නගර සභාව සතු කර ගෙන අනාගතයේ අපේ නාගරික සංවර්ධන කටයුතු සඳහා යොදා ගමු.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා අපි ප්‍රධාන අමාත්‍යතුමත් සමඟත් සාකච්ඡා කලා ඕක ඒ අදාල ලිපිගොනු ටික ලැබෙන්න සලස්වන්න කිව්වා ඇමතිතුමා ඒ නිසා පිටපත් ටිකක් යවන්න ඇමතිතුමාට..

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

අනික සභාපතිතුමනි මේක ගැන අපි පොදුවේ සාකච්ඡා කරමු. මම නිකන් අදහසක් වශයෙන් තමයි ඔබතුමාට ඉදිරිපත් කරන්නෙ. මේ ඉඩම්වලදි ඇත්තටම දැන් මේක පරිශීලනය කරන කොට තේරෙනව සියලුම ඉඩම් 75% වඩා රජය සතුයි. එතකොට මිනින්දෝරු මහත්තරු ගහලා තියෙනවා හිමිකම් කියයි කියල . මම දන්නෙ නෑ හිමිකම් කියයි කියන එකේ නීතියානුකූල තත්වය තියෙනවද කියල.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හිමිකම් කියයි නම් ඒවගේ හිමිකම් පරීක්ෂණය තියෙනවා

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මම එකඟයි. මම දන්නෙ නැහැ නීතියේ කොහොම තියෙයිද කියල හිමිකම් කියයි කියන එක අයිතියක් ද කියන එක හැබැයි මම අදහස් කලේ කියන්න මේ ඉඩම් කට්ටි වශයෙන් අපට බෙදුම් නඩුවලට ඉදිරිපත් කලොත් උසාවියෙදි අපට තීන්දුව ලැබෙනවා. වන්දි නිවැරදිව ගෙවන්න පුළුවන් නිවැරදි අයිතිකරුවන් ඉදිරිපත් වේවි උසාවියට එතකොට කොටස් කොටස් වශයෙන් අපි ඉදිරිපත් කරල බෙදුම් නඩු 7 කට විතර මේක ඉදිරිපත් කලොත් එතකොට අපට ඒ කට්ටි 7 ඉතාම නිවැරදි අයිතිය නගර සභාවට එනවා. නිවැරදි නැති අයිතියක් නෙමේ. එතකොට ඉතාම පැහැදිලී. එතකොට අපි වන්දි ගෙවිය යුතු ප්‍රමාණය නිවැරදිව අයිතිකරුවන් උසාවියෙන් තීන්දු කොට ලබල දෙනවා. කිසිම කරදරයක් නැහැ අපට වන්දි ගෙවන්නත් පුළුවන් සභාපතිතුමනි කාලයත් තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

කාලය කොච්චර යයිද?

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

එය අපට අදාල නැහැනෙ අපිට නෙවෙයිනෙ මේක මේකෙ අවශ්‍යතාවය. අපි නීතියානුකූල වෙන්න එපයිනෙ. අපි කියනව නීතියානුකූල අයිතිකරුවන් උසාවියෙන් එන්න කියලා

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක අපි සැරෙන් සැරේ ගෙවන්න පුළුවන්

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

රජයට අයිති 75% අපිට අයිති වෙලා ඉතිරි 25% අධිකරණයෙන් තීරණය කරනව අහවලුන්ට අහවලුන්ට අයිතී කියල බෙදුම් නඩු තීන්දු වලදි එතකොට අපි දෙනව.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි අපි මේ සම්භන්ධයෙන්, ඕව කියන්න

**ගරු නගර සභා මන්ත්‍රීනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්**

සභාපතිතුමා ඉවර කරන්න ඉස්සර වෙලා මට පොඩ්ඩක් විනාඩි පහක් දෙන්න

තීරණය

**හල්වතුර ව්‍යාපෘතිය යටතේ අත්පත් කරගත් ඉඩම්වලට අදාළ මූලික පිඹුරුපත් සමග සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු මේ පිළිබඳ සාකච්ජා කල සභාව සංවර්ධන කටයතු වෙනුවෙන් මෙම ඉඩම් භාවිතා කළ හැකි බැවින් බෙදුම් නඩු වශයෙන් ඉදිරිපත් කර නිවැරදි අයිතිය නගර සභාව සතු කර ගැනීමටත් අදාළ නිවැරදි අයිතිකරුවන් හට වන්දි මුදල් ලබා දීමටත් සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12.12** **පුද්ගලික සංචාරයක් සදහා 2018.08.10 දින සිට 2018.08.17 දින දක්වා කාලය තුළ විදේශ ගත වීමට නියමිත බැවින් නිවාඩු ලබා ගැනීම අනුමත කර ගැනීම** සදහාගරු නාගරික මන්ත්‍රිනි ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

තීරණය

**අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නගර සභා මන්ත්‍රීනි ඒ.ජී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වාමෙනවිය2018 08.10 සිට 2018.08.17 දක්වා කාලය තුළ විදේශගත වන බැවින් එම දිනයන් සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙසට කරන ලද ඉල්ලීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12.13** **'2018.09.01 දින සිට 2018.10.01 දින දක්වා කාලය තුළ විදේශ ගත වීමට බලාපොරොත්තු වන බැවින් නිවාඩු ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම** සදහාගරු නාගරික මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

**අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නගර සභා මන්ත්‍රී ජී.ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා 2018 සැප්තැම්බර් 01 සිට ඔක්තෝම්බර් 01 දක්වා කාලය තුළ විදේශගත වන බැවින් එම දිනයන් සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙසට කරන ලද ඉල්ලීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12.14 '2018.05.28 දින සභා රැස්වීමේදී යෝජනා වූ ස්ථිර වූ අටමස්ථාන වන්දනාමාන සුභද චාරිකාව සඳහා ප්‍රජා මණ්ඩල ගිණුමෙන් මුදල් නිදහස් කර ගැනීම** සඳහා කරිත්ත කන්ද ප්‍රජාවලය ලේකම් සභාපති භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

එම ලිපිය මගින් ප්‍රජා මණ්ඩල සාමාජිකයන් පවුල්වල සාමාජික සහභාගිත්වයෙන් අටමස්ථාන වන්දනා කිරීමේ චාරිකාවක් සංවිධානය කිරීමට යෝජනා වී ඇතිබවත්,ඒසඳහා බස් ගාස්තු සහ නවාතැන් පහසුකම් සැලසීමට ආහාරපාන සැපයීම සඳහා 145000.00ක මුදලක් ප්‍රජා මංඩල ගිණුමෙන් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත. ප්‍රජා මංඩල ව්‍යවස්ථාවේ අංක 04 කාර්යයෙහි "අ" වගන්ති ප්‍රකාරව ශ්‍රමදාන කඳවුරු පිහිටුවීම සහ සමූහ චාරිකා වාර්ෂික දිස්ත්‍රික් සම්මේලනය පැවැත්වීම අනුමත කර ඇත එබැවින් සාමූහික චාරිකා වෙනුවෙන් ප්‍රජාමංඩල අරමුදල් පරිහරණය කිරීමට හැකියාව ඇති බැවින් ඉහත කී මුදල නිදහස් කිරීමට හැකි මුත් ප්‍රජා මංඩල අරමුදල් ගිණුමේ ශේෂය රු. 165000.00ක් වන බැවින් ප්‍රවාහන හා නවාතැන් පහසුකම් වියදම් වලට අදාලව ප්‍රජාමංඩලය විසින් සකස් කල ඇස්තමේන්තුව රු.94,375.00ක මුදල නිදහස් කිරිමටත් ආහාරපාන වියදම් පෞද්ගලිකව දැරිමට සුදුසු බවත් යෝජනා කර සිටිමි.ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම මෙහෙම දෙයක් කියන්න ඕනෙ මේ කරිත්ත කන්ද ප්‍රජාමංඩලය කරන්නෙ අපේ කොන්ත්‍රාත් අත්සන් කරන කොට ඒ ගොල්ලන්ට 5%බැඟින් ඉතුරු වෙනවා. ඉතිරි වන කොට ප්‍රජාමංඩල ව්‍යවස්ථාවක් පාර්ලිමේන්තුව පණවා තියෙනවා.ඒ ඒ ව්‍යවස්ථාව අනුකූලව ඒ ගොල්ලනට මේ විදියේ ඉල්ලීම් කරන්න පුළුවන්.ඒ නිසා මේ දැනට අනිත් කොට්ඨාස 11ත්මේ විදියෙ සක්‍රිය මට්මේ ගමේ තියෙන සුබසාධන කටයුතු ටික ආරම්භ කරන්න කියලා අපි මන්ත්‍රීවරු සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒ සමගාමීව තියෙන පොඩි යෝජනාවක් මම පස්සෙ යෝජනාවක් විධියට කරන්නම් මේ සභාව දැනුවත් කරන්නයි. මේ කරිත්ත කන්ද කොට්ඨාශයේම තව තියෙනව වෙනම අවමංගල්‍යාධාර සමිතියක් කන්ද ප්‍රදේශය නියෝජනය වන ඒ කියන්නෙ 100 ආසන්න සංඛ්‍යාවක් සාමාජික සංඛ්‍යාව ඉන්නව ඒ ගොල්ලොත් මේකෙ සාමාජිකත්වය නගර සභාවේ සමිතියක් ලෙස ලියාපදිංචි වන්න අවසර පැතුවා. මම මේ ගැන වාසනා මහත්මියගෙන් විමසා බැලුවා. ඇය කිව්වා පුලුවන් කමක් තියෙනවා කියලා. ඒ නිසා ඉදිරි කටයුතු සඳහා අවසර ලබා දෙන්න කියලා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ සමිතියේ කාර්යභාරයන්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඔව් ඒ සමිතිය ලියාපදිංචි වෙන්න ඕනෙ නගර සභාවෙ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ මෙහෙමයි අපි එක ග්‍රාම සේවක කොට්ඨාශයක අපි ලියාපදිංචි කරන්නේ එකයි.

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්

නෑ වාසනා මිස් උපදෙස් ලබාගෙන තිබුන දෙකක් පුලුවන් කියල. ඒකයි මම මේ සභාව දැනුවත් කරන්නෙ

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

මම දන්න විධියට මම හිතන්නෙ ප්‍රජා සමිතියක හෝ කුමන හෝ සමිතියක ලියාපදිංචිය තියෙන්නෙ එකයි.

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්
මම දන්නෙ නැහැ මමත් ඒ ගැන ඇහුවා

තීරණය

**කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය විසින් සාමූහික චාරිකාවක් යාම වෙනුවෙන් ප්‍රජා මණ්ඩල ගිණුමෙන් මුදල් ලබා ගැනිම සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු මුදලින් ප්‍රවාහන සහ නවාතැන් පහසුකම් හා අනෙකුත් වියදම් වලට අදාළව රු.94375.00 ක මුදල නිදහස් කිරීමටත් ආහාරපාන පෞද්ගලික වියදමින් දැරීමටත් ප්‍රජා සංවර්ධන නිලධාරිනිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12.15 'ප්‍රණාමය පුද කර සිටීම'** මැයෙන්ගම්සිරි උදාන පදනම ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.
2018.08.05 දින පවත්වන ලද ලේ දන් දීමේ පුණ්‍ය කටයුත්ත වෙනුවෙන් ශ්‍රී විජයාරාම පාර එලි පෙහෙලි කර දීම. පාර දෙපස කොඩිවලින් සරසාලීව. පුටු සහ කසල බඳුන් නොමිලයේ ලබා දෙමින් සහ නන් අයුරින් උපකාර කරමින් ලබා දුන් සහයෝගයට ඔබතුමා නාගරික මන්ත්‍රීවරුන්ටත් සහ නගර සභාවේ කාර්ය මණ්ඩලය ට ප්‍රණාමය පුද කරන බවද දන්වා කිබුණි.

තීරණය

**ගම්සිරි උදාන පදනම විසින් 2018.08.05 දින පවත්වන ලද ලේ දන් දීමේ පුණ්‍ය කටයුත්ත වෙනුවෙන් ශ්‍රී විජයාරාම පාර එලි පෙහෙලි කර දීම. පාර දෙපස කොඩිවලින් සරසාලීම. පුටු සහ කසල බඳුන් නොමිලයේ ලබා දෙමින් සහ නන් අයුරින් උපකාර කරමින් ලබා දුන් සහයෝගයට ගරු සභාපතිතුමා ඇතුලු ගරු නගර සභා මන්ත්‍රීවරුන්ටත් සහ නගර සභාවේ කාර්ය මණ්ඩලයටත් ප්‍රණාමය පුද කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

බලමු අපි. මී ලඟට කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරලා තියනවා ඒක ඉතින් කියවන ඕනෙ නැහැනෙ දැන ගැනීම සඳහා ඇතුල්කරනවා

**12.16 'ආයුධ කට්ටලයක් ලබා ගනීම** මැයෙන් සෞඛ්‍ය පරිපාලන නිලධාරීවිසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

සෞඛ්‍ය අංශයේ රථ වාහන නඩත්තු කටයුතු හා එදිනෙදා අවශ්‍ය සියලු අලුත්වැඩියාවන් සිදුකිරීම සඳහා ආයුධ කට්ටලයක් නොමැති බවත්. සති අන්තයේ නිවාඩු දිනයන්හිදී කර්මාන්ත අංශයේ සේවක හා නිලධාරී මහතුන් රාජකාරියේ නොසිටින අවස්ථාවලදී භාවිතය සඳහා ට්‍රැක්ටර් රථ අලුත්වැඩියාව සඳහා භාවිතයට ආයුධ කට්ටලයක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්

එය ලබා දෙන්න

තීරණය

**සෞඛ්‍ය අංශයේ රථවාහනවල නඩත්තු කටයුතු සහ අළුත්වැඩියාකිරිම් සිදුකිරීම සඳහාත් ට්‍රැක්ටර් රථ සඳහාත් ආයුධ කට්ටලයක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව එය ලබාදෙන ලෙස ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.**

**12.17 'අඩි 15 මාර්ගය පැවරීම හා සංවර්ධනය කර සකස් කර දෙන මෙන් ඉල්ලීම'**ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පොල්වත්තේ නුගේතුඩුව මාවතේ (නුගේතුඩුව වත්ත අඩි 15පාර)පදිංචිව සිටිනබී. නන්දනී ද සිල්වා, ඩබ්ලිව්. නැනවතී ද සිලවා, කේ.පී.ඩී. චන්ද්‍රලතා මහත්මිය, ඩී. එස්. පී.කේ. ද සිල්වා, එල්. ඒ. චන්ද්‍රසීලි, එස්. ඒ. රංජිත්, එච්. එල් ලසන්ත කියන අය **නුගේතුඩුව වත්ත අඩි 15 පාර**අම්බලන්ගොඩ නගර සභාව වෙත පවරා දීමට කැමැත්ත පල කර සිටින බවත් එම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙසත් ඉල්ලා තිබුණි.

ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, නුගේතුඩුව වත්ත පාර කියන්නෙ පල්ලමේ පාර නන්දනීලාගෙ ගෙවල් පාර. ඒකෙ මං හිතන්නෙ අවුරුදු කල්පයක් තිස්සෙම අවු. 25 ක් 30ක් තිස්සෙම ඒ පාරෙ සංවර්ධනයක් වෙලා නැහැ. බහින්න විධියකුත් නැහැ යන්න විදියකුත් නැහැ. ඒක නිසා ඒකෙ හත් දෙනෙක් අත්සන් කරල තියෙනවා එක්කෙනෙක් විරුද්ධත්වය ප්‍රකාශ කරල තියෙනවා .නැහැ විරුද්ධ නැහැ එයා කියන්නෙ ඒක පවර ගන්නෙ නැතිව ඒක කලොත් එයා පාර හදන්න දෙනව කියල පවර ගත්තොත් සීතා කුමුදුණී කියන එක්කෙනා පවරා ගත්තොත් කැමති නැහැ කියලා පවරා ගන්නේ නැතිව කරොත් පාර හදාගන්න දෙන්නම් කියලා එයා යෝජනා කරනවා එයා කැමැත්ත ප්‍රකාශ කරනවා

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මන්ත්‍රීතුමා මෙහෙමයි අපට නගර සභා අරමුදල් යොදවනවනම් පවරා ගැනීම ස්ථිරවම කරන්න ඕනෙ.

ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්

සීතා කුමුදුනී කියන එක්කෙනා පවරා ගන්නවට කැමති නැහැ.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එහෙමනම් මෙහෙමයි දැනට නගර සභා ප්‍රතිපාදන යොදවනව නම් ස්ථිරවම පැවරීමක් කරන්න ඕනෙ. එහෙම නැත්නම් පළාත් සභා ප්‍රතිපාදන හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන වලින් මේ පාර කරන්න පුළුවන්. හැබැයි පවරාගැනීමෙන් තොරව අපි කරනවනම් ස්ථිරවම පවරා ගැනීම සිදු කරන්න ඕනෙ.

ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්

මම පොල්වත්ත ආර්ථික සංවර්ධන නිලධාරීතුමත් හම්බවෙලා අපි කථා කරා එයත් කියනවා ඒ ගොල්ලන්ට තවම ප්‍රතිපාදන හම්බවෙලා නැති නිසා එය කරන්න බැහැයි කියලා

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මම මේ පාර සෑහෙන කල් අවු.20 පමණ මමත් නිතරම ගිහින් කියනවා ඔය පාර පවරන්න අපි කරල දෙන්නම් කියල නමුත් ඔය ප්‍රශ්නය නිසා කරන්න බැරි වුණා. ඔබතුමා ඔය කියන එක්කෙනා කැමති කර ගෙන මේක කරව ගන්න.

ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්

එයා කැමති නැහැනේ, ඒක කරගන්න විධියක් තමයි නැත්තේ අනිත් එක ඒගොල්ලන්ට කිසිම අලාභයක් වෙන්නෙත් නැහැ. සභාපතිතුමා අපට මේකට වෙන පියවරක් නැත්ද?

ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේමහතා කතා කරමින්

මාත් ගියා ඊයෙ සීතා කුමුදුනීලාගෙ ගෙදර ගිහිල්ලා කථා කෙරුව, කථා කෙරුවහම කියන්නෙ එයා අර කොළයට විතරයි අත්සන් කරන්නෙ නැත්තෙ හදාගන්නලු එයාට ප්‍රශ්නයක් නැහැ කියල. එයා කොලේට අත්සන් කරන්නෙ නැහැලු.

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නැහැ ඔබතුමාලාට කැමති කරගන්න පුළුවන් මම කියන්නම් පස්සෙ කරන විදිය.

තීරණය

**අම්බලන්ගොඩ පොල්වත්ත නුගේතුඩුව මාවතේ (නුගේතුඩුව වත්ත අඩි 15 පාර)අම්බලන්ගොඩ නගර සභාවට පවරා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන්ගේ කැමැත්ත ලබාගෙන පවරා ගැනීම් කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා සිසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රී වරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

- වෙනත් කරුණු

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේමහතා කතා කරමින්

සභාපතිතුමනි, ගැහැණු දරුවො ඉන්න අප්පච්චි කෙනෙක් හැටියට සභාපතිතුමනි ගැහැණු දරුවන්ට ඇහුන්කන් දෙන අප්පච්චි කෙනෙක් හැටියට ඔබතුමාට කෙටි ඉල්ලීමක් තියෙනව අපේ ගමේ දැරිවිය කරන මේ දැරිවිය මාස කීපයක් අපේ සභාවේ අපේ තාක්ෂණ සේවා නිලධාරීන්ට සහාය වෙමින් මම කියවන්නම් සිංහලෙන්ම අම්බලන්ගොඩ කෙරම්ණිය පාරේ අංක 34 නිවසේ පදිංචි වමෝදි සිතාරා මදුවන්ති වන මා බලපිටිය කාර්මික විද්‍යාලයේ ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව හදාරා ඒ සම්බන්ධිත ප්‍රායෝගික පුහුණුව ඔබට නගර සභාවේ ලැබීම්.2017 දෙසැම්බර් මස සිට 2018 මාර්තු මස දක්වා වූ කාලය තුල එම පුහුණුව ලැබූ අතර දිනකට රු.500.00 වූ දීමනාව ඉල්ලා ඉල්ලීම් කළද එය ප්‍රතික්ෂේප වූ බව අසන්නට ලැබුනි. මා නැවත වරක් ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ එම දීමනාව ලබා දීමට කටයුතු කරන ලෙසයි. සභාපතිතුමනි ඔබතුමා අපට පැවසුවා මීට පෙර මෙම දීමනාව කිසිදු අයෙකුට ගෙවා නොමැති බව අප ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙම දැරිවිය මෙම පුහුණුවට එකතුවුනේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමියගේ පාලන සමයේ එතුමිය එකඟවුණා රු.500.00ක දීමනාවක් මෙම දැරිවියට ගෙවන බවට එම නිසයි මෙම පුහුණුව ලැබුයේ ඔබතුමා යම් හෙයකින් අපුලක් තියෙනවනම් එම ගොනුවට අත්සන් කරන්න අපි ඉල්ලනව ඔබතුමාගෙන් බොහොම කාරුණිකව සහකාර පළාත් පාලන කොමසාරිස් තුමියගේ අනුමැතියට යටත්ව හෝ මේ රු.20,000.00 ගෙවල දරු දුක හඳුනන තාත්ත කෙනෙක් හැටියට මේකට අවනත වෙන්න කියලා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ගරු මන්ත්‍රීතුමනි අපි දැනට අවු.20ක් පමණ මෙම පුටුවල වාඩිවෙලා ඉදල තියෙනවා අපි කිසිම ට්‍රේනින් කෙනෙකුට සල්ලි ගෙවල නැහැ. හැබැයි අපි උපරිම අන්දමින් ඒ අවශ්‍යා පුහුණු කිරීම් කරල තියෙනවා ඉතින් මෙයාට විතරක් ගෙවුවම අර අච්චර කල් ඉදපු මිනිස්සුන්ට ලොකු අසාධාරණයක් කියල මම නම් හිතුවේ ඒක හින්ද තමයි මම ගෙවන එක නැවැත්තුවේ

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්</u>**

දැන් සභාපතිතුමා මෙහෙමයි අපි දන්න කල්ම සභාපතිතුමා දන්න කල්ම ගෙවීම් කරලා නෑ...

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙම දේකුත් තියෙනවා දැන් පළාත් සභාවේ ඔය කියන නිලධාරීන් හිතවත් කට්ටියට ලියුම් දීල එවනව එතකොට පන්සීය ගානෙ මාස හයක් මෙහේ ඊළඟ මාස 6ා මහ ඇමති තුමාගේ ඔෆිස් එකේ ඊලඟ මාස 06 අරකෙ එහෙම එහෙම පඩි ගන්න කට්ටියත් ඉන්නව එහෙමත් කට්ටිය ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේමහතා කතා කරමින්</u>**

පෙර සිරිතයි දැක්කෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නමුත් සභාව විසින් කියනවනම් ගෙවන්න කියල මම ගෙවන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, අප ඔබතුමාගෙන් ඉල්ලනව මේක සහකාර පළාත් පාලන කොමසාරිස්තුමිය එවකට ලේකම් දූරය දැරුවෙ එතුමිය ඒකට එකඟ වුණු නිසා තමයි පුහුණුව ලැබුවේ ඒ නිසා ඔබතුමා වගකීමක් නොගෙන ඒ කොමසාරිස්තුමියටමඒ ගොනු යවලා අපේ ලේකම්තුමත් දන්නව ඒ සිද්ධිය ඔබතුමාගේ අනුමැතිය දෙන්න

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට තියෙන බලතල මම කාටවත් පවරන්නේ නැහැ හැබැයි මගේ තිබෙන බලතල මම ඔය තමුන්නාන්සේලා 21 දෙනාගේ ඉල්ලීමට මේව කරනවා 21 දෙනාම කියනවනම් ගෙවන්න කියල මම ගෙවන්නම් නැතුව මම සාමාන්‍යයෙන් ප්‍රතිපත්තියක් හැටියට ගෙවන්නේ නැහැ. මම අත්දැකීමෙන් දන්නව දැන් මේ අපි දේශපාලනය කරල උඩහට ගියහම රස්සාවක් ඉල්ලගෙන ආවහම ඒ මහත්තරු ලියුමක් එවනවලු මෙන්න මේ හෙම කියල ඒ මාස 06 ඉවර වුණහම ඊලඟ තැනට තව මාස 06ක් යවනව ඉතින් දවසකට රු.500.00 ගානෙ ගෙවන්න කියල මේ අයට චක්‍ර ලේඛකයකුත් තියෙනව ඒ නිසා රු.500.00 ගානෙ රුපියල් 15,000.00ක් මාසෙට අරගෙන මේගොල්ලො වටේ කැරකෙනව යන දවසෙ ඕක තමයි සභාව විසින් කියනවනම් ගෙවන්නම් නමුත් මම කියන්නෙ මීට පෙර අපි කිසිම ළමයෙකුට ගෙව්වෙ නැහැ මීට වඩා බොහොම දුප්පත් බොහොම අසරණ මිනිස්සු හිටිය අපි ගෙව්වෙ නැහැ. ඕනිනම් ගෙවන්නම් කියනවනම්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා කියන්නෙ ප්‍රතිපත්තිමය තීන්දුවක් එක්කෙනෙකුට කරොත් තව ආවත් සභාපතිතුමාට ඒක අපට සභාවට කන්දෙන්න වෙනවා ඉතින් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න නිසා මේක A ද, Bද, Cද, කියල අපිට වැඩක් නැහැ කොහේද කියල වැඩක් නැහැ ප්‍රතිපත්තිමය තීන්දුවක් නම් ඉතින් ඕක ගෙව්වොත් අනිත් අයටත් ගෙවන්න වෙනවනේ සභාපතිතුමා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාකතා කරමින්</u>**

අපි රුපියල් 1000.00 ගානෙ දාල ඕක ගෙවල දාමු ඉවරයිනෙ වැඩේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්</u>**

මේකයි වෙලා තියෙන්නෙ සභාපතිතුමා අපේ විපක්ෂ නායක තුමා ට්‍රේනින් ළමයි හැම තැනටම හැම ආයතනයම රු500.00 ගානෙ ගෙවනව දැන් අම්බලන්ගොඩ නගර සභාවෙ ප්‍රාදේශීය සභාවෙත් ගෙවනව බලපිටියෙ හැම තැනම ගෙවනව අම්බලන්ගොඩ නගර සභාවෙ විතරයි සභාපතිතුමා ඕක ගෙවන්නෙ නැත්තෙ ඒක අපි සභාවෙ කවදාවත් ගෙව්වෙ නැහැ හැබැයි මේකෙ වෙලා තියෙන්නෙ මේ ළමයට ට්‍රේනින් එක දීල පළාත් පාලන කොමසාරිස් පළාත් පාලන කොමසාරිස් හිටන් අනුමත කරල එවල තියෙන්නෙ ගෙවන්න කියල නමුත් සභාපතිතුමාගෙ කථාවෙ සත්‍ය තියෙන්නෙ කාටවත් ගෙවපු නැති හින්දා හැබැයි ආපහු පළාත් සභා කොමසාරිස්තුමියට යවන්න ඕනි නෑ ගෙවනවනම් අපට ගෙවතැහැකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක තමයි සභාව කියනවනම් ගෙවතැහැකි අවශ්‍ය නැහැ එතැනට යවන්න

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙහෙමයි සභාවෙන් ගෙවනව නම් තීරණයකට එන්න වෙනවා මොකද අනිත් ළමයි ආවත් ට්‍රේනින් එකක් වුනොත් ගෙවන්න වෙනවනෙ .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

පෙර පාසැල් වලත් ඉන්නවනෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මේ දේම කියන්නම් අපිත් එක්ක දේශපාලන කරන මිනිස්සුම ඇවිල්ලා අපේ දූ ට්‍රේනින් එහෙකට දාලා රුපියල් දහ දාහක් හරි දෙන්න පුලුවන්නම් දෙනන කියන ඉල්ලීම අපට ඕන තරම් ලැබෙනවා ඉතින් මේක හිස බේරගෙන ඉන්න බැරි තත්ත්වයක් තියෙන්නේ ඉතින් ඒක හින්ද මන්ත්‍රීවරුන් තේරුම් ගන්න ඇයි ඒගෙවුවෙ නැත්තෙ ඇයි කියලා නැත්නම් මමකැමතී මේක කරල මටත් මේක හුහක් සල්ලි තියෙනවනම් සල්ලි ටික ඉවර වෙන්න හරි දිල ඉවර කරන්න නමුත් ඊට වැඩියෙ මේකක් තියෙනවා ඔය ඉල්ලීම් ගොඩාක් ඇවිල්ල තියෙනවා

**<u>තීරණය</u>**

**2017 දෙසැම්බර් මස සිට පෙබරවාරි මස දක්වා අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රායෝගික පුහුණුව ලැබූ චමෝදි සිතාරා මධුවන්ති මෙනවියට එම කාලය වෙනුවෙන් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව මීට පෙර මේ ආකාරයට ගෙවීම් කර නොමැති බැවින් ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයක් නොතිබූ බැවින් සභාවේ අනුමැතිය ලබා දිම සුදුසු නොවන බවට සභාව තීරණය කරන ලදි.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේමහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එසේනම් ඔබතුමා බැරෑරුම් බවයි කියන්නෙ අපේ දෙවන ඉල්ලීම, සභාපතිතුමා එච්.එල්. මල්ලිකා ද සිල්වා මහත්මාව නො:294, නිලන්ති නිවහනේ පදිංචි මෙන්න මෙහෙම ඉල්ලීමක් තියෙනවා කෙටියෙන් මම ඒක කියනව ලියුම කියවන්නේ නැතිව අනතුරුදායක ගස් දෙකක් සම්භන්ධව මීට පෙර අප සභාවේ එතුමිය රු.1700.00 ගානක මුදලක් බැදලා ඒ අනතුරුදායක බවෙන්

මිදීම සඳහා ඉල්ලීම් කලා. එය ගහ කපන්නයැයි නියෝග යවල කිහිප සැරයක් ඊට විරුද්ධව ඉන්නේ ඩී. එල්. උපාලි කුලසිරි කියන තැනැත්තා මොටදැලිය කියන ගහට පනා කියල කියන්නෙ අර අපි පොඩිකාලෙ ඔලුව පීරුවෙ අන්න ඒ වගේ කිසිම වටිනාකමක් නැති මුල හයිය නැති අරටුක් නැති විශාල රුස්සයක් වගේ හැදිච්ච තඩි ගහක් ඔවුන් මෙම ගහ කැපුවෙ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කියන්නෙ ඔය ගොල්ලන්ගෙ ගෙදරට අල්ලපු ගෙදර

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

අල්ලපු ගෙදර චිත්‍රාවංශ ධනසිරි

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය දෙකේම දෙපැත්තක් තියෙනවා අනිත් එක්කෙනා මේ මොටදෙනිය ගහ කපන්නෙ නැහැ කියල මෙතන ඉල්ලීමක් තියෙනවා අරයගෙ ඇල්බීසිය ගස් ටික කපන්නෙ නැහැ කියල ඒ මිනිහගෙ වහල උඩ මමත් ගිහිල්ල බැලුවා ඒ මිනිහගෙ ඉල්ලීම කෝ ඉල්ලීම් දෙකයි ඔබතුමා මන්ත්‍රීතුමානෙ ඔය දෙන්නට කියන්න ඔයාගෙ ඇල්බීසිය ගස්ටික කපන්න අර මිනිහගෙ අර ටික කපයි කියල එතකොට වැඩේ කථාකරල කරන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, ඒ ඇල්බීසිය ගස් ටික කපන්න ගියා මේ පශු වෛද්‍යතුමා ඔය අල්ලපු ගෙදර ඉන්න ඒ ඇල්බීසිය අතු කපන්න යනකොට මේ තැනැත්තා යම් රෝගයකින් පෙළෙනවදැයි මම දන්නෙ නැහැ ඒ තැනැත්තා පොළීසියට කියල ඒ අතු කැපීම වැලැක්වැක්කුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ ඒ තැනැත්තා මෙහේට දාල තියෙනවා ඇප්ලිකේෂන් එකක්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ඒ නැවත මේ ඊයෙ පෙරේද ඔබතුමාට ලියුමක් දාල තියෙනවා ඇල්බීසිය අතු කපන්න කියල ඔබතුමා නැවත එතුමා කියපු සැනින්ම මේ අතු කපන්න කියල ඒ අපේ පශු වෛද්‍යතුමාට ලියුමක් ගහල තියෙනවා. ඉතින් ඔබතුමාගෙන් අපි ඉල්ලන්නේ දෙපාර්ශවය සමබරව සොයා බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ මෙහෙමයි ඒ තැනැත්තත් මෙතැනට ඇප්ලිකේෂන් ඔය වගේ දාල එයා ඇවිල්ල කිව්ව මේ ඔෆිස් එකෙන් මට සාධාරණයක් ඉටුවුනේ නැහැයි කියල මම ෆයිල් එක බැලුවම ඒ මනුස්සයගෙ මේක එක ඇත්ත මම ඇත්තටම ඔතනින් යනගමන් ඔය මනුස්සය කියන එක ඇත්තද කියල බැලුවා තනිකර ඇල්බීසිය ගස් තියෙන්නෙ එතුමාගේ වහල උඩ ඉතින් ඇල්බීසිය ගස්වලින් ඇති ප්‍රයෝජනයකුත් නැහැ. ඉතින් ඕක කපල දැම්මනම් ඉවරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා එහෙනම් අපි මොකද මම මේකට දෙපාර්ෂවයට මම මැදිහත් වෙන්න අවශ්‍ය නැහැ මේ නිලධාරීන් දෙන්නෙක් යවල ඒක හරියට ස්ථානීය පරීක්ෂාවක් කරල

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ දෙන්නට ගහගන්න කියල අපි පැත්තකට වෙලා ඉන්න ඉවරයි මල කරදරයක් ඕක.

ඔය මොටදැලියා ගහ ඒ ලිපිගොනුවේ අංකය කියන්න එතකොට දෙකම එකට කරතැහැකි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ලිපි ගොනු අංකය අම්/නස/02/15

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අනවසර ඉල්ලීම් කරුගේ නම කියන්න

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ඉල්ලුම්කරුගෙ නම තමයි ඩබ්ලිව්. උපාලි කුලසිරි ද සිල්වා
ඒ ගස් අයිතිකෙනා නේද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ඒ ගස් හිමිකරු එච්. එල්. මල්ලිකා හේමලතා ද සිල්වා

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැ නෑ ඔය දෙකම ඉෂ්ඨ කරන්නම්

<u>****ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේමහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි තෙවනුව කෙරමිණිය පුස්තකාල භූමියේ අපි දානපති පීටර් ද සිල්වා නමින් නම් කිරිමට මීට මසකට පෙර යෝජනා කරා. දැන් විරෝධතා කැදවිය යුතු කාලයත් ඉක්මවලයි තියෙන්නෙ ඉතින් විරොධතා කැඳවිය යුතු ආකාරය පිළිබඳව ලේකම්තුමියට හරි හමන් උපදෙසක් දෙන්න පුලුවන් කෙනෙක් නැත්ද අපට මේ සභාවේ හොයාගන්න

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ලේකම් මිස් දැන් අපේ මේ මන්ත්‍රීතුමා යෝජනා කරා මොකක්ද  නම කිව්වෙ පීටර් ද සිල්වා අනුස්මරණ පුස්තකාලය ලෙස නම් කරන්න කියල කෙරමිණිය පුස්තකාලය එතකොට අපේ අඥා පනත අනුව එහෙම නම් කරනවනම් විරෝධතා කැඳවන්න ඕනෙ. ඉතින් ඒක මේ යෝජනාවෙන් විතරක් හරියන්නෙ නැහැ ඊට පස්සෙ නිලධාරින් වශයෙන් ඉතිරි යුතුකම් ටිකෙ ඉෂ්ඨ කරන්න. ඒ විරෝධතා කැඳවල ඒක ගැසට් කිරිම දක්වා යන්න ඕන ප්‍රධාන අමාත්‍යතුමා ලඟට ගිහිල්ල හරි ඒ අනුව ස්මාරක නම් කිරීමේ මේකක් අනුගමනය කරන්න.

<u>**තීරණය**</u>

**කෙරමිණිය පින්නදූව ග්‍රාමයේ පිහිටි මහජන පුස්තකාලය දානපති කේ.ජී.පීටර් සිල්වා පුස්තකාලය නමින් නාමකරණයට ලක් කිරීම සඳහා විරෝධතා කැඳවීම් සිදු කර ඉදිරි කටයුතු  සිදු කරන ලෙස සභාව  තීරණය කරන ලදි.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේමහතා කතා කරමින්**</u>

අන්තිම ප්රශ්නෙ සභාපත්තුමා අපේ කෙරමිණිය පිනනදූව ක්‍රීඩා පිට්ටනියට දානපතිනියක් පර්චස් 36ක භූමි භාගයක් ප්‍රදානය කලා. එම භූමි භාගය අල්ලපු වැටේ ඉන්න තන්හාපති මනුස්සයෙක් අල්ලගෙන ඒ මනුස්සය වැට මායිම් ගහගෙන ඒක මිනුම් කටයුතු කරන්න කියලත් අපි ඉල්ලීමක් කරා. ඒ ගැන මෙකද ප්‍රගතිය කියලත් ඒ එක්කම අහල අපි නවතිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම් මිස් දැන් මේ වගේ ප්‍රශ්න අසන්න තියන්න එපා. සභාවෙන් ගත්ත තීන්දුවක් ඉල්ලීමක් කරොත් ඒක කරන්න කියල ඒක කරන්න. නැත්නම් වෙන්නෙ අපේ ඔලුවෙත් තියෙන්නෙ හැමදේම ඒකක් මේකක් නෙමෙයි. නැත්නම් මන්ත්‍රීවරුත් ඇවිල්ල නිලධාරීන් හම්බවෙලා ඒ ටිකත් ඔයවගේ දේවල් කර ගන්න ඒවා. දැන් මේ මේකෙ මට නිවැරදි පිඹුර හම්බවුණා ඔබතුමා ගාව නැතිවුනත් මං ගාව තියෙනවා මගේ ගෙදර තියෙනවා දැන් මම ඒක ගෙනෙත් දෙන්නම් ඒ මනුස්සය කෙලින්ම ගහල තියෙනවා ඔහොම්ම වැට ඒක තියෙන්නෙ මෙහෙම තුන් හුලස් හැඩයට ඒක අනිත් කැලිට්ක ඔයා පවර ගත්ත ඉඩමට අයිතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේමහතා කතා කරමින්</u>**

සභාපතිතුමා සභාවෙන් සල්ලි යන එක අපේ හිතට දැනෙන නිසා ප්‍රාදේශීය ලේකම් හරහා මේක මැනගෙන පිනටම මේක අපට කරගන්න පුළුවන්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාකතා කරමින්</u>**

මට කරුණක් තියෙනව කෙටියෙන් ඉදිරිපත් කරන්න අපේ නගර සභාවෙන් පාරවල් අලුත්වැඩියා කරන කොට ලඟදි මම හිතන්නෙ තල්ගස්ගොඩ ඒරියා එකේදිත් ප්‍රශ්නෙ වුණා. මටත් එහෙම වුණා අපේ දැන්වීම් සයින් බෝඩ් මුකුත් පාරවල් වල දාන්නෙ නැති හින්ද ඇත්තටම ජනතාවත් අපහසුවට පත් වෙනව, අපේ වැඩකරන හිමාල් මහත්තයලත් අපහසුතාවයට පත්වෙනවා අර පාර වසා ඇත ආදී රූට් බෝඩ්ස් ටිකක් අපේ සභාවෙන් හිමාල් මහත්තයලාට දෙන එක හොඳයි ඒක නීතිය පැත්තෙනුත් අපි නිකන් කොළ අත්තක් හරහට දාල වහනව ඊට පස්සෙ මිනිස්සු ඇවිල්ල මේ ගොල්ලන්ට ගහන්න යනව මටත් ඇවිල්ල බැනල ගියා එක දවසක්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ ඔබතුමාගෙ කථාව ඇත්ත TO මහත්තරු රෝඩ් සයින්ස් තියෙන බෝඩ්ස වෙනම අපට අවශ්‍ය ඇස්තමේන්තුව ඉදිරිපත් කරල ඒව හදාගන්න. ඒ කියන්නෙ "පාර වසා ඇත","මේ පාර යොදන්න" ඒ වගේ තියෙන සයින් බෝඩ්ස් ඒව යොදා ගන්න.

**<u>**ගරු නගර සභා මන්ත්‍රීනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපගේ නාගරික මන්ත්‍රී වන ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය අසනීප වෙලා රෝහල්ගත වෙලා ඉන්නවා ඔබතුමාට ලිඛිතව දැනුම් දීමක් කරයි. ඒ නිසා සභාවට පැමිණීමට නොහැකි බව මම කාරුණිකව දැනුම් දෙනව මට දුරකථනයෙන් දැනුම් දුන්න දන්වන්න කියල සභාවට අනිත් එක

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
එතුමියගේ නිවාඩු අනුමත කරමු අපි සභාව වෙනුවෙන්

** **<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඊට පස්සෙ මට ඊ ලඟ කරුණ තමයි නගර සභා මන්ත්‍රීවරුන්ගෙ හැඳුනුම්පත්, ඇයි නගර සභා මන්ත්‍රීවරුන්ගෙ හැඳුනුම්පත් ටික ප්‍රමාද වෙන්නෙ වාර කිහිපයක් ගියා ඒක ලබා දෙන්න කටයුතු කරන්න මේක ඉතා වැදගත් දෙයක් අනිත් එක අපේ අර කණ්ඩායම් පින්තූරය ගැනත් බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නෑ නෑ අද ඒක කරන්න තිබුණ ඇයි ඒක කරේ නැත්තෙ. මිල ගණන් කැඳවලාලු තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඇත්තටම කියන්න බැරිවුණා එකක් නගර සභාවේ හැඳුනුම්පත් එක අනිත් එක නගර කණ්ඩායම් ඡායාරූපය සම්බන්ධව අනිත් එක වැඳගත්ම දෙයක් අපි කන්තා මන්ත්‍රීවරියන් ඉන්නව ඇත්තටම සභාපතිතුමනි අපට වැසිකිලියක් ඒ කියන්නෙ කොමර්ඩ් එකක් සහිත වැසිකිලියක් නොමැතිවීම ඉතාමත්ම කණගාටුදායක තත්වයක් මොකද අපි මෙතෙන්ට එනවා මොකද එහෙම වැසිකිලියක් නොමැතිකම අපි ලොකු අපහසුතායකට පත් වෙනවා මොකද අපි ඇඳන් එන්නෙ සාරිය. කණගාටුවෙන් හරි කියන්න ඕනෙ මොකද අපි නගර සභාවක ඉන්න මන්ත්‍රීවරියක් මේ හාර ලක්ෂ ගානක් දීලා වැසිකිලියක් හැදුව ඒකට අවශ්‍ය කොමර්ඩ් පහසුකම් සපයන නැහැ පුස්තකාලයේ ඉන්නෙත් ඔක්කොම හරියක් කාන්තාවන් මේක ලොකුම අසාධාරණයක් වෙලා තියෙනව අපිට මේක අපේ අයිතිය අපට මේක ලබා දෙන්න කටයුතු කරන්න. මම ඔබතුමාගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

TO මත්තය මේ අලුතින් හදපු එකේ කොමඩ් එකක් නැතිද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

වල හදන්න එපයි ඉස්සර වෙලා

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒක ප්‍රශ්නයක් නැහැ දැන් මේ දෙක හරි අලුත්වැඩියා කරල කොමර්ඩ් එකක් හයි කරල දෙන්න ඇත්තටම මමත් දැන් එළියට ගිහින් ආවෙ ඔය වැඩේට තමයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනී ඊ ඉන්ද්‍රාඅයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ලොකු අසීරුතාවයක් මොකද අපි මෙතන දවසෙම ගත කරනව

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ කියන කථාව සාධාරණයි ඒකට ඇහුම්කන් දෙන්න. ඒක අපි ඉක්මනින්ම විසදන්නම්

<u>**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මට කාරණා දෙකක් ගැන කථා කරන්න තියෙනවා රණසූරිය පාරෙ පෙට්ටු බෝක්කුව සම්භන්ධවත් ඒකෙ අලුත්ම තත්වය පිළිබඳවත්

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒකෙ කොන්ත්‍රාත් එක ලබා දීල තියෙනවා දැන් ආරම්භ කරයි. TO මහත්තය මට කොන්ත්‍රාත්කරු කිව්ව ඔයා කිව්ව කියල ඉන්ජිනේරු මහත්තය එනකන් ඉන්න කියල ඒක මොකක්ද දන්නෙ නැහැ

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙතුමාගෙ එක ප්‍රශ්නයක් නොවෙයි දැන් 4000ක් 5000ක් ඉස්කෝලයක් තියෙනව එතන ඒ ළමයි ඉස්කෝලෙ යනව එතනින් ඒක හින්ද අපි ඒක ඉක්මනින් කරන්න ඕනෙ ඔබතුමා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ටික දෙන්න නැත්නම් එයා හේතුවක් වශයෙන් කරන්නෙ ඉන්ජිනියර් ආවෙ නැහැයි කියල දැක්වුව මට. දැන් ඉන්ජිනියර් කවදද එන්නෙ මේ සතියෙ මේ සතියෙ එනවයි කියල කියනව

<u>**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

ඊලග කරුණ සභාපතිතුමා පීරිස් වෙද මාවතට වැටෙන අතුරු මාර්ගය 120,000.00 කොහේ අනුමත කරලත් තියෙනව ඒ සම්භන්ධව දැනගන්නත් කැමතියි

තව කරුණක් තියෙනව සභාපතිතුමනි, ඉස්සරහට එන්නෙ වැහි කාලය එන්නෙ අවුරුදු 06ක් විතර සුද්ද කරල නැහැ පොල්වත්ත ප්‍රධාන පාරට මුහුණලා තියෙන දයාසිරි ගැරේජ් එකට අනිත් පැත්තෙ තියෙන හල්වතුර ඇලත් එක්ක තියෙන ඉඩම් අවුරුදු 07ක් විතර සුද්ද කරල නැහැ ඒ අහල පහල කට්ටිය කිව්ව සත්තු එනවා ඩෙංගු වසන්ගත තියෙනව ලගදි කලුවඩුමුල්ලෙ මල්ලි කෙනෙක් නැතිවුණා.
නගර සභාවට අයිති එකක් නෙමෙයි අදාල නිලධාරීන් දැනුවත් කරල ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ගයක් ගන්න

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

PHI මහත්තයා මෙන්න මේකට නෝටිස් කරල මේව කරන්න. හරියට කියන්න තැන
දයාසිරි ගැරිජ් එක තියෙන්නෙ වම් අත පැත්තෙ පොල්වත්ත පාරට මුහුණලා තියෙන එතන ඉඩම ගැර්ජ් එක එහා පැත්තෙ ඒ වගේම හඳුනාගත් ඉඩම් තියෙනව මුළු අම්බලන්ගොඩම තව ඉඩම් තියෙනව මගේ ගමේම ඒ වගේම හඳුනාගත් ඉඩම්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ වගේ සුද්ද නොකරන ඉඩම් සම්බන්ධයෙන් PHI මහත්තය දැනුවත් කරන්න එතකොට එතුමා නෝටිස් යවල ඒ දැනුවත් කිරීමේදී අදාල අයිතිකාරයගෙ නමයි, ලිපිනයයි නිවැරදිව දැනුවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි කරිත්ත කන්ද බලප්‍රදේශයේ හදිසි පිළියම් යෙදිය යුතු ආපදාවන් ගැන දන්වා සිටිනව කියල කරිත්ත කන්ද ප්‍රජා මංඩලය ලියුමක් එවල තියෙනව.

එක හල්වතුර කුලරත්න හරස් පාර කොන්ක්‍රීට් ඉතාම අබලන්වී ඇත. දැන් මාස 03ක් තිස්සෙ කියනව අර හල්වතුර හොරුවිල වෙද මහත්තයගෙ ඒ පාර.

ඊලඟට සංඝරාජ මාවත පීරිස් වෙද මාවත යාවත්කරන පාර අබලන්වීම අර සක්වා එකට එහා පැත්ත පාර,

පීරිස් වෙද මාවත ප්‍රධාන කාණුවේ කාණු කිහිපයක් ජලය එකතුවන අනුර ප්‍රනාන්දු නිවස ඉදිරිපිට බෝක්කුවෙ වැලි සිරවී වල්බිහිවී ඇත. බැකෝ එකක් ආධාරයෙන් එය ඉවත් කළ යුතුය. මේක මම දැන් මොහොතකට කලින් කථාකර ප්‍රශ්නෙ නමුත් බැකෝ එකක් මඟින් ඒක කරන්න බැහැ සේවකයෙක් දාල කරන්න ඕනෙ සභාපතිතුමනි,

ඊලඟට හතර කරිත්ත කන්ද ක්‍රීඩා පිටියට පඩිපෙළ පිවිසුම් මාර්ගයක් සකස් කිරීම. මහ කාණුවක්නෙ තියෙන්නෙ පඩි පෙළ දෙකක් හදන්න කියල මම නිලධාරීන්ට කිව්ව අපේ කැල්ලෙ පොදු කටයුතු සඳහා තියෙන පිට්ටනියෙ පොදු කටයුතු සඳහා වෙන් කරපු කැල්ල හල්වතුරෙ හොරුවිල වෙද ගෙදරට මෙහා පැත්තෙ කාණුවෙන් ළමයින්ට පනින්න බැහැනෙ පඩි පෙලක් විදියට පොඩි පඩි පෙළවල් දෙකක් විතර ඕන වෙනවා
ඊලඟට කන්ද මාවත සියලුම කාණු අබලන් වී ඇත. පිළිසකර කරන්න කියල කියල තියෙනවා.
මේ ප්‍රජා මංඩලයේ ලියුම ගරු සභාපතිතුමනි මම ඒක ඉදිරිපත් කරනවා
පොඩ්ඩක් ඉන්න සභාපතිතුමනි, බරපතලම ප්‍රශ්නය තියෙන්නෙ මේ කන්ද මාවතේ ලිඳ සම්බන්ධයෙන් මං මේ සභාවට කලින් සභාවේ මේක පිළිබඳව සියලුම ලිපිලේඛණ සභාගත කරා මේ අපේ නගර සභාවට අයිති ඉඩම ලිඳ සම්බන්ධව ඔප්පු මහා ප්ලෑන් බෙදුම් නඩු තීන්තු සියල්ල ලේඛනගත කරල ඇත්තෙ සභා ගත කරල අවශ්‍ය නම් මට නැවත ඉදිරිපත් කරන්න පුළුවන් දැන් එතන මහා පරිමාණයේ තට්ටු දෙකේ ගෙයක් ඉදි කරල තිබෙනවා ඒක නගර සභාවෙන් අවසර දීලා ද නැද්ද කියන එක මම දන්නෙ නැහැ. හැබැයි සියලුම ප්‍රදේශවාසීන් මේකට විරුද්ධත්වයක් පානවා ඒ අයව නවත්තගෙන ඉදීම ඉතාම අසීරු කරුණක් ඒ අස්සෙ ලිඳේ තාප්පෙට තමයි ඒ අය තාප්පෙ ඉදිකරලත් තියෙන්නෙ ඒක භෞතිකව ඕන කෙනෙකුට පේනවා ඒක වෙන්න බැරි දෙයක් කියල ඒ අස්සෙ ඒක නැවත අද වෙනකොට ටකරන් මඩු දෙකක් ගහල ඒ ඉතුරු වෙච්ච ලිඳේ දකුණු

පැත්තප්‍රදේශයආවරණය කරන් එයා පාවිච්චි කරන්න උත්සාහ කරනවා. ඉතින් මේක ගමේ ජනතාව කොහෙත්ම අනුමත කරන දෙයක් නෙමෙයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

TO මහත්තය මෙන්න මේක ඔය කියන කන්ද මාවතේ ලිඳ අපේ භූමිය ඇතුලෙ තියෙනව නම් මොනව හරි අපේ සේවකයො ගිහිල්ල ඒව ගලවගෙන එන්න. නගර සභාවට ගේන්න ඒව

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා  මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඒකෙ වැට ගහන්න අපේ නගර සභාවෙ අවශ්‍ය ගල් වැලි තැන්පත් කරන්න කියල මම කියනව තාවකාලිකව ඒකෙ ඉදි කිරීමක් කරන කන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාමහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි පොල්වත්ත හන්දියෙ පූර්ණ වෙළඳ සැල අසල ඊයෙ පෙරේදා ලොකු වාහන දෙකක් නවත්තගෙන අපට හරිම වදයක් ඒක එතන මම ඉල්ලා සිටිනව එතන වාහන නවතා තැබීම තහනම් කියන පුවරුක් හරි මොකක් හරි ගහන්න කියල මොකද මම විනාඩි 10ක් හිටිය එතන එහා පැත්තට යන්න බැරුව මොකද අඩි 20ක් දිග කන්ටේනර් දෙකක් ගහගෙන ඒ මිනිස්සු අපිට පාර පනින්න විදියකුත් නැහැ බඩු බාන්න ඇවිල්ල එතන ගහන්න කියල මම කියනව වාහන නවතා තැබීම කියල මොකක් හරි

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා දැන් හාඩ්වෙයාර් එකනෙ බඩු බාන්න වෙනකොට අපි තේරුම් ගන්න ඕනෙ හාඩ් වෙයර් එකට බඩු බාන්නෙ නැතිව කොහොමද ඒ මනුස්සය

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාමහතා කතා කරමින්</u>**

අඩි 20ක් විතර දෙකක් ගහගෙන

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඕක මාසෙකට එක දවසක් දෙකක් වේවි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාමහතා කතා කරමින්</u>**

මෙම ස්ථානයේ මොකක් හරි ගහන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍රමහතා කතා කරමින්</u>**

මේ ස්ථානය පිළිබඳව මමත් කථා කෙරුව කලින් කථා කරේ හාඩ්වෙයාර් එකට බඩු බාන එක ගැන නොවෙයි. එතන අඩි 10 පමණ පටු පාර එතන ඔබතුමා දන්නව ඇති එතන ත්‍රීවිලර් නවත්තල තමයි කඩේට යන්නෙ මිනිස්සු මෝටර් සයිකල් එක නවත්තනව හරහට දවසක් බයිසිකල් එකක් නවත්තල තිබුන පාර හරහට ඉතින් මේවට කොහෙන්ද ක්‍රියාත්මක වෙන්නෙ මේවයෙ නීතියක් කොහෙන්ද ක්‍රියාත්මක වෙන්නෙ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෙ පොළීසියයි. නමුත් අපි හැම තිස්සෙම බලන්න ඕනෙ දැන් හාඩ්වෙයාර් එකක් වගේ ඉස්සරහ අපි නෝ පාර්කින් කරනව කියන්නෙ ඒ මිනිහගෙ බිස්නස් එකේ දොර වැහුව වගේ වැඩක් ඒක නිසා අපි හැම තිස්සෙම පෙක්සිබල් වෙන්න දෙපැත්තම ඉදල හිටල ඒ වගේ කරදරයක් වේවි. නමුත් මිනිස්සු ජීවත් වෙන්නත් ඕනිනෙ. නගර සභාව කියන්නෙ ජීවත්

වෙන්න මිනිස්සුන්ට පහසුකම් සපයන තැනක් මිසක් කරදර සපයන ස්ථානයක් නෙමෙයිනෙ ඇත්තටම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාමහතා කතා කරමින්</u>**

ඒ පුද්ගලයා අපෙත් හිතවතෙක් තමයි නමුත් පොදු ජනයාට අවහිරයක් නොවන විදියට ඒගොල්ලො ඒක පාවිච්චි කරන්න දැනගන්න ඕනෙ ඒක එතන ප්‍රධාන මංසන්ධියක්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මං පුද්ගලිකව කථා කරන්නම් එයාට

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී වඩුමේස්ත්‍රී නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මොකද මම මේ කියන්න ගත්තෙ ඔබතුමාට විශේෂයෙන් අර හල්වතුර යෝජනා ක්‍රමය දැන් පෙට්ටි බෝක්කුවක් බඳින්න අරගෙන දැන් ගොඩාක් කල් වෙනවා තාම එකේ අවසානයක් නෑ ඒ වගේම කුණු ගෙනියන ඒ හල්වතුර යෝජනා ක්‍රමයේ පාරවල් හරිම අබලන් තත්ත්වයේ තියෙන්නේ යන්නවත් බෑ මම හිතන්නේ සෞඛ්‍ය අංශයේ අයත් කර්මාන්ත අංශයේ අයත් ඇවිල්ල කියන්න ඇති මං හිතන්නෙ අපේ ගරු මන්ත්‍රීතුමා ප්‍රදේශයේ ඉන්න

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ එහෙම අබලන් තත්වයේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී වඩුමේස්ත්‍රී නිලානි මෙනවිය කතා කරමින්</u>**

යන්න බැහැ ඇත්තටම ඔක්කොම කැඩිල මේ ප්‍රදේශයේ මන්ත්‍රීතුමා එහෙනම් ඔබ ලඟකදී ගිහිල්ල නැතුව ඇති
ඇත්තෙන්ම මේ බෝක්කු හින්ද ඒ පාරේ යන්න බෑ ඒක හදන්න අරගෙන මාස කීයක්ද වෙනවා මාස 03ක්ද කොහේ වෙනව තාම වතුර රැඳීල මොනව හරි මේවට බොරුවට අපි ඇවිල්ල සභාවේ කථාවෙනව ක්‍රියාත්මක වීම අඩුනම් ඒ කථා කරන දේත් ප්‍රතිඵල නැහැ ඒ නිසා ඒක කාර්යක්ෂමව කරන්න කියල

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනුමැතිය ලැබුනෙත් මම හිතන්නෙ ඊයෙ පෙරේද පළාත් සභාවෙන් බෝක්කුව හදන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කේ. පී. දයාන්න්ද ද සිල්වා මහතා හදිසි හෘදයාබාධයකට bypass එකක් කරල මම හිතන්නෙ ඉන්නෙ දැන් එතුමානන්ට අපි ඉක්මන් සුවය ප්‍රර්ථනා කරමු සභාවෙ සියලු දෙනාම ඒ එක්කම මේ විලේගොඩ පැත්තෙ අපේ මන්ත්‍රීතුමා දැක්කද දන්නෙ නැහැ අර ලුම්බිණී එකට යන පාරෙ බෝක්කුව තියෙන තැන උතුරල යනවා දැක්කද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ මන්ත්‍රීතුමා ඇවිල්ල පැමිණිලි කලා ආර්. ඩී. එකට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ඒ පාරෙන් එහා පැත්තට බෝක්කුවක් තියෙනව ඒ බෝක්කුව හිරවෙලා

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හරි හරි මන්ත්‍රීතුමා අවුලක් නැහැ ඔබතුමාට බලය තියෙනව ඕන අහකින් මහ ජරාව මෙතන සබන් හෝදල මේව කරල යන්නෙ ඔබතුමාට තමයි බයින්නෙ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාපට් පාර කඩන්න මට අයිතියක් නැහැ

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කාපට් එක කඩන්න අවශ්‍යතාවක් නැහැ මේ පැත්තට බස්සන්න පුළුවන් එහා පැත්තට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
රේල්පාර අස්සෙන් බහින් නැත්තන් මොකක් කරන්නද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඇයි රේල්පාර අයින දිගේ බහිනව වතුර දැනට තාවකාලිකව හරි ඒක කරන්න. අනිත් එක තමයි මේ කාණු පද්ධතිය නම් අපෝ ඕනෙ නැහැ ස්ලැබ් එහෙම මේව වෙලා තියෙන්නෙ හරියට මට්ටම් කරන්න ඕනෙ නේ අනිත් එක අනිකුත් පාරවල් වලත් කාණු පද්ධතිය නගර සභා පාරවල්වල ගොඩාක් අසාද්‍ය තත්වයේ පවතින්නෙ ඔබ තුමා ටිකක්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නගර සභා කාණු ඉතාමත්ම හොඳින් අපි දැන් සුද්ද කරල තියෙන්නෙ

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සුද්ද කරල තියෙනව, නමුත් සමහර තැන් තියෙනව ඕනෙ නම් මම කියන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි පොල්වත්ත හන්දියේ සාප්පු සංකීර්ණයේ තියෙන වැසිකිලිය සම්බන්ධයෙන් ගැන අපි යෝජනා කරා

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඒක අපි ඒක ඉස්සරහට කරනවා
ඒ වගේම පඤ්ඤාලෝක මාවතේ කාණු දෙපැත්තත් ඔක්කොම බ්ලොක් වෙලා තියෙන්නෙ ඒකත් පොඩ්ඩක් කරල දෙන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා කතා කරමින්</u>**

කාණු පිරිල තියෙන්නේ කාණු නෑ පස් පිරිල කුණු දාල පිරිල ඔක්කොම තියෙන්නෙ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
පී.එච්.අයි මහත්තයා ඒක පොඩ්ඩක් බලන්න. කට්ටිය යොදවල ඒක සුද්ද කරල දම්මන්න ප්‍රශ්නයක් නැහැ

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කොඩිකාර පෙදෙසෙ ඒව අපේ දම්මික කොඩිකර මහතා ඇත්තටම මේව කරල හරි ගස්සලා තියෙනවා. දැන් ඕකන්දෙත් තියෙනවා පැච් දාන්න පාරවල් ගොඩාක් අබලන්වෙලා ඒ ටිකයි ඒක හදන්න කියල අපි ඉල්ලනව. අනිත් එක කුලරත්න මේ පැත්තෙන් යන ටික කොටසක් හැදුවා. රාජපක්ෂ මහත්තය කුලරත්න ස්කෝලෙට යන පාර දැන් නිවාඩු නිසා කරන්න පුළුවන් නේද? පැච් ටික දාන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාමහතා කතා කරමින්</u>**

ඒකයි මම කියන්නෙ ඒක තමයි මැද පාර ඒකෙ ඇස්තමේන්තුව අපි මේව කරල තියෙන්නෙ ඇස්තමේන්තුව පාස් කරල තියෙන්නෙ මම හිතන්නෙ ඒකෙ වැඩ කරගෙන යන්න පුළුවන් වේවි කියල හිතනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
ඒ ටික හදන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**
මේ දැන් කිව් කාණු පද්ධති අපේ TO මහත්තරු දම්මලා චෙක් කරල හදන්න ඕන කාණු ටික තියෙනවනේ ඒ ටිකේ
පළල, දිග, පාරෙ නම කාණුවෙ දිග ප්‍රමාණවල් එක්ක විස්තර එකක් ප්‍රාදේශීය සංවර්ධන අපේ සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන්න. ඕ දැන් එතකොට මෙතැන අපිට වෙන්වුණු සල්ලි වලින් ඒකට මුදලක් කෙලින්ම වෙන් කර ගන්න පුළුවන් ඒ පාරෙ නමත් එක්කම එතකොට ප්‍රශ්න විසඳ ගතහැකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මෙන්න මේ අපේ TO මිස් ඉන්නවනේ මිස් මෙන්න මේ මේ කියන එක කරල දෙනවද ඔයා? මොකද දැන් අනිත් දෙන්නට පැවරුවොත්, වැඩ ටිකක් අඩුවෙන්නෙ දැන් ඉන්නෙ මේ කාණුවල දිගයි, පළලයි, දුරයි ඒ හඳන්න ඕන පාරෙ නමයි ඒක ඉදිරිපත් කරල මෙතනින් සම්බන්ධීකරණ කමිටුවට යවන්න ඕනෙ. ඒක ලෑස්ති කරන්න. ඒ අපේ ටෙක්නිකල් ඔෆිසර් කෙනෙක්

**අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින සියලුම කාණු පද්දති වල පළල , ගැඹුර ප්‍රමාණය , දුර ප්‍රමාණය සහ පාරෙහි නම යන සියලු කරුණු ඇතුළත් වාර්තාවක් අම්බලන්ගොඩ ප්‍රාදේශිය සංවර්ධන කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් තාක්ෂණ සේවා නිලධාරිනිය වෙත උපදෙස් ලබා දෙන ලදි.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාකතා කරමින්</u>**

දැන් සඳහන් කරන්නෙ මට අම්බලන්ගොඩින් උසම ප්‍රදේශය තමයි කලුවඩුමුල්ල. කලුවඩුමුල්ලෙ කන්දෙ ඉඳන් තමයි වතුර එන්නෙ ලොකු ප්‍රෙෂර් එකකින් වතුර එන්නෙ කලුවඩුමුල්ලෙ කාණු සෑදීම ඉතාම අවශ්‍යයි. කලුවඩුමුල්ලෙ පාර

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මන්ත්‍රීතුමාට කිව්වනේ මම සල්ලි දෙන්නම් ඇස්තමේන්තු කර ගන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාකතා කරමින්</u>**

ඒ කියන්නෙ කලුවඩුමුල්ලෙ කාණු පද්ධතිය උඩ ඉඳලම ලෙවල් කරල හදන්න ඕනෙ අර තැනින් තැනින් හැඳුවට වැඩක් නැහැ කන්ද හින්ද එක ලෙවල් එකක් ගෙනෙල්ල පල්ලෙයහට වෙනකම්ම ගේන්න ඕනෙ එතකොට ඔය ප්‍රශ්නෙ හරියනවා එතකොට අර ඩෙනට මන්ත්‍රීතුමා කිවූ විදියට එතුමා සැලසුමක් අනුව අපි ලෙවල් ටික අරගෙන මේගොල්ලත් එක්ක ප්‍රොපෝසල් එකක් දෙමු නේ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

❧ **ප.ව' 2.40ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| බී. ඒ. ධම්මිකා, | අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු, |
| ලේකම්, | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2018 -08–28** වන දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.